ගරු සභාපතිතුමනි, සමූපකාර අමාත්‍යාංශයේ වැය ශීර්ෂය ගැන වචන කීපයකින් හරි සංග්‍රහ කරන්නට ඕනෑ; නැත්නම් ගරු ඇමතිතුමා අපිත් සමඟ තරහ වෙනවා. සමූපකාර අංශය ඇත්ත වශයෙන්ම රටට ඉතාමත් වැදගත් අංශයක් හැටියටයි, ඇති කළේ. නමුත් අද තිබෙන තත්ත්වයේ හැටියට බලන විට, සෑම මන්ත්‍රීවරයෙකුගේම කීම අනුව, සමූපකාර සමිති ඉදිරියට තිබෙයිද එහෙම නැත්නම් මැරෙයිද කියන්නට බැරි තත්ත්වයක තිබෙන බව ප්‍රකාශ කරන්නට ඕනෑ.

**ආර්. පී. විජේසිරි මහතා**
*(திரு. ஆர். பி. விஜேசிறி)*
(Mr. R. P. Wijesiri)

පණ අදිනවා.

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
(Mr. Ananda Dassanayakt)

පණ අදිනවාය කියා හාරිස්පත්තුවේ දෙවන ගරු මන්ත්‍රීතුමා කියනවා. අපටත් එය පිළිගන්නට සිදු වී තිබෙනවා. සමූපකාර ව්‍යාපාරය කෙරෙන ප්‍රදේශවල, ගම් බදව තිබෙන ව්‍යාපාර ආදිය පුද්ගලික අංශයට පවරා දෙන්නට එපාය කියා පසු ගිය කාලය තුළ මම පමණක් නොවෙයි, අපේ ගරු මන්ත්‍රීවරු, ඇමතිවරු, නියෝජ්‍ය ඇමතිවරු හැම දෙනාම වාගේ කියා සිටියා. විශේෂයෙන් මේ කාරණය මම ගිය වතාවේත් කිව්වා. ඊට කලින් වතාවේත් කිව්වා. දැන් අවුරුදු හතරක සිටම කිය නවා. සමූපකාර ව්‍යාපාරය තිබුණු ප්‍රදේශවල විශේෂයෙන්ම වතුකරයේ ද්‍රව්‍ය බෙදා හැරීම දැන් භාර වී තිබෙන්නේ ඒ වතුවල සුපිරින්ටෙන්ඩන්ට්වරුන්ටයි. මේක මම ගිය වතාවේත් කිව්වා. නමුත් මේ ක්‍රමයේ වෙනසක් ගරු ඇමතිතුමා මෙතෙක් කර නැහැ. මොන හේතුව නිසාද කියන්නට මම දන්නේ නැහැ. කලින් සමූපකාර සමිති මගින් බෙදුණු බඩු අද වත්තේ සුපිරින්ටෙන්ඩන්ට් මහත්මයා විසින් ඒ වත්තේම පොඩි කඩයක් දමාගෙන බෙදා දෙනවා. සමහර විට කිසිම සමිතියක් ඇත්තේ නැහැ. දැන් ඒ විධියට ආහාර ද්‍රව්‍ය ආදිය බෙදා දෙනවා. මම දන්නවා, සමහර තැන්වලට ඒ ද්‍රව්‍ය ගෙන එන්නේ පුද්ගලික වෙළෙන්දන් අල්ලාගෙන, කොමිස් තබාගෙන, ඉතාමත්ම වැඩි මිලට බව. ඊළඟට ඒවා වත්තට ගෙන ගොස් ඒ වත්තේ කම්කරුවන්ට දෙන්නේ ඊට වඩා වැඩි ලාභයක් තබාගෙන. මේ නිසා රටට ආදායමක් උපදවන කම්කරුවන්ටත් ජීවත් වීම සඳහා මේ බඩු ගන්නට වැඩි මිලක් ගෙවන්නට සිදු වෙනවා. සමහරවිට පොඩි සරමක් වත්තේ කම්කරුවෙකුට විකුණන්නේ සාමාන්‍ය වෙළඳ පොළේ එය විකුණන මිලට වඩා රුපියල් දහයක්, පහළොවක් වැඩි මිලකටයි. එතකොට මේවායේ කෙරෙන්නේ ගසාකෑමක්. ගසා කෑමකට රජය ඉඩ දී තිබෙනවා. සමූපකාර ව්‍යාපාරය ඒවායින් පසු බහිනවා.

අද මේ සමූපකාර ව්‍යාපාරය ගෙන යන්නේ ව්‍යාපාර ප්‍රතිපත්තිය උඩ පමණයි. නමුත් සමූපකාර ව්‍යාපාරයේ පරමාර්ථය ඊට වඩා වෙනස්. ප්‍රදේශයේ තිබෙන සෑම වැඩක්ම, ගොඩනැගිලි ඉදිකිරීම, වාරිමාර්ග කර්මාන්ත, පළාත් පාලන ආයතනවල ඉදිකිරීම් කටයුතු, පාරවල් තැනීම ආදී සෑම වැඩක්ම විවිධ සේවා සමූපකාර සමිතිය මගින් කොන්ත්‍රාත් අරගෙන කරන ක්‍රමයටයි, මෙසේ සකස් වී තිබුණේ. නමුත් අද එය කෙරෙන්නේ නැහැ. අද එහෙම කෙරෙනවා නම්. ඒ විධියට වෙනත් ආදායම් තිබෙනවා නම් අද වතුවල ආහාර ද්‍රව්‍ය බෙදා දීම සුපිරින්ටෙන්ඩන්ට්ලාට භාර දී ඒ උදවිය නංවන්න කටයුතු කළත් කමක් නැහැ. මම දන්නවා බොහොම හොඳින් වැඩ කටයුතු කරගෙන ගිය, දියුණු තත්ත්වයක තිබුණු උඩපළාත උඩව විවිධ සේවා සමූපකාර සමිතියත් අද ඊට අඩු තත්ත්වයකට වැටී තිබෙනවා.

**ආර්. එම්. අප්පුහාමි මහතා, (බදුල්ල දිසා ඇමතිතුමා)**
*(திரு. ஆர். எம். அப்புஹாமி—பதுளை மாவட்ட அமைச்சர்)*
(Mr. R. M. Appuhamy—District Minister, Badulla)

ඒකම කියන්නේ කොහොමද?

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
(Mr. Ananda Dassanayakt)

තමුන්නාන්සේ ඉතින් සුදු හුණු ගානවා. හැම ඇමතිවරයෙකුටම සුදු හුණු ගාලා ආණ්ඩුවටත් සුදු හුණු ගානවා. මම හිතන විධියට ඔය විධියට සුදු හුණු ගාන්නට ගියොත් ලංකාවේම තිබෙන හුණුත් මදි වෙනවා. හැබැයි, අපේ පැත්තේ තිබෙන ඒවාගේ නම් ගාන්න එපා කියල මම කියනවා.

**ආර්. එම්. අප්පුහාමි මහතා**
*(திரு. ஆர். எம். அப்புஹாமி)*
(Mr. R. M. Appuhamy)

දියුණු වෙලා තිබෙනවා.

**ආර්. පී. විජේසිරි මහතා**
*(திரு. ஆர். பி. விஜேசிறி)*
(Mr. R. P. Wijesiri)

දියුණුව පෙනෙනවා, ඈතෙන්.

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
(Mr. Ananda Dassanayakt)

තමුන්නාන්සේ දියුණුයි.

**ආර්. එම්. අප්පුහාමි මහතා**
*(திரு. ஆர். எம். அப்புஹாமி)*
(Mr. R. M. Appuhamy)

අපි කවදත් දියුණුයි.

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
(Mr. Ananda Dassanayake)

තමුන්න්සෙට හොඳට කන්ට බොන්ට තියෙනව. සමූපකාරයත් දියුණුයි. හැම අතින්ම දියුණුයි. විශේෂයෙන් දලු මිලදී ගැනීමත් වැඩිනෙ? දැන් අඩු ගණනට දලු ගත හැකිනෙ?

මම ඇමතිතුමාට තව අදහසක් ඉදිරිපත් කරනවා. සමූපකාරවලින් වෙනත් ව්‍යාපාර පටන් ගන්න කල්පනා කරන්න. පිලිප් ගුණවර්ධන ඇමතිතුමා විවිධ සේවා සමූපකාර සමිති නමින් මෙම ව්‍යාපාරය පුළුල් කලේ ඒ සඳහායි. මේ සමූපකාර සමිති ආහාර ද්‍රව්‍ය බෙදා හැරීමේ

සීමා කරල බැහැ. මම එහෙම කියන්නෙ මේ නිසයි: අසුවල් ද්‍රව්‍ය විකිණිය යුත්තේ මේ මිළට යයි තමුන්නාන්සේගේ සමූපකාර දෙපාර්තමේන්තුව නියම කරනව. නිදර්ශනයක් වශයෙන් අපි හාල් ගැන බලමු. හාල් කොළඹදී නිකුත් කරනවිට අද තත්ත්වයේ හැටියට කිලෝවකට වැටෙන්නෙ රු. 6.01 ක පමණ මිළක්. ප්‍රවාහණ වියදම් "ට්‍රාන්ස්පෝට්" අද වැඩි වෙලා තියෙන නිසා දැන් දුරබැහැර ප්‍රදේශයකට හාල් ගෙන යන විට සේරුවක් ශත 5 කින් තරම වැඩි වෙනව. ඒ වුණත් දෙපාර්තමේන්තුව විකිණිය යුතු මිල නියම කරන්නෙ මේ වැඩිවී තිබෙන ප්‍රවාහණ වියදම් සැලකිල්ලට අරගෙන නොවෙයි. ඒ ගොල්ල නියම කරනව, ශත දෙකක—තුනක තරම ලාභයක් තියාගෙන රු. 6.04ට තරම විකුණන්න ඕනෑ කියල. ඒ මිනිස්සු කොළඹ ඇවිල්ල ද්‍රව්‍ය අරගෙන ගිහින් ශත දෙකක—තුනක සීමාවක් තියාගෙන විකුණන්න ඕනෑ. ඒ සීමාව ඇතුළෙ ලාභයක් ලබාගන්ටත් ඕනෑ. ඉතින් කොහොමද ලාභගන්නෙ? ගෝනි ටික විතරයි, ලාභයට ඉතිරි වෙන්නෙ. සමූපකාර සමිතියකට ජීවත් වෙන්න ඉතිරි වෙන්නෙ ගෝනි ටික විතරයි. ගෝනිත් නැත්නම් කිසිම ලාභයක් ගන්න පුළුන්කමක් නැහැ.

හාල් සේරුවක් අඩු වුණොත් ඒක ගහන්නෙ මැනේජර් මහත්මයගෙ වංචාවක් හැටියට; ද්‍රව්‍ය හිඟයක් හැටියට. එතන ඇවිල්ල හරියට ගණන් බලනව. රතුලුනු හොණ්ඩරයක් ගෙන ගියාම රාත්තල් 112 ක්ම කිරන්න ඕනෑ. ඒකට අපතය කියල ලැබෙන්නෙ ඉතාම සුළු බරක්. ඒ නිසා ඔවුන් කරන්නෙ මොකක්ද? දැන් ද්‍රව්‍ය අරන් යන්නෙම නැති තරම්. මම කියන කාරණය ඇත්ත බව මම දන්නවා.

පසුගිය කාලයේ ගරු ඇමතිතුමා සමූපකාර සමිතිවලට උදව්වක් කළා. සමූපකාර දෙපාර්තමේන්තුවට, පරිපූරක මුදලක් මාර්ගයෙන් යම් කිසි මුදලක් ලබා දුන්නා. සමූපකාර සමිතිවලට මුදල් ආධාර විශාල වශයෙන් ලබා දෙන්න. ඒ විධියේ යෝජනාවක් මේ සභාවට ගෙනාවිත් අනුමත කර ගත් බව මට මතකයි.

එහෙම කාලේ සමූපකාරවලට ඒ මුදල් යොදවා අවශ්‍ය ද්‍රව්‍ය අරගෙන ගිහින් ජන ... කාර බෙදා හරින්න පහසු වෙන්නයි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආනන්ද දසනායක මහතා]

රෙදිපිළි, පිඟන් බඩු, යකඩ බඩු, ගොවි උපකරණ, දුරු මිරිස් හා අනිකුත් ආහාර ද්‍රව්‍ය ගන්න සමුපකාර සමිතිවලට මුදල් මදි නිසයි, ඒ ආධාරය ලබා දුන්නෙ. ඒ මුණත් සමුපකාර කීයෙන් කීයද ඒක කළේ. සමහර සමුපකාර සමිති ඒ මුදල් බැංකුවල තැන්පත් කර තබා අන්තිමේදී ලාභ පෙන්වූ බව මම දන්නව; මට ආරංචි ලැබී තිබෙනව. දැන් බිස්නස් කරනවාට වඩා ලාභයි, බැංකුවක මුදල් තැන්පත් කිරීම. වැවිලි කර්මාන්තයේ යොදනවාට වැඩිය ලාබයි ඒක. සියයට 25 ත් 30 ත් අතර ලාභයක් ඒ මගින් ලබා ගන්න පුළුවනි. දැන් සමහරු කරන්නේ ව්‍යාපාර අත්හැරල බැංකුවල මුදල් තැන්පත් කිරීමයි. ඒ විධියට ලාභ පෙන්වූ සමුපකාරත් තියෙනව. පරීක්ෂණවලින් ඒක සොයා ගන්න පුළුවනි. ඇමතිතුමා මුදල් ආධාර දුන්නෙ පාරිභෝගිකයන්ට සෙතක් සල සන්න අදහස් කරගෙනයි. ඒ හ නරක යයි අපි කියන්නෙ නැහැ. අමාරු අවස්ථාවක, වෙළඳාම අඩු අවස්ථාවක, සමුපකාර පාඩුවට දුවන අවස්ථාවක ඒ දුන්න සහාය වැරදි විධියටයි ඇතැම් සමුපකාර පාවිච්චි කර තිබෙන්නෙ. සමුපකාර දෙපාර්තමේන්තුව මගින් පරීක්ෂණයක් පවත්වා ඒ ගැන සොයා බලන ලෙස ඇමතිතුමාගෙන් මම ඉල්ලා සිටිනවා.

**එස්. බී. හේරත් මහතා**
*(திரு. எஸ். பி. ஹேரத்)*
(Mr. S. B. Herath)

පරීක්ෂණයක් පවත්වනව. ඒ වගේම අපි සමුපකාර සමිතිවලට බලය දීල තියෙනව, ඕනෑ වැඩක් පටන් ගන්න. හැබැයි, හොඳ සමිතිවලට විතරයි. මේවා ජනතාවගේ සමුපකාර සමිති නිසා අපි ඒ අධ්‍යක්ෂ මණ්ඩලවලට බලය දී තිබෙනව, ඕනෑ වැඩක් පටන් ගන්න. එදා රු. 5,000 කට ඉහළ වැඩක් කරන්න ඒ අයට බලයක් තිබුණෙ නැහැ. දැන් අපි දී තිබෙනවා සමහර සමිතිවලට රු. 25,000 ක් තවත් සමහර සමිතිවලට රු. 50,000 ක් සහ සහ ලොකු සමිතිවලට රු. 2,50,000 ක් කොමසාරිස්තුමාගේ අවසරයක් නැතිව පාවිච්චි කරන්නට.

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
(Mr. Ananda Dassanayake)

හොඳයි බොහොම ස්තුතියි ඒ කළ විස්තරයට. මා කියන්නේ මෙයයි; සමුපකාර අමාත්‍යාංශය ගෙන යන වැඩ පිළිවෙළ අපි දන්නෙ නැහැ. ඒක විටින් විට වෙනස් වෙනව. එක එක අවදිවල එක එක ඇමතිවරු එන කොට කාමර වෙනස් කරනව. නිලධාරීන් වෙනස් කරනව. ඉතින් ඒ සැලසුම් මොනවද කියල අපි දන්නෙ නෑ.

**එස්. බී. හේරත් මහතා**
*(திரு. எஸ். பி. ஹேரத்)*
(Mr. S. B. Herath)

කාමර වෙනස් කරල නැහැ. ඒ කාමරේමයි.

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
(Mr. Ananda Dassanayake)

කාමරේ වෙනස් නොකළට කමක් නැහැ. ප්‍රතිපත්ති වෙනස් කරල තියෙනවද?

**එස්. බී. හේරත් මහතා**
*(திரு. எஸ். பி. ஹேரத்)*
(Mr. S. B. Herath)

ප්‍රතිපත්ති නම සම්පූර්ණයෙන්ම වෙනස් කරල තියෙනව.

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
(Mr. Ananda Dassanayake)

මට කියන්නට වුවමනා කරන්නේ මෙයයි: සමුපකාර සංගම් එහෙම විවිධ අංශවලට විවිධ ව්‍යාපාරවලට මුදල් යොදවන්නට කැමති නම් ඒ වෙනුවෙන් සමුපකාර දෙපාර්තමේන්තුවේ වෙනම අංශයක් පිහිටුවන්න ඒ සම්බන්ධව ක්‍රියා කරන්නට වෙනම අංශයක් පිහිටුවන්න. සමුපකාර සමිති අඩපණ වෙනවා නම් ඒ අඩපණ වීම නවත්වා ගන්නට වෙනත් විවිධ ව්‍යාපාරවලට බහින්නට—ඒ ඒ ප්‍රදේශවල සම්පත්වලින් ප්‍රයෝජන ගන්නට, ඒ ඒ ප්‍රදේශවල රජයේ වැඩ පොළවල්වල කොන්ත්‍රාත් ලබා ගන්නට, පාරවල් කැපීම ආදී කොන්ත්‍රාත් වැඩ කරන්නට කැමති නම්—ඒ සඳහා දෙපාර්තමේන්තුවේ විශේෂ අංශයක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පිහිටෙව්වොත් මොකක්ද වෙන්නෙ? ඒක හොඳයි. එහෙම අංශයක් පිහිටුවන ලෙසයි මා ඇමතිතුමාගෙන් හා නියෝජ්‍ය ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ.

**සරත්චන්ද්‍ර රාජකරුණා මහතා (ආහාර හා සමුපකාර නියෝජ්‍ය ඇමතිතුමා)**
*(திரு. சரச்சந்திர ராஜகருணா—உணவு, கூட்டுறவு பிரதி அமைச்சர்)*
(Mr. Saratchandra Rajakaruna—Deputy Minister of Food & Co-operatives)

ඒක කරන්නම්.

අ. භා. 3.15

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
(Mr. Ananda Dassanayake)

දෙවන කාරණය, සමුපකාර සේවක කොමිෂන් සභාව සම්බන්ධවයි. ඒ සම්බන්ධව අවුරුදු තුනක්ම මම කිව්වා. එක්කෝ මේ සමුපකාර සේවක කොමිෂන් සභාවට බලතල දෙන්න; නැත්නම් ඒක අහෝසි කරන්න. සමුපකාර සේවක කොමිෂන් සභාව අහියාචන සම්බන්ධව අවුරුදු තුනකට හතරකට ඉහතදී ගත් තීරණ ක්‍රියාත්මකනොවී තවමත් ඒහෙමම තිබෙන අවස්ථා තිබෙනවා. සමුපකාර සේවක කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ වරදක් නැහැ. අපි මෙතැනට ඇවිත් කියන දේවල් හැන්සාඩ් ගත වෙනවා පමණයි සමහර වෙලාවට මෙතැන සිටින මන්ත්‍රීවරු කීපදෙනා අත්පොළසන් දෙනව. සමහර වෙලාවට ඒක එක්කෙනා එහාට මෙහාට දොස් පවරා ගන්නවා. එපමණයි වෙන්නෙ. අපි මෙතැනට ඇවිත් පෙන්නුම් කරන වැරදි නිවැරදි කිරීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. හැන්සාඩ් වාර්තාව කියවා මේ පෙන්නුම් කරන අඩුපාඩු ගැන සොයා බැලීමේ ක්‍රමයක් කලින්නම් තිබුණා. දැන් තිබෙනවාදැයි මම දන්නෙ නැහැ. නැති බවයි අපට පෙනෙන්නේ.

මන්ත්‍රීවරයෙක් මෙතැනට ඇවිත් යමක් කියන්නේ පැමිණිලි දහස් ගණනක් ආවාට පසුවයි. එක පැමිණිල්ලක් ලැබුණු හැටියේම මෙතැනට ඇවිත් ඒ ගැන කියන්නේ නැහැ. මේවායේ වැරදි අහල අහල විසඳන්නට බැරි වෙන කොට තමයි මෙතැනට ඇවිත් කියන්නෙ. සමහර විට ප්‍රශ්නයකට මුහුණදුන් තැනැත්තා තව හිතවතෙකුත් එක්ක කාර්යාල ගානේ ගිහින් අමාත්‍යාංශ ගානේ ගිහින්, ලියුම් කියුම් පෙන්වමින්, නොයෙකුත් දේවල් කර, බැරිම තැන ඇවිත් අපට කියනවා. අපි මෙතැනට ඇවිත් නීතිය වෙනස් කරල හරි සාධාරණය ඉෂ්ට කරන්න කියනවා. ඊට වැඩිය කියන්නට දෙයක් නැහැ.

ගම්පොල ජී. ඩී. වලලියද්ද නම් කෙනෙකු ගැන මම දන්නව. 1976 දී ඔහු අයුතු විධියට අස් කළා. ඔහු උසාවියට ගියා. නඩු තීන්දුවකින් ඔහු නිදහස් වුණා. නමුත් ඔහුට තවමත් රක්ෂාව දීලා නැහැ. ඔහු නිර්දෝෂී බව පිළිගෙන ඒ බව දන්වා මෙහෙන්—සමුපකාර සේවක කොමිෂන් සභාවෙන්—නියමයක් කළා. නමුත් එහෙ සමිතියට තවම බැරි වුණා ඒ තැනැත්තාට වැඩ දෙන්න. මොකක්ද මේකෙ තේරුම? එහෙම නම් මේ ක්‍රමය වෙනස් විය යුතුයි. අනික් මන්ත්‍රීවරු ඉල්ලා සිටියාක් මෙන්ම මමත් ඉල්ලා සිටින්නේ කලින් වාගේ සමුපකාර සේවකයන්ට කම්කරු උසාවියට නැත්නම් කාර්මික ආරාවුල් විනිශ්චය කිරීමේ මණ්ඩලය ඉදිරිපිටට යන්නට අවස්ථාව සලස්වා දෙන ලෙසයි. ඒ අය මේ විධියට බැඳල තැබීමෙන් වැඩක් නැහැ. ඒ මිනිසුන්ගේ අසහනයත් ඒකයි. මේ සේවකයන් වැඩ නොකරන්නේ එසේ අසහනයට පත්වී සිටින කොටසක් නිසයි. තමන්ට යම් ඇබැද්දියක් වුණොත් ඒක විසඳා ගන්නට හරි ක්‍රමයක් නැහැ. වැරදි ක්‍රමයක් තියෙන්නෙ. ඒ සම්බන්ධයෙනුත් අවධානය යොමු කරන හැටියට ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඊළඟට කියන්න තිබෙන්නේ, සමුපකාර දෙපාර්තමේන්තුවේ සමහර පරීක්ෂණ කල් යෑම ගැනයි. ඒ සමුපකාර පරීක්ෂණ කල් යන්න හේතු රාශියක් තිබෙනවා. සමහර ඒවා හිතාමතාම කල් අරිනවා. තමන්ට හිතවත් නොවන අයගේ පරීක්ෂණ ඒ විධියට කල් අරිනවා. තමන්ට හිතමත් කෙනෙක් සම්බන්ධයෙන් නම් බොහොම ඉක්මනින් පරීක්ෂණ පවත්වා චූදිතයා නැවත සේවයේ පිහිටුවන්න කට යුතු කරනවා. මේ කාලයට පමණක් සීමා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආනන්ද දසනායක මහතා]

වුණු තත්ත්වයක් ගැන නොවෙයි, මම කථා කරන්නේ. කොයි කාලෙත් සිදු වන දේ තමයි, ඒ. චූදිතයනට යුක්තිය ඉෂ්ට වෙන්නේ නැහැ. හිතවත් අය ඉක්මනින් නැවත සේවයේ පිහිටුවීම සඳහා වගේම තරහකාරයන් ඉක්මනින් සේවයෙන් ඉවත් කරන්න ඕනෑ වුණාමත්, අර පරීක්ෂණ ඉක්මන් කරනවා. එම නිසා ඒ තත්වය ගැනත් ඇමතිතුමාගේ අවධානය යොමු කරන හැටියට ඉල්ලා සිටිනවා.

ඒ වගේම අවුරුදු ගණන් කල් යනවා, තීරක තීන්දු—'ආර්බිට්‍රේෂන්ස් ඇවෝඩ්' දෙන්නත්. එක්දාස් නමසිය හැට ගණන් වල ඒවා ගැන කටයුතු කරගෙන යන්නේ ඇනුයි. ඒ වගේම ඇතැම් සමූපකාර සමිති අහෝසි කිරීම සම්බන්ධ පරීක්ෂණ පැවැත්වෙන්නේත් අවුරුදු දහය—පහළොව ගත වුණාට පස්සෙයි. ඒ පරීක්ෂණ ආරම්භ කෙරෙන විට ඒ සමූපකාර සමිති වල කාරක සභාවල හිටපු සාමාජිකයන්, හිටපු සභාපතිවරුන් ජීවතුන් අතර ඇත්තේත් නැහැ.

**එස්. බී. හේරත් මහතා**
(திரு. எஸ். பி. ஹேரத்)
(Mr. S. B. Herath)

පසුගිය ආණ්ඩු කාලයේ කොයි තරම් වැරදි සිදු වී තිබෙනවාද කිවොත් ඒවා හොයා බලා තීරණ දීමත් ඒ තරම් ලෙහෙසි—පහසු කටයුත්තක් නොවෙයි. තීරක තීන්දු කල් යන්නේ ඒ නිසයි. ආරාවුල් තිබුණා, 5589 ක්. ඒවා සේරම ගැන හොයා බලා තීරක තීන්දු දෙන්න ඕනෑ. අපේ කාලයේ ඒවත් කියන්නම්.

**ආනන්ද දසනායක මහතා**
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

මේ කාලයේ ඒවායේ තීන්දු දෙන්න නම් අවුරුදු 10 ක් පන්නයි. ඉස්සර විගේ දෙතුන් ගුණයක් වැරදි සිදු වෙනවා, දැන්.

**එස්. බී. හේරත් මහතා**
(திரு. எஸ். பி. ஹேரத்)
(Mr. S. B. Herath)

තීරක තීන්දු දීම සඳහා පැමිණිලි 4147ක් විභාග කර තිබෙනවා.

**ආර්. පී. විජේසිරි මහතා**
(திரு. ஆர். பி. விஜேசிறி)
(Mr. R. P. Wijesiri)

නමුත් එකක්වත් අවසන් කර නැහැ.

**එස්. බී. හේරත් මහතා**
(திரு. எஸ். பி. ஹேரத்)
(Mr. S. B. Herath)

සමහරක් අවසන් කර, උසාවිය ඉදිරියේ නඩු පැවරීමටත් පොලීසිය කටයුතු කර තිබෙනවා. සමහර ඒවා සම්බන්ධයෙන් උසාවියෙන් තීන්දු ලබා ගෙන මුදලුත් ආපසු අය කරගෙන තිබෙනවා.

**ආර්. පී. විජේසිරි මහතා**
(திரு. ஆர். பி. விஜேசிறி)
(Mr. R. P. Wijesiri)

පොඩි පෙන්දන්ට මිසක් ලොක්කන්ට අත ගහල නැහැ.

**එස්. බී. හේරත් මහතා**
(திரு. எஸ். பி. ஹேரத்)
(Mr. S. B. Herath)

මම පිළිතුරු කථාව කරන කොට ලොක්කන් ගැනත් කියන්නම්. එවැනි ලොක්කන් 5 දෙනෙකුට විරුද්ධව දැන් නඩු දැමීමටත් පොලීසිය කටයුතු කර තිබෙනවා.

**ආර්. පී. විජේසිරි මහතා**
(திரு. ஆர். பி. விஜேசிறி)
(Mr. R. P. Wijesiri)

කටයුතු කර නැහැ. 'මංගලා' ප්‍රශ්නයට මොකද, වුණේ ?

**ආනන්ද දසනායක මහතා**
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

ඒක ටිකක් කල් තබා තිබෙනවා. තීරක තීන්දු සම්බන්ධයෙන් ඇමතිතුමා දුන් පිළිතුරෙන් මම සෑහීමකට පත් වන්නේ නැහැ.

**එස්. බී. හේරත් මහතා**
(திரு. எஸ். பி. ஹேரத்)
(Mr. S. B. Herath)

නමුන්නාන්සේ කවදාද, සෑහීමකට පත් වුණේ ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
(Mr. Ananda Dassanayake)

ඇමතිතුමා කිව්වා, පසුගිය කාලයේ පන්දාස් ගණනක් විභාග කරන්න තිබුණාය කියා. පසුගිය අවුරුදු 4 හමාර තුළ ඒවා විභාග කර ඉවරයක් කරන්න බැරි වුණේ ඇයි ?

**එස්. බී. හේරත් මහතා**
*(திரு. எஸ். பி. ஹேரத்)*
(Mr. S. B. Herath)

අවුරුදු 4 හමාරකින් නොවෙයි, අවුරුදු 10 කින් වත් බැරි වෙයි, ඉවර කරන්න.

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
(Mr. Ananda Dassanayake)

එහෙම නම් කල්පාන්තය වෙනකන් යයි. දැන් පවත්නා ක්‍රමය අනුව තීරක තීන්දු ගන්න ඒ විධියට ප්‍රමාදයක් තිබෙනවා නම් වෙනත් ක්‍රමයක් සකස් කරන්න වෙනවා.

**එස්. බී. හේරත් මහතා**
*(திரு. எஸ். பி. ஹேரத்)*
(Mr. S. B. Herath)

සමහරක් උසාවියට ඉදිරිපත් කර තිබෙනවා.

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
(Mr. Ananda Dassanayake)

ඇමතිතුමාට දෙන්න පුළුවන් උපරිම ගෞරවය දෙමිනුයි, මම කථා කරන්නේ. ඇමතිතුමාගේ උත්තරවන් මේ ප්‍රශ්නය විසදෙන්නේ නැහැ. දැනට තිබෙන ක්‍රමවලින් මේ ප්‍රශ්නය නිරාකරණය වෙන්නේ නැත්නම් ඇමතිතුමාට පුළුවන් වෙන්න ඕනෑ, ඒවා විසදෙන වෙනත් නීතිමය ක්‍රමයක් හොයා ගන්න. ඒ ක්‍රමය හොයා ගන්න කියලයි, මම කියන්නේ.

**එස්. බී. හේරත් මහතා**
*(திரு. எஸ். பி. ஹேரத்)*
(Mr. S. B. Herath)

මට ඒකට බලය ලබා දෙනව නම් බොහොම ලේසියි. Shoot at sight.

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
(Mr. Anura Bandaranaike)

මම හිතනවා තමුන්නාන්සේට පුරුදු කරන්න තිබෙන්නේ "ෂුට්" තමයි කියා.

**එස්. බී. හේරත් මහතා**
*(திரு. எஸ். பி. ஹேரத்)*
(Mr. S. B. Herath)

ගරු සභාපතිතුමනි, මේ තුන් හතර දෙනා බය වෙන්න ඕන නැහැ.

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
(Mr. Ananda Dassanayake)

මගේ කාලය නාස්ති වෙනවා. සභාපතිතුමාට මම උදව් කරන්න ඕන.

මම කියන්නේ මෙයයි. මේ තීරක තීන්දු සඳහා අවුරුදු දහය පහළොහ ගත වෙනවා නම් එයින් සමූපකාර ව්‍යාපාරයට ඇතිවන පාඩුව කොතෙක්ද කියා තමුන්නාන්සේට පෙනෙනව. එහෙම නම් මේ තීරක තීන්දු දීමේ ක්‍රමය වෙනස් කර වැඩ ඉක්මන් කරන්න වෙනත් ක්‍රමයක් ඇති කරන්න බැරිද ? ඒ සඳහා ක්‍රමයක් හදන්න බැරිද ? මම කියන්නේ මේකයි : අපට 'බැහැ' කියන එක නොවෙයි, කියන්න ඕනෑ. ඔය ක්‍රමයම නොවෙයි හැමදාම තිබෙන්න ඕනෑ. තිබෙන නීති මදි නම්, එහෙම නැත්නම් ඒවා හයට ක්‍රියාත්මක කරන්න බැරි නම්, අපි බලන්න ඕනෑ වෙනත් ක්‍රමයක් හෝ වෙනත් පියවරක් හෝ ගන්නට. ඒකයි මගේ ඉල්ලීම.

**එස්. බී. හේරත් මහතා**
*(திரு. எஸ். பி. ஹேரத்)*
(Mr. S. B. Herath)

අවශ්‍ය නීති රීති සැබිනට් එකට තබා මේ ගරු සභාවට ගෙනෙන්න දැන් බොහොම කිට්ටුයි.

**ආර්. පී. විජේසිරි මහතා**
*(திரு. ஆர். பீ. விஜேசிறி)*
(Mr. R. P. Wijesiri)

මැතිවරණයෙන් පසුව වෙන්න ඇති.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**එස්. බී. හේරත් මහතා**
*(திரு. எஸ். பி. ஹேரத்)*
**(Mr. S. B. Herath)**

මැතිවරණය හෙට අනිද්දා තබන්න අපේ බලාපොරොත්තුවක් නැහැ.

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
**(Mr. Ananda Dassanayake)**

ගරු සභාපතිතුමනි, තවත් ප්‍රශ්න එකක් හෝ දෙකක් තිබෙනවා ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව ගැන. ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ රිය අංශයෙන් එවා තිබෙන ලිපියක් මම දැන් ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වෙනවා.

"1981.11.17 වැනි දින,
ආහාර දෙපාර්තමේන්තුවේ දී ය.

ආහාර කොමසාරිස්තුමා,
යූනියන් පෙදෙස,
කොළඹ 2.

1980 ජූලි 17 වැනි දින වැඩ වර්ජනයට සහභාගි වී ඇති සේවක සංඛ්‍යාව අනුව රියැදුරු 04 හා රිය සහකරු 22 ක් දැනට රැකියා අහිමි වී තිබේ. ඒ අනුව ආහාර අමාත්‍යාංශයේ දැනට පුරප්පාඩු නොමැති බව දන්වන අතර, මෙහි නම් සඳහන් රියැදුරු-රියසහකරුවන් නැවත සේවයේ පිහිටුවීම ගැන ගරු ඇමතිතුමාගේ කාරුණික අවධානය යොමු කොට, එය ඉෂ්ඨ කර දෙන මෙන් කාරුණිකව අයැද සිටිමි.

තවද, වැඩ වර්ජනය කළ සේවක සංඛ්‍යාවේ පිටපතක් මෙහි අමුණා ඇත. දැනට ආහාර කොමසාරිස් සතුව ඇති වාහන අංක ද මෙහි අමුණා ඇත.

රියැදුරු මුළු සේවක සංඛ්‍යාව—236

දැනට සේවය කරන රියැදුරු සංඛ්‍යාව—120

දැනට ආ. කො. යටතේ ඇති රියැදුරු ඇබෑර්තු සංඛ්‍යාව—116

රියසහකරු මුළු සංඛ්‍යාව—223

දැනට සේවය කරන රියසහකරු සංඛ්‍යාව—114

දැනට ආ. කො. යටතේ ඇති රියසහකරු ඇබෑර්තු සංඛ්‍යාව—109

දැනට ආ. කො. යටතේ ඇති වාහන සංඛ්‍යාව—117

දැනට ගරාජයේ ආපදා වී ඇති වාහන සංඛ්‍යාව—14

දැනට වෙන්දේසියට තබා ඇති ආපදා වාහන ගණන—08"

මේ මගින් පැහැදිලි විස්තරයක් කරනවා, ඇබෑර්තු නැහැ කියන එක ගැන. පුරප්පාඩු තිබෙනවා කියන එකයි මේ පෙන්වන්නේ. වාහන නවත්වලා තිබෙනවා. ආහාර දෙපාර්තමේන්තුව වාහන අරගෙන තිබෙනවා නම් අරගෙන තිබෙන්නේ එදාට හෝ එසේ නැත්නම් අදට වැඩට අවශ්‍ය වාහනයි. එතකොට වාහන තිබෙනවා. අර රියැදුරු 4 ටයි රිය සහකරු 22 ටයි රක්ෂාව දෙන්නේ නැහැ කියන එකට ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව කියන්නේ ඇබෑර්තු නැහැ කියන එකයි. නමුත් ඇබෑර්තු තිබෙනවා.

මෙන්න මේ අයගේ නම් ටික තමුන්නාන්සේට ඉදිරිපත් කරන්න මම කැමතියි.

"රියැදුරු සේවය

(1) පී. ජී. ඥානසේන
(2) ඩබ්ලිව්. ඒ. ආරියසේන
(3) ජී. ඩී. ඇල්බට්

රියසහකරු සේවය

(1) ඒ. එන්. එන්. පෙරේරා
(2) කේ. එම්. පී. අමරසේන
(3) එම්. ඩී. නන්දසේන
(4) ඒ. ඒ. ප්‍රේමරත්න
(5) එච්. ඒ. රූපවංශ
(6) ඊ. බී. විමලසිරි
(7) ජී. එච්. ෆොන්සේකා
(8) කේ. ඩී. අමරපාල
(9) ජී. ජී. පියසෝම
(10) එම්. සිරිදාස
(11) කේ. කේ. රණසිංහ
(12) ඒ. පී. පීටර් පෙරේරා
(13) ඩබ්. එස්. විජේසිරි
(14) පී. ගාමිණී
(15) එල්. ඩී. කරුණාරත්න
(16) ආර්. කේ. ප්‍රේමසිරි
(17) අයි. එල්. බදුර්දීන්
(18) පී. ඩයමන් ප්‍රනාන්දු
(19) එම්. එස්. ඒ. මැන්ඩිස්
(20) එම්. ගුණදාස පෙරේරා
(21) ඒ. පී. ඥාණසේන
(22) ආර්. ජිනෝරිස් ප්‍රනාන්දු".

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**එස්. බී. හේරත් මහතා**
(திரு. எஸ். பி. ஹேரத்)
(Mr. S. B. Herath)
මන්ත්‍රීතුමා, ඔය මහත්වරු ගැන මම තමුන්නාන්සේට වැඩිය කණගාටු වෙනවා. ඔය මුහුණ පාන්න වෙලා තිබෙන සිද්ධිය මේකයි, සභාපතිතුමනි. අපේ රටේ ආහාර නිපදවීම වැඩි වූ නිසා මේ තරම් ලොරි ප්‍රමාණයක් අපට අවශ්‍ය නැහැ. එදා ලොරි දෙසියයක්, තුන් සියයක් ආහාර දෙපාර්තමේන්තුවෙ තිබුණා. අද ලොරි අවශ්‍ය නැහැ. ඒ තරම්. ඒ නිසා—

**ආර්. පී විජේසිරි මහතා**
(ஆர். பி. விஜேசிறி)
(Mr. R. P. Wijesiri)
ආහාර දෙපාර්තමේන්තුවේ ලොරි සේව යේම මුවම්නා නැහැ. මුර වැඩක් දුන් නත් කමක් නැහැ, ගබඩාවක.

**එස්. බී. හේරත් මහතා**
(திரு. எஸ். பி. ஹேரத்)
(Mr. S. B. Herath)
ඒ නිසා ලොරි වලට රියදුරන්, සහායක යන් ගන්න ලැබෙන්නෙ නැහැ. එදා 1977 දී තමුන්නාන්සේලාගෙන් අපි මේ රට භාර ගන්න කොට විදේශ රටවලින් අවුරුද්දකට හාල් ටොන් පන් ලක්ෂ තිස් දාහක්, හය ලක්ෂයක් පමණ ගෙන් වන්නට සිද්ධ වුණා. නමුත් අද කොහොමද? මේ අවුරුද්දේ 80,000 යි. එන අවු රුද්දේ ගෙන්වන්නට අපි බලාපො රොත්තු වන්නේ නැහැ.

**ආර්. පී විජේසිරි මහතා**
(ஆர். பி. விஜேசிறி)
(Mr. R. P. Wijesiri)
ඒ තරම් කෘෂි කර්මය දියුණු වෙලා තිබෙනවා ?

**ආනන්ද දසනායක මහතා**
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)
ඇමතිතුමා දියුණු කර තිබෙනවා ?

**ආර්. පී විජේසිරි මහතා**
(திரு. ஆர். பீ. விஜேசிறி)
(Mr. R. P. Wijesiri)
ඒක නෝ උප සභාපති කමක් හම්බ වුණේ ?

**ආනන්ද දසනායක මහතා**
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)
ඒකද අපට කියන්නේ ඇමතිතුමා ? අපිට ඕනෑකම තිබෙන්නේ මේ අයට රැකියාව දෙන්න. තමුන්නාන්සේ කැම තිද, අකැමතිද කියන එක දැන් ගන්නයි. අපි කියන්නේ දෙන්න කියලයි.

**එස්. බී. හේරත් මහතා**
(திரு. எஸ். பி. ஹேரத்)
(Mr. S. B. Herath)
දෙන්න පුළුවන් නම් අපිත් දෙනවා. තමුන්නාන්සේලා කල්පනා කරන්න, දෙන්න පුළුවන් වෙන ක්‍රමයක්.

**ආනන්ද දසනායක මහතා**
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)
අපටද කියන්නෙ ?

**එස්. බී. හේරත් මහතා**
(திரு. எஸ். பி .ஹேரத்)
(Mr. S. B. Herath)
ඔව්, මට කිව්වොත් හොඳයි. තමුන් නාන්සේගේ සමූපකාර සමිතිවලට ගන්න පුළුවන් නාම කියන්න.

අ. භා. 3.30

**ආනන්ද දසනායක මහතා**
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)
මට තවත් කරුණක් ඉදිරිපත් කරන් නට තිබෙනවා. මේ, වයි. ඒ. ධර්මදාස, 'සැනසුම' ඇටම්පිටිය ගැන. මේ සමූපකාර පරීක්ෂකවරයෙක්, සමූපකාර දෙපාර්ත මේන්තුවේ. වර්යා සටහන් දමා කිරීම නිසා මොහුට විශ්‍රාම වැටුප ලැබී නැහැ. තමන් සේවය කළ සටහන් එවීමේ ප්‍රමා දය නිසා ඔහුට විශ්‍රාම වැටුප ගන්න බැරිව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආනන්ද දසනායක මහතා]

කාලයක් ගත වී තිබෙනවා. මේ තැනැත්තා 'අප්සෙට්' ගිහිල්ලා; ඔහුට පෙන්ෂන් එක ගන්න බැහැ. අපි අනුකම්පා කරන්න ඕනෑ මේ වගේ ප්‍රශ්න ඉක්මණින් විසඳා දෙන්න. පෙන්ෂන් කියන්නේ එයාගේ ජීවිතේ අවසාන කාලයේ ලබන වැටුප, යහතින් ජීවත් වෙන්න. ඒ නිසා මම ඉල්ලා සිටිනවා, ගරු ඇමති තුමාගෙන් මේ ප්‍රශ්නය ගැන බලන්න කියා.

එස්. බී. හේරත් මහතා
(திரு. எஸ். பி. ஹேரத்)
(Mr. S. B. Herath)
ඒක ගැන මම බලන්නම්.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)
ඒකේ දිනය : 11. 2. 54. ඒවාගේම බී. 101/ඒ කියා අංකයක් තිබෙනවා. මයි නම්බර් : ඊපී/5294—

එස්. බී. හේරත් මහතා
(திரு. எஸ். பி. ஹேரத்)
(Mr. S. B. Herath)
එයාගේ නම කිව්වා නම්?

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)
වයි. ඒ. ධර්මදාස.

එස්. බී. හේරත් මහතා
(திரு. எஸ். பி. ஹேரத்)
(Mr. S. B. Herath)
එයා ඇවිල්ලා මට කිව්වා නම් කරලා දෙනවානේ.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)
මා හිතනවා ඔය අමාත්‍යාංශවලට කිට්ටු වෙන්න බැරි අවස්ථා තිබෙනවා.

එස්. බී. හේරත් මහතා
(திரு. எஸ். பி. ஹேரத்)
(Mr. S. B. Herath)
හැමදාම පුළුවන්.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)
දොර වහලා නේ තියෙන්නේ.

එස්. බී. හේරත් මහතා
(திரு. எஸ். பி. ஹேரத்)
(Mr. S. B. Herath)
හැමදාම ඇරලා.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)
මම අවසාන කරන්නයි, බලාපොරොත්තු වෙන්නේ. ආහාර, සිනි ආදී දේවල් ගැන මිල ගණන් මා අරගෙන තිබෙනවා. නමුත් ඒවා ටේබල් කරන්න වත් මට අවශ්‍ය නැහැ, තව ඉස්සරහට අපට තිබෙනවා ඒතුමන්ලාගේ සේවය ගැන කථා කරන්න. මේ හැම දෙයක්ම මා ළඟ තිබෙනවා. මා කියන්න කැමතියි, අද සීනි මිල ගැන. අපට දෙන්න කියන මිලට වඩා රු. 3 ක් 4 ක් වැඩි මිලටයි, පුද්ගලික වෙළෙන්දන් විකුණන්නේ. මේ දෙකේ තරඟයක් තිබෙන නිසා හැම තැනම මේ තත්ත්වය තිබෙනවා. ගෘහිණියන් නැත්නම් අපේ වනිතා පක්ෂය බඩු ගන්න යනවා. ඒ අය අපට ඇවිල්ලා කියන්නේ, " ආණ්ඩුව නියම කරනවා, මේ මිලට; නමුත් කඩ පොළට ගියාම ඒ මිලට බඩු ගන්න නැහැ " කියායි.

ඇමතිතුමා කිව්වා රු. 6.01 ට ගන්න පුළුවන් කියා, හාල්. මේතැන ඉන්නවාද මම දන්නේ නැහැ, කඩේකට යන අය. නමුත් ඒකට යන අයයි—

එස්. බී. හේරත් මහතා
(திரு. எஸ். பி. ஹேரத்)
(Mr. S. B. Herath)
රු. 6.15 යි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
(Mr. Ananda Dassanayake)
නමුත් 6.15 ට ගන්න නැහැ.

**සරත්චන්ද්‍ර රාජකරුණා මහතා**
*(திரு. சரத்சந்திர ராஜகருணா)*
(Mr. Sarathchandra Rajakaruna)
නමුන්නාන්සේ එවන්න ලොරි.

**එස්. බී. හේරත් මහතා**
*(திரு. எஸ். பி. ஹேரத்)*
(Mr. S. B. Herath)
නමුන්නාන්සේ ලොරියක් එවන්න.

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
(Mr. Ananda Dassanayake)
බැහැ. එහෙනම් මිට මගේ ඉඩමින් විකුණන්න වෙනවා, හාල් ටික අරගෙන යන්න.

ඔය ක්‍රමය කරන්නට ගියොත් රු. 6.15 ට එකම තැනකින්වත් ගන්න ලැබෙන්නෙ නැහැ. සමුපකාර සමිතිවලින් වුණත් විකුණණකොට ලාභ හැටියට සුළුවෙන් ගණනක් හෝ තබා ගෙන විකුණන්න ඕනෑ. නැතුව ඒවා පවත්වා ගෙන යන්න බැහැ; නියම කරන ගණන්වලට විකුණන්න බැහැ. මාර්කට් එකට ගිහින් බැලුවොත් පෙනේවි රු. 7 කට අඩුවෙන් හාල් කිලෝවක් ගන්න බැරි බව. ආහාර අමාත්‍යාංශයේ වගකීම ජනතාවට අවශ්‍ය ආහාර, සාධාරණ මිලකට කලට වේලාවට ලබා දීමයි. එම නිසා ඒක කරන්නටය කියා ඇමතිතුමාගෙන් මම ඉල්ලා සිටිනවා.

**ආර්. එම්. අබේකෝන් මහතා (මොණරාගල දිසා ඇමතිතුමා)**
*(திரு. ஆர். எம். அபேகோன்—மொனராகல மாவட்ட அமைச்சர்)*
(Mr. R. M. Abeykoon—District Minister, Monaragala)
ගරු සභාපතිතුමනි, වැදගත් අමාත්‍යාංශයක වැය ශීර්ෂය යටතේ සාකච්ඡා කරන මේ අවස්ථාවේදී මටත් සහභාගි වීමට අවකාශ සලසා දීම ගැන ප්‍රථමයෙන්ම මම නමුන්නාන්සේට ස්තුති වන්න වෙනවා. මේ රටේ විශේෂයෙන් දුප්පත් ජනතාව එකමුතු කර, දුප්පත් ජනතාවට අවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය ලබා දීමේ එක්තරා ක්‍රියා මාර්ගයක් වශයෙන් මට මතක හැටියට 1943 දී අපේ ජාතියේ පීතෘ ඩී. එස්. සේනානායක ශ්‍රීමතුන් විසින් සකස් කරන ලද, සමුපකාර වෙළඳ ප්‍රතිපත්තිය තුළින් ගොඩ නැංවුණු සමුපකාර ව්‍යාපාරය පිළිබඳවයි, අද දින අප සාකච්ඡා කරන්නෙ.

මෙයට පෙර තිබුණේ සමුපකාර ණය දෙන සමිතියි. 1943 ලෝක යුද්ධය නිසා ආහාර ද්‍රව්‍ය ආදී නොයෙකුත් දේවල් රට පුරා බෙදා හැරීමේ පහසු ක්‍රමයක් වශයෙන් සමුපකාර වෙළඳ සැල් ඇති කළා. සමුපකාර වෙළඳ සැල් ඇති කර, ගම් නියම්ගම්වල සාමාජිකයන් එකමුතු කර, ඒ සාමාජිකයන් ගෙන් සැදුම් ලත් සමිති ආරම්භ කර, ඒ සමිතිවලින් කාරක සභා සකස් කර, ඒ කාරක සභා මගින් පාලනය වුණු සමුපකාර ශාඛා සමිති තිබුණා. ඒ ශාඛා සමිතිවලට බඩු සැපයීම පිණිස අපි දන්නා හැටියට සතොස වැනි ආයතන බිහි වුණා. මේ අන්දමට සතොස ආයතනය බිහි කර, සමුපකාර සංගම් ඇති කර, ඒ ඒ ප්‍රදේශවලට අවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම ආදී කටයුතු පහසු වෙන් කර ගෙන යාමට මාර්ග සලසා ගෙන තිබුණා. නමුත් මම හිතන හැටියට පසුගිය රජය පත් වුණාට පසුව, ඒ ආණ්ඩු බලයට පත් වුණු හැම අවස්ථාවකදීම වාගේ, සමුපකාර සමිති එදා තිබුණු ප්‍රතිපත්තිවලින් බැහැරව වෙනත් ප්‍රතිපත්ති මත කටයුතු කරන්නට සැලැස්සුවා. ඒ කියන්නෙ එදා ගම්වල තිබුණු සමුපකාර සමිති සමුපකාර ප්‍රාදේශික බවට පත් කළා. අපේ සමුපකාර සංගම් සමුපකාර සමිති බවට පත් කළා. ඒ අන්දමේ නොයෙක් වෙනස්කම් රාශියක්ම ඇති කර අද නිකම් පඹගාලෙ පැටළුණු සතෙකුගෙ තත්ත්වයට මෙම ආයතන පත් කර තිබෙනවා.

**මන්ත්‍රීවරයෙක්**
*(அங்கத்தவர் ஒருவர்)*
(A Member)
ඇයි හාලිඇල ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ආර්. එම්. අබේකෝන් මහතා**
*(திரு. ஆர். எம். அபேகோன்)*
(Mr. R. M. Abeykoon)
හාලි ඇලත් එහෙමයි. හාලිඇල ඇති සමිති බොහොම දුර්වල අවස්ථාවකයි, තිබුණේ. තවමත් පසුගිය රජය කාලයේදී බැංකුවලින් ගත් ණය ආපසු ගෙවා ගන්නට පවා නොහැකි වී තිබෙනව. ඒ මිනිසුන් සෑහෙන මහන්සියක් දරනව, සෑහෙන කරදරකාරී තත්ත්වයකට ඒ අය වැටී තිබෙනව. ඒ ණය ගෙවා ගන්නට නොහැකිව. කෙසේ වුණත් මේ කාල සීමාව තුළ එම සමුපකාර සමිති බොහොම දක්ෂ අන්දමින් ක්‍රියා කරගෙන යන බව මතක් කරන්න ඕනෑ.

**මන්ත්‍රිවරයෙක්**
*(அங்கத்தவர் ஒருவர்)*
(A Member)
කවුද සභාපති?

**ආර්. එම්. අබේකෝන් මහතා**
*(திரு. ஆர். எம். அபேகோன்)*
(Mr. R. M. Abeykoon)
ඒක පස්සෙ කියන්නම්. කෙසේ වුණත් මට පෙර කතා කළ පඹුවස්නුවර මන්ත්‍රීතුමා කිව්ව වාගේ සංවර්ධන අරමුදල සඳහා සියයට 10 ක්, ඒවාගේම ආදායම් බදු සඳහා සියයට 20 ක් ගෙවීමට සිදු වී තිබෙනවා නම්, එය මහත් දුෂ්කර කාර්යයක් බව, එතුමාගෙ අදහස අනුමත කරමින් මම කියා සිටිනව.

ගරු සභාපතිතුමනි, සමිතිවලට අධ්‍යක්ෂ මණ්ඩල පත් කිරීමේදී දේශපාලන පක්ෂ භේදයෙන් තොරව කටයුතු කරනවා නම්, සමුපකාර ව්‍යාපාරය දේශපාලන පක්ෂ භේදයෙන් තොරව පවත්වා ගෙන යෑමට කටයුතු සලස්වනවා නම් එය සමුපකාරයෙ ප්‍රගතියට මහත් රුකුලක් වන බව මේ අවස්ථාවේදි මතක් කරන්න ඕනෑ. මොකද, සමුපකාරය සකස් වී තිබෙන්නෙ ගම්බද හැම දේශපාලන පක්ෂයක්ම සම්බන්ධවීමෙන් නිසයි.

1956 න් පසු සමුපකාර සමිතිවල නොයෙක් විධියේ විප්ලව, වෙනස්වීම් ඇති වන්නට හේතු වුණේ එදා සමුපකාර සමිති සකස් වී තිබුණු තත්ත්වය අනුව එක්සත් ජාතික පක්ෂයට මහා බලයක් තිබුණු නිසයි. ඒ නිසාදෝ නොයෙක් විධියේ විපරීත කරන්නට පටන් ගත්ත. ඒකයි, ඇත්ත.

අද ගමේ තිබෙන ප්‍රාදේශිකය ඒ ගමේ ගැමියන්ගේ පාලනයට සම්බන්ධ වී නැහැ. ඒක පාලනය කරන්නේ සමිතිය විසින්. ප්‍රදේශයේ සමිතියක් විසින්. අධ්‍යක්ෂ මණ්ඩලය විසින්. ප්‍රදේශයේ අධ්‍යක්ෂ මණ්ඩලය සමහරවිට ඒ සමිති ගැන සොයන්නෙ නැහැ, බලන්නෙ නැහැ. සොයන්න, බලන්න ඒ මිනිසුන්ට කාලය කුත් නැහැ. ඒ විධියට මේ සමිති පාලනය කරගෙන යාම මහත් දුෂ්කර වී තිබෙනව. ඒ නිසා මම නැවත වරක් ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනව, පැරණි විධියට ගම් තුළ වෙනම සමිති ඇති කරල ස්වාධීන සමිති වැඩ පිළිවෙලක් ආරම්භ කරන්න කියා.

අපි සමුපකාර බැංකුවකුත් පිහිටුවාගෙන තිබුණා. බදුල්ලේ බැංකුවක් තිබ්බ. සමුපකාර බැංකු තවත් නොයෙක් තැන්වල තිබ්බ. පසුව ඒවා මහජන බැංකු බවට පරිවර්තනය කළා. දැන් මොකක්ද වෙලා තිබෙන්නෙ? සමුපකාර සමිතිවලට ඒ බැංකුවෙන් ලැබෙන සහයෝගය හුඟක් දුරට අඩුයි. බැංකු නවීන වෙළඳ ප්‍රතිපත්ති මත සකස් වී තිබෙන නිසා සමුපකාර සමිතිවලට ණය පහසුකම් ලබා ගැනීමේදී මහත් දුෂ්කරතාවයන්ට මුහුණපාන්න සිද්ධ වෙනව. ඒ නිසා නැවත වරක් මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනව, සමුපකාර බැංකු නැවත ආරම්භ කරන්න පියවර ගන්න කියා.

මහජන බැංකුව අද බොහෝ දුරට දියුණු වී තිබෙන්නෙ සමුපකාර සමිතිවල ගනුදෙනු නිසාම බව විශේෂයෙන්ම මතක් කරන්ට ඕනෑ. ඒ වුණත් සමුපකාරවලට ණය පහසුකම් සලසනව අඩුයි. ඒ ප්‍රතිපත්ති තුළින් ඒ පහසුකම් සැලසීම මහජන බැංකුවටත් අමාරුයි. ඒකත් අපි දන්නව. අපේ සමුපකාර බැංකුව නැවත ආරම්භ කළොත් අපට හැකියාව ලැබෙනවා, හැම සමිතියකටම දියුණුවට ණය පහසුකම් සලසා දෙන්න.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඊළඟට විශේෂයෙන් මතක් කළ යුතු කාරණයක් තිබෙනව. ඒ ආහාර දෙපාර්තමේන්තුවෙ ක්‍රියා කලාපයයි. මෙරට හාල් බෙදා හැරීමේදී සමුපකාර දෙපාර්තමේන්තුව එක ප්‍රතිපත්තියකුත්, ආහාර දෙපාර්තමේන්තුව වෙන ප්‍රතිපත්තියකුත්, වී අලෙවි මණ්ඩලය තව ප්‍රතිපත්තියකුත් අනුගමනය කරනව. මෙතැන ලොකු සංවිධානයක් තියෙනව වගෙයි පෙනෙන්නෙ. වී අලෙවි මණ්ඩලය එකතු කරන වී කොටා හාල් බෙදා හැරීමේදී, ආහාර දෙපාර්තමේන්තුවත්, සමුපකාර දෙපාර්තමේන්තුවත් වී අලෙවි මණ්ඩලයත් අතර යම්කිසි සම්බන්ධීකරණයක් ඇති කර ගන්නව නම් වඩා හොඳ බව, වඩා උචිත බව මම මතක් කරන්ට කැමතියි.

1943 දී අපට මතකයි අපි බජිරි කියන වර්ගයක් කෑව; කම්බු කියන වර්ගයක් කෑව. අද සමහරුන්ට මේ රටේ කැකුළු හාල් කන්ට බැරිලු! ගෙන්වන්න ඕනෑලු, පිටරටින් තම්බලු හාල්! මෙහෙම තත්ත්වයක් අපට ආරංචි වී තිබෙනව. අපේ පේදුරුතුඩුවේ මන්ත්‍රීතුමා (තුරෙයිරත්නම් මහතා) කිව්ව. කැකුළු හාල් යාපනයට එවන්න කියල. අපේ අයට කන්ට බැරිලු! පුදුමයි! ආහාර නැති කාලයේ බජිරි කන්ට පුළුවන් අයට අපේ රටේ තිබෙන හොඳ කැකුළු හාල් කන්ට බැරි මොකද කියන එක ප්‍රශ්නයක්. මේ ආයතන අතර මොකක් හරි සම්බන්ධීකරණයක් නොමැතිකම මීට හේතුව වෙන්න ඇති කියලයි, මම කල්පනා කරන්නෙ. අපි මහවැලි ව්‍යාපාරය ක්‍රියාත්මක කර ගෙන යනව. වැව් ප්‍රතිසංස්කරණය කරල කුඹුරු අස්වද්දනව. මේ ආකාරයට නොයෙක් අයුරින් කෘෂිකාර්මික දියුණුවක් ඇති කරගෙන යනව. මේ වැඩ පිළිවෙළ යටතේ මේ රටේ උපදින මේ රටේ ඇති වන ඒ වී, හාල් බවට පරිවර්තනය කර දෙන කැකුළු හාල් කන්ට බැරි යයි යමෙක් කියනව නම් ඒක ලොකු පුදුමයක්. එහෙනම් අපේ ඒ පිරිසට බඩ ඉරිඟු කන්ට සලස්වන්න ඕනෑ. ඒකයි, මට මතක් කරන්න තිබෙන්නේ. ආහාර දෙපාර්තමේන්තුවේ මේ වැඩ පිළිවෙළ මීට වඩා ජනතාවගේත් රටේත් ජාතියේත් යහපත සඳහා සකස් වෙනොත් හොඳ බව සඳහන් කරන්න ඕන [illegible]

දේ පිටරටින් හාල් ගෙන්වන්නේ නැති බව ගරු ඇමතිතුමා කිව්වා. අපි ඒ ගැන බොහෝම සන්තෝෂ වෙනවා. නමුත් යම් යම් අය පිටරටින් හාල් ගෙන්නීමට ඕනෑකමක් දක්වන බව අපට පෙනෙනවා. ඒකට මොකක් හෝ හේතුවක් ඇති.

වතුවල ආහාර ද්‍රව්‍ය බෙදා හැරීම ඉතාම අමාරු වී තිබෙන බව කොත්මලේ ගරු මන්ත්‍රීතුමා (ආනන්ද දසනායක මහතා) කිව්වා. නමුත් ආහාර දෙපාර්තමේන්තුව මේ ගැන කල්පනා කරතොත්, හාල් හා වෙනත් ආහාර ද්‍රව්‍ය සමුපකාර සමිති මාර්ගයෙන් ඉතාම ලේසි පහසුවෙන් බෙදා හරින්නට පුළුවනි. ඒ වාගේම, අප රටේ නිෂ්පාදනය කරන කැකුළු හාල් අඩු මිලට බෙදීමට කටයුතු කරතොත් ඒක ඉතාම පලදායි වැඩක් වෙනවා. විශේෂයෙන්ම, වතුවලින් ගහන ශාලිඇල වැනි කොට්ඨාශවල සමිතිවලට පුළුවනි, ඒ වතුවලට වුවමනා කරන ආහාර ද්‍රව්‍ය සෑම දෙයක්ම සපයන්න. ඒ නිසා මේ කටයුත්තේදී මහත් සැලකිල්ලෙන් ක්‍රියා කරන ලෙස මම ආහාර දෙපාර්තමේන්තුවෙනුත්, සමුපකාර දෙපාර්තමේන්තුවෙනුත් ඉල්ලීමක් කරනවා. අප රටේ නිෂ්පාදනය කරන හාල් අප රටේම අලෙවි කර ගැනීම එතරම් අමාරු වෙන්නේ නැහැ.

ගරු සභාපතිතුමා දැන් මගේ කතාව නතර කරන ලෙස නියම කරනවා. ගරු ඇමතිතුමාට මේ කටයුතු සර්වප්‍රකාරයෙන් සාර්ථක ලෙස කරගෙන යෑමට පුළුවන් වේවායි මම ප්‍රාර්ථනා කරනවා. අපේ දිවංගත ඩී. එස්. සේනානායක මැතිතුමා ආරම්භ කළ සමුපකාර වැඩ පිළිවෙළ නැවත සකස් කරන්නටත් ඒ අනුව ගම්වල ස්වාධීන සමිති හදා එව්‍යාගේ පාලනය ඒවාටම බාර දීමටත් ඉඩකඩ සලසන ලෙස මම ඉල්ලා සිටිනවා.

සමුපකාර ව්‍යාපාරය මීට වඩා පුළුල් අන්දමින් දියුණු වේවායි ප්‍රාර්ථනා කරන [illegible], මේසා විශාල කාර්යයක් බොහෝම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. එම්. අබේකෝන් මහතා]

ලේසි පහසුවෙන් කරගෙන යෑමට යත්න දැරීම ගැන ගරු ඇමතිතුමාටත් නියෝජ්‍ය ඇමතිතුමාටත් නිලධාරී මණ්ඩලයටත් ස්තුතිවන්ත වෙමින් මම නිශ්ශබ්ද වෙනවා.

අ. භා. 3.45

**ඒ. එම්. ආලාලසුන්දරම් මහතා (කෝපායි)**

(திரு. ஏ. எம். ஆலாலசுந்தரம்—கோப்பாய்)

(Mr. A. M. Alaalasundaram—Kapay)

மாண்புமிகு தலைவர் அவர்களே, கூட்டுறவு இயக்கத்தின் எதிர்காலம் இந்த அரசாங்கம் ஆட்சிக்கு வந்தபின் நன்றாயிருக்கும் என்று எதிர்பார்க்கப்பட்டது. கடந்த அரசாங்கம் கூட்டுறவு இயக்கத்தை முற்றுமுழுதாக மக்களிடமிருந்து பிரித்து அரசின் முகவர் நிலையங்களாக மாற்றி இருந்தது. அதை மீண்டும் மக்கள் இயக்கமாக மாற்ற கௌரவ அமைச்சர் முயற்சிகளை மேற் கொண்டார், செயல்பட்டார். நூற்றுக்கு நூறு விதம் எல்லாக் கூட்டுறவுச் சங்கங்களும் மக்கள் இயக்கமாக மாறாது விட்டாலும் 75 விதத்திற்கு மேற்பட்ட கூட்டுறவுச் சங்கங்கள் அமைச்சரின் நடவடிக்கையால் மக்கள் இயக்கமாக மாறி இருப்பதை எவரும் மறுக்க முடியாது. 1977 ஆம் ஆண்டிற்குப் பிறகு இந்த நிலைமை ஏற்பட்டாலும் அரசாங்கத்தின் தளர்த்தப்பட்ட ஏற்றுமதி இறக்குமதிக் கொள்கையால் கூட்டுறவு இயக்கம் மேலும் வளர்ச்சி அடையுமா என்ற சந்தேகம் பலர் மனதில் இன்று தோன்றி இருக்கின்றது. குறிப்பாக கூட்டுறவு அமைப்பு முறையைப் பொருத்தவரையில் நிலைமை பெரும் மாற்றம் அடைந்திருப்பது கூட்டுறவாளர் பலருக்கு இன்று தெரியாமல் இருக்கலாம். ஒரு சில ஆண்டுகளுக்கு முன்பு கூட்டுறவு அமைச்சின் ஒரு பகுதியாக இருந்த புடவைக் கூட்டுறவுச் சங்கங்கள் புடைவைக் கைத்தொழில் அமைச்சிடம் இன்று கொடுக்கப்பட்டுவிட்டன. இதேபோல கடந்த மாதம் கடற்றொழில் கூட்டுறவுச் சங்கங்களும் மீன்பிடி அமைச்சுக்கு கொடுக்கப்பட்டுவிட்டன. எஞ்சி இருப்பதை எல்லாம் உணவுப் பகுதியிடம் ஒப்படைக்கும் ஒரே ஒரு கடமைதான் கூட்டுறவு இலாகாவுக்கு இருக்கிறது. அதுவும் கொடுக்கப்பட்டுவிட்டால் கூட்டுறவு இலாகா என்பதே நிச்சயமாக இல்லாமற்போய்விடும். அந்த இலாகா இருந்தாலும், நான் நினைக்கிறேன், அதனால் எதுவும் செய்ய முடியாத நிலை ஏற்படும். கூட்டுறவு இயக்கம் இந்த நாட்டிலே மக்களுக்குச் சேவை செய்ய முடியும் என்பதின் நம்பிக்கை கொண்டவர்களாக எல்லோரும் இருந்தால் அந்த இயக்கத்தை மேலும் பலவீனமடைய விடமாட்டார்கள்; அந்த இயக்கத்தைப் பலவீனப்படுத்துகின்ற முறையில் அந்த இயக்கத்தை ஒவ்வோர் அங்கம் அங்கமாக வெட்டி அதை ஒழிக்கும் ஒரு நிலையை உருவாக்க மாட்டார்கள்.

இப்போது கூட்டுறவு இயக்கத்தோடு விடப்பட்டிருக்கும் பலநோக்குக் கூட்டுறவுச் சங்கங்களோ விவசாயச் சங்கங்களோ மற்றைய சங்கங்களோ இன்றிருக்கும் பொருளாதார நிலையில் அவற்றால் நிச்சயமாகத் தம் சொந்தக் காலில் நிற்க முடியாத நிலை ஏற்பட்டு வருகின்றது. ஒன்று நான் ஏற்கனவே குறிப்பிட்ட அரசாங்கத்தின் தளர்த்தப்பட்ட இறக்குமதி—ஏற்றுமதிக் கொள்கையால் அச்சங்கங்களின் வியாபாரத்தில் பெரும் வீழ்ச்சி ஏற்பட்டு இருக்கின்றது. மற்றது, இந்த அரசாங்கம் விதித்திருக்கும் வருமானவரியும் வருமான வரிக்கான மேலதிக வரியும் இந்தச் சங்கங்களுக்கு மூடுவிழா நடத்துவதற்கான ஒரு நாளைக் குறிக்கவேண்டிய சூழ்நிலையை ஏற்படுத்தியிருக்கின்றது. இதனை எவரும் மறுக்க முடியாது. உணவு, கூட்டுறவு அமைச்சரின் முயற்சியும் வேண்டுகோளும் காரணமாக நிதி அமைச்சர் அவர்கள் 35 விதமாக இருந்த வருமான வரியை 20 விதமாகக் குறைத்து இருந்தாலும் அந்தக் குறைப்பும் ஆறு மாதங்களுக்கு மட்டுமே நிலைக்கும் சூழ்நிலை இருக்கிறது. அடுத்த தை மாதத்திலிருந்து ஆறு மாதங்களுக்கு 20 விதமாக வரி குறைக்கப்பட்டிருந்தாலும் மேலதிக வரியுடன் பழையபடி எல்லாம் கிட்டத்தட்ட 35 விதத்திற்கு வரக்கூடிய சூழ்நிலையே இருக்கின்றது. உதாரணமாக வருமானம் மூன்று இலட்சம் ரூபாவாக இருந்து அதற்குரிய வரி 20 விதமாகவும் இருந்தால் 60,000 ரூபா வரியாகப் போய்விடும். ஆனால் இந்த அறுபதினாயிரத்திற்கும் 15 வீத மேலதிக வரியைச் சேர்த்தால் மொத்தமாக 69,000 ரூபா வரியாகப் போகும். ஆகவே இதனால் 35 விதமாக இருந்ததைவிடக் கூடுதலாகவே கூட்டுறவுச் சங்கங்கள் வரியைச் செலுத்தப்போகின்றன.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

அத்தோடு கூட்டுறவுச் சங்கங்கள் இலாப நோக்கோடு நடத்தப்படுபவை அல்ல. மக்களுக்கு வேண்டிய அத்தியாவசியப் பொருள்களை விநியோகிக்கின்ற ஒரு சிறந்த அமைப்பு முறை அது. அவற்றின் இலாப விதாசாரம் மிகக் குறைவானது. அது அங்கே ஏற்படுகிற மேலதிக செலவுகளைக்கூடச் சமாளிப்பதற்குப் போதாது. அப்படியிருந்தும் கூட்டுறவுச் சங்கங்களுக்கு இந்த வரிகள் அவசியம்தானு என கௌரவ கூட்டுறவு அமைச்சர் மாத்திரம் சிந்தித்தால் போதாது. அவருடைய முயற்சி பலனளிக்க அமைச்சரவையில் இருப்பவர்கள் அனைவரும் குறிப்பாக நிதி அமைச்சரவர்களும் இதுபற்றிக் கவனமெடுக்க வேண்டும்.

இந்த நாட்டு மக்கள் இரண்டாவது யுத்த காலத்தில் பசியால், பட்டினியால் சாகாமல் இருப்பதற்கு வழிவகுத்த ஒரேயொரு இயக்கம் இந்தக் கூட்டுறவு இயக்கமே. இந்த நாட்டிலே இப்பொழுதும் அத்தியாவசியப் பண்டங்களுக்குத் தட்டுப்பாடு ஏற்படுகிற பொழுதெல்லாம் ஏழை மக்களுக்கு எதாவது ஒரு விதத்தில் அப்பொருள்கள் கிடைப்பதற்கு உதவுகிற இயக்கமும் இந்தக் கூட்டுறவு இயக்கமே. இதனை எவருமே மறந்துவிட முடியாது இந்த இயக்கத்தைக் காப்பாற்றுவதற்கு இந்தக் காலகட்டத்தில் நடவடிக்கையெடுக்காவிட்டால் நிச்சயமாக இந்த இயக்கம் முற்றும் முழுதுமாக மறைந்து போகும் நிலைதான் ஏற்படும். இந்த இயக்கத்தின் அமைப்பில் மக்களிடையே நம்பிக்கை ஏற்படுவதற்கு நாங்கள் இதுவரை முயற்சிக்கவில்லை. இந்த இயக்கத்தைப் பொறுத்தவரையில் இது மிக முக்கியமானது. ஒரு கூட்டுறவுச் சங்க நெறியாளராகவோ தலைவராகவோ வரும்வரையில் கூட்டுறவுக் கல்வியைப்பற்றி எங்களுக்குத் தெரியாது. இந்த நிலையிலே மாற்றம் ஏற்பட்டு இந் நாட்டுக் கல்வித் திட்டத்திலே கூட்டுறவுக் கல்வியையும் ஒரு பாடமாகச் சேர்க்கும் முயற்சி மேற்கொள்ளப்பட வேண்டும். எத்தனையோ பொருத்தமில்லாத பாடங்களை, பயனும் பலனும் இல்லாத பாடங்களை, பழம் பெருமைக்காகவும் வெறும் அறிவுக்காகவும் நாங்கள் படிக்கின்றோம்; எங்களுடைய கல்விப் பாடத் திட்டத்திற் சேர்த்திருக்கிறோம். அன்றாட வாழ்க்கையில் மக்களுடைய வளர்ச்சிக்கும் தேவைக்கும் பயன்படக்கூடிய கூட்டுறவு இயக்கம் சம்பந்தமான கல்வியை எமது பாடத் திட்டத்தில் சேர்ப்பதனுல் நாம் மிகப் பலனடைய முடியும்.

கூட்டுறவுக் கல்வியை ஒவ்வொரு கூட்டுறவுச் சங்கமும் அதன் அங்கத்துவ மட்டத்திலும் அதற்கப்பாலும் வேண்டிய அளவு மக்களுக்குக் கற்றுக்கொடுக்க முன்வர வேண்டும். வெறும் பொருள் வாங்கவும் விற்கவும் இருக்கிற ஒரு முகவர் நிலையமாகக் கூட்டுறவு இயக்கம் இருக்காமல் அங்கத்தவர்களின் சேம நலன் பேணுகிற ஓர் இயக்கமாக, கூட்டுறவு அமைப்புமூலம் பொருள்களை வாங்கவும் விற்கவும் செய்வதோடு மட்டுமல்லாமல் பல்வேறு சமூகப் பணிகளையும் செய்கிற ஓர் இயக்கமாக இதனை மாற்றுவதற்குக் கூட்டுறவுக் கல்வி மக்களுக்குக் கிடைக்கும் வாய்ப்பை உருவாக்க வேண்டியது நிச்சயமாக அமைச்சருடைய கடமையாகும். அதற்கான மேலதிகப் பணக் கொடுப்பனவுகளையும் அதற்கான பயிற்சி நெறிகளுக்கான வாய்ப்புக்களையும் ஏற்படுத்த வேண்டியது நிச்சயமாக அவருடைய கடமையாகும். இந்தக் கல்வியை அளிப்பதற்கான முயற்சியில் பல்வேறு விதமான நடவடிக்கைகளை அமைச்சு எடுத்திருக்கிறது, பல்வேறு பயிற்சி நிலையங்களை ஆரம்பித்து பயிற்சிகள் அளிக்கின்றது. இருப்பினும் இவற்றில் சில குறைபாடுகள் இருப்பதை நான் கௌரவ அமைச்சருடைய கவனத்திற்குக் கொண்டுவர விரும்புகிறேன்.

யாழ்ப்பாணத்திலே கூட்டுறவுப் பயிற்சிக் கல்லூரி ஒன்றிருக்கிறது. பொல்கொலையில் மிகச் சிறந்த கூட்டுறவுப் பயிற்சிக் கல்லூரி ஒன்றிருக்கிறது. தமிழிலே ஒரு டிப்புளோமா பயிற்சியைப் பொல்கொல்லையில் நடத்த வேண்டுமென்று ஆரம்பித்தார்கள். அதேபோல யாழ்ப்பாணத்திலும் ஆரம்பிப்பதற்கு அனுமதி கொடுத்தார்கள். நேர்முகப் பரீட்சையும் வைக்கப்பட்டது, மாணவர்களும் தெரிவுசெய்யப்பட்டார்கள். ஆரம்பிப்பதற்கான நாள் கூடக் குறிக்கப்பட்டது. ஆனல் தேசிய கூட்டுறவுச் சபையினர் திடீரென்று தந்திமூலம் அதை நிறுத்திவிட்டு பொல்கொல்லையிலேயே அப்பயிற்சியை நடத்துவதற்கு முயற்சியெடுத்தார்கள். ஆனல், இன்று இருக்கிற சூழ்நிலையில் யாழ்ப்பாணம், திருகோணமலை, மன்னர், மட்டக்களப்பு, வவுனியா, முல்லைத்தீவு போன்ற இடங்களிலிருந்து மாணவர்கள் அங்கு சென்று மாதக்கணக்காக அங்கு தங்கியிருந்து அந்தப் பயிற்சியைப் பெறுவது சாத்தியமில்லை, மாண

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඒ. එම්. ආලාලුසුන් දරම් මහතා]

வர்கள் மன நிம்மதியாகவிருந்து படிக்கவும் முடியாது. ஆகவே, தயவுசெய்து இந்தப் பயிற்சியை யாழ்ப்பாணத்தில் ஆரம்பிப்பதற்கு அமைச்சரவர்கள் வேண்டிய நடவடிக்கையை எடுக்க வேண்டுமென்று தாழ்மையாகக் கேட்டுக்கொள்ளுகிறேன்.

பொல்கொல்லையில் சிங்கள மொழிமூலம் பல்வேறு பயிற்சிகள், அதாவது கூட்டுறவுப் பரிசோதகர்களுக்கான பயிற்சி, கூட்டுறவாளர்களுக்கான பயிற்சி, நெறியாளர்களுக்கான பயிற்சி, கணக்காளர்களுக்கான பயிற்சி முதலிய பயிற்சிகளையெல்லாம் நடாத்துவதற்கு நிரந்தரமான விரிவுரையாளர்கள் இருக்கிறார்கள்—ஏறத்தாழ 15, 16 நிரந்தர விரிவுரையாளர்கள் இருக்கிறார்கள் என நான் நினைக்கிறேன். ஆனால் அங்கு துரதிஷ்டவசமாகத் தமிழ்ப் பிரிவில், தமிழ் மூலம் கற்பிப்பதற்கு ஒரு நிரந்தர விரிவுரையாளர்கூட கிடையாது. காலத்துக்குக் காலம் சிலர் வருவதும் போவதுமாக இருப்பதால் அவர்களிடமிருந்து திறமையான பயிற்சியை எதிர்பார்க்க முடியாதிருக்கின்றது. போதிய அளவு கூட்டுறவுக் கல்வியில் பாண்டித்தியம் பெற்றவர்களை அங்கே நிரந்தரமாக நியமித்தால் அவர்கள் அந்தப் பயிற்சியைத் திறம்படச் செய்கிற வாய்ப்பும் அதன் மூலம் தரமான கூட்டுறவுக் கல்வியைப் பலரும் பெறுகிற வாய்ப்பும் பொல்கொல்லையில் ஏற்படும். ஆகவே, அதற்கான வழிகளை அமைச்சர் அவர்கள் வகுக்கவேண்டும்.

நான் வரிகளைப் பற்றிக் குறிப்பிடும் பொழுது ஒன்றைக்கூற மறந்து விட்டேன் இப்போது வருமானவரி, மேலதிகவரி, வியாபார மொத்த விற்பனவுவரி என்ற வரிகள் அறவிடப்படும் அதே வேளையில் உள்ளூராட்சி மன்றங்களும் கூட்டுறவுச் சங்கங்கள்மீது இன்னும் மோசமான வரிகள் விதிக்கின்றன. அம்மன்றங்கள் வியாபாரவரி என்று சில கடைகளிலிருந்து ஆயிரம், இரண்டாயிரம் ரூபா வசூலிக்கின்றன. அத்துடன் விளம்பர வரியென்று மாதத்துக்கு ஐந்து ஆறு ரூபா அறவிட்டுக் கொண்டிருக்கின்றன. இந்த வரிகளிலிருந்து சங்கங்களுக்கு விதிவிலக்கு அளிக்க வேண்டுமென்று நான் இந்தச் சபையிலே கௌரவ பிரதம அமைச்சரிடம் கேட்ட பொழுது அதற்கு அவர் சம்மதம் தெரிவித்தார். பிரதமருடைய சம்மதத்தை அடிமூதலாகக் கொண்டு கௌரவ அமைச்சர் அவர்கள் கூட்டுறவுச் சங்கங்களுக்கு அந்த வரிகளிலிருந்து விதிவிலக்கு பெற்றுத்தர முயற்சிக்க வேண்டும். அதன்மூலம் கூட்டுறவுச் சங்கங்களுக்கு ஒரு பெரும் ஆறுதலைக் கொடுக்கமுடியும்.

கூட்டுறவு அமைப்பு முறை எந்தவிதமான பாகுபாடும் இல்லாத முறையில் செயற்படுவதற்கு, அதிகாரத்தைப் பரவலாக்கும் திட்டத்தின்கீழ் பல இடங்களில் இருந்து அலுவல்களை நடாத்தக் கூட்டுறவு இலாகா வழி வகுக்க வேண்டும். கூட்டுறவு வேலையாளர் ஆணைக்குழு கொழும்பில் இருக்கின்றது. தாங்கமுடியாத அளவுக்கு அக்குழுவுக்கு வேலைப்பளு இருக்கிறது—நான் அங்குசென்று பார்த்திருக்கிறேன். எனவே, அக்குழுவை இரண்டாக அல்லது மூன்றாகப் பிரித்து வெவ்வேறு மாகாணங்களிலும் ஒவ்வோர் ஆணைக்குழுவை நியமித்து அலுவல்களை நடத்தினால் அதனால் பல சிக்கல்களைத் தீர்க்கமுடியும். இக்குழுவுக்குச் சில பத்திரங்கள் அனுப்பப்பட்டால் ஆறு, ஏழு மாதங்களுக்கு மறுமொழி ஏதும் வராது. இதற்காக அவர்களை நான் குறைகூறவில்லை. அங்கு போதிய அளவு ஆட்கள் இல்லை அவர்களுக்கு இதைச் செய்யக் காலமும் போதாது.

The Employees Service Commission must be decentralized as far as possible because I personally have gone there and found that they do not have sufficient staff to go through all the papers that come from different societies in all the nine provinces. I think the Hon. Minister should take steps to decentralize the Employees Service Commission.

In respect of the Co-operative Bank, I think the Hon. Minister hade effort a year ago to start a bank somewhere in Kurunegala, but so far no steps have been taken. I think that is a must, because earlier, in about June 1981, the People's Bank all of a sudden sent out a circular to all the societies saying that the loans and overdrafts that were granted to all the societies were frozen or reduced to a certain point, that is the point up to which the society had operated their account on a certain day.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

For example, one society in Jaffna, the Nallur MPCS, had about Rs. 6 lakhs by way of loans and about Rs. 4 lakhs by way of overdrafts, but they did not take up to that amount because they did not want to pay interest to the bank. They were trying to save as much as possible on interest, and they operated only to the extent of about Rs. 1 1/2 lakhs. They firmly believed that for any emergency they would have the loan and overdraft available. They tendered the cheque, but unfortunately the bank sent the circular and the cheque was returned because on the given date they had operated only to the extent of Rs. 120,000. Now the DFC writes a letter saying, you will have to pay interest on this." Who is at fault ? I think to get over difficulties like this the Co-operative Bank is the only answer.

Coming to the Food Department—I will be very brief—the first thing I want to comment in is the food stamps. I think from the inception of this food stamps scheme the societies, the Food Department and everybody else is having a lot of problems. When this food stamp scheme was introduced there was a maximum entitlement that was fixed. Societies, ADs and all these people were given a maximum entitlement limit, but unfortunately there was no limit fixed for bakeries and they were able to surrender any amount of food stamps.

I have a list nn my hand from one of the societies in Jaffna where bakeries which were not even working started surrendering food stamps. The general manager of a particular society informed the DFC and refused to accept stamps from that bakery. The bakery owner went and made representations to the then Government Agent, and immediately the Government Agent sent an order to the DFC to instruct the society to accept the stamps. It is like that.

Many co-operatives, many ADs and all the bakeries started giving stamps over and above their limit. There was no limit for bakeries, and they could have given even ten million ! One fine day, after six or seven months, the DFC informs the society : "You have given Rs. 1.6 million above the maximum entitlement : we cannot pay the money ; the Food Commissioner is querying, Audit is querying." What are we to do ?

So this system is completely misleading, because there is no limit placed on these bakeries, resulting in this malpractice of surrendering over and above the maximum entitlement and creating problems for very many societies. The bakery owners come and surrender the stamps and go away with flour and sugar, while the poor society people who accepted these stamps when they surrendered then are told by the kachcheri, the DFC and the Food Commissioner : or "You are well over the maximum entitlement of Rs. 1.6 million. We cannot pay that." I am personally aware that the DFC will have to pay about Rs. 1.6 million to that society. They find it very difficult to buy their important consumer items. I think some limitation must be put on these bakeries and they must be asked to purchase the required amount and not as they will because they are the channel through which these food stamps manipulation is being done.

Even the ADs should be told strictly to submit the amount of their maximum entitlement. I found that some of the co-operative society branches, which have a maximum entitlement of 4,000 to 5,000 food stamps, were getting only 1,000 and the balance 3,000 or 4,000 were missing. The ADs surrendering those 3,000 because on the very day of issue some fellow who wanted some money for a drink was taking those stamps and goving them to the AD and getting Rs. 40 out of the Rs. 50. I think the stamps are not helping the families. So the ADs can collect the stamps and ultimately surrender them. I humbly request the Hon. Minister to restrict the ADs to their maximum entitlement. They must not surrender even one stamp above it. It should be the same with the societies and the bakeries.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජී. එම්. ආරියදාසන් දර්ම මහතා]

In respect of the employees of the department, I have to draw the Hon. Minister's attention to one or two matters. In Jaffna, about four or five employees struch work and they have not been reinstated. In other Ministries most of the strikers have been reinstated. I think the good Minister will definitely take steps to reinstate these poor employees. They find it very difficult to live. As a co-operator, I appeal to the Hon. Minister to consider reinstating them. They have been working as clerks in your department and we have had occasion to work with them, but when we see them on the road without any work it is heart-rending. I appeal to the Hon. Minister to reinstate all the employees who were attached to the co-operative centres.

Lastly, I thank the Hon. Minister for having given his recommendation to form the NDAPC Union. I am sorry that the hon. Member for Point Pedro did not know that the first meeting of the NDAPC was held. In fact an application has been made to the commissioner for registration. Further, I appeal to the Hon. Minister for help to make this society work like the earlier NDAPC so that it will be able to help all the farmers in Jaffna. I still remember the time when the Hon. Minister visited Jaffna and promised the co-operators that the NDAPC woud be given back.

Thank you.

**සභාපතිතුමා**

*(தலைவர்)*

(The Chairman)

Order, please ! Sitting is suppended till 4.30 p.m.

**රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ. භා. 4.30 ට නියෝජ්‍ය කාරක සභාපතිතුමාගේ [එඩ්මන්ඩ් සමරවික්‍රම මහතා] සභාපතිත්වයෙන් නැවත පටන්වන ලදී.**

*அதன்படி அமர்வு பி. ப. 4.30 மணிவரை இடைநிறுத்தப்பட்டு, மீண்டும் ஆரம்பமாயிற்று. குழு உபதலைவர் அவர்கள் [திரு. எட்மன் சமரவிக்ரம] தலைமை வகித்தார்கள்.*

*Sitting accordingly suspended till 4.30 P.M. and then resumed,* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES ([*Mr.* EDMUND SAMARAWICKREMA] *in the Chair.*

**එම්. එස්. අමරසිරි මහතා (නියෝජ්‍ය වෙළෙඳ හා නාවුක කටයුතු පිළිබඳ ඇමතිතුමා)**

*(திரு. எம். எஸ். அமரசிறி—வர்த்தக, கப்பற் போக்குவரத்துப் பிரதி அமைச்சர்)*

**(Mr. M. S. Amarasiri—Deputy Minister of Trade & Shipping)**

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ආහාර හා සමුපකාර අමාත්‍යාංශය යටතේ කථා කිරීමේදී ප්‍රථමයෙන්ම ගරු ආහාර හා සමුපකාර ඇමතිතුමාටත් ගරු නියෝජ්‍ය ඇමතිතුමාටත් මම ප්‍රශංසා කරන්නට කැමතියි. දීර්ඝ කාලයක් වැළලී ගිය සමුපකාර ව්‍යාපාරය ගොඩ ගැනීමට එතුමන්ලා දෙපළ බලවත් උත්සාහයක් දැරීම ගැන.

තමුන්නාන්සේ දන්නවා, 1970-1977 කාලය තුළ මේ රටේ සමුපකාර ව්‍යාපාරය පැවති ආකාරය ගැන. 1971 දී සමුපකාර ප්‍රතිසංවිධානයට පෙර මේ රටේ සමුපකාරය තිබුණේ සමුපකාර ව්‍යාපාරිකයන් අතේයි. සියයට 99ක් අවංක සමුපකාරිකයන් බලවත් දුෂ්කර මධ්‍යයේ සමුපකාර ව්‍යාපාරය රැකගෙන ආවා. නමුත් 1971 දී සමුපකාර පනත සංශෝධනය කිරීමෙන් පසු සමුපකාර ව්‍යාපාරය 'ජන සතු ව්‍යාපාරයක්' වී එහි තුබූ උතුම් ගුණාංග, එහි තිබූ ස්වාධීනත්වය, ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය ආදී සියල්ලම අහෝසි කරමින් රජයේ දෙපාර්තමේන්තුවක් වගේ පාලනය කෙරුණු කාලයක් තිබුණා. තමුන්නාන්සේට මතක ඇති 1977 කාලයේදී—මැතිවරණ කාලයේදී—සමුපකාරය පැවති තත්ත්වය. විශේෂයෙන්ම පසුගිය රජයේ පරාජයට සියයට 50ක්ම හේතු වුණේ එදා සමුපකාර ව්‍යාපාරයේ තිබුණු දූෂණයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

1977 දී මේ රජය බලයට පත් වන විට සමූපකාරයේ නාම පමණයි තිබුණේ. ව්‍යාපාරය මැරිල තිබුණේ. එවැනි මළකඳකට පණ දීමටයි අපේ සමූපකාර ඇමතිතුමාට සිද්ධ වුණේ. ඒ ගැන බොහෝම මහන්සියෙන් එතුමාත් එතුමාගේ නියෝජ්‍ය ඇමතිතුමාත් නිලධාරීනුත් උනන්දුවෙන් කටයුතු කර ඇති බව අපි ප්‍රකාශ කරන්ඔනෑ.

අඩුපාඩුකම් තිබෙනවා. සමූපකාර ව්‍යාපාරයේ සාමාජිකයන් විසි ලක්ෂයක් ඉන්නවා. සමහර විට ඊට වැඩි වෙන්නත් පුළුවනි. විසි ලක්ෂයක් දෙනා අතර ගනුදෙනු වන විට පාරිභෝගිකයන් 80 ලක්ෂයකට බඩු බෙදා හැරීම කරනවා. එසේ කරන විට අඩුපාඩුකම් ඇති වෙනවා. ඒ කොතෙක් අඩුපාඩුකම් තිබුණත් සමූපකාර ව්‍යාපාරය ජනතාවට අවශ්‍ය ව්‍යාපාරයක්. එය මේ රටේ පටන් ගත් දා සිට මේ දක්වාම එහි වටිනාකම ජනතාව තේරුම්ගෙන තිබෙනවා. පෞද්ගලික අංශය සමග තරඟකාරී වෙළඳාමක් කරන විට සෑම අවස්ථාවේදීම සමූපකාරය ජනතාවට පිහිට වෙනවා. ඒ නිසාම තමයි, සමූපකාර අංශය රැක ගැනීමට ජනතාව විශේෂයෙන්ම ක්‍රියා කර තිබෙන්නේ.

ගරු ඇමතිතුමා පසුගිය අයවැය විවාදයේදී ප්‍රකාශ කළ පරිදි ප්‍රතිපත්ති තුනක් මත මේ සමූපකාර ව්‍යාපාරයේ වැඩ ආරම්භ කළ අතර එතුමාට ලැබුණු විශාල වගකීම අනුව පළමුවැනි කාරණය වශයෙන් සමූපකාර ව්‍යාපාරය වර්තමාන තත්ත්වයට හැඩ ගැස්සීමට, හැකි තාක් දුරට ප්‍රශ්න විසඳමින්, කටයුතු කරගෙන යනවා. දෙවැනි කාරණය හෙට—එහෙම නැත්නම් අනාගතයේදී—සමූපකාර ව්‍යාපාරය රැක ගැනීමට අවශ්‍ය පියවරවල් ගැනීමයි. තුන්වැනි කාරණය අතීතයේ—එහෙම නැත්නම් පසගිය කාලය තුළ—සමූපකාරවලින් සිදු වුණු දූෂණ, අඩුපාඩුකම් සොයා බලා ඒවාට සුදුසු ප්‍රතිකර්ම වශයෙන් පුළුවන් තරම් ක්‍රියා මාර්ග ගැනීමයි. මේ කරුණු තුන ගැන සෑහෙන මහ මහන්සියක්. වෙහෙසක් ගරු ඇමතිතුමාත් නියෝජ්‍ය ඇමතිතුමාත් අරගෙන තිබෙනවා.

ඒ කෙසේ වෙතත්, අපට පෙනී ගිය වැදගත් කාරණයක් වන්නේ—අද මේ ගරු මන්ත්‍රීවරුන් ඉදිරිපත් කළ කරුණු වලින් වැදගත්ම කාරණයක් වුණේ—සමූපකාර සමිතිවලින් ආදායම් බදු ගැනීම පිළිබඳ ප්‍රශ්නයයි. එතැනදී අපි කවුරුත් කියා සිටින්නේ සමූපකාර ව්‍යාපාරය මහ ජනතාවගේ ස්වේච්ඡාවෙන් සංවිධානය වූ ව්‍යාපාරයක් බවයි. එහි, ඒ භාණ්ඩවල මිල නියම කිරීම නිතරම පෞද්ගලික අංශයත් සමග තරඟකාරී තත්ත්වයෙන්, ජනතාවට හිතැතිව කළ යුතු නිසා ආදායම් බදු අය කිරීම ගැන සමූපකාර ව්‍යාපාරිකයින් තදින්ම විරුද්ධ බවයි. මේ ගැන ගරු ඇමතිතුමා නොයෙක් මාර්ග අරගෙන තිබෙනවා. අපි තවදුරටත් කියා සිටින්නේ මෙයයි: තමුන්නාන්සේට සමූපකාර ව්‍යාපාරයේ සිටින සියලු දෙනාම පක්ෂපාතී වෙනවා, මේ ගැන තමුන්නාන්සේ තව දුරටත් මහන්සි වී ක්‍රියා කරන්න.

ඊළඟට උතුරේ මන්ත්‍රීවරු කියා සිටියා උතුරු පළාතේ තිබුණු "නොදර්න් ඩිවිෂන් කෝඅපරේටිව් ෆෙඩරේෂන්"—Northern Division Co-operative Federation.—උතුරු ප්‍රදේශයේ සමූපකාර මහා සංගමය ගැන. ඒ සංගමය දීර්ඝ කාලයක් ඉතාම හොඳින් වැඩ කරගෙන ගිය සංගමයක් බව අපි දන්නවා. නිෂ්පාදකයාගේ භාණ්ඩවලට වැඩි මිලක් දී, පාරිභෝගිකයාටත් සහන සැලසීමට එම සංගමය ක්‍රියා මාර්ග අරගත්තා. 1973 දී, ඒ කාලයේදී තිබුණු රජය, උතුරු පළාතේ සමූපකාර ව්‍යාපාරිකයන්ගේ ඒ සමූපකාර සංගමය අවලංගු කර, "මාකටින් ෆෙඩරේෂන්" කියා අලුත් සංගමයක් ඇති කළා. පාරිභෝගිකයන්ගේ සංගමයත්, සමස්ත ලංකා ගොවි ද්‍රව්‍ය නිපදවන්නන්ගේ සංගමයත් එකතු කරලයි එය හැදුවේ. දැන් අපට එහි අඩුපාඩුවක් පෙනී යනවා. නිපදවන්නන්ගේ භාණ්ඩ මිලයට ගැනීමේදී—රතුළූනු, මිරිස් ආදිය මිලයට ගැනීමේදී—අපට පෙනෙනවා, ඒ උතුරු පළාතේ නිපදවන්නන්ගේ සංගමය තිබුණා නම් පාරිභෝගිකයන්ට ඇතාට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. එස්. අමරසිරි මහතා]

වඩා සාහසයෙක් ඇති විය හැකිව තිබුණා කියා ගරු ඇමතිතුමා ඒ ගැන සුදුසු පිළිදි ක්‍රියා කර තිබෙනවා. සමුපකාර ව්‍යාපාරිකයන් හැටියට අපි ඉතාම සන්තෝෂ වෙනවා, එතුමා ගත් ක්‍රියා මාර්ගය ගැන.

ඊළඟට, පසුගිය කාලය තුළ සමුපකාර සමිතිවල තීරක විභාග ගැන—ආරාවුල විභාග ගැන—කොත්මලේ මන්ත්‍රීතුමා (ආනන්ද දසනායක මහතා) කතා කළා. අපි, එතුමා දැන් මෙතන නොසිටියත් එතුමාගේ දැන ගැනීම සඳහා කියන්නට ඕනා, එතුමන්ලාගේ පාලන කාලය තුළ කෙරුණු වැඩ ගැන අපි නොකීවාට කවුරුත් දන්නවා. සමුපකාර සමිතිවල, සංගම්වල රථවාහන 2000 කට ආසන්න සංඛ්‍යාවක් තිබුණා. ඒ කාලවල මන්ත්‍රීවරුන්ගේ රැස්වීම්වලට, මැයි දින රැලිවලට ඒ සමුපකාර ලොරි පාවිච්චි කිරීම නිසා ඒ කාලයේම ඒවා විනාශ වුණා. ඒ හේතුව නිසා සමුපකාර ව්‍යාපාරයට අද ඒවායේ ගිණුම් සොයා ගන්න පවා බැරිව තිබෙනවා. ඒ කාලයේ ඒ වාහනවල ගමන් බිමන් සම්බන්ධ දෛනික වාර්තාවල් ලිව්වේත් නැහැ. නිකම්ම අරගෙන ගියා. සභාපතිතුමාගේ නියෝගයක් නැත්නම් මන්ත්‍රීතුමාගේ නියෝගයක් උඩය කියලා නිකම්ම ඒවා අරගෙන යනවා. වැරදි පාලනය නිසා ලොරිවලින් පමණක් සමුපකාර ව්‍යාපාරයට රුපියල් කෝටියක පාඩුවක් විඳින්නට සිදු වී තිබෙනවා.

ඒ වාගේම, මම මේ ගරු සභාවේදී විටින් විට කිව්වා, සමුපකාර ව්‍යාපාරයේ වැරදි පාලනය නිසා රුපියල් සියක් කෝටියක පමණ දේපොළ හානියක්, වත්කම් නාස්තියක් සිදු වී තිබෙන බව. එය අපට පැහැදිලි කර දෙන්න පුළුවන්. 1971 සමුපකාර ප්‍රතිසංවිධානයෙන් පසු සමුපකාර සමිතිවල අලුත් සමිති ක්‍රමයක් ඇති කළා. ජනාවාස සමුපකාර සමිති නමින් සමිති ක්‍රමයක් ඒ කාලයේ ඇති කළා. සමුපකාර ගම්මාන සමිති කියා ක්‍රමයක් ඇති කළා. ඒවා—ජනාවාස සමිති—ඇත්ත වශයෙන්ම 'ජරාවාස' බවට පත් වුණා. ඒ කාලවල මේ සියලුම සමිතිවලින් වුණු පාඩුව, නාස්තිය රුපියල් දස කෝටියකට වඩා ලොකුයි. දැන් සමුපකාර ඇමතිතුමාට දුෂ්කරතාවයක් ඇති වී තිබෙනවා. ඒ සමුපකාර සමිතිවලින් වුණු පාඩුව අය කර ගැනීම සමුපකාර දෙපාර්තමේන්තුවට අපහසු වී තිබෙනවා. මේ ජනාවාස සමුපකාර සමිතිවල අඩුපාඩුකම් ගැන බොහෝ විට සමුපකාර අමාත්‍යාංශයට චෝදනා කියනවා. නමුත් ජනාවාස පනත උඩ ජනාවාස සමුපකාර සමිති අවලංගු කරලා ඒ සියල්ලකම වත්කම්, වතු, දේපොළ ඔක්කොම ජනාවාස කොමිෂන් සභාවට පවරා ගත්තා. ඊට අනුව ඒ සමිති සමුපකාර ආඥා පනත යටතේ පරීක්ෂණ පවත්වන්නට පුළුවන්කමක් නැහැ. ජනාවාස සමුපකාර සමිති, ගම්මාන සමුපකාර සමිති එකසිය පණස් ගණනක් තිබෙනවා. ඒ සියල්ලම ජනාවාස කොමිෂන් සභාවට පැවරී තිබෙනවා. ජනාවාස කොමිෂන් සභාව කෘෂිකර්ම අමාත්‍යාංශය යටතට පත් වුණු නිසා ඒ සමිතිවල ක්‍රියාකාරිත්වය ගැන කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්තුමා ක්‍රියා කරගෙන යන බව අපි දන්නවා.

ඊළඟට විවිධ සේවා සමුපකාර සමිති, ඉඩම් ප්‍රතිසංස්කරණ සමුපකාර සමිති ආදියේ අඩුපාඩුකම් ගැන සමුපකාර දෙපාර්තමේන්තුව සැහෙන ප්‍රමාණයකට ක්‍රියා කර තිබෙනවා. පසුගිය අවුරුදු තුන ඇතුළත මෙම සමිති පිළිබඳව පරීක්ෂණ පවත්වා, සමුපකාර දෙපාර්තමේන්තුව ආරවුල් හය දහසක පමණ ගණනක් පරීක්ෂණ අවසන් කර ඒ ගැන ක්‍රියා කර තිබෙනවා. රුපියල් ලක්ෂ 640 කට වැඩි මුදලක්—කෝටි 6 කට වැඩි මුදලක්—ඒ කටයුතුවල [illegible] වුණු, ඒ වැරදි කළ නිලධාරීන්ගෙන්—සභාපතිවරුන්ගෙන්, අධ්‍යක්ෂවරුන්ගෙන්, සේවකයන්ගෙන්—අය කර ගන්නට තිබෙනවා. ඒ ගැන සමුපකාර දෙපාර්තමේන්තුව, විශේෂයෙන් අපේ ගරු නියෝජ්‍ය ඇමතිතුමා සමුපකාර කොමසාරිස් සමග සතියකට වරක් සමාලෝචනයක් කරනවා. ඒ කටයුතු නිසා විශාල ප්‍රගතියක් ඇති වී තිබෙන බව අපි කියන්නට කැමතියි.

ඒ වාගේම සමුපකාර ආරවුල් හාර දහස් එකසියයක් වෙනුවෙන් තීරකවරුන් පත් කර තිබෙනවා. රුපියල් තුන් කෝටි හතළිස් තුන් ලක්ෂයක් වෙනුවෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තීරණ ලබා ගැනීමට ක්‍රියා කර තිබෙනවා. දැන් මේවායින් හත් නෑ. ඩොලර් මිලියන ප්‍රමාණ මුදලක් අය වෙලා තිබෙනවා. නව අනු පත් ලක්ෂයක් අය කර ගැනීමට කටයුතු කර තිබෙනවා. තීරණ ප්‍රදානයන් ලැබී තිබෙනවා. ලක්ෂ පණස් තුනක්, ආර වුල් එක් දහස් තුන්සියයක් පමණ උසාවි වලට ඉදිරිපත් වෙලා තිබෙනවා. සමුපකාර ආඥා පනතේ හැටියටයි මේ කටයුතු කරන් නට වෙලා තිබෙන්නේ. ඇමතිතුමා කිව්වා වගේ එකපාරටම—If you make a mistake I can shoot you.—එහෙම කියන් නට බැහැ.

**ආර්. පී. විජේසිරි මහතා**
(திரு. ஆர். பி. விஜேசிறி)
(Mr. R. P. Wijesiri)
'ෆයර්' වෙන්නේ නැහැ නොවැ.

**එම්. එස්. අමරසිරි මහතා**
(திரு. எம். எஸ். அமரசிறி)
(Mr. M. S. Amarasiri)
ඔබතුමා වෙලාවට 'ෆයර්' වෙයි. නීත්‍යානුකූලව ගතයුතු ක්‍රියාමාර්ග අර්ගෙන තිබෙනවා.

**ආර්. පී. විජේසිරි මහතා**
(திரு. ஆர். பி. விஜேசிறி)
(Mr. R. P. Wijesiri)
ලස්සනගමට මොකද වෙලා තිබෙන්නේ, කියන්න.

**එම්. එස්. අමරසිරි මහතා**
(திரு. எம். எஸ். அமரசிறி)
(Mr. M. S. Amarasiri)
දැන් මෙන්න මේ විධියට තීරක විභාග වලදී සමහර තීරක විභාග ඔප්පු කරන්න වෙලා තිබෙනවා. ඒකට එක හේතුවක්, පොත්පත් හරියට ලියලා නැහැ. ඊළඟට, පොත්පත් නොතබාපු සමිති තිබෙනවා. කොලොන්නාවේ ගරු මන්ත්‍රීතුමා, කොළඹ දිසා ඇමතිතුමා (වීරසිංහ මල්ලිමාරච්චි මහතා) 1978 සිටම කියන කාරණයක් තමයි, දේශීය චිත්‍රපට නිෂ්පාදකයින්ගේ සමුපකාර සමිතියේ පොත්පත් නැතිකම නිසා එහි ගණන් පරීක්ෂා කරන්නට විධියක් නැහැයි කියන එක.

**ආර්. පී. විජේසිරි මහතා**
(திரு. ஆர். பி. விஜேசிறி)
(Mr. R. P. Wijesiri)
ඒකේ සභාපති කවුද කියා කරුණාකර කියන්න.

**එම්. එස්. අමරසිරි මහතා**
(திரு. எம். எஸ். அமரசிறி)
(Mr. M. S. Amarasiri)
ඒකේ සභාපති හැටියට ඉන්නේ, දැනුත් සභාපති හැටියට ඉන්නේ එච්. එම්. නවරත්න මහත්මයා. හිටපු කෘෂිකර්ම නියෝජ්‍ය ඇමතිතුමා.

**ආර්. පී. විජේසිරි මහතා**
(திரு. ஆர். பி. விஜேசிறி)
(Mr. R. P. Wijesiri)
හිටියේ කවුද?

**එම්. එස්. අමරසිරි මහතා**
(திரு. எம். எஸ். அமரசிறி)
(Mr. M. S. Amarasiri)
නාමරා කුමාරි ඉලංගරත්න මහත්මිය. උප සභාපති ඩග්ලස් පෙරේරා මහත්මයා. එච්. එම්. නවරත්න මහත්මයා සභාපති. මේ සමිතිය පටන් ගත්තේ දේශීය චිත්‍රපටි නිපදවන්න උපකාර කරන්නටයි. එකම චිත්‍රපටියයි පෙන්වන්නට කටයුතු කළේ. ඒ චිත්‍රපටිය හැදුවේ හිටපු වෙළඳ ඇමති ඉලංගරත්න මැතිතුමා.

**ආර්. පී. විජේසිරි මහතා**
(திரு. ஆர். பி. விஜேசிறி)
(Mr. R. P. Wijesiri)
එයාද නලුවා?

**එම්. එස්. අමරසිරි මහතා**
(திரு. எம். எஸ். அமரசிறி)
(Mr. M. S. Amarasiri)
ඒ චිත්‍රපටියට ලියපු කතාවට ඒ අයගේ ඇස්තමේන්තුවේ තිබෙනවා, රුපියල් විසි දහසක් ගෙවන්නට. [බාධා කිරීමක්]

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழு உப தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
කරුණාකර ඒ නියෝජ්‍ය ඇමතිතුමාට කතා කරන්නට ඉඩ දෙන්න.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**එම්. එස්. අමරසිරි මහතා**
*(திரு. எம். எஸ். அமரசிறி)*
**(Mr. M. S. Amarasiri)**
ජේනවා නේද?

දේශීය චිත්‍රපටි නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය ඒ චිත්‍රපටිය නිපදවන්නට රු. 2,75,000 ක ඇස්තමේන්තුවක් සකස් කර තිබුණා. සමුපකාර කොමසාරිස්තුමා බලය දුන්නා ඒ ඇස්තමේන්තුව අනුව ඒක කරන්නට. නමුත් අධ්‍යක්ෂ මණ්ඩලය ඒ චිත්‍රපටියට රු. 9,00,000 ක් දක්වා වියදම් කර තිබෙනවා.

**ආර්. පී. විජේසිරි මහතා**
*(திரு. ஆர். பி. விஜேசிறி)*
**(Mr. R. P. Wijesiri)**
කොහෙන්ද සල්ලි?

**එම්. එස්. අමරසිරි මහතා**
*(திரு. எம். எஸ். அமரசிறி)*
**(Mr. M. S. Amarasiri)**
බැංකුවලින් ණයට අරන් තිබෙනවා නවත් ආයතන සමග ගනුදෙනු කර තිබෙනවා. කොළඹ දිසා ඇමතිතුමා කිවාක් මෙන් සතොස සමගත් ණයට ගනුදෙනු කර තිබෙනවා.

මේ කටයුතු සොයන්නට, නීරක්ෂ විභාග වලට අවශ්‍ය ලිපිලේඛන ආදිය සොයා ගන්නට උපකාර වෙන්නට ගරු ඇමතිතුමා අනුකාරක සභාවක් පත් කළා. ඒ කියන්නේ 1970 සිට 1977 දක්වා වූ කාලය තුළ සමූපකාර සමිතිවල ක්‍රියාකාරීත්වය සම්බන්ධව උපකාර වෙන්නට ගරු ඇමතිතුම අනුකාරක සභාවක් පත් කළා. ඒ කියන්නේ 1970 සිට 1977 දක්වා වූ කාලය තුළ සමුපකාර ඇමතිතුමා එම අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවේ අනුකාරක සභාවක් පත් කළා. එහි සභාපති හැටියට මමත් සාමාජිකයන් හැටියට මාතර දිසා ඇමතිතුමාත් බුලත්සිංහල මන්ත්‍රීතුමාත් (ඕ. එස්. පෙරේරා මහතා) පඩුවස්නුවර මන්ත්‍රීතුමාත් (ආර්. එම්. කේ. බී. රත්නායක මහතා) කටයුතු කළා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ දැන ගැනීම සඳහා එහි සභාපති හැටියට මම ඒ වාර්තාව ඉදිරිපත් කළා. මෙතෙක් පරීක්ෂණවලට භාජනය නොකළ සමුපකාර සමිතිවලට ඒ පරීක්ෂණ වලට අදාළ ලියකියවිලි සොයා ගැනීමට අපේ මේ කමිටුව සහාය වූ බව එහි සඳහන් කර තිබෙනවා. දැන් ඔය එක කාරණයක් හැටියට කොළඹ දිසා ඇමතිතුමා ඉදිරිපත් කළ චිත්‍රපටි සිද්ධිය සම්බන්ධයෙන් අදාළ පොත්පත් සොයා ගන්නට විධියක් තිබුණේ නැහැ. ඒ ගැන වාර්තාවේ සඳහන් වෙලා තියෙනවා. දැන් අපේ වාර්තාව පිට කර තිබෙන නිසා ඒ ගැන සඳහන් කරන්නට පුළුවනි. පොත් පත් ලේකම් ළඟ තිබිල ලේකම් මැරිල ගිහින් තියෙනව.

**ආර්. පී. විජේසිරි මහතා**
*(திரு. ஆர். பி. விஜேசிறி)*
**(Mr. R. P. Wijesiri)**
මමත් ගියා මළගෙදර. එයා යන කොට අරන් ගියෙ නැහැ, ඒ පොත්. මම ඒක කියන්නට ඕනෑ.

**කේ. ඩී. එම්. සී. බණ්ඩාර මහතා (නියෝජ්‍ය කෘෂිකාර්මික සංවර්ධනය හා පර්යේෂණ පිළිබඳ ඇමතිතුමා)**
*(திரு. கே. டீ. எம். சீ. பண்டார—விவசாய அபிவிருத்தி, ஆராய்ச்சி பிரதி அமைச்சர்)*
**(Mr. K. D. M. C. Bandara—Deputy Minister of Agricultural Development & Research)**
පොත් ටික මිනී පෙට්ටියට දමල වළලන්න ඇති.

**ආර්. පී. විජේසිරි මහතා**
*(திரு. ஆர். பி. விஜேசிறி)*
**(Mr. R. P. Wijesiri)**
පෙට්ටිය වහන කොටත් මම බලාගෙන හිටියා. එහෙම වුණේ නැහැ.

**එම්. එස්. අමරසිරි මහතා**
*(திரு. எம். எஸ். அமரசிறி)*
**(Mr. M. S. Amarasiri)**
පොත්පත් නැතිවීම නිසා අපි ඒ අධ්‍යක්ෂ මණ්ඩලය—එච්. එම්. නවරත්න මහත්මයා, තමරා කුමාරි ඉලංගරත්න මහත්මිය, ඩග්ලස් පෙරේරා මහත්මයා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය—කමිටුව ඉදිරිපිටට කැඳෙව්වා. කැඳවා ප්‍රශ්න කළා. සමුපකාර නියෝජ්‍ය කොමසාරිස්තුමා ගෙන්වා ඒ අය ඉදිරිපිට දී අතුරු ව්‍යවස්ථාව කියෙව්වා. පොත්පත්වල භාරකාරත්වයේ වගකීම තිබෙන්නේ සම්පූර්ණයෙන්ම අධ්‍යක්ෂ මණ්ඩලයට බව පෙන්වා දුන්නා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒ අධ්‍යක්ෂ මණ්ඩලය යුතුකම් පැහැර හැර තිබෙන බව අපට පෙනී ගියා. ඒ ගැන සමූපකාර දෙපාර්තමේන්තුවට පරීක්ෂණ කරගෙන යෑමට අවශ්‍ය තොරතුරු රාශියක් අපි සොයා දී තිබෙනවා. චිත්‍රපට සංස්ථාවේ නිලධාරීනුත් අපි ඒ කමිටුව ඉදිරිපිටට කැඳවා සාකච්ඡා කළා. ඒ අය කියා සිටියා, මේ කියන චිත්‍රපටිය "බී" ශ්‍රේණියේ චිත්‍රපටියක්ය, ඒක නිෂ්පාදනය කරන්නට වැඩිම වුණොත් රුපියල් ලක්ෂ තුනක් යන්න ඇත කියල, ඒ කාලයේ හැටියට. ඒකට ලක්ෂ නවයක් වියදම් කිරීම සම්පූර්ණයෙන්ම වැඩි මුදලක්. සමූපකාර කොමසාරිස්තුමා ඒ ගැන නිසි විධියට ක්‍රියා කරගෙන යනවා.

මේ ගරු සභාවේ ඇමතිවරුන් නියෝජ්‍ය ඇමතිවරුන් මන්ත්‍රීවරුන් තම තමන්ගේ කොට්ඨාශවල සමූපකාර සමිති ගැන අනු කාරක සභාවට කරුණු ඉදිරිපත් කළා. ඒ ඉදිරිපත් කළ සෑම කාරණයක් ගැනම අදාළ සමිතිවල නිලධාරීන් ගෙන්වා කරුණු විමසුවා. පඬුවස්නුවර මන්ත්‍රීතුමා එතුමාගේ කොට්ඨාශයේ පඬුවස්නුවර විවිධ සේවා සමූපකාර සමිතිය ගැන කරුණු ඉදිරිපත් කළා.. අපි ඒ ගැන පරීක්ෂා කර බැලුවා එම සමිති බල ප්‍රදේශයට අයත් වන සීමා සහිත පඬුවස්නුවර නව විවිධ සේවා සමිතිය, වාරියපොල විවිධ සේවා සමූපකාර සමිතිය සහ වාරියපොල, පඬුවස්නුවර විවිධ සේවා සමිතිය යන සමිතිවල චෝදනා සම්බන්ධයෙන් ප්‍රදානයක් ලබා ගෙන තිබෙනවා. සමිති තුනේම ඇති ආරාවුල් සංඛ්‍යාව 181 යි. එයින්වූ අලාභය රු. 13,75,361.75 යි.

එසේම—

රු. 2,27,068.25 ක් සම්බන්ධයෙන් ආරාවුල් 160 ක් වෙනුවෙන් තීරකවරුන් පත් කර තිබෙනවා. ඒ වගේම, තීරක ප්‍රදානයන්ගෙන් ලැබී ඇති මුදල රු. 1,51,154 ක් වෙනවා. රු. 1,09,360 ක් සම්බන්ධයෙන් උසාවියට කරුණු ඉදිරිපත් කර තිබෙනවා. මේ විධියට සමූපකාර දෙපාර්තමේන්තුව ක්‍රියා කර තිබෙනවා.

වැල්ලවායේ මන්ත්‍රීතුමාගේ (ජේ. එම්. කුමාරදාස මහතා) යොමු කිරීම අනුව බුත්තල විවිධ සේවා සමූපකාර සමිතියේ සාමාජික ණය හා හිඟ බඩු අඩුවීම ඇතුළුව රු. 7,17,145 ක් අය කර ගැනීමට ක්‍රියා කර තිබෙනවා. හම්බන්තොට දිසා ඇමතිතුමාගේ යොමු කිරීම අනුව හම්බන්තොට විවිධ සේවා සමූපකාර සමිතියේ රු. 2,37,899.55 ක් සම්බන්ධයෙන් චෝදනා ඉදිරිපත් කොට ඇතැම් කොටස්වල ප්‍රදානයන් ලබා ගෙන තිබෙනවා.

තැපැල් හා විදුලි සන්දේශ ඇමතිතුමාගේ යොමු කිරීමෙන් උඩුනුවර විවිධ සේවා සමූපකාර සමිතිය සම්බන්ධයෙන් රු. 6,61,012 ක් අය කර ගැනීම සඳහා ක්‍රියා කරගෙන යනවා.

**ආර්. පී. විජේසිරි මහතා**
*(திரு. ஆர். பீ. விஜேசிறி)*
**(Mr. R. P. Wijesiri)**

අඹන්වෙල ඇත් ඇමතිතුමාගේ හොඳ හිතවතෙක් නෙ; ඒ නිසා අය කර ගන්න ඇති.

**එම්. එස්. අමසිරි මහතා**
*(திரு. எம். எஸ். அமரசிறி)*
**(Mr. M. S. Amarasiri)**

තිස්සමහාරාම සංවර්ධන සමූපකාර සමිතිය සම්බන්ධයෙන් 46(1) වගන්තිය යටතේ පරීක්ෂණ අවසන් කොට අනු කමිටුවට වාර්තාව ලැබී තිබෙනවා. තිස්සමහාරාම ඉඩම් ප්‍රතිසංස්කරණ සමූපකාර සමිතිය සම්බන්ධයෙන් රු. 9,53,044 ක් සම්බන්ධයෙන් චෝදනා 12 ක් ඉදිරිපත් කොට, චෝදනා 10 ක් ඔප්පු වී මුදල් අය කර ගැනීමට ක්‍රියා කර තිබෙනවා. වැල්ලවාය මන්ත්‍රීතුමාගේ යොමු කිරීමෙන් වැල්ලවාය සිත්තම්පරම් පළාත විවිධ සේවා සමූපකාර සමිතියේ රු. 4,54,583 ක් අය කර ගැනීම සඳහා චෝදනා 17 ක් ඉදිරිපත් කර ක්‍රියා කර තිබෙනවා. [බාධා කිරීම] මේ විධියට, ක්‍රමයෙන් රු. 75,00,000 ක් අය කරගෙන යනවා. ඇත්ත වශයෙන්ම සමූපකාර දෙපාර්තමේන්තුව ඒ විධියට ක්‍රියා කර තිබීම ගැන අපි සන්තෝස වෙනවා. අලුතින් නිලධාරීන් පත් කරන්නේ නැතිව, දැනට ඉන්නා නිලධාරීන්ගෙන් මයි, මේ වැඩ කටයුතු කරගෙන තිබෙන්නේ. ඇත්ත වශයෙන්ම 1970-1977 කාලයේදී සමූපකාරයට වුණු විනාශය ගැන බලන විට, එම ව්‍යාපාරය නැවතත් ගොඩ ගැනීම සඳහා වෙනම දෙපාර්තමේන්තු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. එස්. අමරසිරි මහතා]

වක් ඇති කළ යුතුව තිබුණා. නමුත් සමූපකාර දෙපාර්තමේන්තුවේ දැනට ඉන්නා නිලධාරීන් ලබා, වර්තමාන සංවර්ධන කට යුතු කරගෙන යන අතරම පසුගිය ආණ්ඩු කාලයේ සිදු වුණු වංචා, නාස්ති හා අපතේ යෑම් නිසා වුණු පාඩු අය කර ගැනීමටත් ක්‍රියා කර තිබෙනවා.

දොඩන්ගොඩ ප්‍රාදේශීය සංවර්ධන සමූපකාර සමිතිය සම්බන්ධයෙනුත් ඒ පිඩියට මුදල් අය කර ගැනීමට ක්‍රියා කරගෙන යනවා. අකුරැස්ස මැතිවරණ කොට්ඨාශයේ ඉඩම් ප්‍රතිසංස්කරණ සමූපකාර සමිතිය සම්බන්ධයෙනුත් මුදල් අය කර ගැනීමේ ක්‍රියා කර ගෙන යනවා.

අත්මීමණ, සාමූහික කෘෂිකාර්මික ජනාවාස සමූපකාර සමිතිය සම්බන්ධයෙන් ඇති මුදල් ප්‍රමාණය ඉතා විශාල නිසා ඒ පිළිබඳ ප්‍රශ්නය ජනාධිපති කොමිසමට යොමු කිරීම සඳහා අදාළ කඩදාසි කෘෂිකර්ම අමාත්‍යාංශයට ඉදිරිපත් කර තිබෙනවා.

**ආර්. පී. විජේසිරි මහතා**
(திரு. ஆர். பீ. விஜேசிறி)
(Mr. R. P. Wijesiri)

ලක්සණගම ?

**එම්. එස්. අමරසිරි මහතා**
(திரு. எம். எஸ். அமரசிறி)
(Mr. M. S. Amarasiri)

අකුරැස්ස විවිධ සේවා සමූපකාර සමිතිය සම්බන්ධයෙනුත් අදාළ මුදල් අය කර ගැනීමට ක්‍රියා කරගෙන යනවා. අකුරැස්ස මැතිවරණ කොට්ඨාශ සංවර්ධන සමූපකාර සමිතිය සම්බන්ධයෙනුත් මුදල් අය කර ගැනීමට ක්‍රියා කරගෙන යනවා. වාරියපොළ සංවර්ධන සමූපකාර සමිතිය සම්බන්ධයෙනුත් මුදල් අය කර ගැනීමට ක්‍රියා කර ගෙන යනවා. බද්දේගම ඉඩම් ප්‍රතිසංස්කරණ සමූපකාර සමිතිය සම්බන්ධයෙන් රු. 13,941 ක් සඳහා නීරක්ෂ ප්‍රදානයක් ලබා ගැනීමට ක්‍රියා කරගෙන යනවා.

මිරිස්වත්ත බණ්ඩාරනායක කෘෂිකාර්මික සාමූහික ජනාවාස සමූපකාර සමිතිය සම්බන්ධයෙනුත් කටයුතු කරගෙන යනවා. එහි සභාපති වෙල පිටියේ බෙන්තර-ඇල්පිටියේ හිටපු මන්ත්‍රීතුමායි. එහි රුපියල් ලක්ෂ ගණනක අඩුපාඩු තිබෙනවා. ඒ ගැනත් ජනාධිපති කොමිසමට කරුණු ඉදිරිපත් කිරීම සඳහා සමූපකාර දෙපාර්තමේන්තුවෙන් අදාළ කඩදාසි යවා තිබෙනවා, කෘෂිකර්ම අමාත්‍යාංශයට. වාරියපොළ මැතිවරණ කොට්ඨාශ ඉඩම් ප්‍රතිසංස්කරණ සමූපකාර සමිතිය සම්බන්ධයෙන් රු. 5,43,202.60 ක් අය කර ගැනීමටත් ක්‍රියා කරගෙන යනවා.

මේ ගණන්-හිලව් බලන විට අපට හිතෙනවා, සමූපකාර ව්‍යාපාරය තවදුරටත් ඉතුරු වී තිබෙනවා ද කියාත්. වලහන්දූව ජනාවාස සමූපකාර සමිතිය සම්බන්ධයෙනුත්, ජනාධිපති කොමිෂන් සභාව යොමු කිරීම සඳහා අදාළ ලියකියවිලි කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත යොමු කිරීමට කටයුතු කර තිබෙනවා.

රත්නපුර විවිධ සේවා සමූපකාර සමිතිය සම්බන්ධයෙන් රු. 3,80,044 ක් අය කර ගැනීම සඳහා උසාවිය මඟින් කටයුතු කිරීමට විධිවිධාන සලස්වා තිබේනවා. කිරිඇල්ල දකුණ විවිධ සේවා සමූපකාර සමිතිය සම්බන්ධයෙන් රු. 32,366 ක් අය කර ගැනීමටත් කටයුතු කරගෙන යනවා. කිරිඇල්ල උතුර විවිධ සේවා සමූපකාර සමිතියෙන් රු. 30,566 ක් අය කර ගැනීමට ක්‍රියා කර ගෙන යනවා. නිවිතිගල විවිධ සේවා සමූපකාර සමිතියෙන් රු. 37,070 ක් අය කර ගැනීමට කටයුතු කර ගෙන යනවා. [බාධා කිරීමක්] අය කර ගන්නේ අධ්‍යක්ෂවරුන්ගෙන්, සමානාධිකාරීවරුන්ගෙන් ඒ ගැන වගකිවයුතු නිලධාරීන්ගෙන්. කොටපොල විවිධ සේවා සමූපකාර සමිතියෙන් රු. 4,62,285.25 ක් අය කර ගැනීමට එන්තරවාසි යවා අය කර ගැනීමට ක්‍රියා කර ගෙන යනවා. බුලත්සිංහල විවිධ සේවා සමූපකාර සමිතියෙන් රු. 68,573.56 ක් අය කර ගැනීමට එන්තරවාසි යවා කටයුතු කර ගෙන යනවා. බෙලිඅත්ත ප්‍රාදේශීය සංවර්ධන සමූපකාර සමිතිය ගැන කොළඹ රෝහල් හා පවුල් සෞඛ්‍ය කටයුතු පිළිබඳ ගරු ඇමති රංජිත් අතපත්තු මැතිතුමා කරුණු ඉදිරිපත් කර තිබෙනවා. ඒ සමිතියෙන් රු. 2,57,038.50 ක් අය කර ගැනීමට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එන්තරවාඩි යවා ක්‍රියා කර ගෙන යනවා. බැදිගම රාජපක්ෂ විවිධ සේවා සමුපකාර සමිතියෙන් අය කර ගැනීමට ක්‍රියා කර ගෙන යනවා.

මෙහි තිබෙන තත්ත්වය මේකයි: අය කර ගැනීමට ක්‍රියා කර ගෙන යනවා. ඒ අය ගෙව්වොත් අපි අය කර ගන්නවා. නොගෙව්වොත් තත්ත්වය මේකයි: තීරක තීන්දුවක් දුන්නාට පසුව සමුපකාර සමිතිය ඒ අයට ලියා යවනවා, ගෙවන්න කියා. මාසයක් ඇතුළත ගෙව්වේ නැත්නම් ඒ සමුපකාර සමිතියට පුළුවන්කම තිබෙනවා, ඒ තීරක තීන්දුව මහේස්ත්‍රාත් උසාවියට ඉදිරිපත් කරන්නට. එසේ මහේස්ත්‍රාත් උසාවියට ඉදිරිපත් කළාට පසුව එතන දී නඩු විභාගයක් ඇති වන්නේ නැහැ. එතන දී කෙලින්ම ඒ පුද්ගලයා ගෙන්වා එයාට කියනවා, ගෙවන්නය කියා. නොගෙව්වොත් හිරේ යවනවා.

දකුණු ගිරුවාපත්තුව විවිධ සේවා සමුපකාර සමිතියෙන් රු. 2,62,998.78 ක් අය කර ගැනීමට තීරක තීන්දු යවා තිබෙනවා. ගාළු ගඟබඩ පත්තු උතුර සංවර්ධන සමුපකාර සමිතියෙන් රු. 46,135,50 ක් අය කර ගැනීමට ක්‍රියා කර ගෙන යනවා. හිනිදුම ඉඩම් ප්‍රතිසංස්කරණ සමුපකාර සමිතියෙන් අයකර ගැනීමට කටයුතු කර ගෙන යනවා.

**මන්ත්‍රීවරයෙක්**
*(அங்கத்தவர் ஒருவர்)*
(A Member)
ගණන කීයද?

**එම්. එස්. අමරසිරි මහතා**
*(திரு. எம். எஸ். அமரசிறி)*
(Mr. M. S. Amarasiri)
එහි තිබෙනවා රු. 1,16,000 ක්. සභාපති හැටියට හිටියේ හිනිදුම හිටපු මන්ත්‍රී.

ඊළඟට ලස්සනගම විවිධ සේවා සමුපකාර සමිතිය. මෙම සමිතිය සිදු කර තිබෙන අඩුපාඩු හා අක්‍රමිකතා සම්බන්ධයෙන් වැඩිදුර ක්‍රියා කිරීම සඳහා අදාල ලිපි ලේඛන ජනාධිපති කොමිසම වෙත ඉදිරිපත් කර තවදුරටත් මේ සම්බන්ධයෙන් ක්‍රියා කිරීම සඳහා ජනාවාස කොමිසම පාලනය කරන කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්තුමාද ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ ලේකම්තුමාද ආහාර හා සමුපකාර අමාත්‍යාංශයේ ලේකම්තුමාද කටයුතු කර ගෙන යනවා.

**වීරසිංහ මල්ලිමාරච්චි මහතා (කොළඹ දිසා ඇමතිතුමා)**
*(திரு. வீரசிங்ஹ மல்லிமாரச்சி—கொழும்பு மாவட்ட அமைச்சர்)*
(Mr. Weerasinghe Mallimaratchi—District Minister, Colombo)
ඒකෙ සභාපති කවුද? නම කියන්න.

**එම්. එස්. අමරසිරි මහතා**
*(திரு. எம். எஸ். அமரசிறி)*
(Mr. M. S. Amarasiri)
මම දන්නා පමණින් ධනපාල වීරසේකර මහත්මයා.

ඉහළ හෝමදොළ ජනාවාස සමුපකාර සමිතියෙන් රු. 5,66,000 යි. සභාපති, හිටපු මන්ත්‍රී හෙන්රි දිසානායක මහතා.

මෙන්න මේ පිඩියට සමුපකාරවල අඩුපාඩු අය කර ගැනීම සඳහා, තීරක විභාග 6,000 ක් ඇති කිරීමට සමුපකාර කොමසාරිස්තුමා සමත් වී තිබෙනවා. මේ 6,000න් 4,000 ක් සඳහා තීරකවරුන් පත් කළා. මේ 4,000 න් 2,761 ක ප්‍රදානය ලබා තිබෙනවා. රු. 95,00,000 ක්. දැන් මේ මුදල අය කර ගන්නට පුළුවන්. දැන් මේ කාලය තුළ සෑහෙන මුදලක් අය කර ගෙන තිබෙනවා. සෑහෙන මුදලක් අය කර ගැනීමට සමුපකාර කොමසාරිස්තුමාත් එතුමාගේ දෙපාර්තමේන්තුවත් ක්‍රියා කර තිබෙනවා.

මෙහි දී එක කාරණයක් කිවයුතුව තිබෙනවා. බොහොම දුෂ්කරතාවන් ඇති වී තිබෙනවා. පොත් පත් ලියවා නැති සමුපකාර තිබෙනවා. අන්න ඒ නිසා සමුපකාර ඇමතිතුමා පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවෙන් මේ කාරණ පිරික්සීම විශේෂ කමිටුවක් පත් කළා. ඒ කමිටුව පාර්ලිමේන්තු විශේෂ කමිටු බලතල යටතේ ඒ නිලධාරීන් ගෙන්වා පොත් පත් ලියවන්නට ක්‍රියා කර තිබෙනවා. මේ අනුව ඉදිරි මාස කීපය තුළ තවදුරටත් මෙවැනි පරීක්ෂණ රාශියක් අවසාන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. එස්. අමරසිරි මහතා]
කිරීමට පුළුවන්කම ඇති වෙනවා. [බාධා කිරීමක්] ලස්සනාගම විවිධසේවා සමුපකාර සමිතියේ සභාපති, ධනපාල වීරසේකර මහත්මයා. මුදල හැර ලක්ෂයකට අධික ප්‍රමාණයක්.

මේ ජනාවාස සමුපකාර සමිතිවල මීට වඩා පාඩු සිදු වී තිබෙනවා. එයට හේතුව විශේෂයෙන්ම පාලනය වෙනස් වන විට කලින් පාලනය කළ අයගෙන් එහි බඩු මුට්ටු ආදිය ගණන් බලා බාර නොගැනීමයි. ඒ කරුණු නිසා විශාල නාස්තියක්, අපතයක් සිද්ධ වෙලා තිබෙනවා. තවත් කාරණයක් තිබෙනවා, පනතේ. ඒ පරීක්ෂණ පැවැත්වීමට සමුපකාර දෙපාර්තමේන්තුවට බලයක් නැහැ. මා ඉල්ලා සිටිනවා කෘෂිකර්ම නියෝජ්‍ය ඇමතිතුමාගෙනුත්, මේ ගැන එතුමාගේ උපදේශක සභාවත් සමඟ සාකච්ඡා කර ජනාවාස පනත අනුව ඒ පරීක්ෂණවලට කිසියම් බලයක් තිබෙනවා නම්. ඒ බලතල උඩ මේ ගැන වැඩි දුර සොයා බලන්නය කියා.

මේ අවස්ථාවේදී මා විශේෂයෙන්ම කියා සිටින්නේ ඒ ජනාවාස සමුපකාර සමිතිවල තිබෙන අඩුපාඩුකම් සමුපකාර කොමිෂන් සභාව භාර ගත් නිසා, ඒ සමුපකාරවල වත්කම් හා බැරකම්, එමගින් පිළිවිය යුතුව තිබෙන නිසයි. තවත් සමුපකාර සමිති රාශියක් තිබෙනවා. ඒවායේ පොත් පත් ලියා නැති නිසා ඒවායේ කටයුතු කරගෙන යාමට සමුපකාර ඇමතිතුමා කටයුතු කර තිබෙනවා, සමුපකාර දෙපාර්තමේන්තුව මගින්.

මෙන්න මේ කරුණුවලින් අපට පෙනී යන කාරණයක් තිබෙනවා. අද මේ සභාවේ කියැවුණු කතා අනුව. සමුපකාර සමිතිවලට මුදල් අතින් අමාරුයි. මේ නාස්ති කළ මුදල්—හොරකම් කළ මුදල්—ලබා ගන්න ක්‍රමයක් තිබෙනවා නම්, බොහෝ දුරට එය සමුපකාර ව්‍යාපාරයට ප්‍රයෝජනවත් වෙනවා. එම නිසා ඒ කටයුතු කරගෙන යාමට ගරු ඇමතිතුමාත්, නියෝජ්‍ය ඇමතිතුමාත් ගන්නා මහන්සිය ගැන අපි සතුටු වෙනවා.

ඒ වාගේම සමුපකාර ව්‍යාපාරයේ විශේෂ ලක්ෂණයක්ව තිබුණේ, සභාපතිවරුන් තෝරා පත් කර ගැනීම. නමුත් අවුරුදු ගණනක් ඒ තෝරා පත් කර ගැනීම නැති කර දමා, මන්ත්‍රීවරුන්ගේ නියමයන් අනුව පත් කිරීම් කළා. දැන් ඒ තත්ත්වය නැති කරලා. සමුපකාර ව්‍යාපාරයේ සභාපතිවරුන්ගෙන් සියයට 90ක්ම තෝරා පත් කර ගැනීමට ගරු ඇමතිතුමා දැන් අවස්ථාව සලසා දී තිබෙනවා. මහජන ව්‍යාපාරයක් හැටියට තිබුණු මේ ව්‍යාපාරය නැවත ගොඩ ගැනීමට එතුමා බලවත් උත්සාහයක් දරනවා. අපි කවුරුත් ඒකට උපකාර කරන්න ඕනෑ. බොහොම අමාරු කාර්යයක් එතුමාට භාර වී තිබෙන්නේ. අපට බොහොම ලේසියි. විවේචනය කරන්න. නමුත් ඕනෑම අවස්ථාවක රටේ ආහාර බෙදා හැරීමේ යම්කිසි අඩුපාඩුවක් වුණා නම් සමුපකාර ව්‍යාපාරය තමයි ඉදිරියට ආවේ. බෙදා හැරීමේ මධ්‍යස්ථාන 8,000 ක් පමණ තිබෙනවා. කෙසේ හෝ ඒවායින් සියයට 70 කින් මහජනතාවට හොඳට සේවය කෙරුණා. අඩුපාඩුකම් තිබෙන නමුත් මීට වඩා හොඳ බෙදා හැරීමේ මාර්ගයක් දියුණු වෙගෙන එන රටවල—තුන්වන ලෝකයේම—සමුපකාර ව්‍යාපාරය හැර නැහැ. එනිසා මේ උතුම් ව්‍යාපාරය ආරක්ෂා කර ගෙන ඒ කටයුතුවලට අපේ සහයෝගය දක්වලා මහජන ව්‍යාපාරයක් හැටියට කර ගෙන යන්නට ඕනෑ.

ඇතැම් විට අපි බොහෝ දෙනෙක් කල්පනා කරනවා සමුපකාර ව්‍යාපාරය රජයේ ව්‍යාපාරයක් ය කියා. එය රජයේ ව්‍යාපාරයක් නොවෙයි සමුපකාර සමිති අයිති සමාජිකයින්ටයි. මේ රටේ සිටින විසි ලක්ෂයක් සාමාජිකයන්ටයි එය අයිති. ඒ අයිතිය රැක ගන්න ඕනෑ. ඒ අයගේ අයිතිය රජය විසින් පැහැර ගන්නට නරකයි. පසුගිය රජය කාලයේ ඒ අයිතිය පැහැර ගෙන, තම තමන්ට හිතවත් අය ඒවාට පත් කරගෙන, ඒවා විනාශ කර දැම්මා; නාස්තිකර දැම්මා. නීතිවල දුර්වලකම් නිසා— සාමාන්‍ය අවංක ජනතාවගේ ආනට දෙන්න හැකි නීති නිසා—1970—77 කාලයේ බලවත් වැරදි කළ පුද්ගලයන්ට ඒවා ගැළ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පෙන්නෙ නැහැ. ඒවාට තිබෙන්න ඕනෑ තද නීති. නමුත් සමුපකාර ව්‍යාපාරය මධ්‍යස්ථ මතධාරීන්ගෙන් යුත් ව්‍යාපාරයක් නිසා නීති රීති ප්‍රජාතන්ත්‍රවාදීවයි තිතරම සකස් වී තිබෙන්නේ.

එවැනි උතුම් ව්‍යාපාරයක් ආරක්ෂා කරගෙන අපි කවුරුත් ගරු ඇමතිතුමාටත්, නියෝජ්‍ය ඇමතිතුමාටත්, සමුපකාර කොමසාරිස්තුමාටත්, නිලධාරීන්ටත් සහයෝගය දී මේ ව්‍යාපාරය රැක ගෙන පාරිභෝගික භාණ්ඩ පුළුවන් තරම් ක්‍රමවත්ව බෙදීමට උපකාර කළ යුතු අවස්ථාව එළඹ තිබෙනවා.

මා විශ්වාස කරනවා, නව අවුරුදු තුන හතරක් මේ තත්ත්වය රැක ගෙන ගියොත්, සමුපකාර ව්‍යාපාරයේ නැති වී ගිය තත්ත්වය නැවත ගොඩනගන්නට පුළුවන් වෙනවාය කියා. එහෙම නැතුව නම් අවුරුදු දෙක—තුනකින් 1970—77 කාලය තුළදී සමුපකාරයට කළ විනාශයෙන් සමුපකාරය ගොඩගන්නට, ප්‍රතිසංවිධානය කරන්නට, යථා තත්ත්වයට පත් කරන්නට කොහොමවත් පුළුවන්කමක් ඇති වෙන්නෙ නැහැ. සමුපකාරයේ ප්‍රතිසංවිධානය ගැන සලකා බැලීම සඳහා ස්වදේශ කටයුතු භාර ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කළා. මේ කමිටුවෙ මාතර දිසා ඇමතිතුමාත් මහා මාර්ග නියෝජ්‍ය ඇමතිතුමාත් සේවය කළා. මේ අයත් තවත් මන්ත්‍රීතුමන්ලා කීප දෙනෙකුත් එකතු වී ලංකාව පුරාම ගිහින් සමුපකාරය ප්‍රතිසංවිධානය කිරීම සම්බන්ධව මහජනතාවගෙන් විමසුවා. ඒ පිළිබඳ වාර්තාව දැන් පිට කර තිබෙනවා. එම වාර්තාවේ ඇතැම් කරුණු දැන් ක්‍රියාත්මක කර තිබෙනව. එපමණක් නොවෙයි, සමුපකාර ව්‍යාපාරය ගැන දැනුමක් ඇති බුද්ධිමතුන්ගෙන් යුත් උපදේශක සභාවකින් එතුමා උපදෙස් ලබා ගන්නව, සමුපකාර ව්‍යාපාරය ප්‍රතිසංවිධානය කිරීම සඳහා; දියුණු කිරීමේ කටයුතු සඳහා. ඊට අමතරව තවත් උපදේශක කාරක සභාවක් පත් කර තිබෙනව. මාසයකට වරක් නොවරදවාම මෙය රැස් වෙනවා. ලේකම්තුමාට ස්තුතිවන්ත වෙනවා, මෙම උපදේශක සභාවල රැස්කර විශේෂයෙන්ම විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීතුමන්ලාගේ අදහස් ද ලබා ගෙන සමුපකාර ව්‍යාපාරය දියුණු කිරීමට ගන්නා උත්සාහයට. එම නිසා ඇමතිතුමාත්, නියෝජ්‍ය ඇමතිතුමාත්, ඒ නිලධාරි මණ්ඩලයත් ගන්නා උත්සාහයට අපේ ප්‍රශංසාව පළ කරමින් සමුපකාර ව්‍යාපාරය දියුණුවෙන් දියුණුවට පත් කරන හැටියට ඉල්ලා සිටිමින් මගේ කතාව මෙයින් අවසන් කරනවා.

**ආර්. පී. විජේසිරි මහතා**
*(திரு. ஆர். பீ. விஜேசிறி)*
**(Mr. R. P. Wijesiri)**

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම විශේෂයෙන්ම තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙනවා, මේ අවස්ථාව මට ලබා දීම ගැන.

**වීරසිංහ මල්ලිමාරච්චි මහතා (කොළඹ දිසා ඇමතිතුමා)**
*(திரு. வீரசிங்ஹ மல்லிமாரச்சி—கொழும்பு மாவட்ட அமைச்சர்)*
**(Mr. Weerasinghe Mallimaratchi—District Minister, Colombo)**

කරුණු පැහැදිලි කර ගැනීමකට ප්‍රශ්නයක් අහන්න තිබෙනව. අද ප්‍රවෘත්ති පත්‍රවල තිබෙනව මේ මන්ත්‍රීතුමා ඇතුළු දහහත් දෙනෙක් ශ්‍රී ලංකා නිදහස පක්ෂයෙන් නෙරපා හැරියාය කියල. එහෙම නම් මේ මන්ත්‍රීතුමා මොන පක්ෂය වෙනුවෙන් කතා කරනවාද කියල දැනගන්න කැමතියි.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
*(குழு உப தலைவர் அவர்கள்)*
**(Mr. Deputy Chairman of Committees)**

දිසා ඇමතිතුමා අහන්නෙ රීති ප්‍රශ්නයක් ද? නීති ප්‍රශ්නයක් ද?

**වීරසිංහ මල්ලිමාරච්චි මහතා**
*(திரு. வீரசிங்ஹ மல்லிமாரச்சி)*
**(Mr. Weerasinghe Mallimaratchchi)**

මට කරුණු පැහැදිලි කර ගැනීමටයි අවශ්‍ය, මේ මන්ත්‍රීතුමා මොන පක්ෂයෙන් කතා කරනවාද කියා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ආර්. පී. විජේසිරි මහතා**
*(திரு. ஆர். பீ. விஜேசிறி)*
(Mr. R. P. Wijesiri)

මම පැහැදිලි කර දෙන්නම්, අපේ නියෝජ්‍ය සභාපතිතුමා මට අවස්ථාව දෙනවා නම්.

ඇත්තවශයෙන්ම මේ වගේ සිද්ධි ඉතිහාසයේ ඇති වී තිබෙනවා. චියැං කායි ෂෙක් චීනයෙන් තායිවාන්යට ගිහින් චීනයේ මාවෝසේතුං අස් කළාය කියා ප්‍රකාශ කළා. ඒ වාගේ තමයි, මේකත්. "මේ කන්දත් මගේ තමයි, ඒ කන්දත් මගේ තමයි, කඳු යායම මගේ තමයි, රජ්ජුරුවෝ මමයි මගේ රාජ්ජේ" කියල කට යුතු කළා වගෙයි, මේ. අපි 1981 ජුනි මාසයේ 28 වනදා ව්‍යවස්ථා සම්මත කර ගත්තා. නමුත් මේ ව්‍යවස්ථාවට පටහැනිව අගෝස්තු මාසයේ 2 වන දා අපෙන් කඩා ගෙන ගිය කණ්ඩායමක් තමයි, අපිව අස් කරන්න මේ උත්සාහ ගන්නේ. මේ විශේෂ නියෝග දෙක උදව්යට මම කියනවා, මොළයෙ තිබෙන අමාරුව මගහරවා ගන්න ඉසකුඩිච්චියක් දමා ගත්තොත් හොඳ බව. ඒක විගෙ අයගෙන් මතක් කරන්න ඕනෑ.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
*(குழு உப தவிசாளர் அவர்கள்)*
(Mr. Deputy Chairman of Committees)

මන්ත්‍රීතුමා, ඕව මේකට අදාළ නැහැ.

**ආර්. පී. විජේසිරි මහතා**
*(திரு. ஆர். பீ. விஜேசிறி)*
(Mr. R. P. Wijesiri)

ගරු නියෝජ්‍ය සභාපති තුමනි, මගේ කතාව ආරම්භ කරන්න පෙර මේ අවුරුද්දෙ ජූලි 7 වනදා මේ ගරු සභාව තුළදී මම ඇසූ ප්‍රශ්නයකට නියෝජ්‍ය ඇමති තුමා දුන් පිළිතුර සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමට මම අදහස් කරනවා. මම අහපු ප්‍රශ්නය මේකයි. "කොළඹ දිස්ත්‍රික්කයේ සුළු ලොරි හිමියන්ගේ සමූපකාර සමිතියට අයත් 27 ශ්‍රී 954 දරණ වැන් රථය 1981. 02. 28 වෙනි දින තිස්සමහාරාම යකඩ ඇලම අසලදී රිය අනතුරකට භාජනය වූ බවට, එම සමිතියේ සේවක සිණ් විසින් 1981. 03.03 වෙනි දිනදී සමූපකාර කොමසාරිස්වරයාට පෙත්සමක් එවා ඇති බවත්......" යන මේ විධියට මම ප්‍රශ්නය අසා තිබෙනවා. මම ප්‍රශ්නය සම්පූර්ණයෙන්ම කියවන්නේ නැහැ. ඊකට උත්තර දුන්න නියෝජ්‍ය ඇමතිතුමා කියා තිබෙනවා, "පොලිස් වාර්තාව ලැබෙන තෙක් කිව නොහැක" කියා. එහෙම නම් තවම පොලිස් වාර්තාව ලැබුණේ නැද්ද කියා අහන්න කැමතියි. මට එදා දුන් උත්තරය බොහෙම නමතා ඇති නිසයි මම අද අහන්නේ.

**සරත්චන්ද්‍ර රාජකරුණා මහතා (ආහාර හා සමූපකාර නියෝජ්‍ය ඇමතිතුමා)**
*(திரு. சரச்சந்திர ராஜகருணா—உணவு, கூட்டுறவு பிரதி அமைச்சர்)*
(Mr. Sarathchandra Rajakaruna—Deputy Minister of Food & Co-operative)

මේ සම්බන්ධයෙන් පොලිසියට කරුණු හරිහැටි පැහැදිලි කර ගන්න බැරි වී තිබෙනවා. මේක හැප්පුණේ කොහේද කියල. මේ සම්බන්ධයෙන් පොලීසිය පරීක්ෂණයක් කර ගෙන යනවා. එම පරීක්ෂණ වාර්තාව ලැබීමෙන් පසු නීති මගින් කටයුතු කරනවා.

**ආර්. පී. විජේසිරි මහතා**
*(திரு. ஆர். பீ. விஜேசிறி)*
(Mr. R. P. Wijesiri)

මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයා ඩබ්ලිව්. වනිගසූරිය මහතාට යවා ඇති ලිපියක් මම දැන් තමුන්නාන්සේගෙ දැනගැනීම සඳහා කියවන්න කැමතියි.

"Mr. W. Wanigasooriya,
5, Galpotta Street,
Kotahena,
Colombo 13.

Dear Sir,

Vehicle No. 27 Sri 954

We thank you for the information passed on to us regarding the accident to the above vehicle.

Our preliminary investigations indicate that all the damage alleged to have been caused to the above vehicle could not have occurred as a result of an accident on the Angoda-Avissawella Road as claimed by the owner of the vehicle.

This letter is issued without prejudice."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මේ වාහනයට වෙච්ච සිද්ධිය සොයා බලනව නම්, සොයා බලන්න හොඳටම කල් ඇති, නියෝජ්‍ය ඇමතිතුමනි, මේවා යටපත් කිරීම්මත් තමයි, මීට වඩා ලොකු දේවල් ඇති වෙන්නෙ. සුළු දළු ලියලනා කොටම ඒකෙ ඉන්න පණුවා මරා දමන්නේ නැත්නම් මුළු ගහටම රෝගය බෝ වෙනව. දැන් ඒ වගේ දෙයක් තමයි, වෙලා තියෙන්නෙ.

**සරත්චන්ද්‍ර රාජකරුණා මහතා**
*(திரு. சரத்சந்திர ராஜகருணா)*
**(Mr. Sarathchandra Rajakaruna)**

මේක යටපත් කරන්න, මගේ ඥාතියෙක්වත්, මගේ සහෝදරයෙක්වත් නොවෙයි, ඒ සමිතියේ සභාපතිතුමා.

**ආර්. පී. විජේසිරි මහතා**
*(திரு. ஆர். பி. விஜேசிறி)*
**(Mr. R. P. Wijesiri)**

නැහැ. ඕක ඥාතියෙකුට සහෝදර යෙකුට කරන එකක් නොවෙයි.

**සරත්චන්ද්‍ර රාජකරුණා මහතා**
*(திரு. சரத்சந்திர ராஜகருணா)*
**(Mr. Sarathchandra Rajakaruna)**

පොලිසිය මාර්ගයෙන් පරීක්ෂණයක් කරවනව මිසක නියෝජ්‍ය ඇමතිවරයා වශයෙන් මට ගිහින් පරීක්ෂණ පවත් වන්න විධියක් නැහැ.

**ආර්. පී. විජේසිරි මහතා**
*(திரு. ஆர். பி. விஜேசிறி)*
**(Mr. R. P. Wijesiri)**

මේ ස්ථානයට ඇවිල්ල පිළිතුරු දෙන්නෙ නියෝජ්‍ය ඇමතිතුමායි. මම චෝදනා ඉදිරිපත් කරන්නේ කොමසාරිස්තුමාටයි. සමූපකාර සංවර්ධන කොමසාරිස්තුමාට චෝදනා පත්‍ර රාශියක් ඉදිරිපත් කරන්නටයි, මම සූදානම් වෙන්නේ. ඒ නිසා මම විශේෂයෙන් මගේ හාරිස්පත්තුව ආසනයේ කටයුතු ගැන කථා කරන්න ඕනෑ.

හාරිස්පත්තුව ආසනයේ සමිති දෙකක් තියෙනවා. හාරිස්පත්තුව උතුර සමිතිය අලවතුගොඩ එකක්. හාරිස්පත්තුව දකුණ සමිතිය, හැදෙනිය අනික. අලවතුගොඩ සමිතියේ, මෑතකදී කර තිබෙන පරීක්ෂණ අනුව පෙනී ගොස් තිබෙනවා, එහි රුපියල් දහ ලක්ෂයකට අධික වංචාවක් සිදු වී තිබෙන බව. ඒ සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිතුමා මේ පරීක්ෂණය ලබා ගන්න විශාල මහන්සියක් දැරුවා. ඒ සභාපති මහත්මයා මගේ හිතවතෙක් නොවෙයි, මගේ ඥාතියෙක් වුණාට, තමුන්නාන්සේලාගේ විදේශ ඇමතිතුමාගෙ හිතවතෙක්; පාක්ෂිකයෙක්. මේ පරීක්ෂණ යට ගහන්ට උත්සාහ ගත් අවස්ථාවේ ඒ මහත්මයා තමයි, විශාල මහන්සියක් දරල ඇමතිතුමාට පැමිණිලි කරල, ඒක මතු කරල අරගෙන එළිදරව් කරන්ට ක්‍රියා කළේ. ඒ කරුණු එළිදරව් වීමත් එක්කම මම චෝදනා කරන්නෙ සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවටයි. මේ වගකීම සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව භාරගත යුතුයි.

මම සොයා බැලුවාම මට දැන ගන්න ලැබුණා, මේක එක අවුරුද්දක [illegible] නෙවෙයි අවුරුදු තුන—හතරක තිස්සේ දිගටම ඇවිත් තිබෙන වංචාවක් බව. අහල තියෙන්නෙ සමූපකාර දෙපාර්තමේන්තුවේ පරීක්ෂක මහත්වරු අවුරුදු පතා එකම ස්ථානයක පරීක්ෂණවලට යන්නෙ නැහැ කියන එකයි. ඒ වුණත් මේ ස්ථානයේ අවුරුදු දෙක—තුනක්ම දිගටම පරීක්ෂණ පවත්වල තියෙන්නෙ එකම පරීක්ෂක කණ්ඩායමක්. ඒ අයගේ සහයෝගයත් ඇතිව මේ වැඩේ සිදු වෙලා තිබෙන බවයි, මට දැන ගන්න ලැබී තිබෙන්නෙ. ඒ නිසා, මම ඇමතිතුමාට නොවෙයි මේ චෝදනාව කරන්නෙ. සමූපකාර දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා හැටියට කොමසාරිස්තුමාටයි මම මේ චෝදනාව කරන්නෙ.

කොහොම හරි පරීක්ෂණයෙන් පසුව කීප දෙනෙකුගේ වැඩ තහනම් කළා. ඉන් පසු ඒ වැඩ නතර වෙලා. සභාපතිතුමා මහන්සි අරන් කටයුතු කරලා වංචාව සොයා ගැනීමෙන් පසු, එතුමා මහ සභාව කැඳවලා; මුදල් නැති බව ඒ අයට අන්වල බඩු බෙදන්න විධියක් නැති නිසා ණය මුදලක් අනුමත කරවා ගන්න මහ සභාවේ අනුමැතිය ඉල්ලා සිටි වෙලාවේදී, අනුමැතිය දෙන්න එපා යයි දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සාමාජිකයන්ට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. පී. විජේසිරි මහතා]

බලපෑම් කර තිබෙනව. අනුමැතිය ලැබුණේ නැහැ. සභාපති මහත්මයා ඉවත් වුණා. දැන් දෙපාර්තමේන්තුවේ මහත්මයෙක් ඒ ස්ථානයේ සභාපති හැටියට කටයුතු කරනව. දැන් ණය මුදලක් ලබා ගැනීමට අනුමැතිය ලබාගෙන තිබෙනව, මහ සභාවෙන්. ඒ නිසා, මා මුලින් කිව්ව විධියට හිටපු සභාපතිවරයාගේ විශාල මහන්සියේ ප්‍රතිඵලයක් වශයෙන් කරන ලද පරීක්ෂණයෙන් පසු හෙළිදරව් වුණු රුපියල් ලක්ෂ 10 ඉක්මවා යන වැඩි ඒ වංචාවත්, ඒ සම්බන්ධයෙන් කීප දෙනෙකුගේ වැඩ තහනම් කිරීමෙන් යටපත් වෙයි කියන සැකයක් මා තුළ තිබෙනව. එය යටපත් වෙන්න ඉඩ නොදී පරීක්ෂණය සාධාරණ විධියට කරන්න කියා මම ඉල්ලා සිටිනව.

හාරිස්පත්තුව දකුණ හැදෙනිය සමිතියත් දැන් ලකුණු පහළ වැටෙගෙන යනව, අලවතුගොඩ සමිතියේ වගේම. දැන් පණ ඇද—ඇද. බොහොම අමාරුවෙන් තමයි හුස්ම ගන්නෙ. තිබුණ මුදල් විනාශ කරල; දැන් ඒකෙ තත්ත්වයත් ඉතාම අසාධ්‍යයි. මම ගරු විදේශ ඇමතිතුමාටත් කිව්ව, මේක කඩා වැටෙන්න ඉස්සර මොනව හරි කරන්න කියල. දෙපාර්තමේන්තුවට භාරගෙන යම් වෙනස් ක්‍රමයකින් හරි මේ සමිතියට යම්කිසි පිළියමක් යොදන්න ඕනෑ මොකද? මෙතැන් සැහෙන්න දූෂණ කෙරෙනව. මේ අධ්‍යක්ෂ මණ්ඩලය තමයි වංචා කරන්නේ. "අපට ලාභ ගන්නත් පුළුවන්, ලාභ පෙන්වන්නත් පුළුවන්, නමුත් සමිතිය අහිමි විධියට මුදල් වියදම් කරනවා, අපේ රු. 70 දෙන්නේත් නැහැ. නමුත් මේ උදවිය විශාල ප්‍රමාණයෙන් මුදල් නාස්ති කරනව" යයි සේවකයෝ කියනව. සැපයීම් අනුකමිටුවක් තිබෙනවා, ඒකේ සභාපති අධ්‍යක්ෂ කෙනෙක්. සභාපති මහත්මයා බඩු සපයනවා. මම කියන්නම් විස්තරේ.

සුළු අපනයන බෝග වර්ග. බී.බී. සිරිසේන මහත්මයා අධ්‍යක්ෂක. 81.9.23 වැනි දින ගම්මිරිස් කිලෝ ග්‍රෑම් 200 ක් හා සාදික්කා කිලෝ ග්‍රෑම් 100 ක් කොළඹ අලෙවි සංගමයට සමිතිය මඟින් අලෙවි කර ඇත. මෙම තොග සමිතියේ 24 ශ්‍රී 8450 දරන වාහනයෙන් ගෙනගොස් ඇති අතර වාහනයට කිසිම මුදලක් සටහන් කර නැත. මෙම බඩු තොගය ඔහුගේ බඩු වන අතර ඔහු විසින්ම සමිතියේ වාහනයක් ගෙන ගොස් අලෙවි කර එම චෙක් පත දී සමිතියෙන් මුදල් ලබාගෙන ඇත. මෙම සුළු අපනයන බෝග අංශය ආරම්භ කර ඇත්තේ මෙම අයගේ පෞද්ගලික ප්‍රයෝජනය සඳහා බව පෙනේ. බඩුවල තත්ත්වය හොඳ බවට තීර්දේශ කරන්නේත් මිල නියම කරන්නේත ඔහුමය. බඩු සපයන්නේත් ඔහුමය. එබැවින් මෙම සුළු අපනයන බෝග අංශය ඇත්ත වශයෙන්ම සමිතියට පාඩුවකි.

මේ කෝ ලස්සනම එක, මේ බී. බී. සිරිසේන තමයි අධ්‍යක්ෂක. එයා බඩු සපයන්නේ එල්. එස්. දොඩනතැන්න, දොඩන්තැන්නගේ සිරිසේන නමින්. බී. බී. සිරිසේන අධ්‍යක්ෂක තනතුර දරනවා. සභාපතිමයි බඩු සපයන්නේ. සේවකයන් ඉදිරියේ දොඩන්තැන්න කියලා අත්සන් කරන්නේ, බී. බී. සිරිසේන තමයි. සාක්ෂි ඇතිව මේක බලා ගන්න පුළුවනි. හොඳ ලස්සණ වැඩ කෙරෙනවා.

පසුගිය කාලයේ දී වැසිකිළි පෝච්චි හිඟයක් තිබුණා. ග්‍රාමසේවක කොට්ඨාසවට තමයි ඒවා දෙන්න නියම කර තිබුණේ. නමුත් නාන්සේලා හැමදාම කිව්වා වගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුව කාලයේදී වාගේම හිස් පෝච්චියටත් පර්මිට් එක ඕනෑ ග්‍රාම සේවකගෙන්. පර්මිට් එකට දෙන්න නියම කර තිබෙන්නේ. මේවා අලෙවි වෙන්නේ නැහැ, විකිණෙන්නේ නැහැ කියලා, කටුගස්තොට යකඩ බඩු කඩයකට දුන්නා. රු. 165 ගණනේ මෙහේ විකුණන එක රු. 265 ගණනේ ගන්න හාරිස්පත්තුවේ ජනතාවට සිදු වුණා. සැහෙන දුරට මේ සමිතියට මුදල් නැහැ කියනවා. නමුත්, පරීක්ෂණ වලට පෙනී සිටියාය කියලා විශාල වශයෙන් මුදල් අය කර ගන්නව. නිතර, නිතර රැස්වීම් පැවැත්තුවාය කියලා මුදල් අය කර ගන්නවා. මේ වාගේ අක්‍රමිකතා රාශියක් තියෙනවා. විදේශ කටයුතු භාර ඇමතිතුමාටත් මේ ගැන ගරු ඇමතිතුමාට මතක් කරන්න ඇති. මේවා ගැන සොයා බලා මේ සමිතිය කඩා වැටෙන්නට නොදී ආරක්ෂා කරන ලෙස මම ගරු ඇමතිතුමාගෙන් විශේෂයෙන් ඉල්ලා සිටිනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මම සමුපකාර කොමසාරිස්තුමාට චෝදනා කරන බව කිව්වා. ගරු ඇමති තුමනි, මම තමුන්නාන්සේට මතක් කරන්න කැමතියි, අම්පාරේ විවිධ සේවා සමුපකාර සමිතියේ උක්ගස් ණයක් ගැන. මේ ගැන 46(1) වගන්තිය යටතේ පරීක්ෂණයක් පැවැත්තුවා. නමුත් ඒ වාර්තාව තමුන්නාන්සේලාට දකින්න ලැබුණේ නැහැ. ඒක හංගලා. ඒකේ පිටපතක් මා ළඟ තිබෙනවා. ඒ පරීක්ෂණ වාර්තාව කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කර, කැබිනට් මණ්ඩලය නියෝගයක් දුන්නා, මේ සභාපති අස් කරන්න. මේ ඔක්කොම කියවන්න වෙලාවක් නැහැ. ඒ නිසා මම මේක සභාගත කරන්නම්. මේ පුද්ගලයා අස් කර, වෙනත් කිසිම රජයේ ආයතනයකට මොනම එකකටවත් ගන්න එපාය, ඔහුට අවස්ථාවක් දෙන්න එපාය, කියා කැබිනට් මණ්ඩලය නියෝග කර තිබෙනවා. මේ පුද්ගලයා පවුලේ පස් දෙනකුට උක් වගා ණය අරන් දී තිබෙනවා. දහ දාහ බැගින් පස් දෙනකුට, ඒ. පී. පී. චන්ද්‍රදාස, යුනියන් පෙදෙස, ඒ. පී. ඩී. චන්ද්‍රලතා, ඒ. පී. පී. ධම්මිකා, ඒ. පී. පී. ඩැනීපාල. එස්. එච්. ලුසිනෝනා මේ පස්දෙනායි. ඒ පස් දෙනෙකුටම දීලා තිබෙනවා. මෙන්ම ඇමතිතුමනි, ' කැබිනට් තීරණය ක්‍රියාත්මක කිරීම " යටතේ කියා තිබෙන දේ :

"1979.02.14 දින කැබිනට් තීරණයේ පිටපතක් අමුණා ඇත. ණයකරුවන් විසින් වංචනිකව ලබා ගත් ණය නැවත සමිති මඟින් අය කිරීම. සමිතියේ ණය නිකුත් කරන ලද අධ්‍යක්ෂ මණ්ඩලය එම තනතුරුවලින් ඉවත් කිරීම සහ, මින් ඉදිරියට කිසිම සමුපකාර සමිතියක අධ්‍යක්ෂ මණ්ඩලයක් සඳහා හෝ වෙනත් තනතුරකට නම් නොකිරීම."

මේ විධියේ කොන්දේසි රාශියක් දමා නියෝග කළා. නමුත් 46(1) වාර්තාව යට පනු කරල. පසුගිය නගරසභා මැතිවරණයේදී මේ චන්ද්‍රදාස මහත්මයා එක්සත් ජාතික පක්ෂයේ ලැයිස්තුවේ පළමු වෙනියා හැටියට නම් කර තිබුණා. ඒ නිසා අද නගරාධිපති. නමුත් කැබිනට් තීරණයේ තිබෙන්නේ කොහොමද ?

**පී. දයාරත්න මහතා (අම්පාර දිසා ඇමතිතුමා සහ නියෝජ්‍ය විදුලිබල හා බල ශක්ති ඇමතිතුමා)**
(திரு. பி. தயாரத்ன—பிரதி மின்சக்தி, எரிபொருள் அமைச்சர்)
**(Mr. P. Dayaratne—District Minister, Amparai and Deputy Minister of Power & Energy)**

මන්ත්‍රීතුමනි, සම්පූර්ණ මුදල ඒ මහත්මයා ගෙවා තිබෙනවා. ඒ සැම කෙනෙක්ම උසාවියට කැඳෙව්වා.

**ආර්. පී. විජේසිරි මහතා**
(திரு. ஆர். பீ. விஜேசிறி)
**(Mr. R. P. Wijesiri)**

ඊට පස්සෙ ගෙවන්න ඇති. නගරාධිපති වුණාට පස්සෙද මම දන්නේ නැහැ. නමුත් නියම කළ වෙලාවෙ, කැබිනට් තීරණය දුන් වෙලාවෙ දිස්ත්‍රික් ඇමතිතුමනි, ගෙවා තිබුණෙ නැහැ. කෘෂිකර්ම සංවර්ධන අධිකාරියේ නිලධාරී මහත්මයෙකුත්, මහජන බැංකුවේ නිලධාරියකුත් ඇතුළු, ඒ වාගේ නිලධාරීන් පස් දෙනෙක් එකතු වී පරීක්ෂණයක් පවත්වා කැබිනට් මණ්ඩලයට වාර්තා කළා. ඒ අවස්ථාවෙදි ගෙවීමක් ගැන සඳහන් වී තිබුණෙ නැහැ. ඊට පස්සෙ ගෙවන්න ඇති.

**පී. දයාරත්න මහතා**
(திரு. பி. தயாரத்ன)
**(Mr. P. Dayaratne)**

ඒ පස් දෙනා පමණක් නොවෙයි, තව දහස් ගණනක් ණය අරගෙන තිබුණා. ඒ සැම දෙනෙකුගෙන්ම මුදල් අය කරගෙන තිබෙනවා.

**ආර්. පී. විජේසිරි මහතා**
(திரு. ஆர். பீ. விஜேசிறி)
**(Mr. R. P. Wijesiri)**

අය කරගන්න ඇති. නමුත් මේ තිබෙන්නේ කැබිනට් තීන්දුව. මෙන්න තමුන්නාන්සේට ඕනෑ නම් බලන්න.

**පී. දයාරත්න මහතා**
(திரு. பி. தயாரத்ன)
**(Mr. P. Dayaratne)**

මම දැක්කා. ඒක ක්‍රියාත්මක කර තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ආර්. පී. විජේසිරි මහතා**
*(திரு. ஆர். பீ. விஜேசிறி)*
(Mr. R. P. Wijesiri)

ක්‍රියාත්මක කළා නම් කොහොමද ඔහුට නාගරාධිපතිකම දුන්නෙ?

**පී. දයාරත්න මහතා**
*(திரு. பீ. தயாரத்ன)*
**(Mr. P. Dayaratne)**

නාගරාධිපතිකමට ඉල්ලන්න බැහැ කියා කැබිනට් තීරණය තිබුණාය කියා මම හිතන්නෙ නැහැ.

**ආර්. පී. විජේසිරි මහතා**
*(திரு. ஆர். பீ. விஜேசிறி)*
(Mr. R. P. Wijesiri)

ඒ වෙලාවෙ මුදල් ගෙවා තිබුණෙ නැහැ. හිනා වෙන්නෙ බග් බග් ගාලා.

**මන්ත්‍රීවරයෙක්**
*(அங்கத்தவர் ஒருவர்)*
(A Member)

ප්‍රජා අයිතිවාසිකම් නැති වුණේ නැහැ මැතිණියට වාගේ.

**කේ. ඩී. එම්. සී. බණ්ඩාර මහතා (නියෝජ්‍ය කෘෂිකාර්මික හා පර්යේෂණ පිළිබඳ ඇමතිතුමා)**
*(திரு. கே. டீ. எம். சீ. பண்டார—விவசாய அபிவிருத்தி, ஆராய்ச்சி பிரதி அமைச்சர்)*
(Mr. K. D. M. C. Bandara—Deputy Minister of Agricultural Development & Research)

ඡන්ද නීතිය වෙනස් කරන්න ඕනෑ, පාර්ලිමේන්තුවෙන්. කැබිනට් මණ්ඩලයට බැහැ ඡන්ද නීතිය වෙනස් කරන්න. ඒ සඳහා පාර්ලිමේන්තුවට එන්න ඕනෑ.

**පී. දයාරත්න මහතා**
*(திரு. பீ. தயாரத்ன)*
(Mr. P. Dayaratne)

නගර සභා මැතිවරණයට ඉල්ලන්න එපාය කියා එහෙම තීරණයක් තිබුණේ නැහැ.

**ආර්. පී. විජේසිරි මහතා**
*(திரு. ஆர். பீ. விஜேசிறி)*
**(Mr. R. P. Wijesiri)**

නැහැ, තමුන්නාන්සේලාගේ චාරිත්‍ර ධර්ම පද්ධතියේ නම් තියා නැහැ, එහෙම කරන්න ඕනෑය කියා.

**එස්. බී. හේරත් මහතා**
*(திரு. எஸ். பீ. ஹேரத்)*
**(Mr. S. B. Herath)**

ඒ ණය සම්පූර්ණයෙන්ම ගෙව්වා. තවම සුමාන දෙකක්වත් නැහැ, අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා ඇසූ ප්‍රශ්නයකට පිළිතුරු වශයෙන් ඒ ණය ගත් සියලුම දෙනා පිළිබඳව විස්තර, ඒ ගැන ක්‍රියා මාර්ග, ඒ විශේෂම නඩු තීන්දු සියල්ලම මම පාර්ලිමේන්තුවට තැන්පත් කළා.

**ආර්. පී. විජේසිරි මහතා**
*(திரு. ஆர். பீ. விஜேசிறி)*
(Mr. R. P. Wijesiri)

තමුන්නාන්සේ තැන්පත් කළ නිසා තමයි අපි දකින්න නැත්තේ. සභාගත කළා නම් අපට තියෙන්න තිබුණා.

**එස්. බී. හේරත් මහතා**
*(திரு. எஸ். பீ. ஹேரத்)*
(Mr. S. B. Herath)

ඔව්, සභාගත කළා. එයින් සියයට 95ක් ගෙවා අවසානයි.

**ආර්. පී. විජේසිරි මහතා**
*(திரு. ஆர். பீ. விஜேசிறி)*
(Mr. R. P. Wijesiri)

නමුත් කැබිනට් තීරණය ක්‍රියාත්මක කෙළේ නැහැ.

**එස්. බී. හේරත් මහතා**
*(திரு. எஸ். பீ. ஹேரத்)*
(Mr. S. B. Herath)

කැබිනට් තීරණය තිබෙනවා. නමුත් ඊට පස්සෙ ගෙව්වා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ආර්. පී. විජේසිරි මහතා**
*(திரு. ஆர். பீ. விஜேசிறி)*
**(Mr. R. P. Wijesiri)**

ඔව්, ඒක මම පිළිගන්නවා. කැබිනට් තීන්දුව දෙන කොට ගෙවා තිබුණේ නැහැ. මේ වාගේම උතුරු කොළඹ සමූපකාර සමිතියේත් 46 (1) වගන්තිය යටතේ යම් නියමයන් කළා. ඇයි මේවා ක්‍රියාත්මක කරන්නෙ නැත්තෙ? ඇයි මේවා වසන් කෙළේ? උතුරු කොළඹ සමූපකාර සමිතියේ රු. 1,10,000ක නාඩුවක් තිබුණා. තමුන්නාන්සේ නියම කරනවා, නමුත් ක්‍රියාත්මක වන්නෙ නැහැ.

**එස්. බී. හේරත් මහතා**
*(திரு. எஸ். பீ. ஹேரத்)*
**(Mr. S. B. Herath)**

මේක පමණක් නොවෙයි, 46 (1) වන වගන්තිය අනුව ක්‍රියා කරගෙන ගිය සෑම අවස්ථාවකදීම මගේ සහෝදරයෙක් ගැන වුණත් නාන්නා ගැන වුණත් අපි ඒ විධියට ක්‍රියා කරන බව මල මිනක් කරනවා.

**ආර්. පී. විජේසිරි මහතා**
*(திரு. ஆர். பீ. விஜேசிறி)*
**(Mr. R. P. Wijesiri)**

ඒක නම් මම පිළිගන්නවා, හිරියාලෙ නම් පරීක්ෂණ කළා, අස් කළා. නියෝජ්‍ය ඇමතිතුමාගේ පරීක්ෂණ වාර්තාව කෝ?

**සරත්චන්ද්‍ර රාජකරුණා මහතා**
*(திரு. சரத்சந்திர ராஜகருணா)*
**(Mr. Sarathchandra Rajakaruna)**

මගේ ආසනයේ තිබ්බේ නැහැ පරීක්ෂණයක්.

**ආර්. පී. විජේසිරි මහතා**
*(திரு. ஆர். பீ. விஜேசிறி)*
**(Mr. R. P. Wijesiri)**

ඒක නමයි, නියම කළ එක නොතිබ්බේ ඇයි?

**සරත්චන්ද්‍ර රාජකරුණා මහතා**
*(திரு. சரத்சந்திர ராஜகருணா)*
**(Mr. Sarathchandra Rajakaruna)**

නියම කරන්නෙ එක්කෝ ඇමතිතුමා නැත්නම් නියෝජ්‍ය ඇමති විශයෙන් මම. කවුද නියම කෙළේ? තමුන්නාන්සේට නියම කරන්න බැහැ.

**ආර්. පී. විජේසිරි මහතා**
*(திரு. ஆர். பீ. விஜேசிறி)*
**(Mr. R. P. Wijesiri)**

ඔව්, මම දන්නව මට බැරි බව.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම එකින් එක අහන්නම්. දැන් ඇලහැර විවිධ සේවා සමූපකාර සමිතියේ සාමාන්‍යාධිකාරිතුමාගෙන් තුන් ලක්ෂ ගණනක් එන්න තිබුණා. එතුමාගෙන් රුපියල් තුන් ලක්ෂ ගණනක් එන්න තිබියදී අද කෘෂිකර්ම සංවර්ධන අධිකාරියේ සම්බන්ධීකරන නිලධාරියා හැටියට පත් වී සිටිනවා. අර මුදල් ගෙවලත් නැහැ. මොනවද එනන කර තිබෙන්නෙ?

මොහුට විරුද්ධව සමිතිය විනය පරීක්ෂණ පවත්වා, චෝදනාවලට වැරදිකරු වී තිබියදීත් දේශපාලන බලපෑම් උඩ මොහු සේවයෙන් පහ කළ දිනට මාස කීපයකට පෙර දිනයක් අමා සමිතියෙන් අස් වූ ලෙසට සහතිකයක් දෙන ලදී.

තුන් ලක්ෂ ගණනක මුදලක් තමුන්නාන්සේ ඒවා අය කර ගන්නට කටයුතු කරන්න නැත්තේ මොහු පූර්ණ වාකාර යෙක් නිසාද? එක්සත් ජාතික පක්ෂිකයෙක් නිසාද කියා මම අහන්න කැමතියි.

**එස්. බී. හේරත් මහතා**
*(திரு. எஸ். பீ. ஹேரத்)*
**(Mr. S. B. Herath)**

අය කරගන්න ක්‍රියා කරනවා.

**ආර්. පී. විජේසිරි මහතා**
*(திரு. ஆர். பீ. விஜேசிறி)*
**(Mr. R. P. Wijesiri)**

මම නම් හිතන්නෙ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**වීරසිංහ මල්ලිමාරච්චි මහතා**
*(திரு. வீரசிங்ஹ மல்லிமாரச்சி)*
**(Mr. Weerasinghe Mallimaratchchi)**

නමුන්නාන්සේගේ නියෝජ්‍ය නායකතුමා ගෙවල තිබෙනවාද?

**ආර්. පී. විජේසිරි මහතා**
*(திரு. ஆர். பீ. விஜேசிறி)*
**(Mr. R. P. Wijesiri)**

එතැනට මම එන්නම්.

ඒ වගේම, නාවලපිටිය සමුපකාර සමිතියේ විශාල වශයෙන් දූෂණ සිදු වෙනවා. මම ගරු නියෝජ්‍ය ඇමතිතුමාටත් කිව්වා මේ කාරණය මම හෙළිදරව් කරනවා කියල. මෙහි සිදු වී තිබෙන දූෂණ ගැන කතා කර නවා නම්, ඒ සඳහා මට පැයක්-හමාරක් මදි. ඒ නිසා කෙටියෙන් කථාව කර, සුදුනම් කර තිබෙන කඩදාසි ටික සභාගත කරන්නටයි මම බලාපොරොත්තු වෙන්නෙ. මෙතැන විශාල වශයෙන් අනුමත නොකළ සේවක පිරිසක්—කොමිෂන් සභාවෙන් අනුමත නොකළ සේවකයන් විශාල සංඛ්‍යාවක්—විසින් ලක්ෂ ගණනක මුදල් වංචා කර තිබෙනවා. මම ඒ මුදල් සංඛ්‍යාව පිළිබඳ විස්තරත් සභාගත කරන්නට බලාපොරොත්තු වෙනවා. මේ හැම දෙනාම සභාපතිතුමාගේ කැමැත්ත උඩ ගත්ත අයයි. කොමසාරිස්තුමාගේවත් කොමිෂන් සභාවේවත් අනුමැතිය ඇතිව ගත්ත අය නොවෙයි. මෙන්න ගරු ඇමතිතුමනි, නමුන්නාන්සේගේ දැනගැනීම සඳහා මේවා කියවල බලන්න.

**එස්. බී. හේරත් මහතා**
*(திரு. ஆர். பி. விஜேசிறி)*
**(Mr. S. B. Herath)**

අපේ කාලයේදී වුණු දේවල්ද?

**ආර්. පී. විජේසිරි මහතා**
*(திரு. ஆர். பி. விஜேசிறி)*
**(Mr. R. P. Wijesiri)**

මම කියන්නෙ නැහැ, පසුගිය කාලයේ ඒවා. නමුන්නාන්සේලා තමයි පසුගිය රජය තිබුණු කාලයේ සිද්ධ වූ දේවල් ගැන කියන්නෙ.

**එස්. බී. හේරත් මහතා**
*(திரு. எஸ். பி. ஹேரத்)*
**(Mr. S. B. Herath)**

අපි පසුගිය කාලයේ ඒවාත් කියනවා. ඒ වගේම 1977 සිට අද වන තෙක් කාලය තුළ සමූපකාර සභාපතිවරුන් 14 දෙනෙක් අස් කර තිබෙනවා. අධ්‍යක්ෂවරුන් 20 දෙනෙක් අස් කර තිබෙනවා. නිලධාරීන් හතර දෙනෙක් අස් කර තිබෙනවා. තවත් සභාපතිවරුන් තුන් දෙනෙකුත් අධ්‍යක්ෂවරුන් 11 දෙනෙකුත්, නිලධාරීන් දෙදෙනෙකුත් අස් කරන්නට ක්‍රියා කරගෙන යනවා, දැන් මේ මොහොත වෙන විට. තවත් සොයා බලන්න ඒවා තිබෙනවා.

**ආර්. පී. විජේසිරි මහතා**
*(திரு. ஆர். பீ. விஜேசிறி)*
**(Mr. R. P. Wijesiri)**

ඒක තමයි අපි මේ පණිවුඩය දෙන්නෙ.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා)**
*(குழு உப தவிசாளர் அவர்கள்)*
**(Mr. Deputy Chairman of Committees)**

ඔය ඔක්කොම අස් කළාම තවත් ඉතුරු වෙනවාද?

**ආර්. පී. විජේසිරි මහතා**
*(திரு. ஆர். பி. விஜேசிறி)*
**(Mr. R. P. Wijesiri)**

(1) වගන්තිය යටතේ පරීක්ෂණයෙන් පසු හිරියාල සමිතියේ ඔබතුමාගේ ප්‍රබල හිතවතුන් පවා දොට්ට දැම්මයි කියන එක මම පිළිගන්නවා. නමුත් ඒ ක්‍රියා පටිපාටිය අනිත් තැන්වල ඇති වුණේ නැත කියන එකත් මම මතක් කරන්න ඕනෑ.

**සරත්චන්ද්‍ර රාජකරුණා මහතා**
*(திரு. சரத்சந்திர ராஜகருணா)*
**(Mr. Saratchandra Rajakaruna)**

නැහැ, නැහැ.

**ආර්. පී. විජේසිරි මහතා**
*(திரு. ஆர். பீ. விஜேசிறி)*
**(Mr. R. P. Wijesiri)**

නැහැ නැහැ, කිව්වාට බැහැ. මේ දෙන විස්තර බලන්න බලන්න. කොයි තරම් මුදලක් මේ උප සභාපති මහත්මයා අර ගෙන තිබෙනවාද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කොළඹ එන්නට කියල එයාගේ කාර් එකට රුපියල් දහදාස් ගණනක් අර ගෙන තිබෙනවා. කාගෙද මේ නම් දමල තිබෙන්නෙ? ගැරේජ් එකේ වැඩ කරන මිකැනික් කෙනෙකුගෙ, සමිතියේ වැඩ කරන කම්කරුවෙකුගෙ, නම් දමල කාර් එක කොළඹ ආවයි කියල රුපියල් දහදාස් ගණනක් අරගෙන තිබෙනවා. තව බොහොම ලස්සන වැඩක් වෙලා තිබෙනවා.

**එස්. බී. හේරත් මහතා**
*(திரு. எஸ். பி. ஹேரத்)*
**(Mr. S. B. Herath)**

ඔය මේ කාලයේදී වුණු දෙයක්ද?

**ආර්. පී. විජේසිරි මහතා**
*(திரு. ஆர். பி. விஜேசிறி)*
**(Mr. R. P. Wijesiri)**

ඔව්, මේ ඊයේ-පෙරේදා. අපේ කාලයේ ඒවා දත් යල පැනල.

**එස්. බී. හේරත් මහතා**
*(திரு. எஸ். பி. ஹேரத்)*
**(Mr. S. B. Herath)**

මේ කාලය ඇතුළත අපේ සමිති 141 ක් පරීක්ෂා කරල තිබෙනවා. බය වෙන්න එපා. මේ තියෙන ඔක්කොම පරීක්ෂා කරනවා.

**ආර්. පී. විජේ-සිරි මහතා**
*(திரு. ஆர். பி. விஜேசிறி)*
**(Mr. R. P. Wijesiri)**

මෙන්න බලන්න, නාවලපිටිය සමුපකාර යට පිටින් සහල් ලබාගෙන තිබෙන විධිය. විසි හත් ලක්ෂයක සහල් ලබාගෙන තිබෙනවා. මේවා කියවා බලා සභාගත කරන්න දෙන්න. මේ සමිතියේ කේ. බී. දිසානායක, එම්. ආර්. ඩබ්ලිව්. සිරිසේන, එම්. ආර්. පියදාස ජයනේරිස්, මේ වාගේ කීප දෙනෙකුගේ නම්වලින් තමයි කරල තිබෙන්නෙ. මේ සියලු දෙනාම මේ සමිතියේ නාච්චාමිලා.

**සභාමේසය මත තබන ලද ලියවිලි:**
*சபாபீடத்தில் வைக்கப்பட்ட மறுமொழி:*
***Answer tabled:***

**සි./ස. නාවලපිටිය වි.සේ. සමුපකාර සමිතියට පිටතින් සහල් ලබා ගැනීම**

| දිනය | ලබා ගත් අයගේ නම | චෙක් අංක | වව්චර් අංක | මුදල රු. | ශ. |
|---|---|---|---|---|---|
| 80.01.14 | කේ. බී. දිසානායක | 2බීඑස් 132008 | — | 33,000 (උපරිම මුදල්) | 0 |
| 80.02.02 | කේ. බී. දිසානායක | 2බීඑස් 132096 | — | 40,600 | 0 |
| 80.03.19 | කේ. බී. දිසානායක | 2බීඑස් 135690 | — | 35,000 (උපරිම මුදල්) | 0 |
| 80.03.20 | ඩබ්. සිරිසේන | 2බීඑස් 141528 | — | 65,857 | 28 |
| 80.05.26 | ඩබ්. සිරිසේන | 2බීඑස් 141547 | 5/181 | 55,236 | 80 |
| 80.06.02 | ඇම්. ආර්. පියදස | 2බීඑස් 141564 | 1/6 | 31,287 | 23 |
| 80.06.12 | ඇන්. ඇම්. දිසානායක | 2බීඑස් 143537 | 6/79 | 79,088 | 0 |
| 80.06.16 | ඇම්. ආර්. පියදස | 2බීඑස් 143547 | 6/104 | 75,536 | 0 |
| 80.06.25 | ඩබ්. ජයනේරිස් | 2බීඑස් 143595 | 6/163 | 94,173 | 04 |
| 80.07.01 | ඇම්. ආර්. පියදස | 2බීඑස් 145407 | 7/02 | 34,054 | 90 |
| 80.07.05 | ඇම්. ආර්. පියදස | 2බීඑස් 145420 | 7/15 | 29,799 | 0 |
| 80.07.07 | ඩබ්. සිරිසේන | 2බීඑස් 145441 | 7/29 | 46,346 | 75 |
| 80.07.08 | ඇන්. ඇම්. දිසානායක | 2බීඑස් 145448 | 7/39 | 40,050 | 0 |
| 80.07.11 | ඩබ්. ජයනේරිස්, (උප සභාපතිගේ රියැදුරු ගේ මල්ලි හරක් ශාලාව බාරව) | 2බීඑස් 145482 | 7/81 | 34,122 | 60 |
| 80.07.18 | එම | 2බීඑස් 145319 | 7/126 | 30,838 | 50 |
| 80.07.21 | එම | 2බීඑස් 146333 | 7/140 | 49,334 | 0 |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## සී./ස. නාවලපිටිය වි.සෙ. සමුපකාර සමිතියට පිටතින් සහල් ලබා ගැනීම

| දිනය | ලබා ගත් අයගේ නම | චෙක් අංක | වව්චර් අංක | මුදල රු. ශ. |
|---|---|---|---|---|
| 0.07.29 | ඩබ්. ජයනෝරිස් | 2බීඑස් 146360 | 7/200 | 43,617 60 |
| 80.07.30 | එම | 2බීඑස් 146364 | 7/206 | 34,828 80 |
| 80.08.05 | එම | 2බීඑස් 146383 | 8/21 | 36,475 20 |
| 80.08.05 | එම | 2බීඑස් 146387 | 8/22 | 47,571 25 |
| 80.08.07 | ඇල්. පී. ජයසේකර | 2බීඑස් 148135 | 8/62 | 44,774 40 |
| 80.08.13 | ඇල්. පී. ජයසේකර | 2බීඑස් 148167 | 8/102 | 52,88 06 |
| 80.08.18 | ඩබ්. ජයනෝරිස් | 2බීඑස් 148605 | 8/149 | 47,904 0 |
| 80.08.26 | එම | 2බීඑස් 148636 | 8/191 | 47,177 10 |
| 80.08.28 | එම | 2බීඑස් 148640 | 8/197 | 48,954 70 |
| 80.09.01 | එම | 2බීඑස් 148661 | 9/06 | 45,293 45 |
| 80.09.05 | එම | 2බීඑස් 148684 | 9/33 | 52,035 0 |
| 80.09.05 | එම | 2බීඑස් 148685 | 9/34 | 13,534 0 |
| 80.09.09 | ඩබ්. සිරිසේන | 2බීඑස් 149427 | 9/79 | 39,605 50 |
| 80.09.11 | ඩබ්. සිරිසේන | 2බීඑස් 149446 | 9/105 | 37,751 04 |
| 80.09.17 | ඩබ්. සිරිසේන | 2බීඑස් 149494 | — | 35,906 88 |
| 80.09.24 | ඩබ්. ජයනෝරිස් | 2බීඑස් 151923 | 9/198 | 18,170 40 |
| 80.09.24 | එම | 2බීඑස් 151924 | 9/199 | 31,314 56 |
| 80.09.29 | එම | 2බීඑස් 151942 | 9/227 | 40,680 0 |
| 80.10.01 | එම | 2බීඑස 151951 | 10/2 | 44,250 80 |
| 80.10.06 | එම | 2බීඑස් 151990 | 10/33 | 75,759 72 |
| 80.10.07 | එම | 2බීඑස් 153507 | 10/53 | 26,175 32 |
| 80.10.10 | එම | 2බීඑස් 153531 | 10/76 | 7,833 16 |
| 80.10.13 | එච්. පී. දයානන්ද | 2බීඑස් 153547 | 10/88 | 30,632 04 |
| 80.12.19 | එස්. කේ. ප්‍රේමචන්ද්‍ර | 2බීඑස් 160127 | — | 2,181 96 |
| 81.02.12 | එස්. කේ. ප්‍රේමචන්ද්‍ර | 2බීඑස් 164854 | 1/81 | 15,660 0 |
| 81.02.14 | එස්. කේ. ප්‍රේමචන්ද්‍ර, (ම.ග.ම. අනියම් කම්කරු) | 2බීඑස් 164867 | — | 50,002 50 |
| 81.02.17 | එම | 2බීඑස් 164888 | 1/114 | 45,000 0 |
| 81.02.21 | එම | 2බීඑස් 164899 | 1/154 | 40,000 0 |
| 81.02.28 | එම | 2බීඑස් 166137 | — | 61,962 25 |
| 81.03.02 | එම | 2බීඑස් 166143 | — | 15,000 0 |
| 81.03.14 | එම | 2බීඑස් 167842 | — | 28,387 05 |
| 81.03.16 | එම | 2බීඑස් 167848 | — | 43,000 08 |
| 81.03.17 | එම | 2බීඑස් 167853 | — | 17,363 0 |
| 81.03.21 | එම | 2බීඑස් 167864 | — | 21,883 25 |
| 81.03.31 | එම | 2බීඑස් 169021 | — | 41,188 40 |
| 81.04.02 | එම | 2බීඑස් 169040 | — | 26,684 85 |
| 81.04.02 | එම | 2බීඑස් 169041 | — | 30,000 0 |
| 81.04.06 | එම | 2බීඑස් 169054 | — | 21,943 35 |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

| දිනය | ලබාගත් අයගේ නම | චෙක් අංක | වවුචර් අංක | මුදල රු. ශ. |
|---|---|---|---|---|
| 81.04.11 | එම | 2බීඑස් 169096 | — | 16,425 60 |
| 81.04.20 | එම | 2බීඑස් 171619 | — | 46,707 40 |
| 81.04.22 | එම | 2බීඑස් 171629 | — | 20,697 20 |
| 81.04.25 | එම | 2බීඑස් 171644 | — | 37,926 0 |
| 81.04.29 | එච්. ටී. දයානන්ද, (නගර සභාවේ කම්කරු) | 2බීඑස් 171659 | — | 20,000 0 |
| 81.05.02 | එම | 2බීඑස් 171681 | — | 28,930 0 |
| 81.05.05 | එම | 2බීඑස් 171690 | — | 18,201 90 |
| 81.05.09 | එම | 2බීඑස් 172734 | — | 18,201 90 |
| 81.05.16 | එම | 2බීඑස් 172769 | — | 30,290 0 |
| 81.05.21 | එම | 2බීඑස් 172781 | — | 20,000 0 |
| 81.05.23 | එම | 2බීඑස් 172782 | — | 8,802 80 |
| 81.06.01 | එම | 2බීඑස් 176521 | — | 10,207 80 |
| 81.06.02 | එම | 2බීඑස් 176535 | — | 20,000 0 |
| 81.06.02 | එම | 2බීඑස් 176536 | — | 16,199 0 |
| 81.06.03 | එම | 2බීඑස් 176539 | — | 39,067 05 |
| 81.06.16 | එම | 2බීඑස් 178613 | — | 30,714 94 |
| 81.06.20 | එම | 2බීඑස් 178621 | — | 20,000 0 |
| 81.07.02 | එස්. එම්. ඉබ්‍රාහිම් | 2බීඑස් 178667 | — | 22,707 0 |
| 81.07.11 | එච්. ටී. දයානන්ද | 2බීඑස් 179932 | — | 26,458 5 |
| 81.07.14 | එච්. ටී. දයානන්ද | 2බීඑස් 179939 | — | 15,000 0 |
| 81.07.25 | එස්. කේ. ප්‍රේමචන්ද්‍ර | 2බීඑස් 179991 | — | 28,933 10 |
| 81.07.25 | එස්. කේ. ප්‍රේමචන්ද්‍ර | 2බීඑස් 181802 | — | 17,000 0 |
| 81.08.13 | ඇම්. ඒ. ඇස්. හමීඩ් | 2බීඑස් 184112 | — | 15,000 0 |
| 81.08.13 | ඇම්. ඒ. ඇස්. හමීඩ් | 2බීඑස් 184113 | — | 39,521 58 |
| 81.08.20 | ඇම්. ඒ. ඇස්. හමීඩ් | 2බීඑස් 184139 | — | 38,435 95 |
| | | | | 27,36,139 20 |

නමුත් විසි හත් ලක්ෂයක හාල් මේ අයගේ නමින් නිකුත් කර තිබෙනවා. මේ අයගෙන් සමහර දෙනෙකුට බැංකු ගිණුම් පවා විවෘත කර තිබෙනවා. හාල් ඕඩරයක් දුන්නාට පස්සේ රුපියල් සියයක් හමාරක් දෙනවා. මේ තරම් මුදලක් ගසා කාලා තිබෙන්නේ සමිතියේ බලධාරීන් කියන එක විශේෂයෙන්ම මම මතක් කරනවා.

මෙතැන ලස්සන සිද්ධියක් වෙලා තිබෙනවා. සමිතියේම ගබඩාවේයි, හාල් තිබෙන්නේ. පිටට වික්කා කියල ඊසිට් දමලා. ආපසු සමිතියට පිටින් හාල් ගන්නාය කියා ඊසිට් දමලා ඊසිට්වලින්, කඩදාසිවලින් වංචා කරලා තිබෙනවා. ඔන්න ඔය විධියේ ලස්සන සෙල්ලම් නාවලපිටිය සමිතියේ වෙනවා. මේවා පිළිබඳව විශේෂයෙන්ම කරුණු සොයා බලන ලෙස මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

අ. භා. 5.30

**එස්. බී. හේරත් මහතා**
*(திரு. எஸ். பி. ஹேரத்)*
**(Mr. S. B. Herath)**

නාවලපිටිය සමිතිය අපි පරීක්ෂා කර ගෙන යන ඒවායින් එකක්.

**ආර්. පී. විජේසිරි මහතා**
*(திரு. ஆர். பீ. விஜேசிறி)*
**(Mr. R. P. Wijesiri)**

අන්න බලන්න. ඉතින් මම හරිනේ. දූන් මම පසුගිය කාලයේ තෙල්දෙනිය ගැන කිව්වා. ඒක හරිනේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**සරත්චන්ද්‍ර රාජකරුණා මහතා**
(திரு. சரத்சந்திர ராஜகருணா)
(Mr. Saratchandra Rajakaruna)
තමුන්නාන්සේ කියාගෙන එන්නේ මේ පරණ දේවල්, අපි පරීක්ෂා කර ගෙන යන දේවල් ගැනනේ.

**ආර්. පී. විජේසිරි මහතා**
(திரு. ஆர். பீ. விஜேசிறி)
(Mr. R. P. Wijesiri)
මම දන්නේ කොහොමද පරීක්ෂා කරන වාද කියල. එහෙන් මිනිස්සු ඇවිදින් මට කියනවා.

**එස්. බී. හේරත් මහතා**
(திரு. எஸ். பி. ஹேரத்)
(Mr. S. B. Herath)
මේවා කොයි "ෆයිල්" එකෙන් ගැලෙව් වාද දන්නේ නැහැ, නේද?

**ආර්. පී. විජේසිරි මහතා**
(திரு. ஆர். பீ. விஜேசிறி)
(Mr. R. P. Wijesiri)
ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේට ගිය වතාවේ මම විශේෂයෙන්ම මතක් කළා, විශාල වශයෙන් මේ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, හොඳ දක්ෂ පළපුරුදු නිල ධාරීන්, ගිය අවුරුද්දේ මම කතා කරන අවස්ථාව වෙන විට 14 දෙනෙක් ගිහින් කියල. අද මම කතා කරන විට තවත් 14 දෙනෙක් ගිහිල්ලා. තමුන්නාන්සේගේ දෙපාර්තමේන්තුව දන් ගෙන යන්නට බැරි තත්ත්වයකයි තිබෙන්නේ.

**එස්. බී. හේරත් මහතා**
(திரு. எஸ். பி. ஹேரத்)
(Mr. S. B. Herath)
ඔව්! ගෙන යන්න බැහැ.

**ආර්. පී. විජේසිරි මහතා**
(திரு. ஆர். பீ. விஜேசிறி)
(Mr. R. P. Wijesiri)
බැහැ! ඇයි ඒ බැරි? තමුන්නාන්සේගේ කොමසාරිස්තුමාගේ වරදින් නොවැ, හොඳ නිලධාරීන් යන්නේ. එක් කෙනෙක් රකින් නට ගිහින් විශාල ගණනකට තමුන්නාන් සේ යන්නට හරිනවා. ඒකයි, වෙලා තිබෙන්නේ. මම කියවන් නම් ගිය අවුරුද්දේ මම කිව්වාට පස්සේ ගිහින් තිබෙන අය. ඒ. බී. ජයසුන්දර මයා—[බාධා කිරීමක්].

**සරත්චන්ද්‍ර රාජකරුණා මහතා**
(திரு. சரத்சந்திர ராஜகருணா)
(Mr. Saratchandra Rajakaruna)
නම් ටික කියවන්න කරුණා කරලා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழு உப தலைவர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
තවත් මන්ත්‍රීවරු කතා කරන්නට සිටිනවා.

**ආර්. පී. විජේසිරි මහතා**
(திரு. ஆர். பீ. விஜேசிறி)
(Mr. R. P. Wijesiri)
එහෙම නම් මම මේවා සභාගත කරනවා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழு உப தலைவர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමා මිනිත්තු 22 ක් කතා කරලා තිබෙනවා. තව කොපමණ වෙලා ඕනෑද?

**ආර්. පී. විජේසිරි මහතා**
(திரு. ஆர். பீ. விஜேசிறி)
(Mr. R. P. Wijesiri)
මට තව පැය බාගයක් පමණ ඕනෑ.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழு உப தலைவர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
ඒක කරන්න බැහැ. ඒකට ඉතින් ඇමතිකමක් ගන්නට ඕනෑ.

**ආර්. පී. විජේසිරි මහතා**
(திரு. ஆர். பீ. விஜேசிறி)
(Mr. R. P. Wijesiri)
මම ඇමතිකෙනෙක් හා සමානයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නියෝජ්‍ය සභාපති. මේ වෙලාවේ වැඩ බලන සභාපති.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
*(குழு உப தலைவர் அவர்கள்)*
(Mr. Deputy Chairman of Committees)

Order, please ! Apart from the hon. Member, there are other hon. Members from the Opposition who have to participate in the Debate. At the same time, there are also many hon. Members from the Government side also.

**ආර්. පී. විජේසිරි මහතා**
*(திரு. ஆர். பீ. விஜேசிறி)*
(Mr. R. P. Wijesiri)

The Opposition moves the cut so that we can pin-point all these things. We have the right to speak a little long.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
*(குழு உப தலைவர் அவர்கள்)*
(Mr. Deputy Chairman of Committees)

All right. I will give you five minutes more.

**ආර්. පී. විජේසිරි මහතා**
*(திரு. ஆர். பீ. விஜேசிறி)*
(Mr. R. P. Wijesiri)

I know that you will not disappoint me like that.

ගරු නියෝජ්‍ය සභාපතිතුමා කාලවේලා දෙන්නේ නැති නිසා මම මේ ලියවිල්ල *සභාගත කරනවා.

'මාක් ෆේපඩ්' ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම්වලට තමුන්නාන්සේගේ කොමසාරිස්තුමා නිතරම සහභාගි වෙනවා. නියෝජ්‍ය කොමසාරිස්තුමාත් සහභාගී වෙනවා. එහි අද රුපියල් එක් කෝටි විසි ලක්ෂයක නොවිකෙණන බඩු ගොඩ ගසා තිබෙනවා. ඒවා අතර "හැන්ඩ්ල්" සහ "චේන්" නැති බයිසිකල් ලක්ෂ 20 ක පමණ තිබෙනවා. ලංකාවේ කිසි වාහනයකට සරිනොයන ටයර් සහ ටියුබ් ලක්ෂ 60 ක පමණ තිබෙනවා. 'චිත්‍රා' කෝඩියල් බීම වර්ග—මේවා කාගෙද මම දන්නේ නැහැ. චිත්‍රා කොහේ කෙනෙක්ද මම දන්නේ නැහැ—එක් ලක්ෂ විසි දහසක තිබෙනවා. මැන්ටල් දෙකේ කෝල්ටන් ලැන්ටන් අවුරුදු තුනක් පැරණි ඒවා අසූ පන් දහසක් තිබෙනවා. අවුරුදු තුනකට පෙර අහස් යාත්‍රාවෙන් ගෙන්නූ නත්තල් බඩු පන් ලක්ෂ අසූ දහසක තිබෙනවා. නොවිකිණිය හැකි උඳුන් දෙකේ හීටර් විශාල තොගයක් තිබෙනවා. මේ සියල්ලම එක් කෝටි විසි ලක්ෂයක තිබෙනවා.

එපමණක් නොවෙයි, තමුන්නාන්සේ දන්නවාද මම දන්නේ නැහැ. "මාර්ක් ෆේපඩ්" එකෙන් වී මෝල් වගයක් ගෙන්නුවා. වී මෝල් 15 ක් ද කොහෙද ගෙන්නුවා. එයින් එකක් අම්පාරේ සවි කළා. තිබුණු ගොඩනැගිලිවල ඒවා සවි කරන්නට බැරි නිසා ඒවා කඩා නැවත සකස් කර මේ මෝල සවිකළේ. අම්පාරේ ඒ වී මෝල සවි කරලා මාස දෙකක් පාවිච්චි කරන්නට බැරි වුණා. ඒක දැන් ක්‍රියා විරහිත වෙලයි තිබෙන්නේ. ඒක නඩත්තු කරන්නට අමාරුලු. ලංකාවේ නිෂ්පාදනය කරන වී මෝල්වලට වඩා විශාල මුදලක් ඒවාට වැය වෙනවා. අනික් වී මෝල් ටික නිකුත් නොකර දැන් දෙපාර්තමේන්තුවේම තබා ගෙන තිබෙනවා. ඒ මොකද, ඒවාත් නිකුත් කළොත් අර අම්පාරේ සිද්ධියම වෙයි කියලයි. මේ සඳහා හැම තැනින්ම ණය අරගෙන තිබෙනවා. දෙපාර්තමේන්තුවලින් දෙලක්ෂයක් ණය දීලා තිබෙනවා. බැංකුවලින් සමිතිය ණය අරගෙන තමයි මේවා කරලා තිබෙන්නේ. දෙමාසයක් වැඩ කළාට පසුව අම්පාරේ මෝල ක්‍රියා විරහිත වෙලා තිබෙනවා. ඒක වැඩ කරවන්න බැරිලු. ඒකේ රෝල් දවසින් දෙකින් ගෙවෙනවාලු. ඒකේ වියදම අධිකලු. ඒක නඩත්තු කරන්න බැරිය කියනව. ඒක "මාර්ක් ෆේපඩ්" එක ගෙන්නුවාය කිව්වත් ගම්පහ පෞද්ගලික නියෝජිතයකුගේ මාර්ගයෙන් ගෙන්වා තිබෙන්නේ. කෙලින්ම "මාර්ක් ෆේපඩ්" එකෙන් ගෙන්වා නැහැ. ටෙන්ඩර් කැඳවා ගෙන්නුවාද, නැත්නම් වෙන විධියකට ගෙන්නුවාද කියල අපි දන්නෙ නැහැ. කරුණාකර සොයා බලන්න.

---

*කථාව අවසානයේ පළ කර ඇත.
*உரையினிறுதியில் தரப்பட்டுள்ளது.
* *Produced at end of speech.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. පී. විජේසිරි මහතා]
අද මේ යන්ත්‍රවලින් එකක් අනුරාධපුරයේත් තව එකක් පොලොන්නරුවේත් සවි කරන්නට ලෑස්ති කරනවා. ඒ හදපු ගොඩනැගිලිත් වෙනස් කරන්නට සිද්ධ වී තිබෙනවා. සැලැස්මකට හදපු ගොඩනැගිලිත් වෙනස් කරන්නට සිද්ධ වී තිබෙනවා. කරුණාකර මේවා ගැන සොයා බලන්න.

විශේෂයෙන්ම මම චෝදනා කරන්නේ කොමසාරිස්තුමාට. පසුගිය ආණ්ඩුව කාලයේ ලක්ෂ ගණන් වංචා කළාය යන්න පසුගිය අවුරුදු හතර ඇතුළත හැමදාම කියපු දෙයක්. මෙතෙක් බැරි වී තිබෙනවා ඒවා විභාග කර අවසානයක් කරන්නට. "මංගලා" චිත්‍රපටිය ගැන තමුන්නාන්සේලාට කටයුතු කරන්නට බැරි වුණා නම් කොහොමද මේ පොඩි මිනිස්සු ගැන—ජේමා ගැන ජේම්ස් ගැන සිරිපිනාල ගැන—හොයන්නෙ? ඉලංගරත්නලාට හැංගෙන්න පුළුවන්ද? නුවරත්නලාට හැංගෙන්න පුළුවන්ද? ඩග්ලස් පෙරේරලාට හැංගෙන්න පුළුවන්ද? විජේකෝන් මැරෙන කොටා මිනී පෙට්ටියෙ අරන් ගියාද පොත්? විජේකෝන් මැච්චි වෙලාවේ ඉලංගරත්න ගෙනියන්න ඇති පොත් ටික. පොත් නැති වුණාට චක්‍ර ලේඛය තිබෙනවා නම් තමුන්නාන්සේලාට අහන්න බැරිද ඒ වගකිවයුත්තන්ගෙන්? වගකීම භාර ගත්තා නම් ඉලංගරත්න නෝනා මහත්මිය සභාපතිකම දැරුවා නම් ඒ මුදල්වලට වගකියන්න ඕනෑ නේද? බලගතු නිසා නේද ඒ මිනිස්සු පස්සෙ එළවන්නෙ නැත්තෙ? ලක්ෂ 9 ක් වියදම් කර තිබෙනවාය කියා වෙළඳ නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා. සමුපකාරය කාපු හොරෙක්ය කියල පිලිප් ගුණවර්ධන ඇමතිතුමාට චෝදනා කළ අර එල්. එස්. පෙරේරා අද එයාගෙ සංවිධායක ලේකම් කෙනෙක්. අද එයාට හොරු හොඳයි. කෝ, ඒ අයට විරුද්ධව තමුන්නාන්සේලා කටයුතු කරනවාද? මා ඒකයි අහන්නෙ. රබර් නිෂ්පාදන සංස්ථාවේ සභාපති වශයෙන් සිටි දාස්වත්තට අද කොහොමද උසස්වීම් ලැබී තිබෙන්නෙ? තමුන්නාන්සේලාගේ අමාත්‍යාංශවල සහ දෙපාර්තමේන්තුවල ඒ උදවියට උසස්වීම් ලැබී තිබෙන්නේ කොහොමද? තමුන්නාන්සේට කවදාවත් ඔය පරීක්ෂණ අවසාන කරන්නට බැහැ, හිතවත්කම් වෙන තැනක කියල ඔවුන් ආරක්ෂා කරන නිසා. තමුන්නාන්සේ කොපමණ මහන්සි ගත්තත් නෑදෑ මිත්‍රකම් ගැන නොබැලුවොත් කොමසාරිස්තුමා බලනවා. [බාධා කිරීමක්] පරණ හිතවත්කම් ඇති.

ගිනිගත්හේන කුඩා කර්මාන්තයට අද මොකක්ද වෙලා තියෙන්නෙ? ඒක පසුගිය ආණ්ඩුව කාලෙ ඇති කළ ඉතාම හොඳට කරගෙන යන සුළු කර්මාන්තයක්. පිටරටින් කුඩ ගෙනාවාය කියල එතැන හදන කුඩවලට වෙළඳ පොළක් නැති වෙන්නෙ නැහැ. මට ආරංචියි කොහොම හරි ඒක ආදායම් නැති පාඩු සහිත ආයතනයක් හැටියට නම් කරල ඒක විකුණවන්න ක්‍රමයක් සකස් කර තිබෙනවාය කියල. ඊට පස්සෙ කවුරු හරි හිතවතෙක් ඇවිත් ඒක ගනියි. මේව කරන්න එපා, ඇමතිතුමනි.

"මංගලා" චිත්‍රපටිය ගැන මා නැවතත් මතක් කරනවා. මේ තරම් බලසම්පන්න පුද්ගලයන්ට—ස්වාමියා ඇමති; බිරිඳ සමිතියේ සභාපති—මෙපමණ ප්‍රමාණයකින් ණය අනුමත කරනවාය කියල සමුපකාර කොමසාරිස් නිර්දේශ කළා. ඒ ණයට වඩා විශාල මුදලක් ඇමති හැටියට තමන්ගේ බිරිඳට දීල තියෙනවා නම් ඇයි ඒවා ලබා ගන්නට බැරි?

තමුන්නාන්සේලා සමාජයට ඇවිත් අපි මෙහෙම මෙහෙම කරනවාය කියනව. නමුත් තමුන්නාන්සේලා නැවත වරක් සමාජය දූෂණය කළ හොර තක්කඩින්ට ඔළුව උස්සන්ට දෙනවාය කියන එක මා කණගාටුවෙන් මතක් කරනවා. 1970 සිට 1977 දක්වා වූ කාලයේ දූෂණ ගැන 66 වන වගන්තිය යටතේ පරීක්ෂණ පවත්වන්නාය කියා කාර්යාල විවෘත කරමින් තමුන්නාන්සේලා ගෙවිල් කුලී වශයෙන් කීයක් ගෙවා තිබෙනවාද? මුලින්ම බොරැල්ලේ ගෙවල් දෙකක් හම්බ වුණා, රුපියල් දෙදහස් ගණනකට; තුන්දහස් ගණනකට. එතැන ඉඩකඩ මදිය කියල රුපියල් දහදාස් ගණනකට දෙහිවල

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගෙයක් ගත්ත. එතැන මාස දහයක් පමණ ගෙවල් කුලී ගෙව්වා. දැන් ඇවිත් තිබෙනවා, බාන්ස් ප්ලේස් එකට. මේ වෙනුවෙන් පසුගිය අවුරුදු තුනක පමණ කාලය ඇතුළත තමුන්නාන්සේලා කොපමණ මුදල් වියදම් කර තිබෙනවාද? කරුණාකර අපට කියන්න. මේ වෙනුවෙන් නිලධාරීන් කී දෙනෙකු පත් කර තිබෙනවාද? අපට කියන්න. මේවා අපට දැනගන්නට වුවමනා කරනවා. පසුගිය කාලෙ මේවා වුණාය, පසුගිය කාලෙ මේවා වුණාය කියල හැමදාම කිව්වාට වැඩක් නැහැ.

තවත් කාරණයක්. මට කණගාටුයි කියන්නට, මේ කොමසාරිස්තුමාගේ ක්‍රියා පටිපාටිය නිසා හොඳ පළපුරුදු නිලධාරි මහත්වරු විශාල වශයෙන් දෙපාර්තමේන්තුවෙන් අස් වී යනවා. ඒ වෙනුවට එන්නේ කවුද? කාන්තාවෝ. මොකද යන්නට වෙන තැනක් නැති නිසා. මෙයට හේතුව මොකක්ද? ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සිටියදී ආධුනිකයින් හැටියට අලුතින් බැඳෙන අයට උසස් වීම් දීමයි. කරුණාරත්න මහත්මයට උසස්වීමක් දී තිබෙනවා, නියෝජ්‍ය කොමසාරිස් හැටියට. එහෙත් ඒ මහත්මයාට වඩා ජ්‍යෙෂ්ඨ නිලධාරීන් 9 දෙනෙක් පමණ එතන සිටිනවා. එහෙම වන විට ඒ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් එක්කෙනෙක්වත් වැඩ කරයිද? ජ්‍යෙෂ්ඨත්වය ගැන සලකන්න ඕනෑ. සුදුසුකම් ගැන සලකන්න ඕනෑ. ඕනෑම දෙපාර්තමේන්තුවක සිටින කෙනෙකුට අත වනනවා. ඉන්දියාවට ශිෂ්‍යත්වයක් දී යැවූ තැනැත්තාට රු. 20,000 කුත් දීලයි යැව්වේ. ඇයි? කොමසාරිස්තුමාගේ පුතා ඉන්දියාවෙලු අධ්‍යාපනය ලබන්නේ. ගුරුන්නාන්සේ හරියට වැඩ කරන්නේ නැත්නම් ගෝලයින්ගෙන් කොහොමද වැඩ බලාපොරොත්තු වන්නේ? අන්න ඒකයි මම කියන්නේ. ඒ ගැන විශේෂයෙන්ම මතක් කරනවා.

තවත් කරුණක් තිබෙනවා, විශේෂයෙන්ම මතක් කළ යුතු. මූලායි සමුපකාර ඉස්පිරිතාලයට පත් වූ සභාපතිවරයා අස් කර තිබෙනවා. ඒ ගැන පැමිණිල්ලක් කර තිබෙනවා, රාජසූත් දරම් මහත්මයා. ඒ. සී. සී. ඩී. මහතාට එවූ ලිපියේ පිටපතකුත් මට එවා තිබෙනවා. මේ ගැනත් විශේෂයෙන් සොයා බලන ලෙස මම ඉල්ලනවා.

ඒ අතරම තිරක තීන්දු දෙන ආකාරය ගැනත් මම කියන්න කැමතියි. පසුගිය කාලයේ මේ තිරක පරීක්ෂණ පැවැත්වීමට අවස්ථාව දී තිබුණේ විශ්‍රාම ගිය සමුපකාර පරීක්ෂක මහත්වරුන්ටයි. දැන් ඒ ක්‍රමය වෙනස් කර ඉස්කෝලෙ මහත්වරු ලිපිකාර මහත්වරු ආදී වෙනත් අංශවල අයටත් මේ තීරක පරීක්ෂණ පවත්වන්නට අවස්ථාව දී තිබෙනවා. එහෙත් සමුපකාරය ගැන දැනීමක් අර විශ්‍රාම ගිය පරීක්ෂක මහත්වරුන්ට තරම් ඉස්කෝලෙ මහත්මයෙකුටවත් වෙන කෙනෙකුටවත් නැත කියන එකයි, මගේ විශ්වාසය. ඇයි ඒ ක්‍රමය වෙනස් කළේ කියා මම දැනගන්න කැමතියි. සමහරවිට ඔබතුමාට යම් හේතුවක් තිබෙන්නට පුළුවන්, ඒ ක්‍රමය වෙනස් කරන්නට. එහෙම නම් මම දැනගන්න කැමතියි. මොන හේතුවක් නිසාද මෙය වෙනස් කළේ කියා.

මම විශේෂයෙන්ම සන්තෝෂ වෙනවා, නාවලපිටිය ගැන පරීක්ෂණ පවත්වාගෙන යනවා කියා දැනගන්නට ලැබීම ගැන. තෙල් දෙනියෙන් දැන් ලක්ෂ ගණනක අපතයක් සිදු වී තිබෙනවා. දැන් ඒ සභාපතිතුමාත් තෙරපලා. ඒ මුදල් අය කර ගැනීමට කටයුතු කරනවාද කියා මම දැනගන්නට කැමතියි.

**සරත්චන්ද්‍ර රාජකරුණා මහතා**
(திரு. சரச்சந்திர ராஜகருணா)
(Mr. Sarathchandra Rajakaruna)
ඔව්.

**ආර්. පී. විජේසිරි මහතා**
(திரு. ஆர். பி. விஜேசிறி)
(Mr. R. P. Wijesiri)

ආහාර මුද්දර ගැනත් වචනයක් කියා මගේ කථාව නතර කරන්න මම බලාපොරොත්තු වෙනවා. මේ ආහාර මුද්දර දූෂණ ගැන පසුගිය දවස්වල අපේ ප්‍රදේශයේ විටින් විට කතාබස් ඇති වුණා. තමුන්නාන්සේලා නිකුත් කරනවලු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. ටී. විජේසිරි මහතා]

දිසාපතිට, ආහාර මුද්දර ප්‍රමාණයක්. ඒවා දේශපාලන බලපෑම් උඩ, නිර්දේශ උඩ, අරක උඩ, මේක උඩ, යම් ප්‍රමාණයක් උප දිසාපති කාර්යාලවලට නිකුත් කරනවාලු. මෙහි කොටසක් ඉතිරි කර ගෙන අර සමිතියේ වෙළඳ සැලෙහි කළමනාකරුත් උප දිසාපති කාර්යාලයේ නිලධාරි මහත්වරුත් අතර —එයින් බාගයක් පමණ—කඩදාසිවලින් හුවමාරු වෙනවාලු. ලංකාව පුරාම විශාල වශයෙන් ලක්ෂ ගණනක් එවැනි සිද්ධීන් සිද්ධ වෙනවා කියා ඒ ගැන හොඳ දැනීමක් තිබෙන නිලධාරි මහත්මයෙක් මා සමග කිව්වා. මම හිතන්නේ උකුවෙල සමිතියේ ලක්ෂ ගණනක ආහාර මුද්දර වංචාවක් සිදු වී පොලිසියෙන් පරීක්ෂණ පැවැත්තුවා කියලයි. ඒ නිසා මේ ආහාර මුද්දර දීමේදී විශේෂ සැලකිල්ලක් දක්වා ආරක්ෂාව ඇතිව ඒවා නිකුත් කරන්නට කටයුතු කරන්න. කියන්න කණගාටුයි, මගේ ආසනයේ නම් ලැබිය යුත්තාට නොවෙයි ලැබෙන්නේ. හොඳට යාන වාහන තිබෙන, වී මෝල් තිබෙන, ව්‍යාපාරිකයින්ට තමයි වැඩි වශයෙන් මේ ආහාර මුද්දර ලැබෙන්නේ. කොපමණ කිව්වත් නාමුන්නාන්සේලා ඒ ගැන සැලකිල්ලක් දක්වන්නේ නැහැ. කෙසේ වෙතත් මීට වඩා කල්පනාකාරීව මේ කටයුත්ත කරන්නය කියා ඉල්ලමින් මම නිහඬ වෙනවා.

**සභාමේසය මත තබන ලද ලියවිල්ල:**

***Documents tabled :***

**සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ වර්තමාන තත්ත්වය**

පසුගිය අයවැය – විවාදය අවස්ථාව වන විට දෙපාර්තමේන්තුව හැර ගොස් සිටි අය.

(1) ඩී. එස්. ෂන්මුගලිංගම් මහතා, (නියෝජ්‍ය කොමසාරිස්).
(2) එස්. ඒ. ජිනදස මහතා, (නියෝජ්‍ය කොමසාරිස්).
(3) එල්. ටී. ජයසේකර මහතා, (නියෝජ්‍ය කොමසාරිස්).
(4) වයලට් ප්‍රනාන්දු මහත්මිය, (නියෝජ්‍ය කොමසාරිස්).
(5) පී. ඩී. ජයවීර මහත්මිය, (ජ්‍යෙෂ්ඨ උප කොමසාරිස්).
(6) ඇම්. ඇම්. ස්වර්ණලතා මැණිකේ මිය, (ජ්‍යෙෂ්ඨ උප කොමසාරිස්).
(7) වී. හපන්ගම මහතා, (උප කොමසාරිස්).
(8) එච්. එම්. පතිරණ මහතා, (උප කොමසාරිස්).
(9) එස්. දනන්සූරිය මහතා, (උප කොමසාරිස්).
(10) ඩී. ඒ. ඩී. ජයවර්ධන මහතා, (උප කොමසාරිස්).
(11) එස්. එච්. එම්. චන්ද්‍රසේන මහතා, (උප කොමසාරිස්).
(12) ඩබ්. ජී. මිත්‍රරත්න මහතා, (උප කොමසාරිස්).
(13) ඩබ්. ජී. විජේවර්ධන මහතා, (උප කොමසාරිස්).
(14) පී. ටී. ප්‍රතිරාජ මහතා, (උප කොමසාරිස්).

ඉන්පසුව දෙපාර්තමේන්තුවෙන් ගිය නිලධාරීන් (1981.01.01 සිට මෙ දක්වා).

(15) ඒ. බී. ජයසුන්දර මහතා, (නියෝජ්‍ය කොමසාරිස්).
(16) ඩබ්. වී. ඩබ්. වීරවර්ධන මහතා, (නියෝජ්‍ය කොමසාරිස්).
(17) ඩබ්. පී. ඩී. පී. වීරවර්ධන මහතා, (නියෝජ්‍ය කොමසාරිස්).
(18) ඒ. ජී. පියතිස්ස මහතා, (නියෝජ්‍ය කොමසාරිස්).
(19) පී. කමලනාදන් මහතා, (උප කොමසාරිස්).
(20) එස්. ජී. නාගනාදන් මහතා, (උප කොමසාරිස්).
(21) ටී. මර්කන්ඩු මහතා, (උප කොමසාරිස්).
(22) ඒ. මහාදේව මහතා, (උප කොමසාරිස්).
(23) පී. බඹරවාන මහතා (උප කොමසාරිස්).
(24) ඩී. ශූ. යාපා මහත්මිය, (උප කොමසාරිස්).
(25) බී. ඇම්. ඒ. බාලසූරිය මහතා, (උප කොමසාරිස්).
(26) එල්. පී. ප්‍රේමපාල මහතා, (උප කොමසාරිස්).
(27) ඩබ්. එම්. ගමගේ මහතා, (ජ්‍යෙෂ්ඨ උප කොමසාරිස්).
(28) ඒ. මුණසිංහ මහතා, (උප කොමසාරිස්).

මෙම අන්දමින් නිලධාරීන් මාරුවී යාම නිසා දෙපාර්තමේන්තුවේ සියළුම කටයුතු අවුල් සහගත තත්වයකි. ව්‍යාපාරය ගැන අවබෝධයක් තිබෙන නිලධාරීන් දෙපාර්තමේන්තුව හැර යාමට හේතුව ඇත්තේ කොමසාරිස්වරයා උසස්වීම් දීමේ දී හා ශිෂ්‍යත්ව දීමේ දී අනුගමනය කරන පක්ෂග්‍රාහි ක්‍රියාවන් නිසාය. මේ නිසාම තවත් විශාල පිරිසක් මාරුවී යාමට සූදානම්ව ඇත.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 5.46

**එච්. බී. වන්නිනායක මහතා (පුත්තලම් දිසා ඇමතිතුමා)**
*(திரு. எச். பி. வன்னிநாயக்க—புத்தளம் மாவட்ட அமைச்சர்)*
(Mr. H. B. Wanninayake—District Minister, Puttalam)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, හැමදාම සමුපකාර අමාත්‍යාංශය ගැන අපි කතා කරන්නේ ඉතාමත්ම සන්තෝෂයෙන්. විශේෂයෙන්ම ජාතික අවශ්‍යතාවයක් නිසා මේ රටේ ඇති වූ සමුපකාර ව්‍යාපාරය, ක්‍රමයෙන් දියුණු වෙලා අද අපේ ගම්බද ප්‍රදේශ දක්වා පැතිර තිබෙනවා. අපේ සංවර්ධන කටයුතුවලට, ඒ වාගේම අපේ ප්‍රදේශ දියුණු කර ගැනීම සඳහා අපට අත්‍යාවශ්‍යම ආයතනය බවට අද සමුපකාර ව්‍යාපාරය පත් වෙලා තිබෙනවා. කොයි අන්දමට මේ තත්ත්වය දියුණු වෙලා තිබෙනවාද කිව්වොත් අපි ගෞරවයෙන් කියන්නට ඕනෑ නිදහස ලබා ගන්නට පෙර. ඩී. එස්. සේනානායක අගමැතිතුමා කෘෂිකර්ම ඇමතිවරයා හැටියට සිටි කාලයේ—දෙවැනි ලෝක මහා යුද්ධ කාලයේ—ආරම්භ කළ මේ ව්‍යාපාරය නව අවුරුදු ගණනාවක් ඉදිරියට ගියත් මේ රටේ ජාතික සංවර්ධනයේ පමණක් නොවෙයි, ජනතාවට අවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය බෙදා දීම සඳහා පමණක්ද නොවෙයි, අපේ සංවර්ධන වේගයේ මට්ටමටම එය හැඩ ගසන්නට සිදුවී තිබෙන බව. විශේෂයෙන්ම ගරු ඇමතිතුමාටත්, නියෝජ්‍ය ඇමතිතුමාටත්, සමුපකාර දෙපාර්තමේන්තුවටත් මුළු රටේම අද විශේෂ ගෞරවය හිමි වී තිබෙන්නේ මේ සමුපකාර ව්‍යාපාරය අත්‍යවශ්‍යම මහජන ව්‍යාපාරයක් ලෙස පිළියෙළ වී තිබෙන නිසායි.

පසුගිය රජය කාලයේ සමුපකාර ව්‍යාපාරය සම්පූර්ණයෙන්ම දේශපාලනයෙන් කෙළසුණා. හාරිස්පත්තුවේ දෙවන ගරු මන්ත්‍රීතුමා (ආර්. පී. විජේසිරි මහතා) කියන්නා වාගේ මේ සමුපකාර ව්‍යාපාරයේ දූෂණ ඇති වුණා. සමහර අය සමුපකාර ව්‍යාපාරයට ඇඟ ගහන්නේ නැතුව තමන්ගේ අත දාන්න පටන් ගත්තා සමුපකාර ව්‍යාපාරයට දේශපාලන අත ගැහුව දවසේ ඉඳල සමුපකාරය සම්පූර්ණයෙන්ම විනාශ තත්ත්වයට පත් වුණා.

**ආර්. පී. විජේසිරි මහතා**
*(திரு. ஆர். பீ. விஜேசிறி)*
(Mr. R. P. Wijesiri)

අද දාන්නේ ඔලුව, අත නොවෙයි.

**එච්. බී. වන්නිනායක මහතා**
*(திரு. எச். பி. வன்னிநாயக்க)*
(Mr. H. B. Wanninayake)

සමුපකාරය තරම් විවේචනය වූ ආයතනයක්, සමුපකාරය තරම් කටකතා ඇති වූ ආයතනයක් ලංකාවේ තවත් නැහැ. ඒ තරමටම සමුපකාර ව්‍යාපාරය ජනතාවට අවශ්‍යයි. සමුපකාර ව්‍යාපාරයෙන් සිදු වී ඇති සේවය ඒ තරම් විශාලයි. අපි කියන්න කැමතියි මේ රජය යටතේ එම ව්‍යාපාරය විශාල දියුණුවක් ලබා තිබෙන බව. දූෂණ තිබෙනවා; අඩුපාඩුකම් තිබෙනවා. අපි නැතැයි කියන්නේ නැහැ. නමුත් පොදුවේ ගත්තාම, පසුගිය හත් අවුරුද්දක කාලය තුළ තිබුණු තත්ත්වය ගැන කල්පනා කර බැලුවාම අද ඉතාමත්ම උසස් දියුණුවක් ඇති වී තිබෙනවා. දිස්ත්‍රික් මට්ටමෙන් බැලුවත්, ගම් මට්ටමෙන් බැලුවත් අද ඉතාමත්ම දියුණු තත්ත්වයක සමුපකාරය තිබෙනවා. ඊට ප්‍රධාන හේතුව වුණේ සමුපකාරය නැවත මහජනතාවට ලබා දීමයි. ගරු ඇමතිතුමා ප්‍රජාතන්ත්‍රවාදී අන්දමට, ජනතාවට වුවමනා අන්දමට, සමුපකාර ව්‍යාපාරය ජනතාව අතට නැවත පත් කර තිබීම ජනතාවගේ විශාල ජයග්‍රහණයක්.

ඒ වාගේම අපි කියන්නට ඕනෑ අපට ජය ගන්නට සමුපකාරයේ තවත් ප්‍රශ්න රාශියක් තිබෙන බව. එක ප්‍රශ්නයක් තමයි මේ මහජන ව්‍යාපාරයක් හැටියට තිබිය යුතු සමුපකාරයට නිලධාරීන් අතින් සිදුවන බාධා. යම් සමුපකාරයක් දියුණුවට වැඩ කරගෙන යද්දී ඒ උදවිය කල්පනා කළොත් එම ව්‍යාපාරයට බස් එකක් ගන්න, යම් සංවර්ධන වැඩක් කරන්න, සමහරවිට සමුපකාර කොමසාරිස් කිසිම කල්පනාවක් නැතිව ඒවා අතපසු කර කරනවා. මගේ කොට්ඨාශයේ නිකවැරටිය සමුපකාර සමිතියට අයත් ලොරි රථයක් තිබෙනවා, අවුරුදු ගණනාවක් තිස්සේ අළුත්වැඩියා කර ගන්නට බැරුව. සමුපකාර කොමසාරිස්වරයාගේ අනුමැතිය ඒකට ලබාගන්න බැරුව තිබෙනවා. ඒ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එච්. බී. වන්නිනායක මහතා]
වාගේම ලක්ෂ 2 කට ගන්නට තිබුණු බස් රථයක් ලක්ෂ 5 වන තුරු ඉන්න සිද්ධ වුණා සහකාර කොමසාරිස්වරයාගේ කල්පනාව, උනන්දුව නැතිකම නිසා. ඒ නිසා මේ ව්‍යාපාරය අද ආරක්ෂා කර ගන්න ඕනෑ, නිලධාරීන්ගෙන්.

ගරු ඇමතිතුමා යම් ව්‍යාපාර ඇති කර න්වා; අදහස් සකස් කරනවා; රජය ඒ අනුව කටයුතු කරනවා. නමුත් ජාතික සංවර්ධනයේ ඉතාමත්ම වැදගත් ඒකකය බවට පත් වෙලා තිබෙන්නේ සමුපකාරය. ඒනිසා අපි හැම කෙනෙක්ම කල්පනා කරන්න ඕනෑ සමුපකාරය මීට වඩා දියුණු කොට ඉදිරියට ගෙන යන්න.

විශේෂයෙන්ම වියළි කලාපයේ ගොවියා නිපදවන එළවළු, ඔහු නිෂ්පාදනය කරන ගොවි ද්‍රව්‍ය, නියම මිලකට විකුණා ගන්නට පුළුවන් ආයතනයක් තවම මේ රටේ ඇති වෙලා නැහැ. ගොවීන්, නිපදවනවා. නමුත් අවසානයේදී මොකක්ද, සිද්ධ වෙන්නේ? ඒ ගොවීන්ට ඕනෑ කරන ද්‍රව්‍ය ලබා ගන්නත් ක්‍රමයක් නැහැ.

අද කොළඹ 'මාර්කට්' එකකට ගිහින් බලන්න, එළවළු මිල කොයි තරම් වැඩි වෙලාද කියා. තක්කලි, මිරිස්, වම්බටු වගේ දේවල මිල අද කොළඹ වෙළෙඳ පොළේ විශාල වශයෙන් ඉහළ ගිහින් තිබෙනවා. නමුත් ඒවා නිපදවන ගොවීන්ට ලැබෙන්නේ ඉතාම සුළුමිලකුයි.

එම නිසා, ගම්බද ප්‍රදේශවල නිපදවෙන එළවළු සමුපකාර ආයතන මගින් කොළඹට ගෙනල්ලා බෙදා හැරීම සඳහා සමුපකාරයට අවශ්‍ය උපදෙස් දීලා යම්කිසි සම්බන්ධීකරණයක් ඇති කරන්න රජයට පුළුවන් නම් එමගින් දෙවිධියකට නැත්නම් දෙපිරිසකට සේවයක් සිදු වෙනවා. එක අතකින්, එළවළු නිෂ්පාදනය කරන ගොවියාට සාධාරණ මිලක් ලැබෙනවා. තමන්ගේ එළවළුවලට. අනෙක් අතින් නගරබදව ඉන්නා පාරිභෝගික ජනතාවට සැහෙන සේවයක් සැලසෙනවා, සාධාරණ මිලකට ඒ එළවළු මිල දී ගන්න පුළුවන් වන නිසා.

ඒ වගේම සමුපකාර ව්‍යාපාරයට පුළුවන් කම තිබෙනවා, නොයෙකුත් කර්මාන්ත ව්‍යාපාර ආරම්භ කිරීම මගින් සහ තවත් නොයෙකුත් මාර්ගවලින් රැකී–රක්ෂා ඇති කරන්නත්. කර්මාන්ත අමාත්‍යාංශයේත් සහයෝගය ලබාගෙන; වෙනත් අදාළ දෙපාර්තමේන්තුවලින් උදවු ලබාගෙන, ඒ ඒ ප්‍රදේශවල තිබෙන ස්වාභාවික සම්පත් ප්‍රයෝජනයට අර ගෙන, ප්‍රදේශයේ ආවේණික රක්ෂාවලට අලුත් පණක් දී එමගින් රැකීරක්ෂා වැඩි කරන්න සමුපකාර ව්‍යාපාරයට පුළුවන් කම තිබෙනවා. මේ විධියට සමුපකාර ව්‍යාපාරය වැඩි—දියුණු කිරීමට සෑහෙන බාධාවක් වී තිබෙන්වා, සමුපකාර දෙපාර්තමේන්තුවේ ඇතැම් උසස් නිලධාරීන්ගේ ආකල්ප මේ නිදහස් යුගයට ගැළපෙන විධියට පරිවර්තනය වී නොතිබීම. පරණ විධියටම කල්පනා කරන අයත්, තවම ඒ දෙපාර්තමේන්තුවේ ඉන්නවා. 1957 දී කෙරුණු සමුපකාර ප්‍රතිසංවිධානයටත් කලින් සිට රජයේ සේවයේ කටයුතු කළ පරණ නිලධාරීනුත් මෙහි තවමත් ඉන්නවා. ඒ උදවිය නිතරම කල්පනා කරන්නේ සමුපකාර ව්‍යාපාරයේ ප්‍රගතියක් ඇති කරන්න නොවෙයි, පුළුවන් නම් තිබෙන ප්‍රගතියටත් බාධාවක් කරන්නයි.

එහෙන් මේ අවස්ථාවේදී කියන්න සන්තෝෂයි, මගේ කොට්ඨාශයේ කොබෙයිගනේ සහ නිකවැරටිය යන සමුපකාර සමිති දෙකේ ප්‍රගතියක් ඇති වී තිබෙනවාය කියා, පසුගිය අවුරුදු 4 1/2 තුළ. ඒ ප්‍රගතිය සම්බන්ධයෙන් අමාත්‍යාංශයෙන් හා දෙපාර්තමේන්තුවෙනුත් ලැබුණු සහාය ගැන මේ අවස්ථාවේදී මම ස්තුතිවන්ත වෙනවා.

ඒ වගේම මම නව ගොඩනැගිලි දෙකක වැඩ කටයුතුත් ආරම්භ කළා. ඒ දෙකට මුල්ගල් තිබ්බේ පිළිවෙළින් නියෝජ්‍ය ඇමතිතුමා සහ ගරු ඇමතිතුමායි. නියෝජ්‍ය ඇමතිතුමා මුල්ගල් තිබ්බ ගොඩනැගිල්ලේ වැඩ දැන් අවසානයි. ලබන ජනවාරි මාසයේදී එය විවෘත කරන්න පුළුවන් වෙනවා. නමුත් කොබෙයිගනේ ගොඩනැගිල්ලේ වැඩ අවසන් කරන්න

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තවම බැරි වුණා. ඊට හේතුව ඒ ගොඩ නැඟිල්ල ඇති කෙරෙන ඉඩම සම්බන්ධ ප්‍රශ්නය නිරාකරණය කර ගැනීම සඳහා අමාත්‍යාංශය සහ දෙපාර්තමේන්තුවෙන් දුන් සහයෝගය ප්‍රමාණවත් නොවීමයි. ඒ ඉඩම් ප්‍රශ්නය තවම විසඳා දී නැහැ. ඒ ප්‍රශ්නයේදී අපේ සමුපකාර ව්‍යාපාරයට අසාධාරණයක් කර තිබෙන බව මෙහිදී නොකියාම බැහැ. ඉහළින් යම් යම් බලපෑම් තිබෙන නිසා—යම් යම් නිලධාරීන්ගේ බලපෑම් තිබෙන නිසා—ඒ කටයුත්ත කටදාවත් සම්පූර්ණ කරන්න ලැබෙන එකක් නැහැ.

එම නිසා මට අද කරන්න සිදු වී තිබෙන්නේ මොකක්ද? කොබෙයිගනේ මධ්‍ය මහා විද්‍යාලය දියුණු කිරීම සඳහා ඒ සමුපකාර ඉඩම් භාරදී තිබෙනවා. ඒ සමුපකාර ගොඩනැඟිල්ල ඉදි කිරීම සඳහා විමධ්‍යගත අයවැයෙන් වෙන් කළ මුදලුත් මධ්‍ය මහා විද්‍යාලයේ දියුණු කිරීම සඳහා යෝදවන්න පුළුවන් වන විධියට, ඉක්මනින් ඒ මුදල් නිදහස් කිරීමට ඇමතිතුමා පියවර ගන්නවා ඇතැයි කියාත් මම බලාපොරොත්තු වෙනවා.

අපේ ජනතාව අද මුහුණ පා ඇති රැකියා ප්‍රශ්නය, ගොවි නිෂ්පාදන අලෙවි කර ගැනීමේ ප්‍රශ්නය ආදී ප්‍රශ්න සම්බන්ධයෙන් සමුපකාර ව්‍යාපාරයෙන් ඉටු කළ හැකි සේවය ඉතා විශාලයි. ඒ සේවය සමුපකාර ව්‍යාපාරය මඟින් නියමාකාරයෙන් ඉටු කර ගැනීමට බැරි වී තිබෙන්නේ සමුපකාරයේ තිබෙන දූෂණ නිසයි. ඒ විධියට සමුපකාර ව්‍යාපාරය තුළ දූෂණ, වංචා ඇති කොට එම ව්‍යාපාරය කඩාකප්පල් කිරීමට, විනාශ කිරීමට කටයුතු කළ සේවයෙන් ආරක්ෂා කිරීමටයි, අද සමුපකාර සේවක කොමිෂන් සභාවෙ කටයුතු කරන්නේ. සමුපකාර ව්‍යාපාරයට, ඒ සමුපකාර සේවක කොමිෂන් සභාව තරම් හානිකර වෙනත් දෙයක් අද ඇත්තේ නැහැ. අද කුරුණෑගල දිස්ත්‍රික්කයේ පමණක් නොව මුළු ලංකාව පුරාම, සමුපකාර ව්‍යාපාරය නියම විධියට ක්‍රියාත්මක කිරීමට තිබෙන ලොකුම බාධාව තමයි, ඒ සමුපකාර සේවක කොමිෂන් සභාව. කාලයට ඔබින විධියට සේවක පඩිනඩි වැඩි කළ යුතු බව, ඔවුන්ගේ ප්‍රශ්න නිරාකරණය කළ යුතු බව අපි පිළිගන්නවා. සේවකයන්ගේ දියුණුවට කටයුතු කරන්න ඕනෑ බවත් අපි පිළිගන්නවා. ඒ වගේම සේවකයන්ගේ උසස්වීමුත් සාධාරණ විධියට ලබා දෙන්න ඕනෑ. ඒ හැම එකක් ම සිදුවිය යුතු බව පිළිගන්නවා. නමුත් සමුපකාර ව්‍යාපාරය කඩාකප්පල් කරන්න, විනාශ කරන්න ක්‍රියා කරන උදවිය ආරක්ෂා කරන්න රජයේ ම ආයතනයක් තිබෙනවා නම්, එය ඉතාමත් අවාසනාවන්ත දෙයක් බව කියන්න ඕනෑ. අද එවැනි අවාසනාවන්ත තත්ත්වයක් ඇති වී තිබෙන බව සියලුම මන්ත්‍රීවරුන් සමුපකාර සමිතිවල සභාපතිවරුන් දන්නවා. අද සමුපකාර සමිතිවල සභාපතිවරුන්ට, සාමාන්‍යාධිකාරිවරුන්ට තමන්ගේ කාලයෙන් වැඩි හරියක් උසාවිවල ගත කරන්න සිදු වී තිබෙනවා, සේවක ප්‍රශ්න සම්බන්ධයෙන්. සමුපකාර සේවක කොමිෂන් සභාවේ ඇතැම් තීරණවලට විරුද්ධව නඩු කීම සඳහා සමුපකාර සමිතිවල මුදල් වියදම් කිරීමට සිදුව තිබීම, අද සාමාන්‍ය සිරිතක් බවට පත් වී තිබෙනවා.

මෙයට වඩා මම කතා කරන්න යන්නෙ නැහැ. මේ අවුරුදු කීපය තුළ ගත් තීරණ, ඇති කරන ලද සංවර්ධනය අපි අගය කරනවා. සමුපකාරයට අද තිබෙන්නෙ දේශපාලනඥයන්ගෙ බාධා නොවෙයි, දේශපාලනඥයන්ගෙ අත පෙවීම නොවෙයි, සමුපකාර ව්‍යාපාරයෙ අද තිබෙන්නෙ නිලධාරීන්ගෙ සහයෝගය නොලැබීම බව කියන්න සිදු වී තිබෙනව. එම නිසා සමුපකාර ව්‍යාපාරය සම්බන්ධයෙන් නියම ක්‍රියාපිළිවෙතක් නැතුව, ඒ සම්බන්ධ නියම තීරණ ගන්නෙ නැතුව කටයුතු කරන උදවිය කවුද කියා ඇමතිතුමාට දැනගන්න ඕනෑ නම්--මම ඒ අය ගැන මේ සභාව තුළදී කියන්න කැමති නැහැ—ඒ සඳහා එතුමාට උදව් කරන්න මට පුළුවන්.

යම් වාර්තාවක් දුන්නාම ඒ වාර්තාව සම්බන්ධයෙන් විශ්‍රාම ගිය උසස් සිවිල් නිලධාරීන්ගේ උපදෙස් අනුව ක්‍රියා කරන නිලධාරී මහතුන්ගෙන් සමුපකාර දියුණු කරන්න බැහැ. කෙසේ වෙතත් ඩී. එස්. සේනානායක මැතිතුමාගේ කාලයේදී ආරම්භ වී පසුව විනාශයට පත් වුණු සමුපකාරය නැවතත් ජනතාව අතට පත් කරන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එච්. බී. වන්නිනායක මහතා]

නට අපේ මේ ගරු ඇමතිතුමාට පුළුවන්කම ලැබුණා. එමගින් සමුපකාර ව්‍යාපාරය අද ජාතික සංවර්ධනයට අත දෙන ආයතනයක් බවට පත් වී තිබෙනව. මෙය නීලධාරී වාදයෙන් බේරා ගෙන ජනතාව සංවිධානත් එක්ක ඉදිරියට ගෙන යන්නට ගරු ඇමතිතුමාගේ සහයෝගය අපි ඉල්ලා සිටිනව.

ගරු සභාපතිතුමනි, ආහාර දෙපාර්තමේන්තුව සම්බන්ධයෙනුත් වචන කීපයක් සඳහන් කරන්න කැමතියි. අපේ ගම්බද පළාත්වල ජනතාවට නිකුත් කර ඇති ආහාර මුද්දර සම්බන්ධයෙන් නැවත සමීක්ෂණයක් පැවැත්වීමට ඇමතිතුමා එකඟ වීම ගැන ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම අපේ කොට්ඨාශවල සියයට 30 ක් පමණ ආහාර මුද්දර නොලැබිය යුතු අයට ආහාර මුද්දර ලැබී තිබෙනව. ඒ වාගේම ලැබෙන්න ඕනෑ අයට මුද්දර ලැබී නැහැ. ඒ පිළිබඳව අපේ මන්ත්‍රීතුමන්ලා එක්ක සාකච්ඡා කර කිසියම් සාධාරණ ක්‍රමයක් උඩ, යුක්ති සහගත පදනමක් මත කටයුතු කරන්නට ගරු ඇමතිතුමාට අපගේ සහයෝගය දෙන්න කැමතියි. ඒ අන්දමේ වැඩ පිළිවෙලක් ඇති කරනවා පමණක් නොවෙයි, ඒ වැඩ පිළිවෙළ අසුවල් දිනයේ සිට ක්‍රියාත්මක කරනවාය කියා ජනතාවට දැනගන්න සලස්වනවා නම් අපට සන්තෝෂ වෙන්න පුළුවනි.

ගරු සභාපතිතුමනි, මේ කටයුතුවලදී අපේ ඇමතිතුමාත්, නියෝජ්‍ය ඇමතිතුමාත් ඒ ඒ දෙපාර්තමේන්තුවල මහතුනුත් අපට දැක්වූ සහයෝගය ගැන, ඒ අය කටයුතු කළ ආකාරය ගැන අපේ ස්තුතිය පුද කරමින්, මහජනතාවට ඉතාම ඇනෙන අංශ දෙකක් වන ආහාර සහ සමුපකාර අංශවල කටයුතු දියුණු කිරීමට ඇමතිතුමාට හා නියෝජ්‍ය ඇමතිතුමාට ශක්තිය හා වාසනාව ලැබේවායි ප්‍රාර්ථනාය කරමින් මගේ වචන ස්වල්පය මෙසින් අවසන් කරනව.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා** (අත්තනගල්ල)

*(திரு. லக்ஷ்மன் ஜயக்கொடி—அத்தனகல்ல)*

(Mr. Lakshman Jayakody—Attanagalla)

Mr. Chairman, before I come to Co-operatives, I wish to raise a matter with regard to sugar imports into this country. I am informed that when the sugar prices were very high—somewhere around $ 900 per metric ton—the Government had contracted for a quantity of 80,000 tons—

**එස්. බී. හේරත් මහතා**

*(திரு. எஸ். பி. ஹேரத்)*

(Mr. S. B. Herat)

We contracted for one month.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**

*(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)*

(Mr. Lakshman Jayakody)

I will give you an average of that whole quantity of about 80,000 tons that have been imported.—[*Interruption.*] Wait, I am trying ti help you out. I am not to attack you.

**එස්. බී. හේරත් මහතා**

*(திரு. எஸ். பி. ஹேரத்)*

(Mr. S. B. Herat)

You are wrongly informed.

අ. භා. 6

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**

*(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)*

(Mr. Lakshman Jayakody)

I am not wrongly informed. Right throughout it has been a case of your importing sugar into the country on contracts given out to tenderers every month, and the purchases that have been made come in various ships. These tenders are given out at various stages of the year. Now, I am told that there is a stock of approximately 18,000 to 20,000 tons—I think the correct figure is 20,000 tons—and the Hon. Minister has even taken up in the Cabinet the matter of selling the 20,000 tons and trying to save as much money as possible so that they would not incur a loss. He has to incur this loss mainly becaue the sugar prices

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

came down and the Government decided to allow imports of sugar into the free market by individuals. When this happened suddenly and the free market prices dropped, the Government was saddled with a quantum of sugar which they could not sell.

My point is this. This is one instance where the Government organization has imported sugar at a very high price and cannot get rid of it even at a lower price because the world price has come down. That is why I say that there is something completely and radically wrong with trading in that department. I am not blaming the Ministry as such, because I know that the Ministry does not want to get involved in that aspect of it. They have given permission to trade in wheat and in rice sme time ago and also to trade in sugar. I feel that a very good trader must head the Food Department. Some time ago they had a gentleman by the name of Mr. Hassan, during whose time I think this sugar had been imported ; and today the sugar is melting.

So what I would suggest to the Hon. Minister is to get rid of the stocks as fast as possible at the best possible price ; otherwise he is going to suffer more losses in the future because sugar prices are coming down. Therefore, I would ask him to get in touch with His Excellency.

There is another method he could adopt, but I do not know whether he would agree. That is to regulate the import of sugar by various parties until this stock is over. When you held a monopoly in importing sugar you did regulate the quantum. With regard to the import of sugar a certain amount of regulation has to come in. There are three aspects to this question. It is geared to the production of sugar, the trading in sugar and the manufacture of sugar by the small-holders in the Baddegama and Moneragala areas. I feel that if the Government wants to get over this difficulty it should have some sort of regulation in imports of sugar into this country.

සමූපකාර ව්‍යාපාරය ගැන නුහ දෙනෙක් චෝදනා මුඛයෙනුයි කථා කළේ. මම ඉන්න ප්‍රදේශය සමූපකාර ව්‍යාපාරයේ මාතෘ භූමිය නමින් හඳුන්වන්නට පුළුවන් යයි මම හිතනවා. අපේ ප්‍රදේශයේ තමයි, සදලංකාව දුනගහ වැනි සමූපකාර දියුණු වුණේ. 1929 සිටම මේ රටේ දියුණු විගෙන ආ ව්‍යාපාරයක් සමූපකාර ව්‍යාපාරය. ඒ කාලයේ රජයේ සේවකයන් හිටියෙත් නැහැ, රජයේ ඇඟිලි ගැසීමක් තිබුනෙත් නැහැ, මෙම සමූපකාර ව්‍යාපාරයට. ජනතාව එකතුවෙලා තමයි සමූපකාර සමිති පවත්වාගෙන ගියේ. මට මේ අවස්ථාවේදී සමූපකාර ව්‍යාපාරයේ අද්විතීය නම් දෙකක් මතක් වෙනවා. සදලංකාවේ වින්සන්ට් සුබසිංහ, මරඳගහමුල පී. ඊ. ද ඉසෙඩ් සිරිවර්ධන. ඒ උදවිය සමූපකාර ව්‍යාපාරයේ කටයුතු කළ කාලයේ කවදාවත් ඒ අයට රජයේ සේවකයන්ගේවත්, රජයේවත් අනුග්‍රහයක් වුවමනා කළේ නැහැ. ඒ පදනම මත තමයි, අපේ ප්‍රදේශයේ සමූපකාරවල සැහෙන දියුණුවක්—විශිෂ්ට දියුණුවක්—ඇති කර ගන්ට පුළුවන් වෙලා තියෙන්නෙ. ඒක නියෝජ්‍ය ඇමතිතුමා හොඳින්ම දන්නව.

මේ අවස්ථාවේදී විශේෂයෙන් මම එක කාරණයක් මතක් කළ යුතුයි. එනම්, කුමන රජයක් කුමන කටයුත්තක් කළත්. කුමන පරිපාලනයක් ගෙනත් දැම්මත්, කුමන පාලනයක් කළත්, සමූපකාර ව්‍යාපාරයට විතරක් දේශපාලනය ගාවගන්නෙ නැතුව කටයුතු කළ යුතුයි, කියන එකයි. ඒ තීරණයට බැස්සොත් පොදු වශයෙන්, ජාතික වශයෙන් අපට මේ ප්‍රශ්න සියල්ලම නිරාකරණය කර ගන්න පුළුවන් වෙයි කියා මම විශ්වාස කරනව.

මගේ ප්‍රදේශයේ සමූපකාර ගණනාවක් තියෙනව. ඒවායේ අඩුපාඩු නැත්තෙ නැහැ. අඩුපාඩු ඇති වෙන්නෙ, වෙන මොනම හේතුවක්වත් නිසා නොවෙයි. දේශපාලනඥයන් ඒ ඒ ආයතනවල ප්‍රධානත්වය ලබා ගන්නට කටයුතු කිරීම නිසයි. මට බොහොම කනගාටුවෙන් වුණත් ඒක කියන්ට සිද්ධ වෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලක්ෂ්මන් ජයකොඩි මහතා]

දූනගහ පොල් නිපදවන්නන්ගේ සමූපකාර සමිතිය. ඉතාම වැදගත් සමිතියක්. මුළු ලංකාවේ විතරක් නොවෙයි, නෝර්වේ රටේ, ඩෙන්මාර්කයේ, බෝමුස් කියන සමූපකාර ආයතනවල නියෝජිතයන් පවා දිවුලපිටිය ප්‍රදේශයට ඇවිත් මේ සමූපකාරයේ කටයුතු පිළිබඳව අවබෝධයක් ලබාගෙන ගියා. සිරිවර්ධන මුදලිතුමාගේ කාලයේදී ඒ සමූපකාරය ඒ තරම් හොඳින්, ආදර්ශවත් විධියට පවත්වාගෙන ගියා. එතුමාගේ අභාවයෙන් පසුව ඒ සමූපකාරයටත් දේශපාලනය රිංගන්න පටන් ගත්තා. එදා සිට ඒ සමූපකාරයට පත් වුණු සභාපතිවරුන් ඒ අයගේ අභිප්‍රායයන් මුදුන් පත් කර ගන්නට, ඒ ගොල්ලන්ගේ ජාවාරම් සරු කර ගන්නට පටන් ගත්තා. මමත් ඒ සමූපකාරයේ සාමාජිකයෙක්. ඒ වුණත් අපි කවදාවත් ඒ සමූපකාරය දේශපාලන අතකොලුවක් කර ගත්තෙ නැහැ.

දැන් ඒ සමූපකාරයේ විශාල අඩුපාඩුකම් තියෙනවා. දර විකා හොරෙන් විකිණීම, පෝර විකා නියම මිලකට නොවිකිණීම, පොල් සඳහා අත්තිකාරම් මුදල් ගැනීම, ටෙන්ඩර් ආදිය ලබා ගැනීම, පොල් ලෙලි ගැනීම. ව්‍යාපාරික කටයුතුවල යෙදී සිටින උදවිය ඒ අයගේ ව්‍යාපාරික කටයුතුවලට ප්‍රයෝජනවත් පරිදි කටයුතු කිරීම, වගේ දූෂණ ඒ ස්ථානයේ සිදු වන බව ජනතාව කියනවා.

ගරු ඇමතිතුමාගේ හිත පිරිසිදු බව මම දන්නවා. ගරු ඇමතිතුමා මේ අමාත්‍ය මණ්ඩලයේ ඉන්න ඉතාම වැදගත් ඇමති කෙනෙක්. ඉතාම හොඳින් පරිපාලනය ගෙන යන කෙනෙක්, එතුමා. එතුමාත්, නියෝජ්‍ය ඇමතිතුමාත් කවර කවදාවත් තමන්ගේ සහෝදරයෙක් වුණත් වරදක් කළොත් ඒක වහන්ට ක්‍රියා කරන්නෙ නැති පුද්ගලයන් බව මම හොඳින් දන්නවා. ඒ වගේම එතුමා ළඟ සේවය කරන්නා වූ ලේකම්තුමා ඉතාම දක්ෂ, හොඳ කෙනෙක්. අපේ කාලයේ එතුමා අප යටතේත් සේවය කළා. ඒ නිසා මම ඒ ගොල්ලන්ගෙ මට්ටම දන්නවා. ඒ ගොල්ලන්ගෙ හැකියා දන්නවා; ඒ ගොල්ලන්ගෙ අදහස් දන්නවා; ඒ ගොල්ලන්ගෙ පරමාර්ථ දන්නවා. ඒ වගේම ඒ ගොල්ල මොන මට්ටමින් හැදුණු වැඩුණු උදවියද කියාත් මම දන්නවා. ඒ ගොල්ල කවදාවත් හොරකම් කිරීමේ බලාපොරොත්තුවක් ඇති උදවිය නොවෙයි. එඩ්මන්ඩ් ජේ. කුරේ මහත්මයාගේ පටන්, තිලක් ගුණරත්න මහත්මයා වගේ ඉතාම දක්ෂ උදවිය සමූපකාර සේවයේ යෙදී සිටියා. ඒ නිසා සඳලංකාවේ වේවා, දූනගහ වේවා, මරඳගහමුල වේවා යම් සමූපකාරයක යම් අඩුපාඩුවක් තියෙනවා නම්, 46 (1) වගන්තිය යටතේ නියෝගයක් නිකුත් කර කරුණා කර ඒවා පරීක්ෂා කරන්නට පියවර ගන්න කියා ගරු ඇමතිතුමාගෙන් මම ඉල්ලා සිටින්න කැමතියි.

මම ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්න කැමතියි, ප්‍රථමයෙන්ම දූනගහ පොල් සමිතියේ කටයුතු ගැන 46 (1) පරීක්ෂණයක් පවත්වන්න කියා. මේ අවස්ථාවේදී ඒ සමිතියට තිබෙන චෝදනා විකා කියන්න වුවමනා නැහැ.

දෙවැනි කාරණය මේකයි: "ලක්ෂ 50 ක ලොරියක් දිරයි" කියන ප්‍රවෘත්තියක් "දිවයින" පත්තරයේ පළ වී තිබෙනවා මම දැක්කා. ලක්ෂ 50 ක් ය කියන්නේ fපයිව් මිලියන්. මේක ඇත්තද බොරුද මම දන්නේ නැහැ. ඊට පසුව පරීක්ෂණයක් කරමින් හොයාගෙන යන විට උතුරු කොළඹ තිබුණු අඩුපාඩුකම් වගයක් හෙළි වුණු හැටි හැරිස්පත්තුවේ ගරු මන්ත්‍රීතුමා (ආර්. පී. විජේසිරි මහතා) කිව්වා. ඒකේ සම්පූර්ණ වාර්තාව කියවාගෙන යන විට, සමූපකාර ප්‍රතිපත්ති නොවෙයි, මුළු සමූපකාරය පවා මේ තරම් දුරට ඉතිරි වී තිබීම ඇත්තා වශයෙන්ම සැහෙන ලොට පුදුමයක්. ඒ නිසා, පත්තරවල පළ වන හැම එකක්ම බොරුවක් නොවෙයි කියන කාරණය මම ඉදිරිපත් කරන්න කැමතියි. පත්තරවලින් කරන්නේ යම් වරදක් කොහේ හරි තිබෙනවා නම් එය උලුවා පෙන්නීමයි. එය කෙනකුට මඩ ගහන්න හෝ හිරිහැරයක් කරන්න හෝ කරන දෙයක් නොවෙයි. වරදක් තිබෙනවා නම් පෙන්නා දෙනවා. ලක්ෂ 50 ක් කියන්නේ පොඩි මුදලක් නොවෙයි. එම නිසා, උතුරු කොළඹ සමූපකාරය සම්බන්ධව විවිධ පත්තරවල පළ වී තිබෙන අක්‍රමිකතා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගැන 46(1) වගන්තිය යටතේ පරීක්ෂණයක් කරන ලෙස මම ඉල්ලා සිටිනවා. පත්තරවල පළ වී තිබුණු නොයෙක් ඡායා රූප සටහන් ආදිය මගේ කතාවෙන් පස්සේ මම ගරු ඇමතිතුමාට බාර දෙනවා, පරීක්ෂණයක් කිරීම සඳහා.

ඊළගට, සමුපකාර සේවක කොමිසම ගැන යමක් කියන්න ඕනෑ. මෙය හොඳ නැත, අත්‍යවශ්‍ය නැත ආදී වශයෙන් නොයෙක් දෙනා කිව්වා. නමුත්, අද ඇති වී තිබෙන සමුපකාර පද්නම අනුව්ත් අද සිටින සමුපකාර සේවක සංඛ්‍යාව අනුවත් සලකා බලන විට, සමුපකාරය ස්වාධීන වනතුරු මෙය තියෙන්නට ඕනෑ බව පැහැදිලි වෙනවා. අද සමුපකාර සේවකයාට තිබෙන එකම රැකවරණය මෙපමණයි. ඔහුට වෙනත් කිසිම නිදහසක් නැහැ. කම්කරු උසාවියකට ඔහුට යන්න බැහැ. කම්කරු සේවා, නීති රීති යටතේ ඔහුට සහනයක් ලබා ගන්න අවස්ථාවක් නැහැ. ඒ නිසා සමුපකාර සේවකයාට තිබෙන එකම ආරක්ෂාව මේ කොමිසම පමණයි.

මේ කොමිසමේ නියෝග අනුගමනය නොකරන සමුපකාර සමිති සම්බන්ධයෙන් ගරු ඇමතිතුමා ගන්නා තීරණය කුමක්ද කියා මම අහන්න කැමතියි. යම් වරදක් කළ සේවකයකුට යම් කිසි දඬුවමක් දීලා හෝ ඔහු නිර්දෝෂ වුණායින් පසු හෝ ඔහු නැවත රැකියාවට ගන්නා ලෙස සමුපකාර සේවක කොමිසම නියෝග කළත් සමහර සමුපකාර සමිති ඒ සේවකයන් ආපසු රැකියාවට ගන්නේ නැත්නම් කාට කියන්නද? දිවුලපිටියේ විවිධ සේවා සමුපකාර සමිතියේ එවැනි දෙයක් සිදු වුණා. අයි. ඇන්තනි ප්‍රනාන්දු නමැති මහත්මයාට. ඔහු චෝදනාවලින් නිර්දෝෂී වුණා. පසුව ඔහු රැකියාවට ගන්න කියා සමුපකාර සේවක කොමිසම නියෝගයක් කළ නමුත් ඒ සමිතිය ඔහු ආපසු ගත්තේ නැහැ. ඒ සමිතිය සමුපකාර සේවක කොමිසමේ නියෝගය ක්‍රියාත්මක කළේ නැහැ. ඒ නිසා සමුපකාරය ස්වාධීන වන තුරු—මළ කිව්වා එය ස්වාධීන වෙන්නේ කොහොමද කියා —දේශපාලනයෙන් තොරව එය කටයුතු කරන තුරු මේ කොමිසම තියෙන්න ඕනෑ. ඒ වාගේම, ඒ කොමිසමේ නියෝග ක්‍රියාත්මක නොකරන සමිති සම්බන්ධයෙන් ගරු ඇමතිතුමා ගන්න බලාපොරොත්තු වන පියවර කුමක්ද කියා මම අහනවා.

**එස්. බී. හේරත් මහතා**
*(திரு. எஸ். பி. ஹேரத்)*
**(Mr. S. B. Herath)**

නීතිය වෙනස් කරන්න කටයුතු කර ගෙන යනවා.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
*(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)*
**(Mr. Lakshman Jayakody)**

එසේ කරන තුරු, නමුත් නාන්සේට පුළුවන්කම තිබෙනවා, මහ පනත යටතේ ක්‍රියා කරන්න. ඒ නිසා, නීතිය වෙනස් කරන තුරු නොසිට මුල් පනත යටතේ ක්‍රියා කරන්න. ඒ මුල් පනතේත් සමුපකාර සේවකයන් ගැන සඳහන් කර තිබෙනවා. ඒ අනුව ක්‍රියා කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

අනෙක් කාරණය, පිරිවැටුම් බද්ද. මේ ගැන නම් නමුත් නාන්සේට මුදල් ඇමතිතුමා සමග සටන් කරන්න වෙනවා. පිරිවැටුම් බද්ද නිසා අද ඇති වී තිබෙන තරුණ කිපයක් මම කියන්න කැමතියි. මේ නිසා සමුපකාරයට අද විශාල හානියක් සිදු වී තිබෙනවා. සමුපකාරය පෞද්ගලික ආයතනයක් නොවෙයි. මේක එක් එක් කෙනාගෙන් එකතු කළ මුදල්වලින් ගෙන යන ආයතනයක්. අයිරා මගින් කට යුතු කරන්න අද මේකට සිදු වී තිබෙනවා. විශේෂයෙන්ම, මුද්දර බෙදාහැරීම, භූමි තෙල් බෙදා හැරීම වැනි විශාල සේවාවන් කරන විට, ඒවායේ ගණන් හිලවු ගැන බලන විට, ඇත්ත වශයෙන්ම බැංකු අයිරා නැතිව කවර කවදාවත්, ඒ කටයුතු කරන්න අමාරු බව පැහැදිලි වෙනවා. බැංකු අයිරාවක් ගත්තු හැටියෙ සියයට 22 ක පොලියක් ගෙවන්න ඕනෑ. එතකොට, ඒකට පිරිවැටුම් බද්දක් ගෙවන්නත් ඕනෑ. එහෙම වුණාම සමුපකාරය



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලක්ෂ්මන් ජයකොඩි මහතා]

ගෙනයන්න පුළුවන් කමක් නැහැ. ඒ නිසා ගරු මුදල් ඇමතිතුමාත් සමග සාකච්ඡා කරගෙන පිරිවැටුම් බද්ද සමුප කාරය සම්බන්ධයෙන් නැති කිරීමට කට යුතු කරන ලෙස මම ඉල්ලනවා.

ඊළඟට දේවනායගම් කමිටුවේ වාර්තාව. දේවනායගම්තුමා ඉතාමත් හොඳ වාර්තා වක් ඉදිරිපත් කර තිබෙනවා. ඡන්ද යෙන්ම පත් කරන්නය කියා තිබෙනවා. අන්න එහෙම පියවරක් ගන්න. එත කොට පුළුවන්, දේශපාලනයෙන් ඈත් කරන්න. ඒ සම්බන්ධයෙන් මම ප්‍රශංසා කරන්න කැමතියි, රත්ගම, සඳලංකාව සහ කඹුරුපිටිය යන ප්‍රාථමිකවලට නම් කළ අධ්‍යක්ෂවරුන්ට. ඒ සියලු දෙනාම අස් වුණා. ඒ ගොල්ලන් කිව්වා ඡන්ද යෙන් පත් කරන්න ඉඩ තියන්නය කියා. ඒක ඉතාමත්ම සුභදායකයි.

**ඇල්බට් ද සිල්වා මහතා** (කඹුරුපිටිය)
(திரு. அல்பர்ட் த சில்வா—கம்புறுப்பிட்டிய)
(Mr. Albert de Silva—Kamburupitiya)

කඹුරුපිටියෙ අස් වුණේ නැහැ.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

එහෙනම් අසුභයි. අස් වුණා නම් සුභයි. අස් වුණේ නැත්නම් අසුභයි. මම කියන්නෙ ඡන්දයෙන් පත් වී යනවා නම් ඉතාම වැදගත් බවයි.

කටානෙ විවිධ කර්මාන්ත සමූපකාර සමිතිය සම්බන්ධ අඩුපාඩුවක් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ප්‍රශ්න ගණනාවක් මේ සභාවෙ ඇහැව්වා. ඒ සමුපකාරය කටයුතු කර තිබෙන ආකාරය ගැන 'හොඳ උත්තර විකත්' මේ සභාවේදි දුන්නා. නමුත් -ඒවා ක්‍රියාත්මක කර නැහැ. කිසිම පරීක්ෂණ යක් කර නැහැ. එම නිසා කරුණාකර කටානෙ විවිධ කර්මාන්ත සමූපකාර සමිතියේ අඩුපාඩු ගැන ක්‍රියා කරන්නය කියා මම නමුන්නාන්සේගෙන් ඉල්ලනවා.

සමුපකාර ව්‍යාපාරයේ තිබෙන වටිනාකම ගැන මේ මැති ඇමතිවරු කවුරුත් දන් නවා. ඒ නිසා අපි මේක දේශපාලනයෙන් ඈත් කරගෙන කටයුතු කරමු. මම කියන්න කැමතියි, දිවුලපිටිය, සඳලංකාව, අත්තන ගල්ල ආදී ප්‍රදේශවල සමුපකාරවලට කිසිම දේශපාලනඥයෙක් ඇඟිලි ගහන්නෙ නැති බව. කිසිම කෙනෙකුට කියන්න බැහැ. දේශපාලනඥයෙක් ඇඟිලි ගැහැව්වය කියා. මොකද, අපි පුහුණු වී තිබෙන්නේ සමුප කාර ක්‍රමයටයි. එපමණක් නොවෙයි, සමුපකාරයට සුදුසු උදවිය මෙන්න මේ උදවිය කියා සකස් වීමක් වී තිබෙනවා. මම කියන්න කැමතියි, දුනගහ ප්‍රදේශයේ සමුපකාර සමිති ව්‍යාපාරය ගෙන යාමට හතර පස් දෙනෙක් පරම්පරාවෙන්ම දූන් ඉන්නවා. මුදලිතුමාගේ අභාවයෙන් පස්සෙ අපි කල්පනා කළා, කවුද මේක ගෙන යන්න කියා. අපි දේශපාලනයෙන් තෝරා පුද්ගලයෙක් ගත්තා. තවත් එක් තරා වයස් මට්ටමක කෙනෙකුත් ගත්තා. ඊළඟට තවත් එක් කෙනෙක් අරගෙන පුහුණු කරගෙන යනවා. එයා දේශපාලන යෙන් තොරව, දැනට විශ්ව විද්‍යාලයේ උගන්වන කෙනෙක්. එයා ඒ ප්‍රදේශයේ සමුපකාර ව්‍යාපාරය ආරක්ෂා කරගෙන යාමට සුදුසුය කියා අපේ සැකසුමක් තිබෙ නවා. දේශපාලනයෙන් ඈත්ව කටයුතු කරන්නට පුළුවන් යම් ආයතනයක් තිබෙ නවා නම් ඒ එකම ආයතනය සමුපකාර ආයතනය කියා ප්‍රකාශ කරමින් ඒ ව්‍යාපා රය ඒ අනුවම හැඩ ගැසේවා කියා ප්‍රාර්ථනා කරමින් මම මගේ කථාව අවසන් කරනවා.

අ. භා. 6.15

**ඩී. වින්සන්ට් ඩයස් මහතා** (බදුල්ල)
(திரு. டீ. வின்சன்ட் டயஸ்—பதுளை)
(Mr. D. Vincent Dias—Badulla)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ආහාර හා සමුපකාර අමාත්‍යාංශය යටතේ මම කරුණු කීපයක් ගැන පමණක් ගරු ඇමතිතුමා ගේ අවධානය යොමු කරන්නට කැමතියි. නමුන්නාන්සේ දන්නවා සමුපකාර සේවක ප්‍රශ්න විසඳීම සඳහා සමුපකාර සේවක කොමිෂන් සභාවක් ඇති කළ බව. ඒ කොමිෂන් සභාවෙන් කොතරම් දුරට ප්‍රයෝජනයක් වෙලා තිබෙනවාද කියන එක ගැන ගරු මන්ත්‍රීතුමන්ලාගේ කථා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වලට ඇහුම්කන් දීගෙන සිටියා නම් දැන ගන්න තිබුණා. ඒ කොමිෂන් සභාවෙන් සොයන්න ඕනෑ, මුළු ලංකාවේම—මුළු දිවයිනේ—සිටින සමුපකාර සේවකයන් ගේ ප්‍රශ්න ගැන. ඇපෑලක් ගැන විභාග යක් කරන්නට අවුරුදු පහක්, හයක් හතක් අටක් පමණ කල් ගත වෙනවා. එම නිසා මේ සමුපකාර සේවක කොමිසන් සභාවෙන් ප්‍රයෝජනයක් වෙයිද? මම දන්නවා ඒ සභාපතිතුමා දිවංගත බණ්ඩාරනායක අගමැතිතුමාගේ කාලයෙ සිටම තවම එතැන ඉන්නවා. ඒ කොමිසන් සභාවෙන් සමුපකාර සේවකයන් ගේ ප්‍රශ්න විසඳීම පිණිස ඇයි මේ ප්‍රමාද වෙලා ගම්මින් යන්නේ කියා අපි දැන ගන්න කැමතියි. නාමූන්නාන්සේ දන්නවා සමුපකාර සේවකයන්ගේ අපතේ යැවීම් ගැන. විශේෂයෙන්ම ලිකේජ්. හැම කළමනාකාරයෙක්ම වාගේ ඇවිත් මාස හයක් අවුරුද්දක් ගත වෙන විට රු. 6000ක, 10,000ක, 12,000 ක ඔය වගේ මුදල් ප්‍රමාණයක් වඩා අඩුවීම් ඇති වෙනවා ලිකේජ්. මේ කළමනාකාරවරුන්ට විරුද්ධව හෝ යම් සේවකයින්ට විරුද්ධව තීරක තීන්දු දෙන්නට මේ කොමිසන් සභාව මේ තරම් කාලයක් ගන්නේ ඇයි? එක්කෝ මෙය විමධ්‍යගත කරන්න. දිස්ත්‍රික් මට්ටමෙන් මේ කටයුතු කරන්න. සමුපකාර කොමසාරිස් කාර්යාලවලට බල තල දෙන්න. එහෙම නැත්නම් වෙනත් නිලධාරියෙක් —නීති නිලධාරියෙක්—හෝ පත් කරන්න. කලින් එහෙම කෙනෙක් පත් කර සිටියා. මේ නඩු අහන්න. නමුත් දැන් ඒ ක්‍රමය සම්පූර්ණයෙන්ම අහෝසි කර තිබෙනවා.

හොරකම් කළ, ගසා කෑව අය අවුරුදු ගණනාවක් නිදැල්ලේ හැසිරෙනවා. අවුරුදු හතරක් පහක් නොවෙයි, සමහර විට අවුරුදු 10ක් පමණ කාලයක් තිස්සේ නිදැල්ලේ හැසිරෙනවා. ඒ අයට විරුද්ධව කිසිම පියවරක් ගන්නේ නැහැ. සමුපකාරයේ දියුණුවට මෙය ලොකු ප්‍රශ්නයක් වී තිබෙනවා. ඒ නිසා අපි කියා සිටින්නේ මේ කොමිසන් සභාව තිබීමෙන් කිසිම වැඩක් නැති බවයි. මට නම් පෙනෙන්නේ මෙය මහළු මඩමක් වගෙයි. එක්කෝ එය අහෝසි කරන්න. මේවාට, අලුතෙන් පත් කරන්න මිනිසු නැද්ද? ඇයි මේ තරම් නඩු ගොඩ රාශියක් තිබියදී මේවා වහගෙන ඉන්නෙ, කල් දම දමනෙ? දැන අවුරුදු ගණනාක් ගත වුණා. පසුගිය ආණ්ඩුවේ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන්—පොල්ගහවෙල, අක්මීමන, රත්තොට ආදී ආසනවල—කී දෙනෙක් මේ රටේ සමුපකාරයේ නාමයෙන් ගසා කෑවද? සමුපකාරයේ නාමයෙන් අපේ රටේ කී දෙනෙක් ගසා කෑවද? අද මේ වන තෙක් මේ එක් මන්ත්‍රීවරයෙක් වත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හිටපු මන්ත්‍රීවරුන් එක් කෙනෙක් වත් උසාවියට ගෙනැවිත් කූඩුවට නග්ගවන්න සමුපකාර සේවක කොමිසන් සභාවට බැරිව තිබෙනවා. ඇයි? මම දැනගන්න කැමතියි. ඔබතුමා පිළිතුරු කතාවකදී කිව්වා මට මතකයි, නඩු හබ 4000 ක්, 5000 ක් පමණ අවසන් කර තිබෙනවා කියා. නමුත් කෝ නමුන්නාන් සේලා ගත් ක්‍රියා මාර්ගය? අපි දැන ගන්න සතුටුයි. අවුරුදු හතරක් ගත වුණාට පසුවවත් දැනගන්න සතුටුයි. ලබන වර්ෂයේදීවත් මේ ගසාකෑම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හිටපු මන්ත්‍රීවරුන් ටික කූඩුවට නග්ගවන්නය කියා ඔබතුමාගෙන් බැගෑපත්ව ඉල්ලා සිටිනවා.

ඒ වගේම ඔබතුමාට චෝදනාවක් කරන්නත් ඕනෑ. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් වුණත් කරන්න දෙයක් නැහැ, මට සමාවෙන්න. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හිටපු, හොරකම් කළ, මැරකම් කළ, දූෂණ කළ මන්ත්‍රීවරුන් ටික නීතියේ රැහැනට අල්ලා ගන්න තවම බැරි වුණේ ඇයි? මෙය අපි මහජනතාවට කිව්වට පමණක් මදි. අපි නියම විධියට නීතිය ඉටු කරන්න ඕනෑ. මහජනතාවට පෙන්වන්න ඕනෑ, හොරු කව්ද කියා.

ඒවගේම මා නමුන්නාන්සේට මතක් කරන්න ඕනෑ, සමුපකාර අරමුදල ගැන. දැන් මේ අරමුදලේ විශාල මුදලක් තිබෙනවා. කෝටි ගණනක් තිබෙනවා. දැන් ඒවාට මොකද කරන්නෙ? සමුපකාර සමිතිවලට ණයට දෙන්න. පොලියට දෙන්න. වාහන ගැනීමට හෝ ගොඩනැගිලි හදා ගැනීමට දෙන්න. මේ නවාට හරි මේ සමුපකාර අරමුදල පාවිච්චි කරන්න.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. වින්සන්ට් ඩයස් මහතා]

ඒ සමගම තවත් කාරණයක් කියන්න ඕනෑ. සමූපකාර දෙපාර්තමේන්තුවට ලිය කියවිල්ලක් එවුවාම පිළිතුරු ලැබෙන්නේ නැහැ. ඇතැම් සමූපකාර සමිති මගින් ගොඩනැගිලි සංවර්ධනය කිරීමට බලය ඉල්ලා ඉල්ලුම් පත් එවූ විට ඒවාට කිසිම පිළිතුරක් ලැබෙන්නෙ නැහැ. බදුල්ල සමිතිය මගින් අපි වෙළඳ සංකීර්ණයක් හදන්නට පිඹුරු පත් සකස් කර, සේරම අවශ්‍ය දේ සකස් කර, මහජන බැංකුවෙන් මුදල් පවා ලබා දීමට කටයුතු සලසා අවශ්‍ය අනුමැතිය ලබා ගන්නට සමූපකාර දෙපාර්තමේන්තුවට ලියා එවුවා. අවුරුදු දෙකක් ගත වුණා. සමූපකාර දෙපාර්තමේන්තුවට තවම බැරි වුණා, අවශ්‍ය අනුමැතිය කොල කැල්ලෙන් ලබා දෙන්න. එහෙනම් කොහොමද සමූපකාරය දියුණු කරන්නේ, ප්‍රාදේශීය මට්ටමෙන්?

අද අපට බැණුම් අහන්නට සිදු වී තිබෙනවා. මොකද කළේ කියල අහනවා. දැන් අපි දේශපාලන ස්වරූපයක් දී තිබෙනවා. ඡන්දය දීලා පත් කරලා තිබෙනවා. තවත් මොනවාද අපි ජනතාවට කියන්න යන්නේ. එම නිසා දෙපාර්තමේන්තුවෙන් මේ ප්‍රමාද නැති කරන්නට ඕනෑ. සමහර විට ඒ.සී. සී.ඩී., ලාට බලය නැහැ. ඒ බලතල ඔක්කොම මහතැන්වලට ගෙනල්ලා සවි කරගෙන තියාගෙන ඉන්නවා. බලතල කාටවත් දෙන්නේ නැහැ. බලතල විමධ්‍යගත කිරීම අපේ රජය ආන් ප්‍රතිපත්තියක් හැටියට පිළිගෙන තිබෙනවා නම් සමූපකාර දෙපාර්තමේන්තුවේ පාලනයත් විමධ්‍යගත විය යුතු බව මම නමුන්නාන්සේලාට මතක් කරලා දෙනවා.

විශේෂයෙන්ම ප්‍රාදේශීය විශයෙන් අපට අත දෙනවා නම් සමූපකාර දෙපාර්තමේන්තුවෙන් මොන තරම් රැකීරක්ෂා සංඛ්‍යාවක් ඇති කරන්නට පුළුවන්ද? සෑහෙන්නට ඇති කරන්න පුළුවන්කම තිබෙනවා. නමුත් අද මොකද වෙලා තිබෙන්නේ? සමහර සමූපකාර සමිති කර ගෙන ගිය නිෂ්පාදන පවා ඇනහිට තිබෙනවා. කවදාවත් නිෂ්පාදනයක් ඇති කරන්න, දියුණු කරන්න ඉහළින් අත දෙන්නේ නැහැ. බැංකු ණය කලට වේලාවට ලැබෙන්නේ නැහැ. අවශ්‍ය උපදෙස් ලැබෙන්නේ නැහැ. අතදීමක් ඉහළින් ලැබෙන්නේ නැහැ. එක්කෝ අමු ද්‍රව්‍ය නැහැ. ඒවා ඉබේම වැහිලා යනවා.

හුඟක් සමූපකාර සමිති බීඩි එතීමේ කර්මාන්තය සාර්ථකව කර ගෙන ගිය බව අපි දන්නවා. බීඩි සංස්ථාවෙන් කොළ ගෙන්වන්නේ නැති නිසා දැන් සම්පූර්ණයෙන්ම ඒ කර්මාන්තය වැහිලා ගිහින් දහස් ගණනක් ළමයින් අනාථ වෙලා සිටිනවා. රක්ෂාවක් නැතිව. අපි අසන්නට කැමතියි, මේ රටේ ඕනෑම කෙනෙකුට ආනයන නිදහස තිබෙනවා නම් සමූපකාර දෙපාර්තමේන්තුවට පිටරටින් බීඩි කොළ ටිකක් ගෙනල්ලා සමූපකාර ප්‍රාදේශිකවලට ඒ කර්මාන්තය කර ගෙන යන්නට දෙන්න බැරි ඇයි? එතකොට ඇත්ත වශයෙන්ම අත දීමක් කරන්නට පුළුවන් නේද? ඇයි මේ 'මොනොපොලි' එක, එක තැනකට පමණක් දීලා තිබෙන්නේ? එම නිසා සමූපකාරවල රැකීරක්ෂා අංශය සම්පූර්ණයෙන්ම අඩපණ වෙලා තිබෙනවා.

ඊළඟට ප්‍රවාහන සේවය ගැන මම විශේෂයෙන්ම මතක් කරන්නට කැමතියි. අද සමූපකාර සමිතිවලට ප්‍රවාහන සේවය සාර්ථක ලෙස ගෙන යන්නට බැහැ. මේ තිබෙන ලොරි ටික ඔක්කොම අරගෙන, එක 'පූල්' එකකට ගෙන එන්නය කියා දිස්ත්‍රික් මට්ටමේ හැම රැස්වීමකදීම අපි ඉල්ලුවා. සමූපකාර ප්‍රවාහන සේවයක් ඇති කරන්නට අපේ දිසා ඇමතිතුමාට දෙන්න බලය. අපේ දිසා ඇමතිතුමා ඒක කරයි. දිස්ත්‍රික් මට්ටමෙන් සමූපකාර ප්‍රවාහන සේවයක් හදන්නට කියල මේ ලොරි ටික ඔක්කොම දිසා ඇමතිතුමාට දෙන්න. එතුමා ඒක කරයි. අපේ ආසනවලින් සම්පූර්ණ සහයෝගය අපි එතුමාට දෙන් නම්. එහෙම කළොත් සමූපකාරයේ බඩු ටික එහාට මෙහාට ගෙන යාම පමණක් නොවෙයි, මුළු දිස්ත්‍රික්කයේම තිබෙන ප්‍රවාහන කටයුතු අපට සාර්ථකව කර ගන්නට පුළුවන් බව මම නමුන්නාන්සේට මතක් කරන්නට කැමතියි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මම තව කාරණා දෙක තුනක් කියා මගේ කතාව නවත්වන්නම්, මම බොහොම සන්තෝෂ වෙනවා අපේ සභාපති බෝගලගම මහත්මයා, සර්වජන ඡන්ද ක්‍රමයට පණස් වසරක් පිරීම නිමිත්තෙන් පණස් ලක්ෂයක ගොඩනැගිල්ලක් බදුල්ලට දෙන්න සූදානම් කර තිබීම ගැන. මම එය මේ අවස්ථාවේ ස්තූතිපූර්වකව මතක් කරනවා.

සමුපකාරය නිසාම ඇති වුණු මහජන බැංකුව අද සමුපකාරයට දක්වන්නේ කුඩම්මාගේ සැලකිලි. සමුපකාර ව්‍යාපාරයෙන් ආරම්භ වුණු මේ බැංකුවෙන් සමුපකාරයට ලැබුණු වරප්‍රසාද සියල්ලක්ම හීන වී ගොස් තිබෙනවා. තමුන්නාන්සේලාට නිදහස තිබෙනවා නම්, ස්වාධීනත්වය තිබෙනවා නම්, කාගෙන් හරි බලපෑමක් ඇති වෙන්නේ නැත්නම් ආයෙත් වරක් මේරටේ සමුපකාර බැංකු ක්‍රමය පටන් ගන්න. අරින්න ආයෙත්. එහෙම නැත්නම් ග්‍රාමීය බැංකු ක්‍රමය හරි තව ටිකක් පුළුල් කරන්න. තව ටිකක් බලතල වැඩි කරන්න. අද ඒවායේ සල්ලි වෙනත් දෙයකට ප්‍රයෝජනයට ගන්නට බැහැ. ඒවා එහෙමම තිබීමෙන් කිසි වැඩක් නැහැ. ඒ නිසා මේ බැංකු ඇති කිරීම ගැන යළිත් වරක් ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරන්න. එතකොට විශාල සංඛ්‍යාවකට රැකීරක්ෂා සපයන්නටත් පුළුවන්. සමුපකාර ව්‍යාපාරයේ තිබෙන මුදල් ටික සේරම මේ බැංකු මාර්ගයෙන් තමුන්නාන්සේට හරියාකාරව ප්‍රයෝජනයට ගන්නට පුළුවන් බව මම මතක් කරන්න කැමතියි.

සමුපකාර ව්‍යාපාරයේ සේවයේ යෙදී සිටින සේවකයන් ගැන විශේෂයෙන් අපි අමතක කරන්නට හොඳ නැහැ. ඉතාමත් දුබල ලෙස දුක් විඳින සේවක පිරිසක් මේ රටේ සිටිනවා නම් ඒ සමුපකාර සේවකයන් බව මම මේ අවස්ථාවේදී මතක් කරනවා. රජයේ සේවකයන්ට ලැබෙන වරප්‍රසාද ඒ අයට දෙන්නේ නැහැ. බඩු මිල වැඩි වෙන කොට ඒ අයගේ ආර්ථික තත්ත්වය තවත් පහළ බහිනවා. අද ඒගොල්ලන්ට ලැබෙන වේතනය කොහොමටවත් ජීවත් වෙන්නට ප්‍රමාණවත් නැහැ. එමනිසා මේ සේවකයන්ගේ යහපත පිණිස මම ඔබතුමාගෙන් කාරණා 11 ක් ඉල්ලා සිටිනවා. මම ඒ කාරණා ඉල්ලන්නේ මේ ශ්‍රී ලංකා ද්වීපයේ සිටින ලක්ෂ සංඛ්‍යාත සමුපකාර සේවකයන්ගේ යහපත පිණිසයි. එම නිසා ඒ ගැන කල්පනා කර බලා ඒ අයගේ ආර්ථික තත්ත්වය දියුණු කිරීම පිණිස ඔබතුමාට දෙන්නට පුළුවන් සහයෝගය දුන්නොත් එය අපිට කරන උතුම්ම ක්‍රියාවක් කියා මම හිතනවා.

මේවායි, මගේ ඉල්ලීම්: පසුගිය රජය මගින් වැටුප් ක්‍රමයක් සකස් කළා. ඒ වැටුප් ක්‍රමය වර්තමාන තත්ත්වයට කොහෙත්ම ගැලපෙන්නේ නැහැ. සමුපකාර සේවකයන්ගේ අවම වැටුප රු. 450 ක්වත් කරන්නය කියා නියම කරන මෙන් මා ඉල්ලා සිටිනවා.

සමුපකාර සේවක කොමිෂන් සභා පනත නීතිගත වීමට පෙර සේවකයන්ට වර්ෂයකට නිවාඩු දින 42 ක් තිබුණා. අද එය 21 දක්වා අඩු කර තිබෙනවා. ඒ නිවාඩු දින 42 යළිත් ලබා දෙන ලෙසත් මා ඉල්ලා සිටිනවා.

ඒවාගේම දැනට සමුපකාර සමිතිවල දෛනික සේවයේ යෙදී සිටින සේවකයන්ට දිනකට ලැබෙන්නේ රු. 4 යි. ඒක බොහොම සුළු මුදලක්. ඒ මුදල ජීවත් වෙන්නට කොහොමවත් ප්‍රමාණවත් වෙන්නෙ නැහැ. එමනිසා ඒ අයගේ සේවා කාලය අනුව ඒ සේවකයන්ට යම්කිසි දීමනාවක් අඩු වශයෙන් දිනකට රු. 8 ක්වත් ගෙවන්නට නියම කරන ලෙසත් මා ඉල්ලා සිටිනවා.

දැනට අතපසු වී තිබෙන සේවක විනය පරීක්ෂණ කටයුතු කඩිනමින් අවසානයක් කර ඒ අයගේ ප්‍රශ්න ඉතා ඉක්මණින් විසඳන ලෙසත් මා ඉල්ලා සිටිනවා. ඒ සම්බන්ධයෙන් අදාල සමිතිවලට නියෝගයක් කරන ලෙසත් මා ඉල්ලා සිටිනවා.

සමුපකාර සමිතිවල දැනට තිබෙන පිරිස් බල තක්සේරුව වර්තමාන තත්ත්වයට කිසිසේත්ම යෝග්‍ය වෙන්නෙ නැහැ. සුළු ආර්ථික තත්ත්වයක් ඇති සමිතිවලට ඒ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. වින්සන්ට් ඩයස් මහතා]

සම්බන්ධව නැවත තක්සේරුවක් කරන්නට පුළුවන්කමකුත් නැහැ. එම නිසා දෙපාර්තමේන්තුවේ උපදෙස් සහ පරීක්ෂාව යටතේ සමිතිවල ආර්ථික තත්ත්වයට ගැලපෙන ලෙස යළිත් පිරිස් බල තක්සේරුවක් කරන මෙන් මා එතුමාට යෝජනාවක් කරනවා.

රජය මගින් විධින් විට යම් යම් දීමනා ගෙව්වත් සමූපකාර සේවකයන්ට ඒවා කලට වේලාවට ලැබෙන්නේ නැහැ. ලාභ පරතරය අනුවයි, ඇතැම් සමිතිවල සේවකයන්ට ඒ දීමනා ලැබෙන්නේ. මේ තත්ත්වය නිසා දිවයින පුරා සිටින සමූපකාර සේවකයන් ලක්ෂ සංඛ්‍යාත ප්‍රමාණයක් අනාථ වී ඉන්නවා. එමනිසා මේ ලැබෙන දීමනා ඒ අයටත් කලට වේලාවට ලැබෙන්නට සලස්වන මෙන් නියෝගයක් කරන ලෙසත් මා ඉල්ලා සිටිනවා.

සමූපකාර සමිතිවල කළමනාකාර මහත්වරුන්ට සමූපකාර චක්‍ර ලේඛය අනුව වියළි බර සහන සීමාව ලැබෙන්නේ නැහැ. කළමනාකාර මහත්වරුන්ට ඒ වියළි බර සහන සීමාව ලබා දෙන මෙන් මා ඉල්ලා සිටිනවා.

බොහොම සමූපකාර සමිතිවල වර්තමාන ආර්ථික තත්ත්වය දිනෙන් දින ඉතා හය නැති ලෙස පහත වැටී ගෙන එන නිසා ඒවා දියුණු කිරීම පිණිස දෙපාර්තමේන්තුව මගින් උපදෙස් දෙන්නට වැඩ පිළිවෙළක් සකස් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ඒ සම්බන්ධයෙන් වඩාත් සමීප විමර්ශනයක් සඳහා වඩාත් සමීප සුපරීක්ෂාකාරිත්වයක් ඇති කරන ලෙසත් මා ඉල්ලා සිටිනවා.

රාජ්‍ය සංස්ථාවල නිෂ්පාදන භාණ්ඩ බෙදා හැරීමේ නියෝජිත්ව අද පෞද්ගලික අංශයට දී තිබෙනවා. ඒවා සමූපකාරවලට ලබා දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

එදිනෙදා වැටුප්වත් ගෙවීමට නොහැකි තත්ත්වයක තිබෙන සමූපකාර සමිතිවලින් ආදායම් බදු අය කරන්නටත් පටන් ගන්නට ඉඩ තිබෙනව. එහෙම වුණොත් සමූපකාර ව්‍යාපාරය විශාල ප්‍රශ්නයකට මුහුණ දෙන්නට සිද්ධ වෙයි. ඒ ගැන අවධානය යොමු කර සමූපකාර සමිතිවලට ආදායම් බදු සහන ලබා දෙන්නට පියවර ගන්නා ලෙසත් මා ඉල්ලා සිටිනවා.

මා මීට වඩා කථා කරන්නට අදහස් කරන්නේ නැහැ. ඇත්ත වශයෙන්ම ජ්‍යෙෂ්ඨ ඇමතිවරයකු- වන අපේ ආහාර හා සමූපකාර ඇමතිතුමාට අපි උපදෙස් දෙන්නට උවමනාවක් නැහැ, මේ බැරෑරුම් අමාත්‍යාංශයේ වැඩ කටයුතු සාර්ථක ලෙස ගෙන යන්නට. මා ඉදිරිපත් කළ කරුණු ඔබතුමාගේ කාරුණික අවධානය යොමු වේ යයි බලාපොරොත්තු වෙමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

අ. භා. 6.30

**ඇල්බට් ද සිල්වා මහතා (කඹුරුපිටිය)**

(திரு. அல்பேர்ட் த சில்வா — கம்புறுப்பிட்டிய)

(Mr. Albert de Silva)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අත්තනගල්ලේ මන්ත්‍රීතුමා දැන් කිව්වා දේශපාලනයෙන් තොරව සමූපකාරය ගෙන යන්නය කියල. පසුගිය ආණ්ඩුවේ හත් අවුරුද්ද ඇතුළත ඒ ආණ්ඩුවේ මන්ත්‍රීවරු සමූපකාර සංගම්වල සභාපතිවරු වී ඒවා නැති නාස්ති කරමින් ලක්ෂ ගණන් මුදල් වංචා කළා නේද කියා මම ඒ මන්ත්‍රීතුමාගෙන් අහන්නට කැමතියි.

අපේ නියෝජ්‍ය වෙළඳ ඇමතිතුමාගේ කථාවේදී ඉදිරිපත් කළා, ඒ සියළුම විස්තර. විවිධ සේවා සමූපකාර සංගම්වල සභාපතිවරු හැටියට කටයුතු කළ ඒ අය ලක්ෂ ගණන් මුදල් වංචා කර තිබෙන ආකාරය එතුමා පෙන්නුම් කළා. මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. වහාම ඒ සමූපකාරවල හිටපු මන්ත්‍රීවරු කූඩුවට ගෙනෙන්න. කූඩුවට ගෙනැවිත් ඒවා විභාග කර ඒ අයට නිසි දඬුවම් දෙන්න.

අපේ රජයේ මන්ත්‍රීවරු සමූපකාර සමිතිවලට අත ගහන්නෙ නැහැ. කඹුරුපිටියෙ විවිධ සේවා සමූපකාර සමිතියට මම යනකොට එතැන සාමාන්‍යාධිකාරීවරයෙක් හිටියෙ නැහැ. එතැන රෙදි වෙළඳ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සැලේ හිටපු කළමනාකාර මහත්මයා සාමාන්‍යාධිකාරි වශයෙන් වැඩ බලනවා. අධ්‍යක්ෂ මණ්ඩලේ, සාමාන්‍යාධිකාරි මහත්මයාගෙ සාත්තුවේ. ඒ මහත්මයා කියන විධියටයි, අධ්‍යක්ෂ මණ්ඩලේ වැඩ කළේ. විශාල වශයෙන් දූෂණ කර තිබෙනවා. ඒ විධියට 'ජී. එම්.' හැටියට වැඩ කළේ, ගාජා කියන මහත්මයෙක්. එම නිසා මම කොමිෂන් සභාවේ මහත්වරුන්ට උපදෙස් දුන්නා, අලුත් ජී. එම්. කෙනෙක් පත් කරන්න. ඒ කොහොම වුණත්, සුදුසුකම් නැති වුණත් එයා අධ්‍යක්ෂ මණ්ඩලෙත් එක්ක සාකච්ඡා කරල, තනතුරේ ස්ථිර කර ගැනීමට කොමිෂන් සභාවෙන් ලියුමක් අරගෙන තවම සුමානයක් වුණේ නැහැ. කොමිෂන් සභාවේ උදවිය නොමග ඇරල තමයි, ඒ විධියට කටයුතු කරගෙන තිබෙන්නේ.

ඒ ගැන මට දැන ගන්න ලැබුණා, පෙන්සමකින්. එම නිසා මම කොමිෂන් සභාවට ගිහින් ඒ තීරණය ගැන මම විභාග කරල බැලුවා. ඊට පස්සේ කොමිෂන් සභාව විදුලි පණිවිඩයක් මගින් වහාම ඔහුගෙ සුදුසුකම් අවලංගු කළා.

**සරත් මුත්තෙට්ටුවෙගම මහතා**
*(திரு. சரத் முத்தெட்டுவெகம)*
(Mr. Sarath Muttetuwegama)

අවලංගු කෙරුවෙ සුදුසුකම්ද?

**ඇල්බට් ද සිල්වා මහතා**
*(திரு. அல்பட் த சில்வா)*
(Mr. Albert de Silva)

පත්වීම අවලංගු කළා.

**සරත් මුත්තෙට්ටුවෙගම මහතා**
*(திரு. சரத் முத்தெட்டுவெகம)*
(Mr. Sarath Muttetuwegama)

මන්ත්‍රීතුමා කොමිෂන් සභාවටත් බල පෑම් කරල තිබෙනවා. කොමිෂන් සභාව වැඩ කරන්නේ ඒ විධියටද?

**ඇල්බට් ද සිල්වා මහතා**
*(திரு. அல்பட் த சில்வா)*
(Mr. Albert de Silva)

ඊට පස්සෙත් අධ්‍යක්ෂ මණ්ඩලේ කොමිෂන් සභාව ඉදිරියට ඇවිල්ල. ඒ පත්වීම ස්ථිර කරන්න කියල නොයෙක්—නොයෙක් ඒවා කියල තිබෙනවා. නමුත් කොමිෂන් සභාවේ මහත්වරු කියල තිබෙනවා, ඒ මහත්මයාට සුදුසුකම් නැති නිසා ඒක කරන්න බැරිය කියල.

ඊට කලින් මම කොමිෂන් සභාවෙන් ඉල්ලා හිටියා, ඒ මහත්මයා කර තිබෙන දූෂණ ගැන 46(1) වගන්තිය යටතේ පරීක්ෂණයක් කරන්නය කියල. නමුත් ඒ වෙනුවෙන් කොමිෂන් සභාවෙන් යවපු මහත්මයා පරීක්ෂණය කරල තිබෙන්නේ 'ජී. එම්.' මහත්මයා ගැන නොවෙයි, අධ්‍යක්ෂ කෙනෙක් ගැනයි. එම නිසා ඒ 'ජී. එම්.' මහත්මයා ගැන වහාම පරීක්ෂණයක් කරන්නය කියල මම ඉල්ලා සිටිනවා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
*(குழு உப தலைவர் அவர்கள்)*
(The Deputy Chairman of Committees)

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

*අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [නෝමන් වෛද්‍යරත්න මහතා] මූලාසනාරූඪ විය.*

*அதன் பிறகு, குழு உப தலைவர் அவர்கள் அக்கிராசனத்திலிருந்து நீங்கவே, உப சபாநாயகர் அவர்கள் [திரு. நோமன் வைத்தியரத்ன] தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair and* MR. DEPUTY SPEAKER [MR. NORMAN WAIDYARATNA] *took the Chair.*

**ඇල්බට් ද සිල්වා මහතා**
*(திரு. அல்பட் த சில்வா)*
(Mr. Albert de Silva)

ඒ කොමිෂන් සභාවෙන් මම ඉල්ලා හිටියා, වගේම ඇමතිතුමාගෙනුත් ඉල්ලා හිටියා, සම්පකාර 'ඉන්ස්පෙක්ටර්' මහත්මයෙක් තාවකාලිකව ඒ සමිතියේ 'ජී. එම්.' හැටියට පත් කරන්නය කියල. ඊළඟට අළුතින් 'ඇප්ලිකේෂන්ස්' කැඳවල සුදුසුකම් ඇති කෙනෙක් 'ජී එම්.' හැටියට පත් කර ගන්න පුළුවනි. ඇමතිතුමා අද උදේ මට පොරොන්දු වුණා, ඒ විධියට ඉක්මනින් කටයුතු කරනවාය කියල. ඒ ගැන එතුමාට ස්තුතිවන්ත වෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඇල්බට් ද සිල්වා මහතා]

ඒ වගේම, පසුගිය ඡන්ද විමසීමේදී මේ 'ජී. එම්.' මහත්මයා ඡන්දදායකයන් ලොරිවලින් ඇද්දා. ඒ විධියට ඡන්දය අරගෙන දීල, නොයෙක් 'සන්තෝෂම්' දීල, එයාට ඕනෑ විධියට කටයුතු කරන්න, දූෂණ කරන්න අධ්‍යක්ෂ මණ්ඩලයත් පොළඹවාගෙන ඉන්නවා. කඹුරුපිටියේ විවිධ සේවා සමුපකාර සමිතියේ වැඩ කටයුතු කෙරෙන්නේ ඒ සාමාන්‍යාධිකාරි මහත්මයාට ඕනෑ විධියටයි. එම නිසා ඒ මහත්මයා ගැන වගාම් 46(1) වගන්තිය යටතේ අපක්ෂපාත විධිමත් පරීක්ෂණයක් කරන්නය කියා මම ඉල්ලා සිටිනවා.

චුලහට තවත් කාරණයක් කියන්න ඕනෑ. මගේ කොට්ඨාශයේ සමුපකාර බලවේග පෝෂකාර්ම මධ්‍යස්ථානයක් තිබෙනවා. ඒකෙ රක්ෂාව කරනවා, 300 ක් විතර පිරිසක්. නමුත් දැන් රුපියල් ලක්ෂ ගණනක රෙදි—අමු රෙදි, සරොම්, ලේන්සු වගේ දේවල්—විකුණා ගන්න බැරුව ගොඩ ගැහිල තිබෙනවා. ඒ නිසා දැන් ඒ සමිතියට, වියන්න අවශ්‍ය නූල් ටික වත් ගන්න සල්ලි නැහැ. කොටින්ම කියනවා නම් දැන් ඒ මධ්‍යස්ථානය වහල දමන තත්ත්වයකටයි, ඇවිත් තිබෙන්නේ. එම නිසා කොහොම හරි ඒ රෙදි ටික 'සළු සළුවට' විකුණා දෙන හැටියට ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ගොඩ ගැසී තිබෙන ඒ රෙදි අලෙවි කර ගන්න බැරි වුණොත් අර තුන්සිය ගණනටම රැකියා නැති වෙනවා. ඇමතිතුමාත්, නියෝජ්‍ය ඇමතිතුමාත් සමුපකාර සමිති හොඳින් පවත්වාගෙන යෑම සඳහා බොහොම මහන්සි ගන්නා බව අපි දන්නවා. එම නිසා අපේ ඒ සමුපකාර බලවේග බලවේග මධ්‍යස්ථානය නවදුරටත් පවත්වාගෙන යන්න පුළුවන් විධියට අවශ්‍ය පියවර ගන්නය කියා එතුමන්ලාගෙන් ඉතා ඕනෑ කමින් ඉල්ලා සිටිනවා.

හිටිහැටියේම බොම්බයි ලූනු ඉවර වෙලාය කියල ඊයෙ-පෙරේදා පත්තරේක තිබුණා මම දැක්කා. මම අද ගියා තිඹිරිගස්යායේ කඩයකට. ගරු ඇමතිතුමනි, එතන කිලෝ එකක් රු. 25 යි කිව්වා. සමුපකාරයට ගියාම කිව්වා කාඩ් එකක් ඕනෑය කියා. මම ඇහුවා සමුපකාරයේ ගණන කීයද කියා. රු. 16 යි කිව්වා. නමුත් පත්තරේ තිබුණා රු. 15 යි කියා. ඒ නිසා වහාම සොයා බලන්න ඕනෑ, මේ නත්තල් කාලයට අපේ මහත්වරුන්ට රතු ලූනු, රට ලූනු, ආදිය ලබා දෙන්නට ක්‍රමයක් ගැන.

පෞද්ගලික කඩවල නම් රටලූනු තිබෙනවා. සමුපකාරයෙන් කොහොම යනවාද මම දන්නේ නැහැ. රාත්තල් 100 ක පමණ බිල් ලියලා ගෝනියක් හොරෙන් පිට කරනවා. යටින් සල්ලි එනවා. ඒ නිසා ඉන්ස්පෙක්ටර්ලා යොදවා මේවා ගැන නිසි විධියට ක්‍රියා කර හැටියට මම ඉල්ලනවා. මේ ගැන තමුන්නාන්සේගේ අවධානය යොමු කර හොඳ සමුපකාර ව්‍යාපාරයක් ගෙන යන හැටියට මම ඉල්ලනවා.

මට මතක හැටියට 1948 පමණ එවකට සිටි ඩී. එස්. සේනානායක මැතිතුමා සමුපකාරය පටන් ගත්තේ ඒ කාලයේ සිටි පෞද්ගලික වෙළෙන්දන් වැඩි මිලට බඩු විකුණන නිසා දුප්පත් අයට සාධාරණ මිලකට බඩු ලබා දෙන්නයි. අන්න ඒ ප්‍රතිපත්තිය අවංකවම ඉදිරියට ගෙන යන හැටියටත් මම ඉල්ලනවා.

මට තවත් එකක් මතක් වුණා. සමුපකාරයට හාල් කිලෝ එකක් දෙන්නේ රු. 5.90 බැගින්. පෞද්ගලික වෙළෙන්දාට දෙන්නේ රු. 6 බැගින්. නියම තරඟකාරී තත්ත්වයක් ඇති වන්නට නම් පෞද්ගලික කඩවලටත් රු. 5.90 බැගින්ම දෙන්නට ඕනෑ. තරඟයක් තිබෙනු විට පෞද්ගලික වෙළෙන්දා වැඩි ගණන්වලට විකුණන්නේ නැහැ. සත 5 ක් 10 ක් සමුපකාරයේ ගණනට වඩා අඩුවෙනුයි, විකුණන්නේ. අන්න ඒ ගැනත් තමුන්නාන්සේගේ අවධානය යොමු කරන අතර, ගරු ඇමතිතුමාටත් දෙපාර්තමේන්තුවේ සියලු දෙනාටත් ස්තුති කරමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**සරත් මුත්තෙට්ටුවේගම මහතා (කලවාන)**
*(திரு. சரத் முத்தெட்டுவெகம—கலவான)*
(Mr. Sarath Muttetuwegama—Kalawana)

ගරු සභාපතිතුමනි, කරුණු දෙක තුනක් බොහොම කෙටියෙන් කියන්නම්. එකක් ආහාර මුද්දර පිළිබඳවයි. දැන් නැවතත් ආහාර මුද්දර තිබෙන අයගේ ආහාර මුද්දර කපන්න පටන්ගෙන තිබෙනවා. මා හිතන විධියට මේ ගැන මේ ගරු සභාවේ මන්ත්‍රීවරු කලින් කියන්නත් ඇති. අපිත් කීප වාරයක්ම කියා තිබෙනවා. රක්ෂාවක් කරන මිනිහාගේ ආහාර මුද්දර ටික ගන්නවා, රක්ෂාවක් කරනවාය කියා. ඊළඟට එයාට රක්ෂාව නැති වුණාම නැවත ආහාර මුද්දර දෙන්නේ නැහැ. අද ඇත්ත වශයෙන්ම ආහාර මුද්දර අවශ්‍ය අයට ආහාර මුද්දර නැහැ. ඒ නිසා එක්කෝ මේ ක්‍රමය නැති කර දමන්න. නැත්නම් සාධාරණව කරන්න. මම දන්නේ නැහැ, අමාත්‍යාංශය මේ ආහාර මුද්දර ගැන මොනවා කරනවාද කියා. කිසිම සාධාරණත්වයක් නැහැ, එය අපේ පළාත්වල කෙරෙන ආහාරය නම්.

අනික් කරුණ මෙයයි. මම හුඟක් දුරට අනුමත කරන්න කැමතියි, බදුල්ලේ ගරු මන්ත්‍රීතුමා (ඩී. වින්සන්ට් ඩයස් මහතා) කළ කථාව.

**මන්ත්‍රීවරයෙක්**
*(அங்கத்தவர் ஒருவர்)*
(A Member)

කඹුරුපිටියේ ගරු මන්ත්‍රීතුමා.

**සරත් මුත්තෙට්ටුවේගම මහතා**
*(திரு. சரத் முத்தெட்டுவெகம)*
(Mr. Sarath Muttetuwegama)

නැහැ. කඹුරුපිටියේ ගරු මන්ත්‍රීතුමාට (ඇල්බට් ද සිල්වා මහතා) කලින් කථා කළ බදුල්ලේ ගරු මන්ත්‍රීතුමා. කඹුරුපිටියේ ගරු මන්ත්‍රීතුමා හැමදාම කරන ඕනෑම කථාවක් අපි අනුමත කරනවා.

ගරු සභාපතිතුමනි, බදුල්ලේ මන්ත්‍රීතුමා කථා කරද්දී කිව්වා සේවක මණ්ඩල කොමිෂන් සභාව ගැන. මමත් ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ මේ සේවක මණ්ඩල කොමිෂන් සභාව අහෝසි කරන්නය කියන එකයි. කිසිම වැඩක් නැහැ. අවුරුදු හතර, පහ, හය තිබෙනවා විභාග වූ නඩු, කිසිම දෙයක් වෙන්නේ නැතිව. මම තමුන්නාන්සේට කියන්නම් ඊයේ පෙරේදා සිදු වූ සිද්ධියක්.

කලවාන විවිධ සේවා සමුපකාර සමිතියේ වයි. ඩබ්ලිව්. සිරිපාල කියා කෙනෙක් —1977 වැඩ තහනම් කළ කෙනෙක්— අභියාචනයක් ඉදිරිපත් කළා, ඔය සමුපකාර සේවක කොමිසමට. කිසිම දෙයක් වුණේ නැහැ. මේ ගැන ඔහු බලා ගෙන ඉඳලා මට කිව්වට පසුව මම වාචික ප්‍රශ්නයක් සම්බන්ධයෙන් ඔබතුමාට කල් දුන්නා. ඊට පසුව දඩිබිඩිගාලා ඔක්කොම කරලා 1981 අගෝස්තු මාසයේ 18 වැනි ද නියෝගයක් යවනවා මෙයාට ආපසු වැඩ දෙන්නය කියා, වැඩ තහනම් කළ දවසේ සිට—ඒ කියන්නේ 1977.10.24 දින සිට— 1981 සැප්තැම්බර් මස 30 වැනි දා දක්වා හිඟ වැටුපත් එක්ක. ඒ අවුරුදු හතර ගත වුණේ මේ අයගේ ප්‍රමාදය නිසාමයි. අවුරුදු 4 ක හිඟ පඩිත් දෙන්නය කියා නියෝගයක් යැව්වා.

ඊට පසුව 1981 ඔක්තෝබර් මාසයේ 8 වැනි දා එවනවා තවත් ලිපියක්.

"වයි. ඩබ්ලිව්. සිරිපාල
අභියාචනාකරු
එදිරිව
සී/ස කලවාන වි. සේ. ස. සමිතිය
වගඋත්තරකරු"

එහි කියා තිබෙනවා මෙන්න මෙහෙම:

'මෙම අභියාචනය වර්ෂ 1981 ක් වූ ඔක්තෝබර් මස 08 වැනි දින සමුපකාර සේවක කොමිෂන් සභාවේ සභාපති වී. සී. ජයසූරිය මහතා ද එකී කොමිෂන් සභාවේ සභික නීතිඥ ග්ලැඩ්වින් සූරිය ආරච්චි මහතා සහ ඒ. ඒ. ජේ. එස්. වීරසේකර මහතා ඉදිරිපිට දී විභාගයට ගත් අවස්ථාවේ දී ඉහත නම් සඳහන් වයි. ඩබ්ලිව්. සිරිපාල වන අභියාචනාකරු විසින් සමුපකාර සේවක කොමිෂන් සභා ආඥා පනත යටතේ නීති ගත කරන ලද 1972 මැයි 12 වැනි දින අංක 15009/12 ඒ යටතේ ප්‍රසිද්ධ කරන ලද රෙගුලාසි මාලාව යටතේ ඉදිරිපත් කරන ලද අභියාචනය සම්බන්ධවය.'

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මෙහෙම කියාගෙන ගිහිල්ලා:

'මෙම කාරණය සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් දෙන ලද නියෝගය සම්බන්ධව සමුපකාර සේවක කොමිෂන් සභාව නැවත වරක් විමර්ශන යක යෙදීමෙන් පසු සමුපකාර සේවක කොමිෂන් සභා, ඇගැ පනත සහ ඉහත කී රෙගුලාසි මාලාව යටතේ සමුපකාර සේවක කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල අනුව ඉහත නම් සඳහන් අභියාචනාකරු වන වයි. ඩබ්ලිව්. සිරිපාල යන අයට සේවය අහිමි වී සිටි කාලයට හිඟ වැටුප් ගෙවීම වෙනුවට එනි වග උන්තරකාර සමිතිය විසින් රුපියල් හාර දහසක (40000) මුදලක්".

රුපියල් හාර දහසක් පමණක් ගෙවන්නය කියනවා.

මා ළඟ තවත් සිද්ධියක් තිබෙනවා, කියවන්න වේලාවක් නැහැ. මන්ත්‍රීවරුන්ගේ කාලය ගන්න මම කැමති නැහැ. මේ කොමිෂන් සභාව කිසිම දෙයක් කලට වේලාවට කරන්නෙ නැහැ. අභියාචනයක් දැම්මොත් ඒක එනන පැළ වෙනවා. කවදාවත් ඒකේ ප්‍රතිඵලයක් නැහැ. මේ කොමිෂන් සභාව අවලංගු කරදාන්න. නමුත් හාන්සේ මේ කොමිෂන් සභාව අවලංගු කාර මේ සේවක ප්‍රශ්න ගැන, සමුපකාර සේවකයින්ට යන්න පුළුවන් සමුපකාර කම්කරු විනිශ්චය සභාවක් පත් කරන්න. එක්කෝ සමුපකාර සේවකයින්ට අධිකරණ දෙන්න කම්කරු විනිශ්චය සභාවකට යන්න. එහෙමත් නැත්නම් ඒ කම්කරුවන්ට තම අයිතිවාසිකම් කියන්නට පුළුවන් වෙනමම විනිශ්චය මණ්ඩලයක් පත් කරන්න. මේ කොමිෂන් සභාවට වෙන මොනවා හරි තිබෙනවා නම් ඒවා කරගෙන යන්න කියන්න. නමුත් සේවකයින්ගේ ප්‍රශ්න විසඳන්නට නම් එයට කිසිසේත්ම පුළුවන් කමක නැහැ.

තවත් ඉල්ලීම කිහිපයක් තිබෙනවා. Appointment of an employees' representative to the boards of management. නමුන්නාන්සේලා 1979 දී අවලංගු කරනතුරු පාලක මණ්ඩලයට සේවකයින්ගේ නියෝජිතයන් පත් කරන්න ඉඩකඩ තිබුණා. ඒක අවලංගු කලත්, නැවත ඇති කරන්නය කියා මා ඉල්ලා සිටිනවා. මා මේ කාරුණ්‍ය බොහොම කෙටියෙන් කියන්නේ. 'සැලරි ස්කේල්' එක නැවත සකස් කරන්න. දැන් දෙන පඩියට ජීවත් වෙන්න බැහැ. සමුපකාර සේවකයින්ට හුඟක් තැන්වල රු. 70 දෙන්නෙ නැහැ. ඒ වගේම මේ රු. 107 දෙන්නත් බැහැ, සමිති වලට.

**එස්. බී. හේරත් මහතා**
*(திரு. எஸ். பி. ஹேரத்)*
**(Mr. S. B. Herat)**

ඇයි, ඒ දෙන්නෙ නැත්තෙ?

**සරත් මුත්තෙට්ටුවේගම මහතා**
*(திரு. சரத் முத்தெட்டுவெகம)*
**(Mr. Sarath Muttetuwegama)**

දෙන්නෙ නැත්තේ, සමිතිය බංකොලොත්.

**එස්. බී. හේරත් මහතා**
*(திரு. எஸ். பி. ஹேரத்)*
**(Mr. S. B. Herat)**

තවත් වැඩි කලොත් මොකද වෙන්නෙ?

**සරත් මුත්තෙට්ටුවේගම මහතා**
*(திரு. சரத் முத்தெட்டுவெகம)*
**(Mr. Sarath Muttetuwegama)**

නෑ, ඉතින් මොකක් හරි පිළියමක් යොදන්න. එක්කෝ රජයෙන් පඩි ගෙවන්න. කොහොමද, ඒ අයට ජීවත් වෙන්න බැරිනම්? මාසයකට රුපියල් දෙසිය පනහක් තුන්සියයක් ගන්නවා නම් කොහොමද ජීවත් වෙන්නෙ? දවසකට රුපියල් හාරදාහක්, පන්දාහක්, පිරිවැටුම තිබෙන තැනක, ඒ මිනිසුන්ට කන්න නැත්නම්, ඉන්න නැත්නම්, ගෙදර ළමයින්ට කිරි ටික අරන් දෙන්න බැරිනම්, අර පොඩි පඩියක් දුන්නාම, පිරිවැටුමෙන් කීයක් හරි ගන්නවා. මේක කෙළවරක් නැති චක්‍රයක්. ඒ නිසා මේකට මොකක් හරි පිළියමක් යොදන්න. මම හැමදාමත් කියනවා; ඉස්සර ආණ්ඩු තිබෙන විටත් කිව්වා; දැනුත් කියනවා. මේ තත්වය යටතේ කවදාවත් මේවා සාර්ථක වන්නේ නැහැ. මොකද, ලොකු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පිරිවැටුම්ක් තිබෙන ස්ථානයක පොඩි පඩියක් දීලා සේවකයො දා ගත්තාම තමුන්නාන්සේ අනිවාර්යයෙන්ම එයාව නාල්ලු කරනවා හොරකමට. ඒ මනුෂ්‍ය යොත් ජීවත් වෙන්න ඕනෑ. ලොකු පිරිවැටුම්ක් තිබෙන තැනක එහෙම අතපත ගානා කොට ඒක එහෙම වෙනවා.

**එස්. බී. හේරත් මහතා**
*(திரு. எஸ். பி. ஹேரத்)*
**(Mr. S. B. Herat)**
අපේ කාලෙදී පඩි වැඩි කළා.

අ. භා. 6.45

**සරත් මුත්තෙට්ටුවේගම මහතා**
*(திரு. சரத் முத்தெட்டுவெகம)*
**(Mr. Sarath Muttetuwegama)**
ඒක හරි තමුන්නාන්සේගේ කාලයේ සේවකයින්ට සියයට 10 ක් පඩි වැඩි වෙන විට, සියයට 100 ක් බඩු මිල වැඩි වෙලා තිබෙනවා.

Then I am asking for the recognition of the Co-operative Employees' Certificate issued by the School of Co-operative, Polgolla.

I do not think I need elaborate on that. The Hon. Minister will take that into consideration.

"Co-operative Employees certificates issued by the School of Co-operatives, Polgolla, should be recognised by the Government Departments and Co-operative Banks for the purpose of appointments".

"Contributions to the EPE should be increased from the present 15% to 25% (i. e. Employees Contribution from 6 to 9% and Employees contribution 9% to 15%) as available in the CWE, CTB and the Government Corporations."

"A reasonable allowance of not less than 25% should be given for leakages in respect of consumer sales taking into account the turnover for the particular period for dryage and wastage of goods in transit. As regards leakages in respect of paddy, allowances as given by the Paddy Marketing Board be given to the Co-operative sector employees as well".

"All rights and privileges enjoyed by the Government employees such as leave, Railway Warrants and Marriage allowance should be granted to the Co-operative Employees as well".

If you propose to continue with the Co-operative Employees' Commission, I suggest that the only way it can be continued is by decentralising it, by having spread units for the districts. Then even the district problems can be attended to and the work speeded up.

My own proposals is to scrap it altogether and have some other institution, because it is not doing any work. I suggest that there should be a separate tribunal for the co-operative employees run by the Judicial Service Commission. By speaking to the Minister of Finance and negotiating to exempt the co-operatives from BTT and income-tax, the co-operatives can be saved. As the workers are not sufficiently paid, the workers become rogues and thereby the co-operative sector suffers. I do not think the Hon. Minister will like the co-operative sector to suffer. In order to save the co-operative sector, it must be exempted from BTT. I will state the results of the BTT briefly.

විශේෂයෙන් විවෘත ආර්ථික ප්‍රතිපත්තියේ ප්‍රතිඵල නිසාත්, සහල් සහනාධාරය ඉවත් කිරීම නිසාත්, අද සමුපකාර පාරිභෝගික සමිති පවත්වාගෙන යා නොහැකි තත්ත්වයකට පත් වී තිබෙනවා. නියෝජ්‍ය ආහාර පාලකතුමා විසින් සමුපකාරවලට, සහල්, සීනි හා පිටි මිලයට ගැනීම සඳහා පොලී රහිත ණය මුදලක් ලබා දී තිබුණා. මේය සමුපකාර සමිතිවලට විශේෂ සහනයක්ව තිබුණා. එහෙත් ඔහු විසින් දැන් නියෝග කර තිබෙනවා, ලබන වසරේ මැයි මාසය වන විට—1982 මැයි වන විට—මෙම මුදල්වලින් සියයට 50 ක් කපා හරින බවට. එහෙම වුණොත් සමුපකාර සමිති ලොකු අමාරු තත්ත්වයකට පත් වෙනවා. අනෙක් අතට, මහජන බැංකුවෙන් සමුපකාර සමිති සඳහා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සරත් මුත්තෙට්ටුවෙගම මහතා]

දෙන ණය මුදල් වලට සියයට 17 ක් පොලිය අය කරනවා. රුපියල් ලක්ෂ 10 ක් ණය ලබා ගත්තොත් පොලිය වශයෙන් 1,70,000 ක් ගෙවීමට ඒ අනුව සිදු වෙනවා.

මේ තත්ත්වය යටතෙ සමූපකාර සමිති පවත්වාගෙන යෑම ඉදිරියේදි ලොකු ප්‍රශ්නයක් වෙනව. එපමණක් නොවෙයි, සේවක ආයෝජන ගිණුම් සඳහා සියයට තුනක් ගෙවීමට සිදු වෙනව. සේවක වැටුප් ගෙවීමට සිදු වෙනව. අලුතෙන්ම පැනවූ පිරිවැටුම් බද්ද සමූපකාරයට මරු පහරක් වී තිබෙනව. වර්ග තුනකට හැර ඉතිරි සියලුම දේ සඳහා පිරිවැටුම් බදු ගෙවීමට සමූපකාරයට සිදු වී තිබෙනව. රුපියල් ලක්ෂ 180 ක බඩු විකුණුවොත්, ලක්ෂ 9 ක් පිරිවැටුම් බදු වශයෙන් ගෙවීමට සිදු වී තිබෙනව. රබර් බලපත්‍ර වලින් කලින් අය කළ සියයට 10 යෙ බද්ද සියයට 900 කින් වැඩිකර තිබෙනව. රථවාහන බද්ද සියයට 200 කින් වැඩි කර තිබෙනව. සීනි සහ ළදරු කිරි පිටි ගෙන්වීම හා බෙදා හැරීම පෞද්ගලික අංශයට පැවරීම නිසා සියයට 50 කින් සමූපකාරයෙ වෙළඳාම පහළ බැස තිබෙනව.

ගරු සභාපතිතුමනි, මේ විධියට, සමූපකාර ව්‍යාපාරය විනාශ කිරීම සඳහා හිතාමතාම කටයුතු කරනවාද කියන සැකය දැන් අපට ඇති වී තිබෙනව. මේ අන්දමට පිරිවැටුම් බදු අය කළොත් සියයට අනූවක් පමණ සමූපකාර සමිති ලබන අවුරුද්දේදී ගෙන යා ගන්න බැරි තත්ත්වයකට පත් වෙනව. මේ හැරෙන්නට සමූපකාර සමිතිවල පවතින දූෂණ කටයුතු ගැන මම අමුතුවෙන් විස්තර කරන්න යන්නෙ නැහැ. ඒක අවශ්‍ය වෙන්නෙත් නැහැ.

මෙහිදී මම තමුන්නාන්සේට කියන්න කැමතියි, රත්නපුර දිස්ත්‍රික්කයෙ කුරුවිට තිබෙන සමිතිය ගැන. මේක බොහොම හොඳට වැඩ කටයුතු කරගෙන යන සමිතියක්. රජය භාණ්ඩ මිල වැඩි කිරීම නිසා, සීනි, කිරි සහ ළදරු කිරි පිටිවලින් පමණක් රු. 1,22,000 ක ලාභයක් මේ සමිතිය ලබා තිබෙනව. මිල අඩු කිරීම නිසා මේ සමිතිය ලබා තිබෙන්නෙ රු. 40,000 ක පාඩුවක් පමණයි. හොඳ පාලක මණ්ඩලයක් සිටින නිසා අවංකව තොරතුරු ඉදිරිපත් කර තිබෙනව. නමුත් රජයෙන් මිල වැඩි කළාම ලැබෙන ලාභය පිළිබඳව අනිකුත් සමූපකාර සමිතින් මේ වාගේ තමන්ගෙ ගිණුම්වල හරියාකාර පෙන්නුම් කර තිබෙනවාද? සෑම කාලයකම විටින් විට මිල වැඩි වන භාණ්ඩ තිබෙනව, සමූපකාරය මගින් අලෙවි කරන. දැන් මම පෙන්වා දුන්නෙ එක සමිතියක් ගැන පමණයි. සීනි, පිටි හා කිරි මිල වැඩි වීමෙන් රු. 1,22,000 ක ලාභයක් ලබා තිබෙනව. එහෙම නම් අනික් සමිතින් ලබා ඇති ලාභ පිළිබඳව සමූපකාර දෙපාර්තමේන්තුව මගින් සොයා බැලුවොත් හොඳ නේද?

ගරු සභාපතිතුමනි, උතුරු කොළඹ සමූපකාර සමිතියෙ තත්ත්වය ගැන වචනයක් කියා මගේ කතාව නවත්වන්න මම බලාපොරොත්තු වෙනව. මෙම සමිතියෙ සභාපතිතුමා ගැන නොයෙකුත් විධියෙ ආරංචි පැතිර පවතිනාව. මොහු කලින් සේවය කළ සීමාසහිත කොළඹ ප්‍රවාහන සමූපකාර සමිතිය, මොහුගේ අදක්ෂ පාලනය නිසා එහි සේවය කළ සේවකයින් 130 ක් පමණ සේවයෙන් දොට්ට දමා එම ආයතනයත් වසා දමා තිබෙනව. දැනට පාලනය කරන සමූපකාර සමිතියෙ 1980 පෙබරවාරි 1 වනදා සිට 1981 ජනවාරි 31 වනදා දක්වා වසර තුළ ශුද්ධ පාඩුව රුපියල් ලක්ෂ දහ හතාමාරක් වෙනව. ඒ වාගේම 1981 පෙබරවාරි 1 වනදා සිට අගෝස්තු 31 වනදා දක්වා හත් මාසය තුළ කෝටි 25 ක වෙළඳ පිරිවැටුමක් තිබෙද්දීත්, දැනටමත් පාඩුව රු. 5,07,975 ක් බව ඇනගන්න තිබෙනව. මෙපමණ ජනයා ගැවසෙන කොළඹ උතුරේ සමූපකාර සමිතිය ගැනයි මම කියන්නෙ. ඒ වාගේම මෙම තත්ත්වය යටතෙ ඉතිරි කාලයත් ගෙන බැලුවහම රුපියල් ලක්ෂ 10 ක 12 ක පාඩුවක් ලැබිය හැකි බව පෙනෙන්නට තිබෙනව. මේ තත්ත්වය හරිම භයානකයි. මම නිදසුනක් වශයෙන් කලින් පෙන්වූ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සමුපකාර සමිතිය එතරම් ලාභයක් ලැබුව නම් මෙම සමුපකාර සමිතියට ලාභ ඇතුව පවත්වා ගෙන යන්නට බැරි මන්ද කියන ප්‍රශ්නය මම අහනවා.

මේකී සභාපතිතුමා බොහොම බලවත් කෙනෙක්. මා හිතන්නෙ මෙයා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවේද කොහේද අධ්‍යක්ෂවරයෙක් හැටියට කටයුතු කරන කෙනෙක්. එම නිසා මේ සමිතියෙ වැඩ කටයුතු ගැන අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා.

මේ ගැන කියන කොට ගරු ඇමතිතුමාට කියන්න කැමතියි, දුම්කොළ කම්කරුවන් ගහලා තිබෙන පෝස්ටරයක් ගැන. දුම්කොළ ඒජන්ට්ලාගෙ සමුපකාර සමිති තිබෙනවා. මිල වැඩි වීම නිසා ඒ අය ලවා ගන්නා ලාභයෙන් කොටසක් වත් මේ කම්කරුවන්ට ලබා දෙන්නටය කියන ඉල්ලීමක් කර තිබෙනවා. ඇමතිතුමාට මේක කරන්න බැරි බව මම දන්නවා. කෙසේ වුණත් මම කලින් ඉදිරිපත් කළ කාරණා ගැන ඇමතිතුමාගෙ අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා. ඒ ගැන තමුන්නාන්සේට මොකවත් කරන්න පුළුවන් කමක් නැහැ. මම සමුපකාරය ගැන කිව්ව කාරණා තමුන්නාන්සේගේ අවධානයට යොමු කරන්නා.

**සේපාල අකුරුගොඩ මහතා** (බද්දේගම)

*(திரு. சேப்பால அக்குறுகொட—பத்தேகம)*

**(Mr. Sepala Akurugoda—Baddegama)**

ගරු සභාපතිතුමනි, මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, සමුපකාර වැය ශීර්ෂ යටතේ මගේ අදහස් ප්‍රකාශ කිරීමට ඉඩ ලබා දීම සම්බන්ධයෙන්. විශේෂයෙන්, අද දවසේ මේ ගරු සභාව අමතා සමුපකාරය විෂය කොට ගෙන, මුලින්ම කථා කරන්නට අවස්ථාව ලැබීම ගැන මම සන්තෝෂ වෙනවා. මොකද? මම පළමු වරට මෙම් සභාව ඉදිරියේ දිවුරුම් දෙන්නට සූදානම් වූ අවස්ථාවේදී, සමුපකාරය නිසා මට ඒ අවස්ථාව අහිමි වීම මම හිතනවා විශේෂ සිද්ධියක් කියා.

මට කලින් කථා කළ අත්තනගල්ලේ මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මහතා) ඉල්ලීමක් කළා, සමුපකාරය දේශපාලන බලපෑම්වලින් නිදහස් ආයතනයක් හැටියට පවත්වා ගෙන යන්නටය, කියා. ඒ සම්බන්ධයෙන් එතුමාට නියම පිළිතුරු දෙන්නට මට පුළුවන් කමක් තිබෙනවා කියා මම හිතනවා. එතුමන්ලාගේ රාජ්‍ය සමයේ—1970-77 යුගයේ සමුපකාර සේවකයන් මොන තරම් දේශපාලන පළිගැනීම්වලට ලක් වුණා දැයි මම පසුව විස්තර කරනවා.

සැහෙන කාලයක් තිස්සේ ඒකාධිකාරී පාලනයක් යටතට පත්ව තිබුණු සමුපකාර ව්‍යාපාරය මහජන ව්‍යාපාරයක් බවට පත් කරන්නට ප්‍රාදේශික කාරක සභා මැතිවරණ ආදිය පවත්වා ගරු ඇමතිතුමා ගෙන ඇති ක්‍රියා පිළිවෙල ගැන එතුමාට මුළු මහත් සමුපකාරිකයන්ගේ ස්තුතිය හා ප්‍රණාමය ලැබෙන්න ඕනෑ කියා මම හිතනවා. සමුපකාර දෙපාර්තමේන්තුව ගැන මම කථා කරන විට, විශේෂයෙන්ම සමුපකාර ව්‍යාපාරය ගැන කථා කරන විට, නිතරම සඳහන් වන දෙයක් තමයි, සමුපකාර ආඥා පනතේ 46 (1) වන වගන්තිය යටතේ පවත්වන පරීක්ෂණ. මට තරමක් කලින් කථා කළ වෙළඳ හා නාවික කටයුතු පිළිබඳ නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා, 46 (1) වන වගන්තිය යටතේ පැවැත්වුණු පරීක්ෂණ අනුව සොයා ගත් රුපියල් ලක්ෂ 53 කට අධික මුදල් ප්‍රමාණයක් සමුපකාර සමිතිවලින් අය වෙන්නට තිබෙනවාය, කියා. මම කියන්නට ඕනෑ, 46 (1) පරීක්ෂණවලින් සොයා ගත්, සමුපකාර සමිතිවලින් අය වෙන්න තිබෙන, ඒ මුදල් පිළිබඳ වගකීම සම්පූර්ණයෙන්ම සමුපකාර දෙපාර්තමේන්තුව භාර ගන්න ඕනෑ කියල.

අද සමුපකාර දෙපාර්තමේන්තුව ගැන මට කලින් මන්ත්‍රීවරුන් සැහෙන පිරිසක් කථා කළා. මෙම දෙපාර්තමේන්තුව අද සීමා වී තිබෙන්නෙ 46 (1) සහ 44 වගන්ති යටතේ පරීක්ෂණ පවත්වන්නා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සේපාල අකුරගොඩ මහතා]

වත්, වක්‍ර ලේඛ නිකුත් කරන්නටත් විතරයි කියන එක මම මේ අවස්ථාවේදී කියන්න ඕනෑ. සමුපකාරයේ ආකල්ප වර්ධනයට, සමුපකාර ව්‍යාපාරයේ දියුණුව සඳහා ම පිහිටුවූ සමුපකාර දෙපාර්තමේන්තුව අද සමුපකාරයේම මර්දනය සඳහා ක්‍රියාත්මක වන බව මම කනගාටුවෙන් මතක් කරනවා. **වාර්ෂික ගණන්** පරීක්ෂණවලදී හෙළිදරව් නොවුණු කරුණු 46(1) පරීක්ෂණවලදී හෙළිදරව් වී තිබෙනවා. 44 වන වගන්තිය යටතේ වාර්ෂික ගණන් පරීක්ෂණ හරිහැටි කළා නම් 46(1) පරීක්ෂණවලින් ඉදිරිපත් වුණු දුර්වලකම්, අඩුපාඩු, මම හිතන්නෙ ඇති වෙන්න ඉඩක් නැහැ කියායි. එහෙම නම් 46 (1) පරීක්ෂණවලදී අසු වන වැරදිවලට සම්පූර්ණයෙන් වගකිව යුත්තේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව බව කියන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමාගේ බලපිටිය කොට්ඨාශයේ සමුපකාර සමිතියේ වැඩ කටයුතු පිළිබඳව 46 (1) යටතෙ පරීක්ෂණ පැවැත්වූ පරීක්ෂක කණ්ඩායම ඉතාම වැරදි විධියට ඒ පරීක්ෂණය පැවැත්වූ බව මම කියන්නට ඕනෑ. ගරු ඇමතිතුමාගෙත්, නියෝජ්‍ය ඇමතිතුමාගෙත් අවධානයට යොමු කරනවා, මම ඒ කාරණය. මේ ගරු සභාව අනුමත කළ, අයවැය ලේඛනය ඉදිරිපත් කිරීමේදී මුදල් ඇමතිතුමා ගෙවන්නට යෝජනා කළ, රු. 50 දීමනාව, අපි ඒ සේවකයන්ට දුන්න නිසා, එවකට ඒ සමිතියේ හිටපු සාමාන්‍යාධිකාරී වශයෙනුත්, ඒ අධ්‍යක්ෂ මණ්ඩලයෙනුත් ඒ මුදල් අය කර ගන්නට ඒ නිලධාරීන් තීරණය කළා. මේ ගරු සභාවේ ගන්නා ලද තීරණ අවලංගු කරන්නට තරම් සමුපකාර දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමත් වෙනවා නම් මම ඒ ගැන පුදුම වෙනවා. ඒ ගැන මම ඇමතිතුමාගේ අවධානය යොමු කරවනවා.

සමුපකාර සේවක කොමිෂන් සභාව ගැනත් මේ අවස්ථාවේදී වචනයක් දෙකක් කියන්නට ඕනෑ. 1972 අංක 44 දරණ සමුපකාර සේවක කොමිෂන් සභා පනත යටතේ මෙම ආයතනය පිහිටෙව්වේ සමුපකාර සේවකයින්ගේ සුභසිද්ධිය සඳහාමයි. මේ රටේ සමුපකාර ව්‍යාපාරයේ පණස් දාහකට අධික සේවකයන් පිරිසක් ඉතාමත් වටිනා මෙහෙයක්, ඉතාම වටිනා සේවයක් කරන්නෙ. ඒ වුණත් මෙම සමුපකාර සේවක කොමිෂන් සභාව, ඒ සේවකයන්ගේ දුක්ගැනවිලි බලන්නට ඒ අයට පිහිට වන්නට ශක්තියක් නැති අසරණ ආයතනයක් බවට පත්ව තිබෙනවා. උදාහරණය් හැටියට කියන්න ඕනෑ, සමහර විට, සමුපකාර සේවක කොමිසමට යම්කිසි විධියක ඉල්ලීමක් ඉදිරිපත් කළ විට, අද සමුපකාර සේවකයෝ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේත් සමුපකාර සමිතිවල අධ්‍යක්ෂ මණ්ඩලවලත් සමිතිවල සභාපතිවරුන්ගෙත් අධ්‍යක්ෂවරුන්ගේත් ඉත්තන් බවට පත් වන බව. ඔවුන්ට සීමිත වැටුපක් ලැබෙන්නේ 1972 පිහිටුවූ වැටුප් තලය, වැටුප් පරිමාණය මතමයි, ඔවුන් අද දක්වාම ඉන්නේ. මේ දක්වා ඔවුන්ගේ වැටුප් එක මොහොතක වත් වැඩි කර නැහැ.

මේ රජය මගින් සමුපකාර සේවකයන්ට මේ ගරු සභාවෙන් අයවැය කථාවෙන්—අනුමත කළ රු. 50 දීමනාව දුන්නාම සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඒ තත් අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටි නිලධාරීන්ගෙන් අය කරන්න තරම් අත්තනෝමතික වුණා, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට මේ ගරු සභාව අනුමත කරන නීතිරීති අභිබවා ක්‍රියා කරන්න තරම් බලයක් දී තිබෙනවාද කියා මම අහනවා.

සමුපකාර සේවක කොමිසම ඉදිරියට යන සමුපකාර සේවකයන්ටත් අද ඉතාම අසීරු තත්ත්වයකට මුහුණ පාන්නට සිදු වී තිබෙනවා. 1970 දෙසැම්බර් මස සිට 1977 දෙසැම්බර් මස දක්වා දේශපාලන පළිගැනීම්වලට ලක් වුණු සමුපකාර සේවකයන්ගේ දුක් ගැනවිලි සොයන්න 100 ඒ. වගන්තිය යටතේ පරීක්ෂණයක් පැවැත්තුවා ඒ අවස්ථාවේදී ඒ පරීක්ෂණය අනුව සාධාරණය ඉෂ්ට කරන්න කියා දේශපාලන පරීක්ෂණ කමිටුවෙන් තීරණය කර, 100 ඒ. වගන්තිය යටතේ දිස්ත්‍රික් නඩුකාරවරුන්ගේ බලතල දීලා පරීක්ෂණ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නිලධාරීන් පත් කර, ඒ නිලධාරීන්ගේ නියෝග සමුපකාර සේවක කොමිෂන් සභාවට ඉදිරිපත් කළ පසු, සමුපකාර සේවක කොමිෂන් සභාව ඒ යෝජනා, ඒ නියෝග අදාළ සමිතිවලට ඉදිරිපත් කළ විට, ඒ සමිති ඒවා ක්‍රියාත්මක කරන්නේ නැහැ. දිස්ත්‍රික් නඩුකාරවරුන්ගේ බලතල ඇතිව පත් කරන ලද නිලධාරීන්ගේ නියෝග ඒ සමිති ක්‍රියාත්මක කිරීමට පසුබට වෙනවා නම්, ඒවා ක්‍රියාත්මක නොකරන විට සමුපකාර සේවක කොමිසම නිශ්ශබ්ද වෙනවා නම්, තවත් ගරු මන්ත්‍රීවරුන් කිව්වා වාගේ එක්කෝ සමුපකාර සේවක කොමිසම අහෝසි කරන්න ඕනෑ. එහෙම නැත්නම්, සමුපකාර සේවකයන්ගේ සුභසිද්ධියට වැඩ කිරීමට අවශ්‍ය බලතල ඒ කොමිසමට ලබා දෙන්න ඕනෑ. එසේ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

අ. භා. 7.00

කලින් කතා කළ අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා (ලක්ෂමන් ජයකොඩි මහතා) කිව්වා, දේශපාලනයෙන් තොරව, මහජන ව්‍යාපාරයක් හැටියට, ස්වාධීන ව්‍යාපාරයක් හැටියට සමුපකාරය පවත්වාගෙන යන්න කියලා. නමුත් ඒ මන්ත්‍රීවරුන්ගේ රජය පැවති යුගයේදී ඉතාම අසාධාරණ විධියට දේශපාලනය රජ කළ ආයතනයක් බවට සමුපකාරය හරවාගෙන ඒ අයගේ පාක්ෂිකයන්ට හිතවතුන්ට රැකියා සපයන මධ්‍යස්ථානයක් බවට ඒක පත් කර ගත්තා. ජනතා ව්‍යාපාරයක් වන සමුපකාරය සම්පූර්ණයෙන් විනාශ කර, ඒ ආකල්පය සම්පූර්ණයෙන් විනාශ කර, 1972 සමුපකාර සංශෝධන පනතින් ප්‍රාථමික සමිති ඇති කර, සමුපකාරයේ සංකල්පය විනාශ කර, විවිධ සේවා සමුපකාර සමිති ක්‍රමය අහෝසි කර, ඒවා විනාශ වන පරිදි ඒවාට විරුද්ධව කටයුතු කළා. ඒ නිසා මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, ජනතාවගේ ව්‍යාපාරයක් වන පාරම්පරිකව පැවත ආ සමුපකාර ක්‍රමය දියුණු කිරීම සඳහා, ප්‍රාථමික සමිති ක්‍රමය නැති කර, එදා සිට පැවත ආ ගම් මට්ටමේ විවිධ සේවා සමුපකාර සමිති ක්‍රමය නැවත ඇති කරන්න කියා. සමුපකාරය කියන්නෙ ජනතා ව්‍යාපාරයක්. ඒ ජනතා ව්‍යාපාරය නිසි පරිදි පවත්වාගෙන යන්න ප්‍රාථමික සමිති ක්‍රමය තුළ පුළුවන්කමක් නැහැ. අද සමුපකාර පාලනය සමුපකාර දෙපාර්තමේන්තුව විසින් කොහෙන් හෝ පත් කළ අධ්‍යක්ෂ මණ්ඩල විසින් කරගෙන යනවා. ජනතා ව්‍යාපාරයක් එකේ නැහැ. තිබෙන්නේ බාගෙට ජනතා ව්‍යාපාරයක්.

මම තවත් ඉල්ලීමක් කරනවා. සමුපකාර දෙපාර්තමේන්තුවේ පරීක්ෂක මහත්වරුන් සමහර සමිතිවල සාමාන්‍යාධිකාරීන් හැටියට පත් කරනවා. ඒ සමිතිවල මොනම ප්‍රශ්නයක් පැනනැගුණත් සමුපකාර දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඒවා සම්පූර්ණයෙන්ම යටපත් කරනවා. උදාහරණයක් හැටියට, මගේ මැතිවරණ කොට්ඨාශයේ සමුපකාර සමිතියක සිද්ධියක් ඉදිරිපත් කරන්න පුළුවනි. 46(1) වගන්තිය යටතේ එම සමිතිය සම්බන්ධයෙන් පරීක්ෂණයක් ඉල්ලූ විට සමුපකාර සංවර්ධන උප කොමසාරිස්තුමා ඒකට ඉඩ දුන්නෙ නැහැ. මේ සමුපකාර සංවර්ධන උප කොමසාරිස්වරයා මට කිව්වා, ඇමතිවරයාගෙන් නියෝගයක් අරගෙන එන්නය කියා. මම ගරු ඇමතිතුමා හමු වී නියෝගයක් ලබා දුන්නාට පස්සෙ තමයි 46(1) වගන්තිය යටතේ පරීක්ෂණයක් කරන්න තීරණය කෙළේ. පරීක්ෂණ නිලධාරීන් පත් කළා. ඒත් ගරු ඇමතිතුමනි, තවමත් පරීක්ෂණ පවත්වන්නෙ නැහැ. ඒකට හේතුව මෙයයි : ගාලු ගඟබඩ පත්තුවේ කුඩා නේ වතු හිමියන්ගේ සමුපකාර සමිතියේ සභාපති හැටියට අද ඉන්නෙ ගාලු දිස්ත්‍රික්ක මූලස්ථාන පරීක්ෂක වරයෙක්. ඔහුගේ අණසකට යටත් වයි, ගාලු දිස්ත්‍රික්කයේ සමුපකාර සංවර්ධන උප කොමසාරිස්වරු වැඩ කරන්නෙ. ඒ නිසා ඔවුන්ගේ ගසා කෑම්, ඔවුන්ගේ වැරදි සියල්ලම වසන්න සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සූදානම් වී සිටිනවා. ඒ නිසා මේ වාතාවරණයෙන්, මේ තත්ත්වයෙන් මුදාගන්න කටයුතු කරන ලෙස මම ඉල්ලනවා.

අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා (ලක්ෂමන් ජයකොඩි මහතා) ගේ කථාව ගැන යමක් කියන්න ඕනෑ. එතුමන්ලාගේ රජය තමයි, මම එක්සත් ජාතික පක්ෂයේ රැස්වීමක් ඇමතුවාය කියා මා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සේපාල අතුරගොඩ මහතා]

පැය 24 න් දොට්ට දැම්මෙ. එසේ දොට්ට දැමුවටා පස්සෙ සමුපකාර සේවක කොමිෂන් සභාවට අභියාචනයක් කළාට පස්සෙ එදා දේශපාලන බලය පාවිච්චි කළා. ගරු නියෝජ්‍ය කථානායකතුමාත් සාක්ෂි දරණවා ඇති. අම්බලන්ගොඩ ගරු මන්ත්‍රීතුමාත් (රසිටර් තිලකසේකර මහතා) සාක්ෂි දරණවා ඇති.

අන්න එවන් දේශපාලන බලපෑම් තිබුණු එවන් වාතාවරණයක් තිබුණු යුගය පසු කර ඒ යුගයේ රජකළ උදවිය අද මෙතෙන්ට ඇවිත් කියනවා, දේශපාලනයෙන් තොර ස්වාධීන ආයතනයක් කරන්නය කියා. මේක විහිළුවක් නොවේද? ඒ නිසා මම ඉල්ලා සිටිනවා, මෙම නීති ක්‍රියාත්මක කරන්නට අවශ්‍ය බලතල, මෙම නියෝග ක්‍රියාත්මක කරන්නට අවශ්‍ය බලතල සමුපකාර සේවක කොමිෂන් සභාවට දෙන්නය කියා. එසේ බල තල දී අධිකරණ කොමිෂන් සභාව, පළාත් පාලන සේවා කොමිෂන් සභාව, රාජ්‍ය සේවා කොමිෂන් සභාව වැනි තත්ත්වයට සමුපකාර කොමිෂන් සභාවත් පත් කරන්න. ඒ වාගේම මේ රටේ දුක් විඳින සමුපකාර සේවකයන්ගේ අනාගත සුභසිද්ධිය සඳහා ඔවුන්ට සෙතක් සැලැස්වීම සඳහා කටයුතු කරන්නය කියා ඉල්ලමින් මගේ කථාව අවසන් කරනවා.

**ආර්. එම්. අප්පුහාමි මහතා (බදුල්ල දිසා ඇමතිතුමා)**

*(திரு. ஆர். எம். அப்புஹாமி—பதுளை மாவட்ட அமைச்சர்)*

(Mr. R. M. Appuhamy—District Minister, Badulla)

ගරු සභාපතිතුමනි, අවසාන මොහොතේ හෝ වචන කීපයක් කථා කරන්නට අවස්ථාව ලැබීම ගැන සතුටු වෙනවා. සමුපකාර ව්‍යාපාරය ගැන මේ ගරු සභාවේ මන්ත්‍රීවරුන් රාශියක්ම කථා කරන්න යෙදුණා. ඒ තරම් උතුම් ව්‍යාපාරයක් දියුණු කර ගැනීමට ඒ ඒ කොට්ඨාශවල මන්ත්‍රීවරුත්, ඒ ඒ පළාත්වල ජනතාවත් මහන්සි වෙනවා. ඒ නිසයි, එතුමන්ලා වුවමනාවෙන්ම මේ අදහස් ප්‍රකාශ කරන්නෙ. මේ වැදගත් ආයතනය ආරක්ෂා කර ගැනීමට ගරු ඇමතිතුමාත් නියෝජ්‍ය ඇමතිතුමාත් දෙපාර්තමේන්තුවත් සෑහෙන්න මහන්සි ගන්නවා.

කෙසේ වෙතත් සමුපකාර සංගම් අඩු පාඩු රාශියක් ගැන කිව්වා. අපේ රජය බලයට පත් වුණාට පස්සේ අපි මහජන්තාව අනාපින් අධ්‍යක්ෂ මණ්ඩල පත් කළා. ඒ ගොල්ලන්ගේ උනන්දුවෙන්ම දියුණු වුණ සමුපකාර සමිති ගැනත් මතක් කරන්න ඕනෑ. විශෙෂයෙන්ම අපේ කොමසාරිස්තුමා, බදුල්ලෙ උප කොමසාරිස්තුමා, ඒ වාගේම ඇමතිතුමා නියෝජ්‍ය ඇමතිතුමා කිප විටක්ම ඒ සමුපකාර සමිතිවලට පැමිණ තිබෙනවා.

අර හත් අවුරුදු කාලයට පස්සෙ අද බණ්ඩාරවෙල සමුපකාර සමිතිය ඉතාමත් ආදර්ශමත් සමුපකාර සමිතියක් හැටියට පත් වී තිබෙනවාය කියා මම සන්තෝෂයෙන් ප්‍රකාශ කරන්න කැමතියි. ඊට හේතුව අපේ සභාපතිතුමාගේ සහ අධ්‍යක්ෂවරුන්ගේ උනන්දුවයි. ඒ වාගේම සේවක මහත්වරුන්ගේ උනන්දුවයි. සෑහෙන පළපුරුද්දක් තිබෙන ඒ සේවක මහත්වරුන්ට උනන්දුවක් වුවමනාවක් තිබෙනවා සමුපකාරය ආරක්ෂා කර ගැනීමට. ඒ සඳහා හොඳ අධ්‍යක්ෂ මණ්ඩලයක් ඉන්න ඕනෑ. අධ්‍යක්ෂ මණ්ඩලය හරියාකාර කටයුතු කරනවා නම් තමයි, සභාපතිවරයා හරියට ක්‍රියා කරනවා නම් තමයි සමුපකාර දෙපාර්තමේන්තුවේ සම්පූර්ණ සහයෝගය ලැබෙන්නෙත්, ඒ වාගේම සමුපකාර ව්‍යාපාරය ගැන සෑහෙන පළපුරුද්දක් තිබෙන සේවකයන්ගේ සම්පූර්ණ සහයෝගය ලැබෙන්නෙත්.

අපේ බණ්ඩාරවෙල සමුපකාර සමිතියේ සේවකයන් 600 ක් පමණ ඉන්නවා. අපේ ව්‍යාපාර ගණනාවක් තිබෙනවා. අපේ ප්‍රාදේශික සංවර්ධන මණ්ඩලය ලක්ෂ ගණනක් වටිනා බඩු බාහිරාදිය සමුපකාර සමිති සංගමයට භාර දුන්නා. අද ඒ හැම ව්‍යාපාරයක්ම දියුණුවෙන් දියුණුවට පත් වෙමින් තිබෙනවා. ඒ වාගේම ඒ සභාපතිතුමාත් අධ්‍යක්ෂ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මණ්ඩලයන්—සෑම දේශපාලන පක්ෂවලම අර ඉන්නවා. සියලු දෙනාගේම සහයෝගය ඇතිව ඒ ආයතනය ඒ පළාතට ඉතාමත් ප්‍රයෝජනවත් ආයතනයක් හැටියට දියුණු කිරීමට සෑහෙන මහන්සියක් ගන්න බව මේ අවස්ථාවේදී සඳහන් කරන්න ඕනෑ.

අන්න ඒ වගේ සමූපකාර සමිතිවලට තවත් උදව් කරන්න. සමූපකාර කොමසාරිස්තුමාගෙනුත් ඒ වාගේම නියෝජ්‍ය කොමසාරිස්තුමාගෙනුත් අපට ලැබිලා තිබෙනවා. පසුගිය කාලයේදී අපට සෑහෙන ආධාර මුදලකුත් දුන්නා. ඒ වගේම ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසන් සභාවේ වතුවලින් 1977 න් පසු—1978 අවසාන වෙන විට—මාස ගණනක් තුළ, රුපියල් තිස් ලක්ෂයකට වැඩි ගණනක ආදායමක් අපේ සමූපකාරයට ලබා ගන්නට පුළුවන් වුණා. එය විසඳා දැමීමට පසුව ඒ මුදල් අපි සමූපකාර දෙපාර්තමේන්තුවේ තබා තිබෙනවා. අන්න ඒ නිසා ඒ වගේ දියුණු වුණ, ඒ තරම් මහන්සියෙන් කටයුතු කර දියුණුවට පත් කර තිබෙන, දියුණුවෙන් දියුණුවට පත් වුණ සමූපකාර සමිතිවලට තව තවත් ආධාර දෙන්න. හැකි තරම් ආධාර දෙන්න. තමුන්නාන්සේලා ගිහින් බැලුවා. ඒ ව්‍යාපාරය කොයි තරම් සාර්ථක අන්දමට කර තිබෙනවාද කියා තමුන්නාන්සේලා දකින්න ඇති. අන්න ඒ නිසා අපේ ගම්බද ජනතාවගේත් සහයෝගය අර ගෙන මේ සමූපකාර දියුණු කරන්න පුළුවන්. ඒ බව අපි බණ්ඩාරවෙලින් පෙන්නුම් කර තිබෙනවා. විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන්ට හෝ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට ගරු ඇමතිතුමාගෙන් අසා දැනගන්න පුළුවනි, බණ්ඩාරවෙල සමූපකාර සමිතිය කොයි තරම් දියුණු තත්ත්වයකට පත් කර තිබෙනවාද කියා. අන්න ඒ සමූපකාර සමිති තවත් දියුණු කර ගැනීම ප්‍රයෝජනවත් වෙනවා.

ඒ වගේම අපේ ගැරේජ් එකක් තිබෙනවා. මුළු පළාතේම තිබෙන සමූපකාර ලොරි රේපයාර් කිරීමට ගෙනෙන්නේ එතැනටයි. ඒ වගේම ආරෝග්‍ය ශාලාවක් හදන්නටත් දැන් අපි බලාපොරොත්තු අන්න ඒවාට පුළුවන් තරම් උදව් උපකාර කරන්න. ඒ පළාතට පමණක් නොවෙයි, ඒ දිස්ත්‍රික්කයටම ආදර්ශමත් විධියට ඒ සමූපකාරය දැන් කටයුතු කර ගෙන යනවා. ඒ නිසා ඇමතිතුමාගෙන්, නියෝජ්‍ය ඇමතිතුමාගෙන්, දෙපාර්තමේන්තුවෙන් සම්පූර්ණ සහයෝගය තව දුරටත් දෙන්නය කියා ඉල්ලා සිටිනවා.

ඒ වාගේම අපේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නොයෙකුත් අඩුපාඩුකම් තිබුණත් අපි ඒවා කොහොම හරි හදාගෙන සමගියෙන් කටයුතු කරගෙන යනවා. නමුත් නොයෙකුත් අක්‍රමිකතාවයන් මඟින් අධ්‍යක්ෂ මණ්ඩලයට ඇතුල් වෙන්න උත්සාහ කළත්, එයට අවස්ථාවක් නොලැබුණු කට ව්‍යාපාරිකයන් පිරිසක් එකතු වී අද අපේ අධ්‍යක්ෂ මණ්ඩලය හා එහි සභාපතිතුමා අස් කිරීමට නඩුවක් දමලා තිබෙනවා. දැන් කීප වතාවක්ම උසාවියේ ඒ නඩුව කල් ගියා. අධ්‍යක්ෂ මණ්ඩලයට විරුද්ධව කතා කරන්න අද්වකාත් මහත්වරුන් කොළඹින් එන්න යනවා. නමුත් ගරු ඇමතිතුමාත් ඒ වගේම උප කොමසාරිස්තුමාත් දන්නවා, ඒ අධ්‍යක්ෂ මණ්ඩලය මොන තරම් උනන්දුවෙන් කටයුතු කරගෙන යනවාද කියා. ඒ අය එළවන්න අර විධියේ පිරිසක්—කඩාකප්පල්කාරී පිරිසක්—සූදානම් වෙනවා.

අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මහතා) කතා කරමින් කිව්වා සමූපකාරයට දේශපාලනය ඇතුල් කරන්න එපා කියා. නමුත් එතුමාගේ පක්ෂයේ තවත් මන්ත්‍රීවරයෙකු විසින් මතක් කළා, එතුමන්ලාගේ ආණ්ඩුවේ සිටපු ඇමතිවරයෙකුගේ හිතවතුන්ට ඕනෑ විධියට සමූපකාරය කාබාසිනියා කරන්නට ඉඩ දී තිබුණාද කියා. එතුමාගේ පක්ෂයේ මන්ත්‍රීවරයෙකු විසිනුයි, දැන් ඒ කරුණු හෙළිදරව් කළේ. නමුත් අපේ කාලයේදී මන්ත්‍රීවරුන් ඒ කටයුතුවලින් අයින් වී සිටින අතර, අපි කරන්නේ ඒ කටයුතු හොඳින් කරන්නට පුළුවන් අධ්‍යක්ෂවරුන්, සභාපතිවරුන්, සාමාන්‍යාධිකාරිවරුන් පත් කර ඒ සමූපකාර ව්‍යාපාරය පුළුවන් තරමින් දියුණු කිරීමයි. ඒ නිසා රජයෙන් දෙන්න පුළුවන් සම්



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. එම්. අප්පුහාමි මහතා]

පූර්ණ සහයෝගය අපට දුන්නොත් ඒ ව්‍යාපාරය ඉතාමත් සාර්ථක අන්දමට කර ගෙන යන්න පුළුවන් වෙනවා.

මට තව හුඟක් දේවල් කියන්න තිබෙනවා. නමුත් සුළු කාලයකුයි, මට ලැබී තිබෙන්නෙ ඒ නිසා අර විධියේ හොඳ සමුපකාර සමිතිවලට තව තවත් පහසුකම් ලබා දෙන්න කියා මා විශේෂයෙන් ඉල්ලා සිටිනවා. බදුලු දිස්ත්‍රික්කයේ සෑහෙන වතු ගණනකට හාල් දෙන්නේ අපේ සමුපකාර සමිතියෙනුයි. බණ්ඩාරවෙල, හපුතලේ ආදී ප්‍රදේශවල සියල්ලටම හාල් දෙන්නෙ අපි. අන්න ඒ නිසා වුවමනා කරන හාල් ටික විශේෂයෙන්ම අපට ලබා දෙන්න කටයුතු කරන්න ඕනෑ. අපට වුවමනා කරන්නේ කැකුළු හාල් නොව තම්බපු හාලුයි. අන්න ඒවා ගැන සොයා බලා, අපේ සමුපකාරවලටත්, නොදියුණු සමුපකාරවලට උදව් කරන්නා වාගේම අවශ්‍ය උදව් උපකාර ලබා දී තව තවත් දියුණු කර ගැනීමට අත හිත, ධෛර්යය දෙන්නය කියා ඉල්ලා සිටිනවා.

ඒ වගේම මේ ව්‍යාපාරය කාලයක් තිස්සේ පැවත ගෙන එන ව්‍යාපාරයක්. ඩී. එස්. සේනානායක අගමැතිතුමාගේ කාලයේ සිට ඒ වගේම ඒ. රත්නායක මැතිතුමන්ලා විසින් මේ සමුපකාර ව්‍යාපාරය දියුණු කරගෙන ආවා. ඒ නාමයෙන් ඉදිරියටත් මේ සමුපකාර ව්‍යාපාරය දියුණු කර ගැනීමට තමුන්නාන්සේලා සියලු දෙනාගේම ආධාරය, සහයෝගය ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා.

**ආර්. එම්. කරුණාරත්න මහතා (ඌව-පරණගම)**

(திரு. ஆர். எம். கருணாரத்ன—ஊவ-பரணகம)

(Mr. R. M. Karunaratne—Uva-Paranagama)

ගරු සභාපතිතුමනි, ආහාර හා සමුපකාර අමාත්‍යාංශය ගැන සාකච්ඡා වෙන අවස්ථාවේදී මටත් වචන ස්වල්පයක් කතා කිරීමට සුළු වේලාවක් හෝ ලබා දීම ගැන පළමුවෙන්ම මා තමුන්නාන්සේට ස්තුති වන්න වෙනවා. මම දීර්ඝ කතාවක් කරන්න බලාපොරොත්තු වෙන්නෙ නැහැ. බදුල්ල දිස්ත්‍රික්කයේ, ඌව-පරණගම, වැලිමඩ වැනි ප්‍රදේශවල සමුපකාරයේ සෑහෙන දියුණුවක් ඇතිවී තිබෙන බව අමාත්‍යාංශය දන්නවා. ගරු ඇමතිතුමාත් විශෙෂයෙන්ම ගරු ජනාධිපතිතුමාත් ඒ බව දන්නවා.

මට මේ අවස්ථාවේදී විශේෂ කාරණයක් කියන්න කැමතියි. ලංකාවේ සමුපකාර සමිතිවලට පාලනය කරන්නට දී තිබුණ සෑම ඉඩමක්ම වාගේ ආපසු ගත්තත් ඌව-පරණගම මැතිවරණ කොට්ඨාශයේ සමුපකාර සමිතියට පමණක් අද ඉඩමක් පාලනය කිරීමට භාර දී තිබෙනවා. ජනාධිපතිතුමාගේ විශේෂ අවසරයක් පිටයි, ඒ ඉඩම අපේ සමුපකාර සමිතියට භාර දී තිබෙන්නෙ. එසේ භාරදී තිබෙන්නෙ ඒ සමුපකාර සමිතියේ තිබෙන දක්ෂකම නිසයි. ඒ සමුපකාර සමිතියේ දක්ෂකම අපි ඔප්පු කර තිබෙනවා. ජනතා වතු සංවර්ධනය මණ්ඩලයට අයිති වතු. රාජ්‍ය වැවිලි සංස්ථාවට අයිති වතු පාඩුවට දුවන විට අපේ සමුපකාර ආයතනය යටතේ තිබෙන ඒ කුඩා තේ වත්ත අද ප්‍රදේශයේ ඉතාම හොඳ වත්ත බවට පත්වී තිබෙනවා. ඒ නිසා ඒ සමුපකාරය සෑම අතින්ම දියුණුවී තිබෙන බව මතක් කරන්න ඕනෑ. නමුත් අපට යම් යම් බාධා වන් ඇතිවී තිබෙනවා. ඒ පිළිබඳවයි, අපි කියන්නෙ.

අපට අහන්න ගන්නට ලැබී තිබෙන කාරුණු අනුව සමුපකාර දෙපාර්තමේන්තුවේ යම් යම් හොඳ නිලධාරීන් සිටිනවා. ඒ වාගේම දුර්වල අයත් සිටිනවා. විශේෂයෙන් මේ රජය ආවාට පස්සේ සමුපකාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ සිටි නෙයෙක් විධියේ නිලධාරීන් නිතර නිතර මරුවී ගොස් තිබෙනවා. මේ මාසයේ සිටින නිලධාරීන් ඊළඟ මාසයේ නැහැ. සමුපකාර දෙපාර්තමේන්තුව රජයේ සමහර උසස් නිලධාරීන්ගේ තාවාකාලික හැටියටද තිබෙන්නේ කියා මම අහන්නට කැමතියි. මේ තත්ත්වය දිගටම තිබුණොත් සමුපකාර ව්‍යාපාරය ගෙන යන්නට අමාරුයි. සමුපකාර ව්‍යාපාරයේ නියුතු නිලධාරීන් ඒ ගැන නිපුණත්වයක් ලබා ගෙන දිගින් දිගටම ඒ ව්‍යාපාරය දියුණු කරන්නට ඉන්න ඕනෑ. සමහර විට මේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මාසයේ සිටින නිලධාරියා ඊළඟ මාසයේ නැහැ. ලබන මාසයේ සිටින නිලධාරියා ඊට පසු මාසයේ බලන විට නැහැ.

"fපයිල්" එකක් එහාට මෙහාට කරලා සමූපකාර ව්‍යාපාරය දියුණු කරන්නට බැහැ. මහජනතාවට රජයේ හොඳ හෝ නරක කැපී පෙනෙන ව්‍යාපාරයක් තමයි. සමූපකාර ව්‍යාපාරය. එහෙම නම් පළමු වෙන්ම සමූපකාර ව්‍යාපාරය ප්‍රතිසංවිධානය කළ යුතු අතර එයට පත් වෙන සිය ලුම නිලධාරීන් යම්කිසි කාලයක් ඒ ආයතනයේ දියුණුවට වගබලා ගැනීම ඉතාමත් වැදගත්ය කියා මම කල්පනා කරනවා.

ඒවාගේම ගණන් පරීක්ෂණ අංශයේ දුර්වලකම් නිසා මේවායේ දුර්වලකම් ඇති වෙන බව ප්‍රකාශ කළ යුතුව තිබෙනවා. සමූපකාර කළමනාකරුවෙකු විසින් රුපියල් දහ පහළොස් දාහක වංචාවක් කළොත් ඒක සොයා ගන්නේ මාස ගණනක් ගිහිනුයි. ඔහුට දඬුවම් කරන්නට තව අවුරුදු හතරක් පහක් යනවා. සමූපකාරයට ඇතුලු වෙලා මැනේජර් කෙනෙක් හැටියට ටික කලක් කටයුතු කර රුපියල් දහ පහළොස් දහසක 'ලීකේජ්' එකක් ඇති වුණාට පස්සේ රස්සාවෙන් අයින් වීම අද පුරුද්දක් වෙලා තිබෙනවා. මේවාගේ සිද්ධීන් සිය ගණනක් ඇති වුණාම ලක්ෂ ගණනක මුදල් අඩුවක් වෙනවා. එම නිසා මේ සමූපකාර ගණන් පරීක්ෂක අංශය ප්‍රතිසංවිධානය කරන්නට ඕනෑ.

ඒවාගේම සමූපකාර ව්‍යාපාරය ගනුදෙනු කරන්නේ මහජන බැංකුව සමග පමණයි. මහජන බැංකුවෙන් සමූපකාර සමිතිවලට නොයෙක් නොයෙක් අවහිරකම් තිබෙන බව ඒවායේ අධ්‍යක්ෂ මණ්ඩලවලින් දැන ගන්නට ලැබී තිබෙනවා. එම නිසා මට කලින් කතා කළ මන්ත්‍රීවරුන් යෝජනා කළ පරිදි සමූපකාර ව්‍යාපාරය නැංවීම සඳහා සමූපකාර බැංකු ක්‍රමයක් නැවතත් ඇති කරන ලෙස මම විශේෂ ඉල්ලීමක් කරනවා.

හාලි-ඇල සමූපකාර පේෂකර්ම සමිතිය අද ඉතාමත් දුර්වල තත්ත්වයක තිබෙනවා. එම නිසා කාරුණාකර ඒ හාලිඇල පේෂකර්ම සමූපකාර සමිතිය භාරයේ තිබෙන ආයතන පේෂකර්ම දෙපාර්තමේන්තුවට පවරා ගන්නා ලෙස ඉල්ලන අතර 'මාර්ක්fපෙඩ්' ආයතනය මගින් ඇති කර තිබෙන ඌව පරණගම එළවළු එකතු කිරීමේ මධ්‍යස්ථානය හැකි ඉක්මණින් පටන් ගන්නා ලෙස ඉල්ලමින් මගේ කතාව අවසාන කරනවා. ස්තුතියි.

අ. භා. 7.15

**ජේ. එල්. සිරිසේන මහතා (සමාජ සේවා නියෝජ්‍ය ඇමතිතුමා)**

*(திரு. ஜே. எல். சிறிசேன—சமூக சேவைகள் பிரதி அமைச்சர்)*

**(Mr. J. L. Sirisena—Deputy Minister of Social Services)**

ගරු සභාපතිතුමනි, කාල වේලා නැතිකම නිසා මම කෙලින්ම මගේ කතාවට බහින්නම්. ආහාර හා සමූපකාර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාව විසින් පත් කරන ලද අනුකාරක සභාව තම වාර්තාවේ 10 වැනි පිටුවේ 21 වන නිර්දේශය මෙසේ දක්වා තිබෙනවා:

"ලියාපදිංචිය අවලංගු කරනු ලැබ ඇති සීමාසහිත බිංගිරිය ඉඩම් ප්‍රතිසංස්කරණ සමූපකාර සමිතියේ පරීක්ෂණ වාර්තාව විමර්ශනය කළ අනුකාරක සභාව එයින් අනාවරණය වන මුදල් පාඩුවලට වග කිව යුතු අයගෙන් ඒවා අය කර ගැනීමට ඉක්මණින් ක්‍රියා මාර්ගයක් ඈවරකරු විසින් ගත යුතු යයි නිර්දේශ කරයි."

මේ මුදල් අය කර ගන්නේ කවදාද කියා මම ගරු ඇමතිතුමාගෙන් දැන ගන්නට කැමතියි. මොකද? මේ මුදල් නිලධාරීන්ගෙන් අපට අය කර ගැනීමට නීතියක් නැහැ. නමුත් මේ තත්තත්වයට සම්පූර්ණයෙන් වගකිව යුත්තේ එදා සමූපකාර කොමසාරිස් ධූරය දැරූ කාන්තාවක්. තමන්ගේ රාජකාරිය හරියට ඉෂ්ට නොකර දහහත් ලක්ෂයක 'ලීකේජ්" එකක් ඇති වෙන තුරු බලාගෙන සිටි, මේ විධියේ වැඩ කළ කොමසාරිස්වරියට තමුන්නාන්සේලා මොනවාද කරන්නට යන්නේ කියන එකයි මම අහන්නේ? ඒවාගේ නිලධාරීන් තවත් සිටින බව මේ ළඟ දී තිබුණු සාකච්ඡාවකදී ලේකම් මහත්මයාත් ඉදිරිපිටදී ගරු ඇමතිතුමා—මගේ හොඳ මිත්‍රයා—ප්‍රකාශ කළා. එහෙම කවුරු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජේ. එල්. සිරිසේන මහතා]

හරි සිටිනවා නම් ඒ හැම කෙනාකුටම දඬුවම් කළ යුතුයි. එහෙම නැත්නම් මේක හරි පුදුම තත්ත්වයක්. මේ කාන්තාව එක්කෝ තමන්ගේ රාජකාරිය නොදන්නා කෙනෙක් වෙන්න ඕනෑ. මේ කාන්තාව තමන්ගේ රාජකාරිය නොදන්නා කෙනෙක් නම්, එයාට 'ප්‍රොමෝෂන්' හම්බ වෙන්න විධියක් නැහැ.

ඒ කාන්තාව රාජකාරිය හරියට දැන ගෙන රාජකාරිය නොකළා නම් එය රාජකාරිය පැහැර හැරීමක්. රාජකාරිය පැහැර හැරිය අයට කරන්නට දඬුවම් තිබෙනවා. ඒකට බලතල තිබෙනවා. ඒ බලතල පාවිච්චි කරන්නට ඕනෑ. රාජකාරිය පැහැර හැරියා නම් ඒ පැහැර හරින්නට හේතු තිබෙන්නට ඕනෑ. තමන්ගේ වාසියට වෙන්න පුළුවන්. වෙනත් දෙයකට වෙන්න පුළුවන්. කාරණය මොකක්ද කියන්නට මම දන්නෙ නැහැ. රාජකාරිය පැහැර හැරියා නම් මොන හේතුවක් නිසා හෝ ඒ පැහැර හැරීම නිසා ලක්ෂ සංඛ්‍යාත මහජන මුදලක් නැති වෙලා තිබෙනවා. මේ නැති වුණේ වතුවල පමණක් නොවෙයි, වෙළඳ ව්‍යාපාරවලත් 'ලීකේජ්' ඇති වෙන තුරු බලාගෙන සිටීම නිසා මහජන මුදල් නැති වී තිබෙනවා. එක කාන්තාවක් එක් ලක්ෂ අසූ දහක් වංචා කළා. එක් කෙනෙක් එක් ලක්ෂ අසූ දෙදාහක් වංචා කළා. මේක එක දවසකින් කළාද? එක සතියකින් කළාද? එක මාසයකින් කළාද? නැහැ. අවුරුදු ගණනක් මේක කළා. කරන්න දීල බලාගෙන හිටිය නම් ඇයි ඒ නිලධාරිනියට හෝ නිලධාරියාට විරුද්ධව ගත යුතු පියවරවල් නොගන්නේ? මෙහෙම කළොත් කවදාවත් සමූපකාර ව්‍යාපාරය දියුණු කරන්නට බැහැ.

සමූපකාරය මහජන ව්‍යාපාරයක්. ඒ මහජන ව්‍යාපාරයට මහජනයාගෙන් කෙනෙකු අතින් අනවරයක් වුණොත් ඔහුට පමණක් දඬුවම් කළාට මදි. නිලධාරීන් තමන්ගේ රාජකාරිය පැහැර හරිනවා නම් ඔවුන්ටත් දඬුවම් කරන්නට ඕනෑ. මොකක්ද මෙතැන වෙලා තියෙන්නෙ? "මායම් හැට හතර ලොව් සැම අඟනුන්ට—වැයම් කිසිත් නොකරම හැක ඇනගන්ට" යනුවෙන් පරණ කියමනක් තිබෙනවා. ඒකෙ ලොකු සත්‍යයක් තිබෙන බව මේ කාරණයෙන් පෙනෙනවා. මේ නිලධාරිනිය මෙපමණ වැරදි කරල තියෙද්දිත් උසස්වීම් පමණක් නොවෙයි උස්ස උස්ස පිටරටත් යවනවා. මේක පුදුම තත්ත්වයක්. කොහොමද අනික් නිලධාරීන් පාඩමක් ඉගෙන ගන්නෙ? වැරදි කළ නිලධාරීන්ට දඬුවම් කරන්නෙ නැත්නම් අනික් නිලධාරීන් කොහොමද පාඩමක් ඉගෙන ගන්නෙ? ඒකයි තත්ත්වය.

අපේ ඇමතිතුමා නිතරම කියනවා පාකිස්ථානයේ වගෙ හොරකම් වංචා කරන අයගේ අත පය කපන්න එතුමාටත් බලය තිබෙනවා නම් මේක කරන්න පුළුවන් ය කියල. ඒක මම පිළිගන්නෙ නැහැ. අපට තිබෙන්නෙ බෞද්ධ සංස්කෘතියක් ඇති සමාජයක්. මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්ඛා කියන විහරණ හතර ඇතුළත අප ක්‍රියා කළ යුතුව තිබෙන්නෙ. ශ්‍රීමත් ජනාධිපතිතුමා මේ රටේ ධර්මිෂ්ඨ සමාජයක් ඇති කරන්නට පදනම දමන්නෙ. එහෙම සමාජයක මිනිස්සු හොරකම් කළාය කියල අත පය කපන්න බැහැ. නමුත් හොරකම් කර වංචා කර අත්පත් කර ගන්නා දේවල් රජය සන්තක කරන්නට අපට නීති සකස් කරන්නට පුළුවනි. ඔවුන්ට හිර දඬුවම් පමුණුවන්නට පුළුවනි. එහෙම නොකර කොහොමද සමූපකාර ව්‍යාපාරය දියුණු කරන්නෙ?

ඇත්ත වශයෙන්ම පසුගිය අවුරුදු හතර ඇතුළත සමූපකාර ව්‍යාපාරයේ යම් දියුණුවක් දකින්නට පුළුවන් වුණේ අපේ ගරු ඇමතිතුමා හෝ මන්ත්‍රීවරුන් පත් කළ අය ඒවායේ පාලනය ගෙන ගිය නිසයි. යම් තත්ත්වයක් ඇති වුණාට පසු ඒවා ආපසු මහජනතාවට දුන්නා.

සමූපකාර කොමසාරිස්තුමා මගේ හොඳ මිත්‍රයෙක්. එතුමා අවංක දක්ෂ නිලධාරියෙක්. නමුත් එතුමා ආඥාදායකයෙක්. සමූපකාර ව්‍යාපාරය ආඥාදායක ලෙස ගෙන යන්න බැහැ. සමූපකාර ව්‍යාපාරය ගෙන යන්නට ඕනෑ අර මා සඳහන් කළ විහරණ හතර පිළිපදින අය. සමූපකාර ව්‍යාපාරයේ ප්‍රධානියා ආඥාදායකයෙක් නම් මේක ගෙන යන්නේ කොහොමද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අපි ළඟදී බිංගිරිය විවිධ සේවා සමුපකාර සමිතිය පිළිබඳව සාකච්ඡාවක් කළා. ඒ අවස්ථාවේදී මම ගරු ඇමතිතුමාට කිව්වා, සහකාර සමුපකාර කොමසාරිස්තුමා සමුපකාර කොමසාරිස්තුමා ඉදිරිපිට සාක්ෂි දුන්නොත් සමහර විට ඔහුට දඬුවම් කරන්නට ඉඩ තිබෙනවාය කියලා. ඒ අවස්ථාවේදී ලේකම්තුමාත් ඒවාගේම සමුපකාර කොමසාරිස්තුමාත් කිව්වා, " නැහැ, එහෙම වෙන්නෙ නැහැ " කියලා. නමුත් මොකක්ද වුණේ ? කිසිම හේතුවක් නැතිව ඒ මහත්මයා දෙපාර්තමේන්තුවෙනුත් පිටනට මාරු කළා. ඒ සම්බන්ධයෙන් මා ඇතුළු ගරු මන්ත්‍රීවරු හතර දෙනෙකු ගරු ඇමතිතුමාට පෙත්සමක් ඉදිරිපත් කළාම ඇමතිතුමා ඒක අවලංගු කළා. ඒ ගැන ඇමතිතුමාට කෘතඥ වෙනවා. ඒ මහත්මයාට ආපසු එතැනම රක්ෂාව දුන්නා. එදා අර දුන් පොරොන්දු සියල්ලම කඩ කරලා ඒ විධියට වැඩ කිරීම ඉතාම වැරදියි. කොයි තරම් බලතල තිබුණත් ඒ බලතල පාවිච්චි කළ යුත්තේ අනුකම්පාසහගතවයි. නිලධාරියෙක් වරදක් කර තිබුණා නම් කොමසාරිස්තුමාට තිබුණා සාක්ෂි ඉදිරිපත කරන්නට. ඒ මොකවත් නැතිව මිනිසුන්ට එහෙම කරන එක වැරදියි. එහෙම කොහොමද සමුපකාරය දියුණු කරන්නෙ ? එම නිසා මේ ආඥාදායක නිලධාරි මහත්මයාට—කොමසාරිස්තුමාට—සහ ඊට ආධාර දුන් නිලධාරීන්ටත් කරුණාකර සමුපකාර දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා අස් වෙන්නය කියන ලෙස මා ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

**සරත්චන්ද්‍ර රාජකරුණා මහතා (ආහාර හා සමුපකාර නියෝජ්‍ය ඇමතිතුමා)**
*(திரு. சரச்சந்திர ராஜகருணா—உணவு, கூட்டுறவு பிரதி அமைச்சர்)*
**(Mr. Sarathchandra Rajakaruna—Deputy Minister of Food & Co-operatives)**

ගරු සභාපතිතුමනි, ඉතාම වැදගත් කථා කීපයකට මට ඇහුම්කන් දෙන්නට අවස්ථාව ලැබුණා. මේ උත්තරීතර සභාවේ ගරු මන්ත්‍රීවරුන් විශයෙන් අපි ඉතාම කල්පනාකාරීව කථා කරන්නට ඕනෑ. නිලධාරීන් ගැන කරන චෝදනා සම්බන්ධයෙන් ඒ නිලධාරීන්ට මේ සභාවට ඇවිත් පිළිතුරක් දෙන්නට බැහැ. කොහේවත් තිබෙන නැතිනම් කවුරු හරි දෙන තුණ්ඩු කෑල්ලක් අරගෙන නැත්නම් තුණු බාල්දියකින් අහුලා ගත් කොළයක් අරගෙන මෙතැනට ඇවිත් යම් යම් දේවල් ප්‍රකාශ කිරීම ඉතාම භයානකයි.

හාරිස්පත්තුවේ දෙවන ගරු මන්ත්‍රීතුමා එතුමාගේ කථාවේදී සඳහන් කළා සමුපකාර දෙපාර්තමේන්තුවේ කොමසාරිස්තුමාගේ වැඩ පිළිවෙළ නිසා නිලධාරි මහත්වරු ඒ දෙපාර්තමේන්තුවේ රැඳී නොසිට අස් වී යනවාය කියලා. මම කියන්නට ඕනෑ. මේ අවස්ථාවේදී, සමුපකාර දෙපාර්තමේන්තුවට පමණක් නොවෙයි රජයේ අනෙකුත් දෙපාර්තමේන්තුවලටත් නව අවුරුදු පහළොවකට විස්සකට සුදුසු අවශ්‍ය දක්ෂ නිලධාරීන් සොයා ගන්නට ලැබෙන්නේ නැති බව.

1956 ට කලින් මේ රටේ රක්ෂා දුන්නේ සුදුසු පුද්ගලයන්ටයි. එහෙම නැතිව මන්ත්‍රීවරයාගේ තුණ්ඩුව අනුව නොවෙයි. 1956 යේ බණ්ඩාරනායක යුගයේ දී තමයි, මන්ත්‍රී තුණ්ඩු ක්‍රමයට රක්ෂා දීම ආරම්භ වුණේ. ඒ ක්‍රමය වෙනස් කරන්න ඕනෑ කාලය දැන් එළඹී තිබෙනවා. අපි භය නැතුව හාල් පොතට අත ගැහුවා වගේ, මේ රටේ සුදුස්සාට සුදුසු තැන දෙන්නත්, සුදුසුකම් අනුව පමණක් රක්ෂා සහ උසස්වීම් දෙන්නත් ඉක්මණින්ම කටයුතු නොකලොත්, මේ රටේ පාලනය ගෙන යෑම සඳහා—පරිපාලන කට යුතු සඳහා—අවශ්‍ය දක්ෂ නිලධාරීන් නැතිව යන්න පුළුවන් බව මේ අවස්ථාවේ දී විශේෂයෙන්ම මතක් කරන්න කැමතියි.

හාරිස්පත්තුවේ දෙවන ගරු මන්ත්‍රීතුමා (ආර්. පී. විජේසිරි මහතා) අපේ සමුපකාර කොමසාරිස්තුමාට වැරදි විධියට අභියෝගයක් කළා. මම හිතනවා, අපේ නියෝජ්‍ය වෙළඳ ඇමතිතුමාගේ කථාවෙන් එතුමාට, කෙටියෙන් වුණත් හොඳ පැහැදිලි පිළිතුරක් ලැබෙන්න ඇතිය කියා. ඒ කථාවෙන් පැහැදිලි කර දුන්නා, මේ වගේ ඉතා සුළු කාලයක් තුළ පවා විශාල වැඩ කොටසක් ඉටු කරන්න පුළුවන් බව ඒ කොමසාරිස්තුමා ඔප්පු කර තිබෙනවාය කියාත්. මම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සරත්චන්ද්‍ර රාජකරුණා මහතා]

හිතන හැටියට පැමිණිලි 4,000 කට වැඩි සංඛ්‍යාවක් සම්බන්ධ කටයුතු අවසන් කරන්න හැකි වීමම, සමුපකාර කොමසාරිස්තුමා ඇතුළු ඒ දෙපාර්තමේන්තුවේ සියලුම නිලධාරි මහතුන්ට මේ රටේ මුළු-මහත් ජනතාවගේම ස්තුතිය හිමි වෙන්න ප්‍රමාණවත්. ඒ බව මේ අවස්ථාවේදී විශේෂයෙන් මතක් කරන්න කැමතියි.

නියෝජ්‍ය සෞඛ්‍ය ඇමතිතුමා ප්‍රකාශ කළා, සහකාර සමුපකාර කොමසාරිස්වරයෙක් වැරදි විධියට නියෝගයක් දී තිබෙනවාය කියා. ඒ නියෝජ්‍ය ඇමතිතුමා ඒ විධියේ ප්‍රකාශයක් කළේ, තත්ත්වය නියම විධියට අවබෝධ කර ගැනීමට අපොහොසත් වීම නිසාය, එහෙම නැත්නම් එතුමාට නියම තත්ත්වය අවබෝධ කර දීමට නිලධාරීන් අපොහොසත් වීම නිසාය කියා මම හිතනවා. ඒ මැතිවරණය නැත්නම් නිලවරණය මාසයකින් කල් තබන්න විතරයි, සහකාර කොමසාරිස් හෙට්ටිආරච්චි මහතා නියෝග කළේ. ඒ විධියට සේවා කාලය මාසයකින් දික් කෙරුණේත්, ඒ නියෝජ්‍ය ඇමතිතුමාම—මහරගම මන්ත්‍රීතුමා වශයෙන්—පත් කළ අධ්‍යක්ෂවරුන්ගේ මිස ඒ සහකාර කොමසාරිස්තුමා විසින් පත් කෙරුණු අධ්‍යක්ෂවරුන් වගයකගේ නොවෙයි. එම නිසා, නියෝජ්‍ය ඇමතිතුමා ඇති කරගෙන තිබෙන්නේ වැරදි හැඟීමක් බව නැවතත් පෙන්වා දෙන්න කැමතියි.

අපේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ කථා කළ මන්ත්‍රීවරුන්ගේ ඒ දේශනවලින් මට පැහැදිලි වුණේ, සමුපකාර ව්‍යාපාරය රජයේ ආයතනයක් හැටියට තිබුණත් මේ ආණ්ඩුව බලයට ආවාට පස්සේ, අපේ ඇමතිතුමා ආහාර හා සමුපකාර ඇමති වශයෙන් පත් වුණාට පස්සේ, එය නිදහස් ව්‍යාපාරයක් බවට පත් වී තිබෙන බවයි: ඉහතක් දුරට පිරිසිදු වී තිබෙන බවයි. එය අපේ සන්තෝෂයට කාරණාවක්.

හැම මන්ත්‍රීවරයකුම වාගේ ප්‍රකාශ කළා, රටේ ආර්ථික ප්‍රතිපත්තිය, වෙළෙඳ ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් මේ කාලය තුළ සිදු වී තිබෙන වෙනස නිසා අද සමුපකාර ව්‍යාපාරය බොහොම භයානක ප්‍රපාතයකට වැටී තිබෙනවාය කියා. කලවානේ මන්ත්‍රීතුමා (සරත් මුත්තෙට්ටුවේගම මහතා) ප්‍රකාශ කළා. 'බී. ටී. ටී.' සහ ආදායම් බදු යන දෙක සමුපකාරයෙන් අය කර ගැනීම නතර කළේ නැත්නම් සමුපකාර ව්‍යාපාරය හොඳටම වැටෙයි කියා. මම නම් ඒ අදහසට විරුද්ධයි. ආදායම් බදු නිසා, 'බී. ටී. ටී.' නිසා සමුපකාර ව්‍යාපාරය වැටෙනවා නම්, බිණ්ඩාරවෙල සමුපකාර සමිතිය රුපියල් ලක්ෂ 30 ක ලාභයක් ලබා ගත්තේ කොහොමද?

**ඩී. වින්සන්ට් ඩයස් මහතා**
*(திரு. டீ. வின்சன்ட் டயஸ்)*
**(Mr. D. Vincent Dias)**

බැංකුවලට කෝටිවර ණය තිබෙනවාද?

**සරත්චන්ද්‍ර රාජකරුණා මහතා**
*(திரு. சரச்சந்திர ராஜகருணா)*
**(Mr. Sarathchandra Rajakaruna)**

දොම්පේ විවිධ සේවා සමුපකාර සමිතිය පසුගිය අවුරුද්දේ රුපියල් දස ලක්ෂයක ලාභයක් ලැබුවා. සමුපකාර ව්‍යාපාරය වැටෙන්න හේතුව ආදායම් බද්දවත්, 'බී. ටී. ටී.' එකවත් නොවෙයි, වෙනත් දෙයක්. සමුපකාර ව්‍යාපාරයට—ඒ ඒ ස්ථානාන්තරවලට—හොඳ, අවංක පුද්ගලයන් වැටෙනවා නම් වැටෙන්නේ බොහොම කලාතුරකිනුයි. සමුපකාර ව්‍යාපාරයට වැටෙන පුද්ගලයන් හොඳ නම්, දක්ෂ නම්, මේ රටේ වෙළෙඳ ප්‍රතිපත්තිය හා ආර්ථික ප්‍රතිපත්තිය වෙනස් වුණාට ඒ සමුපකාර ව්‍යාපාරය වැටෙන්න විධියක් නැහැ.

මෙහිදී උදාහරණයක් වශයෙන් එක්තරා කාරණයක් පෙන්වා දෙන්න කැමැතියි. ඊයේ-පෙරේදා මම කොළඹ සිට හංවැල්ල ප්‍රදේශයට පරණ පාරේ—'ලෝ ලෙවල් රෝඩ්' එකේ—යනකොට, මා සමග ගමන් කළ කෙනෙක් මට පෙන්නුවා, පාර අයිනේ සිටි එක්තරා පුද්ගලයෙක්. ඒ පාර අයිනේ සිටි පුද්ගලයා ගැන විස්තර කරමින් මට කිව්වා, ඔහු හාල් ව්‍යාපාරිකයෙක්ය, හංවැල්ලේ පොළ තිබෙන එක සෙනසුරාදාවක පමණක් හාල් ලොරි 3 ක් විකුණනවාය කියා. එවිට මම ඇහුවා, ඒ හාල්වලින් ඔහු ලොකු ලාභයක් ගන්න

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වාද කියා. 'නැහැ, ගෝනිය පමණයි ලාභය හැටියට තබා ගන්නේ' කිව්වා. එයා හාල් ලොරි 3 ක් අරගෙන ගිහින් එතන සිටින වෙළෙන්දන්ට දෙනවලු, විකුනන්නට. ලාභ තබා ගන්නේ ගෝනිය පමණයි.

මම ගරු මන්ත්‍රීතුමන්ලාට කියන්න කැමතියි, වෙළඳාම් කටයුතු කරන විට සුළු ලාභය වැඩි වෙළඳාම මත කටයුතු කිරීම වාසිදායක බව. ගෝනියේ ලාභයෙන් තමයි, ඒ මහත්මයා ඒ වෙළඳාම දියුණු කරගෙන තිබෙන්නේ. අද ගෝනියක් කීයද? පරණ ගෝනියක් විකුණුවම රු. 10 කට වඩා ලැබෙනවා. ලොරියක හාල් ගෝනි 75 ක් පටවනවා නම්, ලොරි තුනේ ගෝනි 225 ක් තිබෙනවා. රු. 2,250 ක ඒ මහත්මයාට සෙනසුරාදා පොළ දවසේ පමණක් ශුද්ධ ලාභය ලැබෙනවා. අන්න ඒ ප්‍රතිපත්තිය ගෙන යන දක්ෂ හොඳ පුද්ගලයින් සිටින තැන්වල මේ ව්‍යාපාරය දියුණු වෙනවා. මේ ව්‍යාපාරයට අද ප්‍රශ්නයක් වී තිබෙන්නේ හොඳ අවංක දක්ෂ පුද්ගලයින් නැතිවීම බව අප ඉදිරිපිට සිටින මේ ගරු මන්ත්‍රීතුමන්ලා දන්නවා ඇති. මම දන්නවා ඇන් මෙහි සිටින මේ එක මන්ත්‍රීතුමෙක් නම් මන්ත්‍රීකම ලබා ගන්නට කලින් හොඳ දක්ෂ සමුපකාර ව්‍යාපාරිකයෙක් බව. ඒ සමගම මම කියන්න කැමතියි, අද මේ සමුපකාරය තුනපහ ටික විකුණන්න පමණක් තබාගෙන මිදී, විවිධ අංශවලට බහින්න ඕනෑ කියා.

ජේ. එල්. සිරිසේන මහතා
(திரு. ஜே. எல். சிறிசேன)
(Mr. J. L. Sirisena)

ඒවට බහින්න ඉඩ දෙන්නෙ නැහැනේ.

අ. භා. 7.30

සරත්චන්ද්‍ර රාජකරුණා මහතා
(திரு. சரச்சந்திர ராஜகருணா)
(Mr. Sarathchandra Rajakaruna)

ඕනෑ තරම් ඉඩ දෙනවා. මට මතකයි, පසුගිය දිනක මගේ කොමසාරිස්තුමාත් මමත් ගියා අනුරාධපුර දිස්ත්‍රික්කයටත් පොළොන්නරුව දිස්ත්‍රික්කයටත්. ඒ, පසුගිය කන්න කපන්නට කලින්. මේ දිස්ත්‍රික්කවලට ගොස් වී මිලදී ගැනීම ගැන අපි සොයා බැලුවා. අපේ සමුපකාර අංශය බාගෙට පණගිහින්. මොකද, පෞද්ගලික අංශය වී කිලෝ එක රු. 3.25 බැගින් ගන්නවා. සමුපකාරයට හැප්පෙන්න විධියක් නැහැ කියා ඒ අය හමාත්වෙලා ඉන්නවා. මම ගිහින් ඒ සමුපකාරවලට කිව්වා "රු. 3.40 දක්වා වී මිලදී ගන්න, වගකීම මම බාර ගන්නවා, බය නැතිව ඒ කටයුත්තට ඉදිරිපත් වෙන්න" කියා. ඒ අනුව වී ගන්නට ඒ අය පටන් ගත්තා.

ගරු සභාපතිතුමනි, මම ආඩම්බරයෙන් කියන්න කැමතියි. හිඟුරක්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතියෙන් පමණක් වී කිලෝ ලක්ෂ 40 කට වැඩි ප්‍රමාණයක් අරගෙන තිබෙනවා. හිඟුරක්ගොඩ සමුපකාරයට වී වලින් පමණක් ලැබුණු ලාභය කීයද දන්නවද? පසුගිය කන්නයේ ලක්ෂ 30 කට වැඩි ප්‍රමාණයක් ලාභ අරගෙන තිබෙනවා. මෙසේ ලාභයක් ලැබීම පමණක් නොවෙයි. හිඟුරක්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය මුළු මහත් ලංකාවේම සමුපකාර කටයුතුවලට හා සමුපකාර ව්‍යාපාරිකයින්ට ආදර්ශමත් වන අන්දමට තවත් දෙයක් කර තිබෙනවා. ඒ ගොල්ල දෙවැනි ලාභයකුත් ගෙව්වා, බුසලකට රු. 2.50 ක්. වී මිලයට අරගෙන ඒවායින් ලාබ තිබුණු නිසා ගොවීන්ට වී බුසලකට තවත් රු. 2.50 ක් ගෙව්වා. එමෙන්ම පසුගිය සතියේ අපේ රැස්වීමකට සහභාගී වී එහි දී ඒ අය පොරොන්දු වුණා. 3 වෙනි ලාභයත් රු. 4 දක්වා ගෙවනවා කියා. වී බුසලකට තවත් රු. 1.50 ක් ගොවීන්ට ගෙවනවා කිව්වා. එය ආඩම්බරයට කාරණක්.

ඒ වගේ තවත් සමිතියක් මට හම්බ වුණා. ඒ අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා සඳහන් කළ පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය. එය එතුමා කලින් සිටි ආසනයේ දූනගහ පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිතියයි. මා ආඩම්බරයෙන් කියන්න කැමතියි, පෞද්ගලික මෝල්වලට වඩා පොල් වැඩ කරන සමිතියක් තිබෙන්නේ දූනගහ සමුපකාර සමිතියයි කියා. දවසකට පොල් 90,000 ක් වැඩ කරනවා. කපාපු පොල්වලට පොල් 90,000 ක් ගන්නවා. ඒ ගොල්ලන් ගෙවනවා, දෙවෙනි ලහයක්. මෙන්න මේ ක්‍රමයෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සරත්චන්ද්‍ර රාජකරුණා මහතා]

තමයි, ජනතාව සමිතිවලට ඇද ගන්න පුළුවන් වෙන්නේ. පසුගිය ආණ්ඩුව කළා වගේ මහජනතාවට අවශ්‍ය බඩු බාහිරාදිය සමූපකාර සමිතිවලින් පමණක් විකුණනවා නම්, අන්න පාරිභෝගිකයා දණ ගහගෙන, වැඳ නමස්කාර කරගෙන, සමූපකාර සමිතිවල මැනේජර් මහත්වරු හමු වී බඩු ගන්න යනවා. ඒ යුගය නොවෙයි, දැන් තිබෙන්නේ. රට හැඩගැහෙන හැටියට; ලෝකය දියුණු වන හැටියට, සමූපකාර ව්‍යාපාරයේ ප්‍රතිපත්තිත් වෙනස් වෙන්නට ඕනෑ. ඒ විධියට වෙනස් වෙච් ඉදිරියට ගියොත් පමණයි, මේ ව්‍යාපාරය දියුණු කරන්නට පුළුවන්.

ඊළඟට, මම තවත් කාරණයක් කියන්නට කැමතියි. කොත්මලේ ගරු මන්ත්‍රීතුමාද (ආනන්ද දසනායක මහතා) කොහෙද කිව්වා රු. 6.15 ට ගන්න හාල් නැහැ කියා.

Mr. Chairman, the main problem that we all have is the problem of the elderly people. In the Western countries, the elders are never looked after by the children: The State looks after them. Although in the East it has been the practice for the children and the grand-children to

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

live with their parents, grand-parents and look after them, very many families in the East are also getting into the bad habit of not looking after the elderly parents and therefore, it is the duty of the Ministry to prepare a scheme by which every elderly person once he reaches the age of 60 years at least should get a minimum allowance of Rs. 200, so that he need not have to depend on the children, particularly grand children. Of course, that will require a lot of money. But the Ministry of Social Services should evolve a scheme to have their own source of revenue.

I think, Sir, for a long time we have spoken of social insurance. It is very difficult to implement a scheme of this nature immediately, at least in the course of an year. I think, the Hon. Minister should appoint a Committee of experts to prepare a report for him about the changes that are necessary. The Government must provide the Minister with a capital of at least Rs. 1,000 million with which he could start, so that every elderly person in this country, if he does not have an income, could be looked after by the State. Even those who have contributed to provident funds and received very large sums of money on retirement may have spent those monies for various reasons and become penniless. They have to resort to the Home for the Elders.

Therefore, if the Hon. Minister can persuade the Government to pay a reasonable proportion of the money contributed by an employee out of the provident fund into the social insurance scheme, then even those who draw large sums as provident fund contributions when they retire, could be looked after by the State.

The hon. Member for Kayts (Mr. K. P. Ratnam) and the Hon. Deputy Minister of Youth Agairs & Employment (Mr. Gamini Atukorale) have already spoken of the disabled. I think the Committee which is working under the Hon. Minister is doing what they can. But I think they should exploit whatever funding they can get from foreign source to prepare an exhaustive scheme for the disabled. The Hon. Minister had, during last year and the year before that, given tricycles to a few disabled persons. I can speak of one instance where a young man in my electorate who was disabled and was given one of those tricycles. Now he makes an income of about Rs. 200 because he had been provided with a tricycle. He goes to the market, buys goods and sells them. Earlier he was a burden on his parents and did not earn any income at all.

සරත් මුත්තෙට්ටුවේගම මහතා (කලවාන)
(திரு. சரத் முத்தெட்டுவேகம—கலவான)
(Mr. Sarath Muttetuwegama—Kalawana)

He may have to pay BTT!

වී. එන්. නවරත්නම් මහතා
(திரு. வீ. என். நவரத்தினம்)
(Mr. V. N. Navaratnam)

Therefore I recommend to the Hon. Minister that all the disabled persons in this country should be provided with such assistance.

There were a number of other matters of a similar nature I wanted to refer to, but for want of time I shall not refer to them. I am grateful to the Hon. Minister and his Secretary for the prompt action they took in giving relief to those who were affected by the floods. Sometimes, when there are these floods and other calamities, certain problems crop up. The people affected have to vacate their homes and have to be provided with accommodation in public buildings. In certain areas the only public buildings there are, are the schools. There was one instance in my electorate where at least 100 families were de-housed, and the A.G.A. and I visited them and found that there was water up

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ශ්‍රී මත්. සිවසිත්තම්පරම් මහතා]

to about two feet, and wanted to house them in the school there, but the principal of the school refused to allow the A.G.A. the use of the building. The people made a prompt complaint to the Secretary and I think he referred the matter to the Government Agent, Jaffna. I hope the Hon. Minister will pursue this matter and, if necessary, bring legislation to enable the Hon. Minister of Social Services, or anyone acting on his behalf, to requisition public buildings in times of distress.

I would like to refer to the largest state run institution in the country which happens to be in my electorate—the State Home for the Elders—which is situated in Kaithady. This state home maintains, at the moment, about 240 persons. About 60 per cent of them are from outside the district. We have no complaint about that. They are mostly from the Eastern Province and the up-country areas. There is an absolute lack of accommodation there. A large number of persons in this state home are Sinhalese elderly persons who are there as a result of the over-flow from other state homes. So, the Minister must take immediate steps to have additional buildings and provide more facilities to these people.

From the inception of this Government I have been referring to one particular matter during the Committee Stage discussion on the Votes of the Ministry of Social Services. There are abut 18 persons employed in this State Home for Elders at Kaithady who have put in over 10 years' of casual service. I think it is unfair to keep them in this position and not absorb them into the permanent cadre. I have given a list of the names of persons concerned to the Hon. Minister on earlier occasions and I shall give it to him again. There are over eight vacancies on the permanent cadre of that institution. I am made to understand—I hope I am wrong ; in any case this certainly would have been done without the knowledge of the Hon. Minister or his Secretary—that persons have been appointed to the permanent cadre of this institution but posted to institutions outside. If those other institutions are short of permanent staff, please increase the cadre there. Do not fill the vacancies in this institution and then appoint the people to institutions outside. So, I hope the Hon. Minister will immediately fill the vacancies in the cadre of this institution, and I hope he will also give permanent appointments to the employees here who have been working in this institution as substitutes for over 15 years.

There is a matter in relation to an individual, Mr. Ganesh, about which I have spoken to the Secretary about 10 times. I have referred to this matter about four times on earlier discussions on the Votes of the Ministry of Social Services. This person was employed by the State Home for Elders as a driver and later discontinued for want of proficiency in Sinhala. I do not know how that came to be done. Therefore, when I brought this to the notice of the Hon. Minister, the Secretary was good enough to employ him as a casual labourer, and he has started working in the pump house. Now, once again, he is employed as a substitute dirver for the last three years. He has all the qualifications. He has been corresponding with the Ministry on several occasions. I hope this time at least this person will be given permanent employment. I wish also to refer to the shortcomings in the State Home for the Elders. There is no reason for me to speak at length about it. I shall send a brief note to the Hon. Minister and the Secretary.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පූ. භා. 10.15

**ජී. ඩී. මහින්දසෝම මහතා (වවුනියා දිසා ඇමතිතුමා)**

*(திரு. ஜீ. டீ. மகிந்தசோம—வவுனியா மாவட்ட அமைச்சர்)*

(Mr. G. D. Mahindasoma—District Minister, Vavuniya)

ගරු සභාපතිතුමනි, සමාජසේවා අමාත්‍යාංශයෙ වැය ශීර්ෂය යටතෙ විවාදවන මේ අවස්ථාවේදී මා විශේෂයෙන්ම සඳහන් කරන්න කැමතියි, මේ අවුරුදු හතරක කාලය තුළදී අපේ රටේ සමාජයට අවශ්‍ය සේවාවන් රැසක්ම ඉෂ්ට කරන අමාත්‍යාංශයක් හැටියට මේ අමාත්‍යාංශය හඳුන්වා දෙන්න පුළුවන් බව.

මේ අවස්ථාවේදී මම දීර්ඝ වශයෙන් කතා කර සභාවේ කාලය මිඩංගු කරන්න බලාපොරොත්තු වෙන්නෙ නැහැ. නමුත් එක කාරණයක් ගැන සඳහන් කරන්න ඕනෑ. ඒ නියත් සහනාධාර ගැනයි. විශේෂයෙන්ම උතුරු මැද පළාතෙ, වවුනියා, මූලතිව්, මන්නාරම වැනි දිස්ත්‍රික්කවලට මේ අමාත්‍යාංශයෙන් විශෙෂ මුදලක් වියදම් කරනවා. නියං සහනාධාර හැටියට නමුත් මේ අමාත්‍යාංශයෙන් වෙන් කරන මුදලවලින් වැඩි ප්‍රමාණයක් ප්‍රයෝජනය ගන්නෙ ඒ දුක් විඳින ගැමි ජනතාව නොවෙයි, සහනාධාර බෙදා දීමේ නියුක්තව සිටින නිලධාරීන් බව විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ. සමාජ සේවා අමාත්‍යාංශයෙන් වෙන් කරන මුදල්වලින් සියයට තිහක්-හතලිහක්වත් ඒ අහිංසක දුප්පත් ජනතාවට ලැබෙන්නෙ නැහැ; මේ නිලධාරීන් විශාල මුදලක් ගසා කනවා. මෙම නියං සහනාධාර වැඩ පිළිවෙල සකස් කර තිබෙන්නෙ අධිරාජ්‍ය වාදී යුගයෙ සිට පටන් ගෙන තිබුණු ඒ ක්‍රමයටයි. ඒ කියන්නේ ගමේ ජීවත්වන අහිංසක ජනතාව ගැන කිසියම් තැනක වැවක් හදනව නම්, පාරක් හදනව නම්, නැතිනම් ඇලක් හදනව නම්, එම ස්ථානයෙ ඇති වැඩ පොළට ගිහින් දවසකට පැය තුන-හතරක්-පහක් රැඳී සිටින්න ඕනෑ. වැඩ පොලේ සිටින ඕවර්සියර් මහත්මයාට කැමති විධියටයි, චෙක් රෝල ලකුණු කරන්නෙ. එම නිසා මම මෙහිදී ඉල්ලා සිටිනවා, නියං සහනාධාර බෙදන අවස්ථාවලදී, උපදිසාපති කොට්ඨාශ අනුව ඒ පවුල්වල ඉන්න සාමාජික සංඛ්‍යාව අනුව සහනාධාර ලබා දෙන්නාය කියා.

ගරු සභාපතිතුමනි, රටේ අද ආගම විකුණා ගෙන කෑමේ යෙදී සිටින විශාල පිරිසක් සිටිනවා. මේ පිරිස වෙසක් හෝ පොසොන් එන කොට වාහනවල නැගී තොරන් ගහනවාය, දන්සල් දෙනවාය කියා ලවුඩ් ස්පීකර්ස් වලින් කියමින් නගරයක් ගමක් පාසා ගිහින් ආධාර එකතු කරනවා. එසේ එකතු කරගන්නා මුදල් පෞද්ගලික වුවමනාවක් සඳහා වියදම් කර ගන්නවා. එම නිසා මේ අන්දමට ලවුඩ් ස්පීකර්ස් දමාගෙන ආධාර එකතු කිරීම සමාජ සේවා අමාත්‍යාංශයෙ අනුමැතිය ඇතුව පමණක් කිරීමට නීති සකස් කරන ලෙස ඉල්ලා සිටින්න කැමතියි.

ගරු සභාපතිතුමනි, දේශපාලන පක්ෂවලට අයිති සමහර අය—විස්සක් තිහක් එකතු වෙලා—පිං අරගෙන නගරයක් පාසා ගමක් පාසා ගිහින් ආධාර එකතු කරන බව පේනවා. මෙසේ එන අයගෙන් නිදහස් වෙන්න ආධාර දෙන්න සිද්ධ වෙනවා. නගරයෙ කඩයකින් ආධාර ඉල්ලන්න ගියොත්, ඒ අයට ආධාර මුදලක් දුන්නෙ නැත්නම් කඩයෙ තිබෙන භාණ්ඩයක් හෝ උස්සාගෙන යන තත්ත්වයකට මේ පිරිස පත් වී තිබෙනවා. එම නිසා ඒ අන්දමට ආධාර සම්මාදන් කරන කොට සමාජ සේවා අමාත්‍යාංශයෙ අවසරය ඇතුව ආධාර මුදල් එකතු කළ යුතුය කියා නීති සකස් කරන ලෙස ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසන් කරනවා.

**සරත් මුත්තෙට්ටුවේගම මහතා (කළවාන)**

*(திரு. சரத் முத்தெட்டுவெகம—கலவான)*

(Mr. Sarath Muttettuwegama—Kalawana)

ගරු සභාපතිතුමනි, මේ අමාත්‍යාංශයෙ වැය ශීර්ෂය සම්බන්ධයෙන් බොහොම කෙටියෙන් වචන ස්වල්පයක් කතා කරන්නයි, මම බලාපොරොත්තු වෙන්නේ. පළමුවෙන්ම කියන්න කැමතියි. මම මේ ඇමතිතුමාගෙන් වාචික ප්‍රශ්නයක් අහල තිබුණා, අමාත්‍යාංශයෙ වැඩ වර්ජන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ශරීෂ මුත්තෙට්ටුවේගම මහතා]

සිත්ගේ තත්ත්වය පිළිබඳව. මම එදා මේ සභාවේදී ඉදිරිපත් කළා, ඇමතිතුමාගෙ අත්සන සහිත ලිපියක්. එම ලිපියෙ ශීර්ෂ පාඨයෙ තිබුණේ 1980 මහා වැඩ වර්ජනයෙ වැඩ වර්ජකයින්ට ආපසු වැඩ ලබා දීම කියල. ඒ වුණත් මගේ වාචික ප්‍රශ්නයට ඇමතිතුමා පිළිතුරු දුන්නෙ, එහෙම වැඩ වර්ජනයක් ඇති වුණෙ නැහැ කියලයි. මේ ඇමතිතුමාගේ අමාත්‍යාංශයේ ඒ විධියේ එකක් ඇති නොවුණොත් මොකද, කැබිනට් එකේ ලේකම්තුමා චක්‍ර ලේඛන යවනවා, මේ වැඩ වර්ජනයේ තත්ත්වය පිළිබඳව විස්තර අහල. චක්‍ර ලේඛන තුන-හතරක් යවා තිබෙනවා. ඒවා එතුමාට හම්බ වුණාද මම දන්නෙ නැහැ, ඒ අමාත්‍යාංශයේ වැඩ වර්ජනයක් සිදු වෙලා නැති නිසාද. 1080 ජූලි මාසෙ වැඩට නොඇමිණි උදවියගෙන් ආපසු වැඩට ගත්ත ප්‍රමාණය, ප්‍රතිශතය කොපමණද, ඉතිරි කට්ටිය වැඩට ගන්න අනුගමනය කරන පිළිවෙත මොකක්ද, මේ කරුණු සම්බන්ධයෙන් ගරු ඇමතිතුමා මේ සභාවට ප්‍රකාශයක් කරනවා නම් හුඟක් කෘතඥ වෙනවා.

තවත් අපේ ප්‍රදේශයට බලපාන කාරණා දෙක තුනකුත් මතක් කරන්ට තිබෙනවා. සමාජ සේවා අමාත්‍යාංශයට මේ අවුරුද්දේ මුදල් ටිකක් වැඩියෙන් ලැබී තිබෙන බව මම දන්නවා. ඒ වගේම මුදල් අමාරුකම් තිබෙන බවත් අපි දන්නවා. ඒ තත්ත්වය යටතේ වුවත් මහජන ආධාර ලබන උදවියගේ සිත් වේදනා ඇති නොවන ආකාරයට කටයුතු සැලසුතු බව මතක් කරන්න ඕනෑ. මහජන ආධාර මුදල් ලබන අය අතර සිත් තැවුල් ඇතිවන ප්‍රශ්න හිටි හැටියේ ඇති වෙනවා. අවුරුදු පහළොස්-විස්ස මාසික ආධාර මුදල් කාගේ හෝ රපෝර්තුවක් ලබා සිටි හැටියේ නවත්වනවා. ඒ නිසා ආධාර මුදල් ලබන්නන්ට නොයෙක් අවස්ථාවල රස්තියාදු වෙන්න සිද්ධ වෙනවා. මේ ළඟ දිසාපතිවරුන්ගේ, ග්‍රාම සේවා නිලධාරීන්ගේ රපෝර්තු උඩම තමුන්නාන්සේලා කටයුතු නොකර උත්සාහයක් දරනවා නම් හොඳයි, සමාජ සේවා දෙපාර්තමේන්තුවේම නිලධාරීන් යොදවා විටින් විට මාසික ආධාර මුදල් ලබන්නන්ගේ වගතුග සොයා බැලීමක් කරන්න. ඒක සමහරවිට මීට වඩා විධිමත් ක්‍රමයක් වේයි.

ආයෙත් නම් ඒ උදවියගේ මාසික ආධාර මුදල් කපන්න ඉඩ තබන්න එපා කියාත් ගරු ඇමතිතුමාගෙන් මම ඉල්ලා සිටිනවා. ගිය අවුරුද්දෙද, එපිට අවුරුද්දෙද මහජන ආධාර ලබන උදවියගේ මුදලත්, සංඛ්‍යාවත් සියයට ගණනකින් කපා හැරියා. දැන් මුදල් ටිකක් වැඩිපුර ලැබී තිබෙන නිසා ඒ කටයුතු ටිකක් ව්‍යාප්ත කිරීමට බලන්න කියා මම මතක් කරනවා.

ඊළඟට යොවුන කටයුතු හා රැකීරක්ෂා කටයුතු පිළිබඳ නියෝජ්‍ය ඇමතිතුමා සඳහන් කළ කාරණය ගැනත් වචනයක් කියන්න ඕනෑ. හිටිහැටියේ ජල ගැල්මෙන් විපතට පත්වන උදවියගේ ප්‍රශ්නය මගේ ඡන්ද කොට්ඨාශයටත් තදින් බල පාන ප්‍රශ්නයක්. මෙවැනි අවස්ථාවලදී ඇනවට වඩා ඉක්මණින්, ක්ෂණිකව සහන සැලසීමට ක්‍රමවත් වැඩ පිළිවෙලක් සකස් කිරීම අත්‍යාවශ්‍යයි. මෙවැනි ප්‍රදේශවල පොලිස් ස්ථානවල හෝ යම්කිසි ස්ථානයක යාන්ත්‍රික බෝට්ටු කීපයක් තබනවා නම් හුඟක් ප්‍රයෝජනවත් වෙනවා. දැන් නාවික හමුදාවට දැනුම් දීල, රත්නපුරයට බෝට්ටු ගෙන්වාගෙන එනකොට අවශ්‍ය තැන්වලට යවන විට වතුර බැහැලා ගිහින්, බෝට්ටු අවශ්‍ය නැහැ. ඒ නිසා ප්‍රදේශයේ යම්කිසි ස්ථානයක හදිසි අවස්ථාවලදී පාවිච්චිය සඳහා බෝට්ටු කීපයක් ගෙනැවිත් තබන්න කටයුතු කරන ලෙස ඇමතිතුමාගෙන් මම ඉල්ලා සිටිනවා. ඒ වගේම දිසාපතිතුමන්ලා හා උප දිසාපතිතුමන්ලාගෙ යම්කිසි මුදලක් තැන්පත් කර තැබුවොත් මෙවැනි ආපදාවලදී ක්ෂණිකව සහන සැලසීම සඳහා ඒ මුදල් යොදවන්නට පුළුවන් වන බවත් මම මතක් කරන්ට කැමතියි. මේ කරුණු දෙක-තුන තමුන්නාන්සේගේ අවධානයට යොමු කරමින් මගේ වචන ස්වල්පය නවත්වනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**කේ. ඩී. එම්. සී. බණ්ඩාර මහතා (නියෝජ්‍ය කෘෂිකාර්මික සංවර්ධනය හා පර්යේෂණ පිළිබඳ ඇමතිතුමා)**
*(திரு. கே. டீ. எம். சீ. பண்டார—விவசாய அபிவிருத்தி, ஆராய்ச்சி பிரதி அமைச்சர்)*
(Mr. K. D. M. C. Bandara—Deputy Minister of Agricultural Development & Research)

සභාපතිතුමනි, මම පළමුවෙන්ම කථා කරන්ට අදහස් කරන්නේ ළමා නිවාස ගැනයි. ළමා නිවාස රාශියක් අද මේ රටේ තිබෙනවා. ඒ ආයතන මගින් අනාථ ළමයින් බලා ගන්නවා; හදා ගන්නවා; අධ්‍යාපනය ලබා දෙනවා. මෙවැනි ළමා නිවාස කීපයක් කෙලින්ම මෙම අමාත්‍යංශය යටතේ රජයෙන් පවත්වාගෙන යනවා. ඒ වගේම රජයේ ආධාර ඇතිව ස්වේච්ඡා සංවිධාන මගිනුත් ළමා නිවාස කීපයක් පවත්වාගෙන යනවා. මට හිතුන හැටියට මේ ආයතනවලට මාසයකට එක ළමයෙක් වෙනුවෙන් දෙපාර්තමේන්තුවෙන් ලැබෙන්නේ රු. 25 ක පමණ මුදලක්.

**එන්. එච්. ඒ. එම්. කරුණාරත්න මහතා**
*(திரு. என். எச். ஏ. எம். கருணாரத்ன)*
(Mr. N. H. A. M. Karunaratne)

රු. 44 ක් ගෙවනවා.

**කේ. ඩී. එම්. සී. බණ්ඩාර මහතා**
*(திரு. கே. டி. எம். சி. பண்டார)*
(Mr. K. D. M. C. Bandara)

රු. 44 කින් වුණත් අද තත්ත්වයේ හැටියට ආහාර පාන සැපයීම, අධ්‍යාපනය ලබා දීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම, ඇඳුම් පැළඳුම් ලබා දීම වැනි කටයුතු කරන්න පුළුවන්කමක් නැති බව අපි කවුරුත් දන්නවා. ඒ නිසා, ස්වේච්ඡා සංවිධාන මගින් පවත්වාගෙන යන ළමා නිවාස කරගෙන යාමට ඒ සංවිධානවලට බැරි තත්ත්වයක් ඇති වී තිබෙනවා. මේ ගැන සොයා බලා ඒවාට දෙන ආධාර මුදල පුළුවන් තරම් වැඩි කර දෙනවා නම් එය ඒවාට ලොකු පහසුවක් වෙනවා.

ඒ ස්වේච්ඡා සංවිධාන හුඟාක් විශාල සේවයක් කරනවා. ඒ අය මේවා කරගෙන යන්නේ ජනතාවගෙන් ලබා ගන්නා ආධාරවලින්. විශේෂයෙන් මේ සමහර ළමා නිවාසවලට ගොඩනැගිලි අවශ්‍ය වී තිබෙනවා. ඒවා ඉදි කිරීමට විශාල වියදම් යනවා. දෙපාර්තමේන්තුව මේවාට ආධාර දෙනවා. නමුත් දෙපාර්තමේන්තුවට දෙන්න පුළුවන් බොහෝම සුළු ප්‍රමාණයක්. ඒ නිසා මේ සංවිධාන, ගොඩනැගිලි ඉදි කිරීම වැඩි වශයෙන්ම කර ගන්නේ පිටින් ලැබෙන ආධාරවලින්. ඒ නිසා, ළමයින්ගේ නඩත්තුවට දෙන මුදල් පුළුවන් තරම් වැඩි කර දුන්නොත් මේ ළමයින් හොඳින් නඩත්තු කරන්නත්, ඔවුනට හොඳ අධ්‍යාපනයක් දීලා, ඔවුන් රටට ප්‍රයෝජනවත් පුරවැසියන් බවට පත් කරන්නත් හැකි වෙනවා.

ඊළඟට, අනාථාධාර ගැන කල්පනා කර බලන්න ඕනෑ. ඇත්ත වශයෙන්ම, කැකිරාවේ ගරු මන්ත්‍රීතුමා (ජී. බී. මහින්ද සෝම මහතා) ප්‍රකාශ කළා මෙන්, වියළි කලාපයේ විශාල වශයෙන් ගංවතුර ගැලූ අවස්ථාවල, වැඩි වශයෙන් වර්ෂා කාලවල දී මේ අනාථයන්ට, අනාථාධාර බෙදෙනවා. මම හිතන හැටියට, මේ ක්‍රමය අවුරුදු සියයකටත් වැඩි කාල සීමාවක් තිස්සේ වෙනස් වෙලා නැහැ. දැන් මෙය වෙනස් කරන්න ඕනෑ. ඇත්ත වශයෙන්ම මේ සඳහා වියදම් කරන විශාල මුදල සම්පූර්ණයෙන් අනාථ උදවියට යන්නේ නැහැ. කැකිරාවේ ගරු මන්ත්‍රීතුමාගේ කීම මම සනාථ කරනවා. ඒ මුදලින් වැඩි කොටසක් අනාථ වැඩ කරවන ඕවර්සියර් හා වෙනත් නිලධාරීන් අතර බෙදෙනවා. මෙහි බොහෝම දූෂණ තිබෙනවා.

ඒ නිසා මම මේ සම්බන්ධයෙන් යෝජනාවක් කරනවා. වර්ෂාව නිසා කුඹුරු වැඩ කරන්න, ඉඩම් වැඩ කරන්න බැරිව අනාථ වන උදවියට දෙන මුදල, ඒ අයගේ පවුලේ ප්‍රමාණය බලා, සතියකට හෝ මාසයකට දෙන ප්‍රමාණය, කෙලින්ම ඒ අයට ම දෙනවා නම් මීට වඩා හොඳයි. ඒ මුදල එහෙම ඒ අයට ලබා දී, ශ්‍රමදානයක් සංවිධානය කර ගමේ මොකක් හෝ පොදු වැඩක් ඒ අය ලවා කර ගැනීමට වැඩ පිළිවෙළ සකස් කරන්න පුළුවනි. එසේ නැතිව ඕවර්සියර්වරුන්ගේ මාර්ගයෙන් චෙක්රෝල් තියාගෙන මේ වැඩේ කිරීමෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කේ. ඩී. එම්. සී. බණ්ඩාර මහතා]

දූෂණ සිදු වෙනවා. ඒක කවුරුත් දන්න දෙයක්. ගරු ඇමතිතුමාත් දන්නවා, ලේකම්තුමාත් දන්නවා, නිලධාරි මහත්වරුත් දන්නවා. හැමදාම මේක චෙක් කර හොයා බැලුවොත් ඕවර්සියර් කෙනෙක් ගහල ඇති. අනුරාධපුර දිස්ත්‍රික්කයේ හුඟාක් අයගේ දැන් වැඩ තහනම් කර තිබෙනවා. ඒ නිසා කරුණාකර මේ ක්‍රමය වෙනස් කරන්න ඕනෑ.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
*(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)*
(Mr. Lakshman Jayakody)

විශේෂ නිලධාරි තමයි දැන් කරන්නේ.

**කේ. ඩී. එම්. සී. බණ්ඩාර මහතා**
*(திரு. கே. டி. எம். சி. பண்டார)*
(Mr. K. D. M. C. Bandara)

කවුරු කළත්, මේ මුදල් කෙලින්ම අනාථ උදවියට දීලා ශ්‍රමදාන මාර්ගයෙන් ඔවුන්ගෙන් ප්‍රයෝජනවත් වැඩක් කර ගන්න පුළුවන් නම් එයින් විශාල ප්‍රයෝජනයක් ලැබෙනවා. අනාථ උදවියට දෙන මුදලෙන් සියයට සියයක්ම ප්‍රයෝජන ගන්න පුළුවන් වෙනවා. ඒ නිසා, දැනට තිබෙන ක්‍රමය වෙනස් කරන ලෙස ගරු ඇමතිතුමාගෙන් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා. පසුගිය අවුරුද්ද හමාර තුළ අනුරාධපුර දිස්ත්‍රික්කයේ මේ අනාථ උදවියගේ වැඩ සම්බන්ධයෙන් තිබුණු තත්ත්වය අපට හොඳට පේනවා.

**එන්. එච්. ඒ. එම්. කරුණාරත්න මහතා**
*(திரு. என். எச். ஏ. எம். கருணாரத்ன)*
(Mr. N. H. A. M. Karunaratne)

සංවිධාන වැඩවලට ආවේ නැත්තේ ඇයි?

**කේ. ඩී. එම්. සී. බණ්ඩාර මහතා**
*(திரு. கே. டி. எம். சி. பண்டார)*
(Mr. K. D. M. C. Bandara)

ආවේ නැති වුණත්, මේ මුදල් අනාථ උදවියට ලැබෙන්න ඕනෑ.

**එන්. එච්. ඒ. එම්. කරුණාරත්න මහතා**
*(திரு. என். எச். ஏ. எம். கருணாரத்ன)*
(Mr. N. H. A. M. Karunaratne)

පිළිගන්නවා.

**කේ. ඩී. එම්. සී. බණ්ඩාර මහතා**
*(திரு. கே. டி. எம். சி. பண்டார)*
(Mr. K. D. M. C. Bandara )

ඊළඟට මම මතක් කරන්න කැමතියි, අපි කාටත් පෙනෙනවා, සමහර උදවිය ඉන්නවා, ඒ අයට හොඳට වැඩ කරන්න පුළුවන්. අත පය හොඳට තිබෙනවා. දරුවන් හතර පස් දෙනා ඉන්නවා. ඒ උදවිය කරන්නේ ඒ දරුවන් හිඟමනට පාවිච්චි කිරීමයි. දරුවන් හිඟමනේ යවනවා. හොඳට වැඩ කරන්න පුළුවන් අය කිසිම වැඩක් නොකර හිඟමන් ඉල්ලන්න දරුවන් යවනවා. නොයෙක් තැන්වල මේ ජාවාරම කරමින් ජීවත් වෙන අය ඉන්නවා. මම හිතන්නේ සමාජ සේවා අමාත්‍යාංශයෙන් මේ සම්බන්ධව කරුණු සොයා බලා මොනවා හරි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න ඕනෑය කියායි. අත පය නැති කෙනෙක්, අසාධ්‍ය ලෙඩක් හැදුණු කෙනෙක්. වැඩක් කරන්න බැරි කෙනෙක් යමක් ඉල්ලා ගෙන ජීවත් වීම අපට පිළිගන්න පුළුවන්. එය සාමාන්‍යයෙන් සාධාරණය කියා අපට කියන්න පුළුවන්. නමුත් හොඳට වැඩ කරන්න පුළුවන් දෙමව්පියන් ගෙවල්වල ඉඳගෙන, කුඩා දරුවන් හිඟමනේ යවනවා නම් එය වැරදියි. මේ වගේ දේවල් මම හොඳට දැක තිබෙනවා. කොළඹත් හුඟක් තැන්වල මේ වගේ අය ජීවත් වෙනවා. අපි මේ ක්‍රමය නැති කරන්න ඕනෑ. මේ ගැන සොයා බලන්න ඕනෑ. එවැනි උදවියට මේ වගේ ව්‍යාපාරයක් කරගෙන යාමට ඉඩ නොතැබීමට මොනවා හරි වැඩ පිළිවෙළක් යොදන්න ඕනෑ.

ඊළඟට රජයේ මහලු නිවාස ගැන නට වචනයක් කියන්න ඕනෑ. රජයේ මහලු නිවාසවල ආවතේව කරන ඇටෙන්ඩන්ස්ල වැනි උදවිය ඉන්නවා. ඇත්තවශයෙන්ම වයසට ගිය උදවිය බලාගැනීම බොහොම අමාරු කාරියක්. ඒ අය පාලනය කරන්න බොහොම අමාරුයි. කිසිම කෙනෙක් කියන දෙයක් අහන්නෙ නැහැ. නොයෙක් විධියේ හිතුවක්කාර වැඩ කරනවා. ඒ, මහලු උදවියගේ හැටි තමයි. මම එය පිළිගන්නවා. නමුත් මම කියා සිටින්නේ මේ මහලු අයට ආවතේව කරන උදවියට ඒ සම්බන්ධයෙන් විශේෂ පුහුණුවක්, හොඳ පුහුණුවක් දිය යුතු බවයි. මොකද? මේ ආවතේව කරන උදවියගේ තිබෙන අඩු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පාඩුකම් නිසා මේ මහලු නිවාසවල සිටින වැඩිහිටි අයට, අනාථ අයට හුඟක් අකර තැබ්බ ඇතිවන බව හුඟක් අවස්ථාවලදී අපට පෙනී ගොස් තිබෙනවා. රජයෙන් විශාල මුදලක් වැය කරන සේවයක්. ඒ සේවයේ උපරිම ප්‍රයෝජනය ඒ මහලු උදවියට ලබා දෙන්නට අපි කටයුතු සලසන්න ඕනෑ. ඒ නිසා අමාත්‍යාංශයෙනුත් ඒ වගේම ලේකම්තුමාගෙනුත් ඉල්ලීමක් කරනවා, මේ ගැන සොයා බලා, මේ සේවකයන්ට හොඳ පුහුණුවක්, ඒ වගේම සේවය ගැන අවබෝධයක් ලබා දෙන්නට යම් වැඩපිළිවෙලක් සකස් කරන්නය කියා. අපි මේ සේවය කරන්නේ මහලු උදවියටයි. මේ මහලු නිවාසවලට එන්නේ කාත් කවුරුත් නැති උදවියයි. ඒ නිසා ඒ උදවියගේ අවසාන කාලය පුළුවන් තරම් සන්තෝෂයෙන් ගත කරන්න අවකාශ සලසා දෙන්න ඕනෑය කියන හැඟීම, අවබෝධය ඒ සේවකයන්ට ඇති කරන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, මට නියමිත වේලාව අවසන් වෙන නිසා තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

පූ. භා. 10.30

**ලක්ෂ්මන් ජයකොඩි මහතා** (අත්තනගල්ල)
(Mr. Lakshman JaJyakody—Attanagagalla)
(Mr. Lakshman Jayakody)

ගරු සභාපතිතුමනි, කුඩම්මාගේ සැලකිල්ල ලැබෙන යම් අමාත්‍යාංශයක් මේ රටේ තිබෙනවා නම් ඒ සමාජ සේවා අමාත්‍යාංශය කියලයි මම හිතන්නේ. එය කවුරුත් පිළිගන්නා දෙයක්. ලංකාවේ අහන්න තිබෙන දුප්පත්කම දිහා බැලූවාම, නිර්ධනභාවය දිහා බැලුවාම, පීඩිතකම දිහා බැලුවාම මොකක්ද තත්ත්වය? මෑත කාදී ගණන් බලා තිබෙන හැටියට සියයට 95ක් පමණ අද රු. 300 වත් ලබන්න පුළුවන් විධියේ තත්ත්වයක නොවෙයි ඉන්නේ. මේ තත්ත්වය ක්‍රමානුකූලව වැඩිවී ගෙන යනවා. 1980 'පබ්ලික් ඉන්වෙස්ට්මන්ට්' කියන පොතේ මේ රු. 300 සීමාව රු. 200 කළ යුතුය කියා යෝජනා කර තිබෙනවා. එය ඉදිරිපත් කර තිබෙන්න මුදල් අමාත්‍යාංශයෙන්. මා ළඟ තිබෙනවා 1981 සිට 1985 දක්වා එහි සම්පූර්ණ විස්තරයක්. මේ පොත කියවා බැලුවාම ඇත්ත වශයෙන්ම කණගාටුවක් ඇති වෙන්නේ වෙන මොකවත් නිසා නොවෙයි; මුදල් අමාත්‍යාංශයම පිළිගෙන තිබෙනවා අද තිබෙන තත්ත්වය. මම කල්පනා කරනවා, මහජන ආධාර ප්‍රමාණයත් මීට වඩා ටිකක් වැඩි කරන්න සිදු වී තිබෙනවාය කියා. අනික් කාරණය අවංකව කියනවා නම්, මැතක සිට—බී.ටී.ටී එක ආවාට පසුව—රු. 15 ක් ලැබෙනවා නම්, රු. 20 ක් ලැබෙනවා නම්, රු. 25 ක් ලැබෙනවා නම් ඒ මුදලෙන් ගන්න පුළුවන් බඩු ප්‍රමාණය නැත්නම් ද්‍රව්‍ය ප්‍රමාණය කලින්ට වඩා අඩුයි. අන්න ඒ හේතුව නිසා නිර්ධන මට්ටම මොකක්ද කියන එක ගැන ගරු ඇමතිතුමා අවබෝධයක් ලබා ගැනීම ඉතාම වැදගත් වෙනවා.

මම මුලින් කිව්වා වාගේ රජයේ සල්ලි පරිහරණය කිරීම ගැන නියෝජ්‍ය කෘෂිකර්ම හා පර්යේෂණ ඇමතිතුමා කිව්ව කාරණය ගැන මමත් එකඟ වෙනවා. රජයේ සල්ලි අපතේ යාම සම්බන්ධයෙන් එතුමා කතා කළා. දැන්, අද වුණත් ගමක රජයේ සල්ලි අත ගාන දෙන්නෙක් ඉන්නවා. ඉස්සර නම් ගමේ සිටියේ එහෙම අය එක්කෙනායි. ඒ ග්‍රාම සේවක නැත්නම් ගම්මුලාදෑනියා. දැන් ඉන්නවා දෙන්නෙක්. විශේෂ සේවා නිලධාරියා කියා පුද්ගලයෙක් ඉන්නවා. ඒ වාගේම ග්‍රාමසේවක කියා කෙනෙකුත් ඉන්නවා. දැන් මම අසන්නට කැමතියි මේ දෙන්නාගෙන් නීත්‍යානුකූලව රජයේ සල්ලිවලට අතගහන පුද්ගලයා කවුද කියල.

**කේ. ඩී. එම්. සී. බණ්ඩාර මහතා**
*(திரு. கே. டி. எம். ஸி. பண்டார)*
(Mr. K. D. M. C. Bandara )

ග්‍රාම සේවක.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
*(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)*
(Mr. Lakshman Jayakody)

ග්‍රාමසේවක නම්, මහජන ආධාර බෙදාදීමත් ග්‍රාමසේවක විසින් කළ යුතුයි. නමුත් එසේ නොවෙයි, කෙරෙන්නේ. මහජන ආධාර දෙන්නේ විශේෂ සේවා නිල



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලක්ෂ්මන් ජයකොඩි මහතා]

ධාරීන්. මුදල් පරිපාලනය කරන්නේ ග්‍රාම සේවක. මේ මුදල්වලට වගකිව යුත්තා කවුද කියන එක මම අසන්නට කැමතියි. ඒ ප්‍රශ්නයට මම ආවේ වෙන හේතුවක් නිසා නොවෙයි; මුදල් අපතේ යාම ගැන මීට වඩා හොඳ සුපරීක්ෂණකාරී තත්ත්වයක් තිබිය යුතු නිසයි.

මම දන්නවා ගරු ඇමතිතුමා මහියංගනය පැත්තේ 'ඩිරවුට් රිලීෆ්' වශයෙන් මහජන ආධාර බෙදා දීම සඳහා මුදල් ඉල්ලන්නට කැබිනට් මණ්ඩලයට ගිය බව. එතැනදී වුණත් ඒ මුදල් පරිපාලනය කරන්නේ කවුද කියන ප්‍රශ්නය කැබිනට් මණ්ඩලයට ආවා. නමුත් ඒකට අනුමැතිය දුන්නා. ඒකට අනුමැතිය දිය යුතුයි. මම හිතන විධියට ඊට ඉස්සෙල්ලා අනුරාධපුරයටත් දුන්නා. නමුත් ප්‍රශ්නය වුණේ කවුද මේවා පරිපාලනය කරන්නේ කියන එගවින්නට ගරු ඇමතිතුමා කල්පනා කර බැලීම ඉතාමත්ම වැදගත් වෙනවා.

තුන් වැනි කාරණය මෙයයි. අපේ ප්‍රදේශයේ තිබෙනවා දූනගහ මහලු නිවාසය. ඒ වාගේම වතුපිටිවල වැඩිහිටි නිවාසය තිබෙනවා. මේ සෑම එකක්ම ගෙන ගියේ ඒ පළාතේ ඉන්නා වූ දානපතියන්ගේ මුදල්වලින්. නමුත් දැන් අපට ලැබෙන මුදල් ප්‍රමාණය අඩු වේගෙන යනවා. මුදල් ප්‍රමාණය අඩු වේගෙන යන විට ඒවාට ගන්නට පුළුවන් සංඛ්‍යාවත් අඩු වෙනවා. ඇතුළත් කිරීමේ ප්‍රමාණයත් අඩු වෙනවා. එම නිසා මේවාට දැනට වඩා වැඩි මුදලක් ගෙවන්නට ගරු ඇමපතිතුමා කල්පනා කළොත් එය ඉතාමත් ප්‍රයෝජනවත් වෙනවා.

අනික් කාරණය මෙයයි. සීදූවේ අඳ, ගොළු, බිහිරි පාසලක් තිබෙනවා. ඉතාමත්ම වටිනා ස්ථානයකයි, මේක තිබෙන්නේ. ඒක භාණ්ඩ නිෂ්පාදනය කරන තැනක්. එතැන භාණ්ඩ නිෂ්පාදනය කළත් මම හිතන විධියට ඒ නිෂ්පාදනය කරන භාණ්ඩ විකිණීම සඳහා වෙළඳ මධ්‍යස්ථානයකුත් එතැන ඇති කළොත්, එය ක්‍රමානුකූලව සැලසුම් කළොත් මේ අන්ධ ජනතාව විසින් නිපදවන දේවල් විකුණා සෑහෙන ආදායමක් ලබා ගන්නට අවස්ථාව ලැබෙනවා. බොහෙම වැදගත් ස්ථානයකයි, මෙය පිහිටා තිබෙන්නේ. ගුවන් තොටුපොළ පාර අයිනෙයි, මෙය පිහිටා තිබෙන්නේ. කවුරුන් හෝ ලස්සනට නිර්මාණය කළ හැකි තැනැත්තෙකුට ඒ වැඩය භාර දුන්නොත් මම හිතන විධියට සෑහෙන මුදලක් ලබා ගන්නට පුළුවන්කම ලැබෙනවා.

අනික් කාරණය මෙයයි: අද ඒ අයට නූල් ලබා ගැනීමේ අපහසුවක් තිබෙනවා. අන්ධ උදවියට නූල් ලබා ගන්නවාය කියන එක බොහොම වැදගත් දෙයක්. ඒ අය මොකක් හෝ කර්මාන්තයක යෙදීමේ ඇති වැදගත්කම ගරු ඇමතිතුමා දන්නවා. නූල් වැඩි වීම නිසා අද ඒ නූල් ලබා ගැනීම ටිකක් අමාරු වී තිබෙනවා. එම නිසා රජයෙන් ගෙන්වන නූල් මේ දෙපාර්තමේන්තුවට ලබා දී දෙපාර්තමේන්තුව ලාභයක් නොගෙන, 'සර්විස් චාජ්' එකක් පමණක් ලබා ගෙන නූල් ලබා දීමට කටයුතු කළොත් එයින් ලොකු ප්‍රයෝජනයක් ලැබෙනවා කියා මම විශ්වාස කරනවා.

**එන්. එච්. ඒ. එම්. කරුණාරත්න මහතා**
*(திரு. என். எச். ஏ. எம். கருணாரத்ன)*
**(Mr. N. H. A. M. Karunaratne)**
අපි ලාභයක් ගන්නේ නැහැ.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
*(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)*
(Mr. Lakshman Jayakody)
ඒක ඇත්ත. නමුත් නූල් ගෙන්වන අය අධික ලාභ ගන්නවා. එම නිසා ඒ ලාභය ගන්න එපාය කියා ඒ උදවියගෙන් ඉල්ලීමක් කරන්නා. මොකද? නූල් ඒ විධියට අඩු මිලකට දුන්නොත් මේ අයට හැම්දාම අත් යන්ත්‍රවල වැඩ කටයුතු කරගෙන යන්නට පුළුවන්කම තිබෙනවා.

අවසාන වශයෙන් ගරු නියෝජ්‍ය කාෂිකර්ම සහ පර්යේෂණ ඇමතිතුමා කිව්ව කාරණයක් වූ රැකියාවන් සඳහා ළමයින් පාවිච්චි කිරීම ගැනත් මතක් කරන්නට ඕනෑ. මේක නම් අද කොළඹ නගරයේ බහුල වශයෙන් දකින්නට තිබෙන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දෙයක්. වෙන මොකක්වත් නොවෙයි; මේක ඇති වෙන්නට හේතුව මෙයයි. විශේෂයෙන් වතුවල සිටින උදවිය ඒ අයට රස්සාව නැති නිසා ඒ අයගේ කුඩා ළමයි කොහොම හරි ගෙනැවිත් කොළඹ ගෙවල් වල නතර කරනවා. ඊට පස්සේ ඒ දෙමාපියන් ඇවිදින් ඒ අයට ලැබෙන පඩිය අර ගෙන යනවා. එම නිසා මේකට මෙන්න මේ විධියේ වැඩ පිළිවෙළක් තමුන්නාන්සේට ඇති කරන්නට පුළුවන්.

**එන්. එච්. ඒ. එම්. කරුණාරත්න මහතා**
(திரு. என். எச். ஏ. எம். கருணாரத்ன)
(Mr. N. H. A. M. Karunaratne)
ගරු මන්ත්‍රීතුමනි, ඒක කම්කරු ඇමතිතුමාටයි, භාර වී තිබෙන්නේ.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)
I think you can take this under child care.

**එන්. එච්. ඒ. එම්. කරුණාරත්න මහතා**
(திரு. என். எச். ஏ. எம். கருணாரத்ன)
(Mr. N. H. A. M. Karunaratne)
Vagrants come under us.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)
මේ ළමයින්ට ඒ ගෙවන පඩිය ඒ ළමයින්ගේ මවුපියන් ගෙන යනවා නම් ඒකට ඉඩ නොතබා ඒ ළමයා නමින් පොතක තැන්පත් කිරීමේ වැඩ පිළිවෙළක් නීත්‍යානුකූලව ඇති කරන්නට තමුන්නාන්සේට පුළුවන්කමක් තිබෙනවා ද? මම දන්නවා සමහර ගෙවල්වල ඒක නිසියාකාරව කරනවා. නමුත් සමහර ගෙවල්වල එහෙම කරන්නෙ නැහැ. ළමයින්ගෙන් වැඩ ගන්නව. ළමයින්ට පඩියක් ගෙවන්නෙ නැහැ. සමහර විට අම්මලා තාත්තලා ඇවිත් ඒ ළමයාගෙ පඩිය අර ගෙන යනව. අවසානයේදී වැඩ කරන ළමයට කීයක්වත් ලැබෙන්නෙ නැහැ.

**එන්. එච්. ඒ. එම්. කරුණාරත්න මහතා**
(திரு. என். எச். ஏ. எம். கருணாரத்ன)
(Mr. N. H. A. M. Karunaratne)
නීත්‍යානුකූලව කුඩා ළමයි වැඩට තියා ගන්න බැහැ.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)
බැහැ. ඒක අපි දන්නවා. නමුත් අද මෙය සමාජ පිළිලයක් වී තිබෙනවා. ගමේ තිබෙන නිර්ධන තත්ත්වය උඩ තමයි, මේක වෙන්නෙ. අපේ පළාතේත් එක් තර ගමක මිනිස්සු කාලයක් රක්ෂාව හැටියට කළේ හිඟාකෑම. නමුත් දැන් ඒ තත්ත්වය නැතිව ගොස් එය දීප්තිමත් ගමක් බවට පරිවර්තනය වී තිබෙනවා.

අනික් කාරණය ගංවතුරෙන් වන හානි සම්බන්ධවයි. ඒ කාලයේදී අපේ ප්‍රදේශයේ වර්ෂයක් පාසා ගංවතුරෙන් වන හානිය වළක්වා ගැනීම සඳහා දීර්ඝ කාලීන වැඩ පිළිවෙළක් සකස් කර එය ක්‍රියාත්මක කළා. එම නිසා අද කොයි තරම් ගංවතුර ගැලුවත් හානියක් වෙන්නෙ නැහැ. පැරණි දිවුලපිටිය කොට්ඨාශයේ එවැනි ප්‍රශ්නයක් අපි නිරාකරණය කළා. ඒ කාලයේ, මාවනැල්ලට රබුක්කනට වහින කොට මාඔය පිටාර ගලනවා. එතකොට ඒ අවට ගෙවල් යට වෙනවා. වර්ෂයක් පාසා ඒ විධියට ගංවතුරෙන් යටවන ගෙවල් 780 ක් තිබුණා. එම නිසා, අපි දීර්ඝ කාලීන සැලැස්මක් ඇති කර—අවුරුදු 15 ක පමණ සැලැස්මක් ඇති කර—ඒ ගෙවල්වල පදිංචි කරුවන්ට ගංවතුරට යට නොවන උස් බිම්වලින් ඉඩම් කැබලි 780 ක් දී ඔවුන් ඒ ඉඩම්වල පදිංචි කෙරෙව්වා. අද මාවනැල්ලට රබුක්කනට කොයි තරම් වැස්සත්, ගංවතුරෙන් පාරවල් යට වෙනවා මිසක් ඒ ගෙවල්වලට හානියක් නැහැ. එම නිසා අපට විශාල මුදලක් ඉතිරි කර ගන්නට පුළුවන් වුනා. ගංවතුරෙන් වන හානි සම්බන්ධයෙන් ඒ ඒ ස්ථානවල හැටියට සුදුසු පියවර ගන්නා මෙන් මා ඉල්ලා සිටිනවා. අනාගත ගංවතුර පාලන ව්‍යාපාර ටික එන කොට තව කොපමණ කල් යාවිදැයි අපට කියන්නට බැහැ. ඒවා සමහර වි එන්නේ නැති බවත් අපි දන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලක්ෂ්මන් ජයකොඩි මහතා]

නවා. එහෙම නම් වර්ෂයක් පාසා ගාංචුරෙන් යට වන ස්ථාන සම්බන්ධයෙන් යම් ක්ෂණික වැඩ පිළිවෙළක් ගත හැකි නම් එය ගැනීම හොඳ බව මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

**එම්. ඩී. ප්‍රේමරත්න මහතා** (අවිස්සාවේල්ල)

*(திரு. எம். டி. பிரேமரத்ன—அவிசாவெல)*

**(Mr. M. D. Premaratne—Avissawella)**

ගරු සභාපතිතුමනි, සමාජ සේවා ඇමතිතුමාටත්, නියෝජ්‍ය ඇමතිතුමාටත් මෙම අමාත්‍යාංශයේ නිලධාරීන්ටත් පැවරී තිබෙන්නේ විශාල වගකීමක් බව මා පළමුවෙන්ම මතක් කරන්නට ඕනෑ. මෙම වර්ෂය ආබාධිතයන්ගේ වර්ෂය හැටියට නම් කර තිබෙනවා. ආබාධිතයන් හා අනාථයන් පුනරුත්ථාපනය කිරීම සම්බන්ධයෙන් තමුන්නාන්සේගේ දෙපාර්තමේන්තුවට විශාල වගකීමක් පැවරී තිබෙනවා. ඒ වගකීම ක්‍රියාත්මක කිරීමට ලැබෙන මුදල් ප්‍රමාණය නම් කිසිසේත්ම ප්‍රමාණ වත් නැහැ. නමුත් මේ අවුරුද්දේ සැහෙන වැඩි මුදල් ප්‍රමාණයක් තමුන්නාන්සේට වෙන් කර දී තිබෙනවා. සහනාධාර වැඩි කරන ලෙසත් සමාජ සේවා කටයුතු මීට වඩා පුළුල් කර ඒවාට ප්‍රමුඛත්වය දෙන ලෙසත් අපේ මන්ත්‍රීවරු සෑහෙන අන්දමට කරුණු ඉදිරිපත් කළා.

මම මේ අවස්ථාවේදී මතක් කරන්නට කැමතියි, කරුණු දෙකක් ගැන. ආබාධිතයන් සහ අනාථයන් පුනරුත්ථාපනය කිරීම සම්බන්ධයෙන් අපේ රජය යම් තීරණයක් ගෙන තිබෙනවා. ඒ ආබාධිතයන් අතර යම් යම් රක්ෂාවල් කරන්නට හැකි අය ඉන්නවා. යම් පුහුණුවක් ලැබූ පළපුරුදු අය ඉන්නවා. කථා කරන්නට බැරි වුණත්—ගොළු වුණත්—බොහොම දක්ෂ කාර්මිකයන් ඉන්නවා. නොයෙක් නොයෙක් කර්මාන්තවලට පුරුදු පුහුණු වූ අය ඉන්නවා. ශාරීරික අඩුපාඩුවත් තිබුණත් එවැනි අය යම් වැඩක් කරන්නට පුරුදු වුණාම ඒක ඉතාම හොඳින් කරන්නට හැකියාවක් ඒ අයට තිබෙන බව කවුරුත් දන්නවා. නොයෙකුත් ආයතනවලත් රජයේ දෙපාර්තමේන්තු සහ සංස්ථාවල

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යම් පුරප්පාඩු පිරවීමේදී සමාජ සේවා දෙපාර්තමේන්තුවේ නිර්දේශය ඇතිව ආබාධිතයන් ඒවාට ඉල්ලුම් කරනවා නම් ඒ අයට ප්‍රමුඛත්වය දිය යුතුය කියා රජය තීරණයක් ගත්තා. පුවත් පත්වල පළ වූ නොයෙකුත් දැන්වීම් අනුව අපේ ප්‍රදේශවල එවැනි දක්ෂකම් තිබෙන ආබාධිතයන් අප ළඟට එනවා. අපි ඒවා නිර්දේශකර යවනවා. තමුන්නාන්සේත් බොහොම ඕනෑකමෙන් ඒවා නිර්දේශ කර යවනවා. ඒවා අදාළ ආයතනවලට යැවූ බවට ඒ ඉල්ලුම් කළ ආබාධිත උදවියටත් දන්වනවා. නමුත් සමහර දෙපාර්තමේන්තුවල සහ සංස්ථාවල වගකිවයුතු පුද්ගලයන් ඒවා තුට්ටුවකටවත් ගන්නෙ නැහැ.

මුළු ලෝකයේම ආබාධිතයන්ගේ වර්ෂය වශයෙන් තීරණය කර ඇති මෙවැනි අවස්ථාවකදීවත් අපේ රජයේ තීරණය අනුව මෙවැනි පුද්ගලයන්ට ප්‍රමුඛත්වය දෙන්නේ නැතුව, ඔවුන්ගේ හැකියාවන් අනුව රැකියාවක් ලබා ගන්නට ගිය විටදී එය ගණන් ගන්නේ නැතිව ඒ අය ආපසු පිටත් කර හැරීම ඉතාම කණගාටුදායකයි. ඒ නිසා මම විශේෂයෙන් ඉල්ලා සිටිනවා, ඇමතිවරුන්ගේ නිර්දේශ ලබා යන මෙවැනි පුද්ගලයන් සම්බන්ධයෙන් මීට වඩා සැලකිලිමත්ව ක්‍රියා කරන්නට සලස්වන්නය කියා හැම අමාත්‍යාංශයකම, හැම දෙපාර්තමේන්තුවකම හැම සංස්ථාවකම වාගේම හැම ඇමතිවරුන්ගේම අවධානය ගරු ඇමතිතුමා තුළින් මේ ගැන යොමු කළ යුතුව තිබෙනවා.

තමුන්නාන්සේට අද සෑහෙන මුදල් ප්‍රශ්න තිබෙනවා. මෙවැනි කටයුතුවලට තමුන්නාන්සේට මුහුණ දෙන්නට අමාරුකම් තිබෙනවා. මට කලින් කථා කළ ගරු මන්ත්‍රීවරුන් සඳහන් කළා වාගේම තමුන්නාන්සේ ආබාධිතයන් සෑහෙන කොටසකට බයිසිකල් ලබා දී තිබෙනවා. අද ඔවුන් ස්වීප් විකිණීමෙන්, වෙනත් වෙළඳ කටයුතුවල යෙදීමෙන් ඔවුන්ගේ ජීවත් වීමට අවශ්‍ය ආදායමක් සොයා ගන්නවා. එය තමුන්නාන්සේ කර තිබෙන විශාල සේව

යක්. තමුන්නාන්සේගේ අමාත්‍යාංශය තුළින් තවත් බාහිර ආධාර උපකාර ලබා දෙනවා නම් එවැනි ආධාර උපකාර කිරීමට විශාල පිරිසක් ඉදිරිපත් වී සිටිනවා.

තමුන්නාන්සේ දන්නවා අපේ ප්‍රදේශය මැණික් ව්‍යාපාරිකයන් සෑහෙන සංඛ්‍යාවක් සිටින ප්‍රදේශයක් බව. ඒ අය මුදල් පරිත්‍යාග කරන්න ලෑහැස්තියි. ඒ නිසා තමුන්නාන්සේගේ අමාත්‍යාංශය තුළින් යම්කිසි අරමුදලක් ඇති කරලාත් හොඳ සංවිධානත්මකව එය කිරීමෙන් අනාථයන්ට උපකාර කිරීමටත්, ඔවුන් පුනරුත්ථාපනය කිරීමටත් අවස්ථාව සැලසෙනවා. මෙසේ බාහිර වශයෙන් ලැබෙන පරිත්‍යාග ආදායම් බද්දෙන් නිදහස් කරනවාය කියා පරිත්‍යාග ඉල්ලුවොත් මම හිතනවා මේ රටේ පරිත්‍යාගශීලී අයගෙන් තමුන්නාන්සේට විශාල මුදලක් ලබා ගන්නට පුළුවන් වේවි කියා.

අද සහනාධාර මුදල් දීමේදී අපේ ප්‍රදේශවල යම් ඉල්ලුම්කරුවකුට අවස්ථාව ලබා දීම සඳහා එවැනි ආධාර ලබන වෙනත් කෙනෙක් මැරෙන තුරු ඉන්න ඕනෑ. එතෙක් තවත් කෙනෙකුට සහනයක් ලබා දෙන්න විධියක් නැහැ. අපට ඉල්ලීම් රාශියක් ලැබී තිබෙනවා. මම දන්නවා ගරු ඇමතිතුමාට අපහසුකම් තිබෙන බව. මේවර සෑහෙන මුදලක් වැඩිකර ගෙන තිබෙනවා. එම නිසා ගම්බද ප්‍රදේශවලින් ඉල්ලන ඉල්ලීම් කෙරෙහි සානුකම්පිකව තමුන්නාන්සේගේ දෙපාර්තමේන්තුවෙත් අමාත්‍යාංශයේත් අවධානය යොමු කරනවා ඇතැයි මම බලාපොරොත්තු වෙනවා.

අවසාන වශයෙන් ඉදිරි වර්ෂයේ මීට වඩා වැඩ කොටසක් කිරීමට ගරු ඇමතිතුමාටත් අමාත්‍යාංශයටත්, දෙපාර්තමේන්තුවටත්, ඒ නිලධාරීන්ටත් ශක්තිය ලැබේවායි ප්‍රාර්ථනා කරනවා.

පූ. භා. 10. 45

**ටී. රාසලිංගම් මහතා** (උඩුප්පිඩ්ඩි)
(திரு. த. இராசலிங்கம்—உடுப்பிட்டி)
(Mr. T. Rasalingam—Uduppiddy)

தவிசாளர் அவர்களே, சமூக சேவை அமைச்சின் மானியம் பற்றிய விவாதத்திற் கலந்துகொண்டு ஒரு சில கருத்துக்களைத் தெரிவிப்பதற்குச் சந்தர்ப்பம் தந்தமை குறித்து முதற்கண் எனது நன்றியறிதலைத் தங்களுக்குத் தெரிவித்துக் கொள்கின்றேன். நேரம் கட்டுப்படுத்தப்பட்டுள்ளமையினால் இரண்டொரு முக்கியமான அம்சங்களை மாத்திரம் அமைச்சருடைய கவனத்துக்குக் கொண்டு வர விரும்புகிறேன்.

சமூக சேவை அமைச்சு சிறந்த சேவைகளைச் செய்து வருகிறது என்பது மறுக்க முடியாத உண்மையாகும். பலவகைப்பட்ட கஷ்டங்களுக்கும் மத்தியில் இந்த அமைச்சு ஆற்றிவருகிற சேவைகளைப் பார்க்கும் பொழுது சமூகசேவை நிவாரணம் வழங்குகின்ற ஒரு தாபனமாக மட்டும்தான் இயங்க வேண்டும் என்ற ஒரு நிலையை இது எதிர்நோக்கியிருக்கிறது. துன்பங்கள், கஷ்டங்கள், சேதங்கள் ஏற்பட்ட பின்னர் நிவாரணங்கள் வழங்குவதில் மட்டும் கூடுதலான கவனத்தைச் செலுத்தாமல் ஆக்க பூர்வமான பல திட்டங்களை உருவாக்கி ஏனைய அமைச்சுக்களோடு, திணைக்களங்களோடு சேர்ந்து செயலாற்ற வாய்ப்பு இதற்கு இருக்கிறது.

இந்தச் சந்தர்ப்பத்திலே நான் முக்கியமான ஒரு விடயத்தை கௌரவ அமைச்சருடைய கவனத்துக்குக் கொண்டு வர விரும்புகிறேன். சென்ற ஆண்டு வரவு செலவுத் திட்ட விவாதத்தின் போதும் இதனைத் தெரிவித்தேன். ஆனால், அதற்கு எதுவிதமான நடவடிக்கையும் இதுவரை மேற்கொள்ளப்படவில்லை. சில சமூக சேவை ஸ்தாபனங்களைப் பொறுத்தமட்டில், தர்ம ஸ்தாபனங்கள் என்று அழைக்கப்படுகின்ற ஸ்தாபனங்களைப் பொறுத்த மட்டில், விஷயம் தெரிந்த வட்டாரங்களில் உள்ள ஒரு இலர் சமூக சேவை செய்யும் நோக்கமாக அரசாங்கச் சட்டதிட்டங்களுக்கமைய ஒரு ஸ்தாபனத்தை அமைத்து அரசாங்கத்தினுடைய உதவியையும் அமைச்சினுடைய உதவியையும் பொது மக்களுடைய உதவியையும் சர்வ தேச நிறுவனங்களுடைய உதவியையும் பெற்று அந்த ஸ்தாபனங்களை விஸ்தரிப்பதற்கான நடவடிக்கைகளை மேற்கொள்கிறார்கள். ஆனால் அவர்கள் பெறுகிற உதவிகளுக்கு ஏற்ற அளவுக்கு சேவைகள் வழங்கப்படுகின்றனவா என்பது பிரச்சினைக்குரிய கேள்வியாகத்தான் இருக்கிறது.

இந்த ஸ்தாபனங்களை அமைப்பதற்காக முதலில் காணிகள்—பல ஏக்கர் காணிகள்—சுவீகரிக்கப்படுகின்றன பொதுப் பணத்திலிருந்து. இரண்டாவதாகச் சுவீகரிக்கப்பட்ட

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ටී. රාසලිංගම් මහතා]

நிலத்தில் பொதுப் பணத்திலிருந்து கட்டடங்கள் கட்டப்படுகின்றன. ஆனால் காலப் போக்கில் சுவீகரிக்கப்பட்ட இந்த நிலங்களும் கட்டடங்களும் யாருக்குச் சொந்தம் என்று தீர்மானிக்கிற ஒரு கட்டம் வரும்பொழுது பிரச்சினை எழச்செய்கிறது. உதாரணமாக, இது போன்ற நிலத்தைச் சுவீகரிப்பதற்கும் கட்டடங்கள் கட்டுவதற்கும் முன் நின்ற ஒருவர் சடுதியாக இறந்து விட்டால் அந்தக் காணியின் சொந்தம் யாருக்குச் செல்லும் என்ற கேள்வி எங்களுடைய நாட்டுச் சட்டத்தின் கீழ் ஆராய வேண்டிய ஒரு கேள்வியாக இருக்கிறது. இறந்தவருடைய வாரிசுகள், சொத்துக்கு உரிமையானவர்கள்—அவர்களை அங்கிலத்திலே heir apparent என்று கூறுவார்கள்—எந்த மனநிலையோடு அவற்றை மேற்கொள்வர்கள் என்பது சந்தேகத்துக்குரியது.

ஆகவே இதுபோன்ற உதவிகளை வழங்குவதை நான் வரவேற்கின்றேன். சேவை நலன் விஸ்தரிக்கப்பட வேண்டுமென்பதை வரவேற்கின்ற அதே நேரத்தில்—உள்ளூர், வெளியூர்களிலிருந்து வழங்கப்பட்டு ஆக்கப்படுகின்ற பொது நிதியை உபயோகித்து சுவீகரிக்கப்படுகின்ற கட்டடங்கள் ஆகியன யாருக்கு உரியன என்பதைத் தீர்மானிக்கக்கூடிய ஒரு திட்டவட்டமான ஒழுங்கை அமைச்சு மேற்கொள்ளவேண்டுமெனவும் நான் வற்புறுத்திக் கூற விரும்புகிறேன்.

இந்த ஆண்டு அங்கவீனர்களுக்குரிய ஓர் ஆண்டாகப் பிரகடனப் படுத்தப்பட்டுள்ளமையால், அங்கவீனர்களின் நிலைமை நன்கு கவனிக்கப்பட வேண்டும். கிழைத்தேயப் பண்பாட்டோடு நாம் அவற்றை இணைத்துப் பார்க்க வேண்டும். பொருளாதார, விஞ்ஞான ரீதியாக முன்னேற்றம் அடைந்துள்ள மேற்கு நாடுகளிலேயுள்ள அங்கவீனர்களுடைய நிலைமை ஒப்பிட்டுப் பார்க்காமல், எமது நாட்டிலேயுள்ள சமய, கலாசாரப் பண்பாட்டுப் பின்னணியிற் பார்க்கின்ற பொழுது இவர்களைக் கைவிடக்கூடிய நிலையில் எமது சமுதாயம் இல்லை என்பதை மறுக்க முடியாது. இறைவனுடைய படைப்பிலே அங்கவீனர்களுடைய திறமையை நோக்குகின்ற பொழுதும் உளவியல் ரீதியாக நாங்கள் எடுத்துப் பார்க்கின்ற பொழுதும், அங்கம் ஒன்று குறைந்த ஒருவருக்கு சில சிறப்புத் திறமைகளை [illegible] அவதானிக்கக்கூடியதாக இருக்கிறது. ஆகவே ஓர் அங்கக் குறைவின் மூலமாக, துரிதமாக இயங்கவேண்டிய சிறப்புச் சக்தி இன்னொரு அங்கத்துக்கு ஏற்படுகின்ற படியால் இந்தச் சிறப்புச் சக்திகளைப் பயன்படுத்தக்கூடிய முறையில் தொழில் வாய்ப்புக்களை—தொழில் பயிற்சி முறைகளை—வெவ்வேறு நிறுவனங்களுடன் இணைத்து வழங்கவேண்டியது சமூக சேவைகள் அமைச்சின் முக்கிய கடமையாகிறது. மேலும் அங்கவீனர்களுக்கு வாகன வசதிகளையும் இந்த அமைச்சு செய்து கொடுக்கவேண்டும்.

அடுத்ததாக சமூகசேவைகள் அமைச்சு வழங்குகின்ற, அனுதைகளுக்கான நிவாரண உதவிகளையும் காலத்திற்கேற்ப கூட்டி வழங்க வேண்டுமென்று அமைச்சரவர்களை நான் கேட்டுக்கொள்ளுகின்றேன். நீக்கிரையாகின்ற விடுகளுக்கு வழங்கப்படுகின்ற நிவாரண நிதியையும் தற்போதுள்ள சூழ்நிலைக்கேற்ப அதிகரித்து வழங்கவேண்டுமெனவும் கேட்டு எனது உரையை முடித்துக்கொள்ளுகின்றேன்.

**ඩබ්ලිව්. පී. බී. දිසානායක මහතා (මහනුවර දිසා ඇමතිතුමා)**

(திரு. டபிள்யு. பி. பி. திஸாநாயக்க—கண்டி மாவட்ட அமைச்சர்)

**(Mr. W. P. B. Dissanayake—District Minister, Kandy)**

සභාපතිතුමනි, අවුරුද්දක් පාසා මේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය ගැන සාකච්ඡා කෙරුණු හැම වාරයකම මම කථා කළේ, නොයෙකුත් ව්‍යාජ හේතූන් පෙන්වමින් මේ රටෙන් පිටරටට අරගෙන යන අපේ දරුවන් ගැනයි. ඒ විධියට පිටරටවලට දරුවන් විකිණීම අද මේ රටේ සාර්ථක ව්‍යාපාරයක් බවට පත් වී තිබෙනවා. එම නිසා නැවත වරක් මේ අවුරුද්දේ දීත් මම මගේ බලවත් විරෝධය ප්‍රකාශ කරනවා. ඒ විධියේ කටයුතු කරන උදවියට. ඒ සමගම මම ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, ලෝකයේ ඉන්න විශාලම ධනපතියා වුණත්, අපේ රටේ ඉන්න අහිංසක දුප්පත්ම කෙනකුගේ දරුවෙක් වුණත් [illegible]ගෙන යන්න ඉඩ දෙන්න එපාය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කියා, මොනම හේතුවක් නිසාවත්, එය අපේ ජාතියට කරන ලොකු නින්දාවක්. මේ රටේ දරුවනුත් විකුණාගෙන කනවාය කියා ප්‍රචාරය වෙනවා, ඒ නිසා.

මම අසා තිබෙන, පත්තරවල දැක තිබෙන දෙයක් කියන්නම්. අපි ගෙවල්වල බල්ලො-බළල්ලු ඇති කරනවා. අපි සුදු බල්ලො ඇති කරනවා; පුල්ලි තිබෙන බල්ලො ඇති කරනවා; හොඳට මයිල් තිබෙන එවුන් ඇති කරනවා; කන් දිග එවුන් ඇති කරනවා. සත්තු, තිරිසන්නු හැටියට අපි එවුන් ඇති කරනවා. අන්න ඒ විධියේ වැඩක් සඳහායි, ජාතියේ වග කීමක් උහුලන්න ඉන්න අපේ ඒ අහිංසක දරුවන් ගෙන යන්නේ, පිටරටින් එන මිනිස්සු.

ඒ වගේම මම අසා තිබෙනවා, පත්තරවලින් දැක තිබෙනවා, ඒ විධියට අපේ දරුවන් හදා ගැනීමටය කියා ඇන්න ගොහින් විශාල මුදලකට ඒ රටවල දී රක්ෂණය කරවා, නොයෙකුත් වද-හිංසා පමුණුවා ඒ දරුවන් මරා දමා, ස්වාභාවික හේතුන් උඩ මැරුණාය කියා අර රක්ෂණ සංස්ථාවලින් නැත්නම් සමාගම්වලින් කෝටි ගණනින් මුදල් හම්බ කර ගන්නවාය කියාත්.

ඒ වගේම මේ දරුවන් නොයෙකුත් දූෂිත වැඩවලට ඒ රටවලදී පුහුණු කරනවාය කියාත් අපට දැන ගන්න ලැබී තිබෙනවා. එම නිසා මේ අවුරුද්දේදී නැවත වරක් මම ගරු සමාජ සේවා ඇමතිතුමාගෙන් අවධාරණයෙන් ඉල්ලා සිටිනවා, කොයි රටක කාට වුණත්, මොනම හේතුවක් නිසාවත් අපේ දරුවකු දෙන්න එපාය කියා, පිටරට ගෙන යන්න. අපි එක වේලක් නොකා-නොබී බඩගින්නේ ඉඳල හරි, ඒ දරුවන්ට ඇනට වඩා වැඩිපුර එක වේලක්වත් කන්න දෙන්න කටයුතු කරමු කියා මේ අවස්ථාවේදී කියන්න කැමතියි.

තවත් එක කාරණයක් මතක් කරන්න කැමතියි. අපේ ප්‍රදේශයේ පමණක් නොවෙයි කොළඹත්—ලංකාවේ අස්සක්-මුල්ලක් නැර ඕනෑම ප්‍රදේශයක—ඕනෑ තරම් දකින්න හම්බ වෙනවා, අඳින්න ඇඳුම් නැතිව පාරේ හිටගෙන ඉන්න, මාන්දම හැදිච්ච, එහෙම නැත්නම් මන්දපෝෂණ නිසා කෙට්ටු වෙච්ච, එහෙමත් නැත්නම් දෙමාපියන්ගේ නොසැලකිලිමත්කම නිසා දුර්වල වෙච්ච ළමයි. අපේ රටේ පමණක් නොවෙයි, එවැනි දුර්වල දරුවන් දකින්න ලැබෙන්නේ. ලෝකයේ, ඔය ධනපතිය කියන රටවල වුණත් එවැනි දරුවන් දකින්න හම්බ වෙනවා. ඒ වගේ ළමයින් දෙතුන් දෙනෙකුගේ පින්තූරයක් අරගෙන, ටවුමේ හිඟා-කන මිනිහෙකුගේ පින්තූරයක් අරගෙන, හේනක කටු-මැටි ගහල තිබෙන පැල්පතක පින්තූරයක් අරගෙන, ඒ විධියේ පින්තූරු එකට ගොනු කර පිට රට යවල, මේ රටේ සමාජ සේවය සඳහා කියා රුපියල් කෝටි ගණනින් මුදල් ගෙන්වා ගන්නා ආයතනත් මේ රටේ තිබෙනවා. එම නිසා, සමාජ සේවා කටයුතු සඳහාය කියා මේ රටට ගෙන්වා ගන්නා මුදල් පිළිබඳව යම්කිසි පාලනයක් කරන්න ඇමතිතුමාට පුළුවන්කමක් තිබෙන්න ඕනෑ. අපේ රට විකුණාගෙන කන්න කාටවත් ඉඩ දෙන්න අපිට බැහැ. මේක අපිට ලොකු මදිකමක්; නින්දාවක්. මේක තවදුරටත් බලා ඉන්න අපිට බැහැ. වෙනත් රටවලට, අපේ රටේ දුප්පත්කම ගැන කියල. අපේ රටේ මිනිස්සු බඩගින්නේ ඉන්නවාය කියල, අපේ රටේ මිනිසුන්ට අඳින්න නැහැ කියල, වැරදි විධියට අපේ රට ගැන ප්‍රචාරයක් කරල මේ රටේ නොයෙක් සමාජ සේවා ආයතන—සමහර විට ඇතැම් ආගමික ආයතන පවා—පිටරටවලින් මුදල් ගෙන්වා ගන්නවා; ආධාර ලබා ගන්නවා.

අපි නැඟී සිටින්න දඟලන ජාතියක්. ඒ විධියට නැඟී සිටින්න උත්සාහ කරන ජාතියක් වශයෙන් අපිට ඉඩ දෙන්න පුළුවන්ද; අපි අර විධියට දුර්වල, කන්න නැති, හිඟා-කන ජාතියක්ය කියල පෙන්වා දෙනවා බලාගෙන ඉන්නද? එම නිසා ඒ විධියේ ව්‍යාපාර නැවැත්වීම සඳහා, වහාම ක්‍රියා කරන්නය කියා මම ඉල්ලා සිටිනවා.

මෙහිදී තවත් එකක් කියන්න ඕනෑ. අත්තනගල්ලේ මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මහතා) මතක් කළා. වැඩිකාරකමට තබාගෙන ඉන්න දරුවන් ගැන. ඒක කම්කරු අමාත්‍යාංශයට අයිති නැහැ. ඒක අයිති පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුවටයි. මෙන්න මේ කාරණය ගැන ගරු ඇමතිතුමාගේ අවධානය යොමු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩබ්ලිව්. ඩී. පී. දිසානායක මහතා]

කරන්න මම කැමතියි. අද දුප්පත්කම නිසා සමහර අය තමන්ගේ දරුවන්— අහිංසක ළමයින් හොඳ උදවිය ළඟ හැදෙන්නට වඩෙන්නය කියා බාර දෙනවා. ඒ අයට පඩිනඩි දෙන්නේ නැහැ. ඒමෙන්ම ඒ අයට නොයෙක් වද හිංසාත් පමුණුවනවා. ලෙඩ රෝගවලට බෙහෙත් දෙන්නේ නැහැ. ළිපට දැම්මට ඇවිලෙන්නෙ නැති ඇඳුම් ඇඳගෙන ඉන්නේ. හරියට කන්න දෙනවද නැද්ද දන්නෙත් නැහැ. එවැනි කොටසක් සිටිනවා. අන්න ඒ දරුවන් ගැන සොයා බැලීම පරිවාස සහ ළමාරක්ෂක දෙපාර්තමේන්තුව බාර ගන්න ඕනෑ කියන එක ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරනවා.

ඒ අතරම තවත් එක කරුණක් ගැන මතක් කර, 'තමුන්නාන්සේට ස්තුතියි' කියා මම වාඩි වෙනවා. කතික ගරු මන්ත්‍රීතුමන්ලා දෙතුන් දෙනෙක්ම දැන් මේ ගැන මතක් කළා. කාරණය මෙයයි: ඉඩෝරය එනවා. මේ රටට පායන එක්තරා කාලයක් තිබෙනවා. වැසි කාලයට සමහර පළාත්වලට ගංවතුර ගලනවා. මෙය වළක්වන්නට බැහැ. ඉඩෝරය පැමිණීමට අපි හමදාම කෝටි ගණනක් ඒ පළාත්වලට යවනවා නියං සහනාධාර කියා. ගංවතුර ගැලුවාම ගංවතුර ආධාර කියා දෙනවා. මෙයින් සීමාවක් තිබෙන්නට ඕනෑ. මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. තමුන්නාන්සේ කරුණාකර, මහවැලි සංවර්ධන ඇමතිතුමාත් සමග කථා කරගන්න, මේ ගංවතුර ගලනවා කියන ප්‍රදේශවල සිටින ඒ සහෝදර ජනතාව මහවැලි වතුර ලැබෙන ප්‍රදේශවල ඉඩම්වල පදිංචි කර ගංවතුර ආධාර දීම නතර කරන්නට පියවර ගන්නය කියා. නියං ආධාර දෙන්නට සිදුවන පළාත්වල මේ නියං දෙන සල්ලිවලින් නළ ළිං හදා ඒ මනුෂ්‍යයින්ට වතුර ගන්නට පහසුකම් සලස්වා දෙන්න. ඒ අයට ස්වශක්තියෙන් ජීවත් වීමේ මාර්ගයක් අපි හදා දෙන්නට ඕනෑ.

මට මේ අවස්ථාව ලැබීම ගැන සතුටයි. ඇමතිතුමාගෙනුත් නියෝජ්‍ය ඇමතිතුමාගෙනුත් ඒ අමාත්‍යාංශයෙනුත් අපේ දිස්ත්‍රික්කයට විශාල වශයෙන් උදව් ලැබී තිබෙනවා. ත්‍රයිසිකල් දුන්නා. නියෝජ්‍ය ඇමතිතුමා ඉපෙරේදා ඇවිත් ඇස් පෙනෙන්නේ නැති අයට කණ්ණාඩි දුන්නා. මගේ පළාතට විශාල වශයෙන් තමුන්නාසේ උදව් දුන්නා. ලබන අවුරුද්දේ මීටත් වඩා අපට උදව් ගන්නට දළදා හාමුදුරුවන්ගේ පිහිට ගරු ඇමතිතුමාටත්, නියෝජ්‍ය ඇමතිතුමාටත්, ලේකම්තුමාටත් ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මම නතර වෙනවා.

**ෂෙල්ටන් රණරාජා මහතා (අධිකරණ නියෝජ්‍ය ඇමතිතුමා)**

*(திரு. ஷெல்டன் றணராஜா—நீதி பிரதி அமைச்சர்)*

(Mr. Shelton Ranaraja—Deputy Minister of Justice)

Mr. Deputy Chairman, last year when the Votes of the Ministry of Social Services was discussed, I raised on the Floor of this House the question of the amendment to the Workmen's Compensation Ordinance, which comes within the purview of the Ministry of Sicial Services. I think this Ordinance is long outdated and it is high time we amend the schedule to the Workmens' Compensation Act.

The payment made in the event of some injury caused in the course of employment is totally inadequate. Even last year I suggested to the Minister of Social Services that some steps should be taken to amend the Workmen's Compensation Ordinance to enable the victims in the course of employment to be paid higher compensation.

I totally disagree with the comments made by the Hon. District Minister for Kandy (Mr. W. D. P. Dissanayake) with regard to the adoption of children. I believe it was the Hon. Minister of Social Services who recently went to the Scandinavian countries ; I think he has sent in a report on the way in which the children who have been taken away are being looked after in those countries. It is very encouraging to learn that the Hon. Minister has mentioned in his report that the children are very

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

well looked after. There are several kind-hearted people in foreign countries who want to adopt children. Therefore, I do not think it should be prohibited. Of course, we should take steps to see that mothers do not sell their children. I saw a report in the newspapers recently that mothers are said to have sold their children for as much as Rs. 50,000 each. I understand that not only mothers but also brokers sell children. That should be prevented. We should have some sort of children bank maintained by the Department of Probation and Child-Care Services; and if there are any foreigners who wish to adopt Sri Lankan children, we should assist them. But we should certainly prevent these racketeers from selling our children abroad.

**මන්ත්‍රීවරයෙක්**
(அங்கத்தவர் ஒருவர்)
(A Member)

They sell the children for as much as $ 2,500 each.

**ෂෙල්ටන් රණරාජ මහතා**
(திரு. ஷெல்டன் ரணராஜா)
(Mr. Shelton Ranaraja)

We should prevent these brokers selling children. If at all any money is paid for these children, that money should go to the Government. We should try to establish some sort of children bank, so that if any parents want to adopt a child on payment of money, that money can be made use for the benefit of the Government rather than be allowed to fall into the hands of these racketeers.

We also observe too many beggars on the streets today. Able-bodied persons are seen abegging. It should be made an offence for able-bodied persons to beg; if they are found guilty, they should be sent to some institution where they can be made to do voluntary work for the Government.

Therefore, I would request you to consider these suggestions I have made, particularly with regard to amending the Workmen's Compensation Ordinance.

**එච්. ජී. පී. නෙල්සන් මහතා (ත්‍රිකුණාමලය දිසා ඇමතිතුමා)**
(திரு. எச். ஜீ. பி. நெல்சன்—திருகோணமலை மாவட்ட அமைச்சர்)
(Mr. H. G. P. Nelson—District Minister, Trincomalee)

ගරු සභාපතිතුමනි, අද දින පැවැත්වෙන මේ සාකච්ඡාවේ දී මේ රටේ අහිංසක ජනතාවට, යන එන මං නැති ජනතාවට සේවය කරන අමාත්‍යාංශයක් ගැන කථා කිරීමට මා සතුටින් බලාපොරොත්තු වෙනවා. අපි දන්නවා, මෙම සමාජ සේවා අමාත්‍යාංශය තුළින් අපේ දිස්ත්‍රික්කවලට සෑහෙන දුරට සේවාවක් සිද්ධවෙලා තිබෙන බව. අපේ ප්‍රදේශවලට බල පෑ පසු ගිය ගං වතුරේදී ගරු ඇමතිතුමාත්, එම අමාත්‍යාංශයේ ලේකම් තුමාත්, ඒ වාගේම අධ්‍යක්ෂ ලීල් ගුණසේකර මහත්මයාත් එම දිස්ත්‍රික්ය නැවත පුනරුත්ථාපනය කිරීම සඳහා ළේ වන තෙක් ඒ කටයුතු නොකඩවාම ගෙන යාමෙන් අපේ ප්‍රදේශවල ජනතාවට විශාල සේවයක් කර දී තිබෙනවා. ඒ ගැන ප්‍රදේශයේ මහජන මන්ත්‍රීවරයා වශයෙන් මගේ ගෞරවය එම අමාත්‍යාංශයට පිරි නමන්න ඕනෑ.

ඒ වාගේම මම කියන්නට ඕනෑ, අපේ ප්‍රදේශවල සෑහෙන දුරකට තමන් හැදූ දරුවන් තමන්ට නොසලකා හැරීම නිසා අසරණ තත්ත්වයට පත් වූ දෙමව්පියන් ඉන්නවා. ඒ මහලු දෙමව්පියෝ සෑහෙන දුරකට අද අතරමං වී සිටිනවා, දරුවන් ඒ අයට නොසැලකීම නිසා. ඔවුන් යන එන මං නැති අන්ත දුගී තත්ත්වයකට වැටී තිබෙනවා. ඔවුන් ගෙන් සමහරුනට සමාජ සේවා දෙපාර්තමේන්තුවෙන් ආධාර ලැබුණත් හුඟක් අයට ලැබෙන්නේ නැහැ. එනිසා මා යෝජනා කරනවා ගරු ඇමතිතුමාට, අපේ ප්‍රදේශවල මෙසේ අනාථ වී සිටින මහලු අයට හා අනාථ වී සිටින ළමයින්ට නිවාසයක්, දිස්ත්‍රික් මට්ටමෙන් ඇති කරන්නය කියා. එසේ කළොත් ඒ ප්‍රදේශයේ සිටින දෙමව්පියන් නැති දරුවන්ටත්, අසරණව ඉන්නා මහලු අයටත් සෑහෙන දුරකට සහනයක් සැලසෙනවා.

අපේ ප්‍රදේශයේ දැනටමත් 'චරයිසිකල්' ප්‍රමාණයක් ලැබී තිබෙනවා. නමුත් ඒවා ප්‍රමාණවත් නැති නිසා, තවත් කීහිප යක් අවශ්‍ය වෙනවා. ඒ වාගේම මැඩිහිටි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එච්. ජී. පී. නෙල්සන් මහතා]

අයට ආධාර වශයෙන් සිංගර් මැෂින් කිහිපයක් පසුගිය දිනවල අපට ලැබුණා. ඒවාද නවත් වැඩිපුර ප්‍රමාණයක් ලබා දෙන හැටියට මා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

මේ අමාත්‍යාංශයේ ගරු ඇමතිතුමාටත්, අධ්‍යක්ෂතුමාටත් අප කියන හැම දෙයක්ම ඉතාමත්ම උනන්දුවෙන් හා ඕනෑකමින් ඉෂ්ට කර දීම ගැන නැවත වරක් ස්තුති කරමින්, දෙපාර්තමේන්තුවේ ඒ කටයුතු කරන අනිකුත් සියලුදෙනාටමත් මගේ කෘතඥතාවය පිරිනමමින් මගේ කථාව අවසන් කරනවා.

**ආනන්ද දසනායක මහතා (කොත්මලේ)**
(திரு. ஆனந்த தசநாயக்க—கொத்மலை)
(Mr. Ananda Dassanayake—Kotmale)

ගරු සභාපතිතුමනි, සමාජ සේවා අමාත්‍යාංශයේ වැය ශීර්ෂ යටතේ ප්‍රශ්න දෙක තුනක් ගැන පමණයි, කියන්නට තිබෙන්නේ. ඔබතුමා අපෙන් බලාපොරොත්තු වෙනවා, ඉක්මණින් කථාව ඉවර කිරීම. සමාජ සේවයට ලොකු අපහසුවක් තිබෙන්නේ රජයෙන්. මොන රජය ආවත් මට පෙනෙන්නේ සමාජ සේවය ගැන සලකන්නේ නැත කියන එකයි. අයවැය ලේඛනවලින් මේ සඳහා මුදල් වෙන් කරනවා මදි. ඒ මදිකම නිසා මේ කටයුත්ත හරියට ගෙන යන්නට සමාජ සේවා අමාත්‍යාංශයටවත්, සමාජ සේවා දෙපාර්තමේන්තුවටවත් බැහැ.

ඊළඟට මම විශේෂයෙන් කියන්න කැමතියි, අද තිබෙන ලොකුම ප්‍රශ්නය ගැන. අපි කොයි කවුරුන් වුවත්, අද ඉතා හොඳට ඉන්නා පුද්ගලයෙක් වුවත්, ආබාධිතයෙක් වෙන්න පුළුවන්. ඒ කියන්නේ "ඩිස්ඒබල්" කෙනෙක් වෙන්න පුළුවන් කියන එකයි. සමහර විට "ඇක්සිඩන්ට්" එකක් වුණත් අතක් කැඩිලා, කකුලක් කැඩිලා, ඇහැක් කණවෙලා, රක්ෂාවත් නැතිව යන්න පුළුවන්. එවිට ඔහු 'ඩිස්ඒබල්' කෙනෙක් හැටියට සමාජයට එනවා. එවැනි අය ඇති වෙනවා. මේක උත්පත්තියෙන් මත් ඇති වෙනවා. අඳ අය, ගොළු අය, බිහිරි අය, කොර අය, අංග විකල අය, ඇති වෙනවා. ඒ සම්බන්ධව සමාජ සේවා දෙපාර්තමේන්තුව නැත්නම් රජය ගන්නා පියවර ක්‍රමානුකූලව ගත යුතුයි. ඒකයි මගේ හැඟීම.

මම විදේශ රටවල ඇවිදින විට—විශේෂයෙන් සමාජවාදී රටවල—මම දැක්කා, මේවා සම්බන්ධව වෙනම ආයතන පිහිටුවා ඒවායින් පුහුණු කර ඒ ඒ දෙපාර්තමේන්තුවලට හෝ ඒ ඒ ආයතනවලට—රජයේ, පෞද්ගලික, සමුපකාර ආදී ආයතනවලට —ඒ අයගේ සේවය ලබා ගන්නවා, සුදුසුකම් හා දක්ෂතාවයන්, අනුව. සමාජ සේවා ඇමතිතුමා හිතනවා නම්, එතුමට පුළුවන් මේ සම්බන්ධයෙන් ක්‍රමානුකූල වැඩ පිළිවෙළක් ඇති කරන්නට. එතුමාට තිබෙනවා, අඳ ගොළු බිහිරි පාසැල. එතනත් පුහුණු කරනවා. ඊට පසුව ඒ අයට—අබ්බගාත අයට නැත්නම් අංග විකල අයට —වරයිඩිලයක් දෙනවා. එහෙත් ඒ මගින් එතුමාට ඊට වඩා වැඩි යමක් කරන්නට පුළුවන්කම තිබෙනවා. අන්ධ ළමයින් අද විශ්ව විද්‍යාලවලට ගොස් දක්ෂ ලෙස උපාධිය ලබාගෙන තිබෙනවා.

**එන්. එච්. ඒ. එම්. කරුණාරත්න මහතා**
(திரு. என். எச். ஏ. எம். கருணாரத்ன)
(Mr. N. H. A. M. Karunaratne)

අපි කරන වැඩවලින්.

**ආනන්ද දසනායක මහතා**
(திரு. ஆனந்த தசநாயக்க)
(Mr. Ananda Dassanayake)

තමුන්නාන්සේ කරන ඒවායිනුත් හුඟක් දුරට වැඩ වෙලා තිබෙනවා කියන ඔක මම පිළිගන්නවා. නැහැ කියන්නේ නැහැ.

මම මේ ගැන කියන්නෙ මේකයි. මේ අය උසස් අධ්‍යාපනය ලබා, දැන් නිතිඥයන් වශයෙන් ක්‍රියා කරනව; උසාවිවල නඩුවලට පවා පෙනී සිටිනව. එහෙම නම් මේ අයගෙ දක්ෂතා වැඩි වැඩියෙන් උපයෝගී කර ගන්න පුළුවන් විධියට වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයි. මේ සම්බන්ධයෙන් අවිස්සාවේල්ලෙ මන්ත්‍රීතුමා (එම්. ඩී. ප්‍රේමරත්න මහතා) වැදගත් යෝජනාවක් කළා. එතුමා කිව්ව 'සමාජ සේවා අරමුදල' කියා අරමුදලක් ඇති කිරීම ඉතා ප්‍රයෝජනවත්ය කියල. මමත් ඒ අදහසට එකඟ වෙනවා. එසේ අරමුදලක් ඇති කළාම මෙම සමාජ සේවා කටයුතු කර ගෙන යන්න එයින් විශාල පහසුවක් සැලසෙනවා. ඒ විධියෙ අරමුදලක් තිබෙනවා නම්, විදේශ රටවල සංවිධානවලින් අපට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආධාර ලබා ගන්න පුළුවනි. එපමණක් නොවෙයි, දේශීය පරිත්‍යාගවලින් මෙන්ම ලොතරැයි ඇදීම ආදී ක්‍රමවලින් උසාවිවලින් නියම කරන දඩ මුදල්වලින් මෙම අරමුදල තර කර ගන්න පුළුවනි.

ගරු සභාපතිතුමනි, මගේ ප්‍රදේශයේ අසරණ පුද්ගලයන්ට පිං පඩි දීම සම්බන්ධයෙන් මෙයට කලිනුත් ඇමතිතුමාගේ අවධානය යොමු කළා.

**එන්. එච්. ඒ. එම්. කරුණාරත්න මහතා**
*(திரு. என். எச். ஏ. எம். கருணாரத்ன)*
(Mr. N. H. A. M. Karunaratne)

දෙන්න සල්ලි නැහැ.

**ආනන්ද දසනායක මහතා**
*(திரு. ஆனந்த தஸநாயக்க)*
(Mr. Ananda Dassanayake)

පසුගිය අවුරුදු හතරක කාලය තිස්සෙ වැඩිහිටි නිවාසයක් ලබා දෙන ලෙස මම ඉල්ලා හිටිය. මහවැලි යෝජනා ක්‍රමය ඇර ඹීම නිසා දුන් පවුල් විශාල සංඛ්‍යාවක් අනාථ වී සිටිනව. වයසක අයට කුඹුරු කොටන්න හෝ වතුවල වැඩට යන්න බැරි නිසා, ආදායමක් නැතිවීමෙන් ඒ අයට ජීවත් වෙන්න විධියක් නැතුව අනාථ වී සිටිනව. මහවැලි ව්‍යාපාරය නිසා බොහෝ දුරට මේ තත්ත්වය ඇති වී තිබෙනව. මන්ද? වයසක අයට වගා කරන්න කුඹුරු ඉඩම් දෙන්නෙ නැහැ. දෙමව්පියන්ට සල කන්න දරුවන්ට ලැබෙන ආදායම මදි. මට හිතෙන හැටියට අපේ ප්‍රදේශයෙ තුන් හාර සියයක වැඩිහිටි පිරිසක් සිටිනවා. මේ අන්දමට අනාථව. අපට වැඩිහිටි නිවාසයක් ලබා දෙනවාය කියල කිව්ව. අනාථ වුණු ඒ අයට ආරක්ෂාව සලසා දෙන්න දැන්වත් වැඩිහිටි නිවාසයක් ලබා දීමට කටයුතු කරන ලෙස ඇමතිතුමාගෙන් මම ඉල්ලා සිටිනව.

කොත්මලේ ප්‍රදේශයට මේ ඇමතිතුමාගෙන් කිසිම වැඩක් කෙරුණේ නැති බව මට කියන්න සිදු වී තිබෙනව. ඇමතිතුමා අනික් ප්‍රදේශවලට වැඩ කරනවා වාගේම අපේ ප්‍රදේශ ගැනත් සොයා බලා වැඩ කරන හැටියට ඉල්ලා සිටිනව. අවසාන වශයෙන් කොත්මලේ ප්‍රදේශයට වැඩිහිටි නිවාසයක් ලබා දීමට ක්‍රියා කරන මෙන් නැවතත් ඉල්ලා සිටිනවා.

**ආර්. සම්පන්දන් මහතා**
*(திரு. ஆர். சம்பந்தன்—திருகோணமலை)*
(Mr. R. Sampanthan—Trincomalee)

I will not take your time, Sir. Many problems referred to by most of the hon. Members are common problems, common to many districts, and many of them are relevant where Trincomalee is concerned. I want to refer to the fact that we have no Assistant Director of Social Services in Trincomalee. In fact, we have not had one for a long time. Currently, the Assistant Government Agent, Headquarters, functions as the Assistant Director of Social Services, the Assistant Director Small Industries, in addition to his own work at Headquarters. He is a jack of all trades and master of none and I think the social service work in Trincomalee District suffers tremendously by reason of the fact that we do not have an Assistant Director of Social Services.

Presently, you have one Social Services Officer who is a Sinhala-speaking officer, but he is unable to communicate with the Tamil people; in many Tamil areas people are unable to communicate with him, and consequently this communication gap is causing certain problems. So, you must either give us an Assistant Director of Social Services, who can speak Tamil, or if you cannot do so, you must attach another Social Services Officer who can work in Tamil because, after all, the majority of the people in the district are Tamil-speaking and most of the villages where social service work has got to be done are Tamil villages. Therefore, there must be someone who can converse in Tamil, communicate in Tamil, and deal with the people in Tamil. Early action in regard to the matter—

**එන්. එච්. ඒ. එම්. කරුණාරත්න මහතා**
*(திரு. என். எச். ஏ. எம். கருணாரத்ன)*
(Mr. N. H. A. M. Karunaratne)

I will give one in January.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ආර්. සම්පන්දන් මහතා**
*(திரு. ஆர். சம்பந்தன்)*
(Mr. R. Sampanthan)

Thank you very much.

The second matter is also a common problem. It is the question of charitable allowances. As the hon. Member for Avissawella remarked, we have now come to a stage where a new applicant is considered only when a recipient expires. This is very unsatisfactory. A large number of people in the district have been clamouring for this charitable allowance, and with regard to this matter I have written to the Government Agent and all the Assistant Government Agents of the different districts to send the relevant particulars. Kindly consider giving us an increased allocation because now, under your Vote, you have got an increased allocation. The amount that is given is totally inadequate. I think you must consider the question of revising the amount payable currently as it is totally inadequate. I want the Hon. Minister to kindly consider the question.

Now, on the question of relief work, I am in agreement with many of the views expressed by many hon. Members of Parliament and I want to associate myself with those views. I think you must take some action to streamline the granting of relief work.

පූ. භා. 11.15

**ජේ. එල්. සිරිසේන මහතා (සමාජ සේවා නියෝජ්‍ය ඇමතිතුමා)**
*(திரு. ஜே. எல். சிறிசேன—சமூக சேவைகள் பிரதி அமைச்சர்)*
(Mr. J. L. Sirisena—Deputy Minister of Social Services)

ගරු සභාපතිතුමනි, සමාජ සේවා අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳව කතා කරන මේ අවස්ථාවේදී කියන්න කැමතියි, ආබාධිතයන්ගෙ වර්ෂය නිමිත්තෙන් මේ වර්ෂය ප්‍රකාශයට පත් කර, ජාතික කමිටුවක් පත් කර මේ කටයුතු කර ගෙන යන බව.

අපේ මන්ත්‍රීවරුන් කීප දෙනෙක්ම මේ ගැන හොඳ යෝජනා ඉදිරිපත් කළා. ආබාධිතයන්ට කිසියම් වෘත්තීය පුහුණුවක් දී ජීවිතය, ස්වාධීනව, නිදහස්ව, නිවහල්ව මිනිසුන් හැටියට ගත කිරීමට අවස්ථාව සලසා දෙන්නය කියන ඉල්ලීම කළා. මෙය ඉතාමත්ම හොඳ යෝජනාවක්. මන්ද, මේ ආබාධිතයන්ට හුඟක් සහජ දක්ෂතා තිබෙනවා. නමුත් දැනට තිබෙන අපහසුව එවැනි පුහුණු මධ්‍යස්ථාන ඇති කිරීම සඳහා අවශ්‍ය මුදල්වල අඩුපාඩුකමයි. නොයෙකුත් ආයතනවලට රැකියා සම්බන්ධයෙන් ආබාධිත පුද්ගලයන් යැව්වාම, ඒ පුද්ගලයන් රැකියාවල යොදවා ගැනීමට එම ආයතන ඉදිරිපත් වෙන්නෙ නැහැ. මම හිතන්නෙ අමාත්‍යාංශය උත්සාහ කරන්නෙ ඒ ආයතන හිමියන් නැතිනම් කර්මාන්ත හිමියන් සුහදතාවයෙන් පොළොඹවාගෙන මේ කටයුත්ත කරන්නටයි. නමුත් මම පෞද්ගලිකව කල්පනා කරන හැටියට මේක කවදාවත් කෙරෙන්නෙ නැහැ. එම නිසා සියයට තුනක් හෝ පහක් හෝ එහෙම නැතිනම් සාධාරණ ගණනක් සෑම සංස්ථාවකටම, සෑම දෙපාර්තමේන්තුවකටම, සෑම පෞද්ගලික ආයතනයකටම, එම ආබාධිත පුද්ගලයන්ගේ ඇති දක්ෂතාවන් අනුව, ලබා ඇති අධ්‍යාපනය අනුව බඳවා ගැනීමට ක්‍රියා කළයුතුය කියා නීති සකස් කළ යුතුව තිබෙනවා.

ආබාධිත වර්ෂය වෙනුවෙන්, අපේ ජාතික කමිටුව පිරිසක් පිටත් කර යැව්වා—මම හිතන්නෙ 12 දෙනෙක්—ක්‍රීඩා උත්සවයක් සඳහා ජපානයට. ලෝකයේ සෑම රටකින්ම වගේ ආබාධිතයන් ඊට සහභාගි වුණා. ඒ උත්සවයට සහභාගි වුණු අපේ ආබාධිතයන් 12 දෙනා අතර පදක්කම් 14 ක් ලැබී තිබුණු බව ඉතාම සන්තෝෂයෙන් ප්‍රකාශ කරන්ට ඕනෑ. එයින් 10 ක් රන් පදක්කම්. අනික් හතර රිදී සහ "බ්‍රොන්ස්" පදක්කම්. එයින්ම පෙනී යනවා, ආබාධිතයන්ට කොයිතරම් කුසලතාවන්, හැකියාවන් තිබෙනවාද කියා. ඒ හැකියාවන් දියුණු කරන්ට ඒ තුළින් ඒ උදවිය නිදහස් නිවහල් මිනිසුන් හැටියට ජීවත් කරවන්ට වුවමනා කරන පුනරුත්ථාපන කටයුතු, වෘත්තීය පුහුණු ආදිය දීමට රජයේ මුදල් තත්ත්වය අනුව තුප්ළු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වන් නිසා, ගරු මන්ත්‍රීවරයෙක් යෝජනා කළා වගේ අරමුදලක් ඇති කරනවා නම් ඒ මගින් සෑහෙන තරමටම මේ කටයුත්ත කරන්නට පුළුවන් වෙයි කියා මමත් හිතනවා.

සමාජ සේවා අමාත්‍යාංශයේ නියෝජ්‍ය ඇමතිවරයා හැටියට මේ තුන් වෙනි වාරයටයි, මම ළමයින් විකිණීම පිළිබඳව කථා කරන්ට අදහස් කරන්නෙ. ඒ ගැන මම කණගාටු වෙනවා. මේ කාරණය ගැන මහනුවර දිසා ඇමතිතුමාත් මතක් කිරීම ගැන එතුමාට කෘතඥ වෙනවා. අධිකරණ නියෝජ්‍ය ඇමතිතුමාත් මේ ගැන මතක් කළා. සමහරවිට එතුමන්ලා මේ ගැන කරුණු හුඟක් නොදන්නවා වෙන්න පුළුවන්. විදේශිකයන්ට ළමයින් හදා වඩා ගන්න දීම අද විශාල බිස්නස් එකක්, විශාල ව්‍යාපාරක් බවට පත් වෙලා. සියයට එක් කොනෙක්වත් රජයේ ආයතනයෙන් ළමයින් ලබා ගන්නෙ නැහැ. ඒ නිසා ළමයින් විකුණන්න අද හොඳ ලස්සණට වැඩ පිළිවෙලක් යෙදී තිබෙනවා.

මම මේ පිළිබඳව එක සිද්ධියක් ඉදිරිපත් කරන්ට බලාපොරොත්තු වෙනවා. අපේ අමාත්‍යාංශයෙන් මේ පිළිබඳව කැබිනට් මණ්ඩලයට සංදේශයක් ඉදිරිපත් කරන්ට ලෑහැස්ති කර තිබෙනවා. තවම ඒක ඉදිරිපත් කළේ නැහැ. ලේකම් මහත්මයාගේ අදහස වුණේ වාතාවරණය හොඳ වූ වහාම ඉදිරිපත් කිරීම සුදුසුය කියලයි. මම හිතන හැටියට වාතාවරණය දැන් හුඟක් හොඳයි. පසුගිය සති කීපය තුළ ස්වාධීන ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ 'සන්' සහ 'දවස' පුවත්පත්වල මේ පිළිබඳව ලිපි කීපයක් පළ කර තිබුණා. තවත් පත්‍රවල විශාල වශයෙන් ලිපි පළ වුණා. ඒ නිසා අද මේ පිළිබඳව සෑහෙන මහජන මතයක් ගොඩ නැගී තිබෙනවා.

මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් ගරු මන්—වරුන් නොදන්න කාරණා හුඟක් තියෙනවා. දැන් මාස 6 කට විතර උඩ දී බටහිර ජර්මන් ජෝඩුවක් මේ රටට ඇවිල්ල රුපියල් ලක්ෂයක් දීල ළමයෙක් අරගෙන ගියා. ඒ අය පෙබරවාරි මාසයේ ලංකාවට ඇවිත් රත්මලානේ ගෙදරක නැවතී සිටියා. ඒ නැවතී ඉන්න අතර ළමයෙක් ලබා ගන්නට ඒ ගෙදර හිමි ජෝඩුව සමග පොරොන්දුවක් ඇති කර කර ගත්ත. ඒ ගෙදර හිමි ජෝඩුව ඒ වන විට කසාද බැඳල මාස 6 කට වැඩිය ගිහින් තිබුණේ නැහැ. මේ ළමයා ලබා ගන්න ගිහින් ඒ ජෝඩුව ප්‍රකාශ කළා ඒ අයට ළමයි නැහැ, කියා. දේශීය වශයෙන් ඇති කිරීමට ළමයා ලබාගෙන මැයි මාසයෙන් පස්සෙ ජර්මන් ජෝඩුව රුපියලක මුද්දරයක් උඩ 'එග්‍රීමන්ට්' එකක් ලියාගෙන තිබුණ, රුපියල් ලක්ෂයක් දෙන්න. ඒ එග්‍රීමන්ට් එක දක්ෂ නීතිඥ මහත්මයෙක් ඉන්නවා. ඒ මහත්මයා තමයි, මට මේ ආරංචිය දුන්නෙ. ඒ මහත්මයාගේ සහෝදරියගෙ නිවෙසෙයි, මේ ජෝඩුව පැත්තක පදිංචි වෙලා සිටියෙ. මේ රුපියල් ලක්ෂයට අමතරව තවත් කැසට්, කැමරා ආදී රුපියල් විසි-තිස් දාහක් වටිනා බඩු මුට්ටුත් ගෙනැවිත් දී තිබුණා. ඒවා දීල මේ ළමයා අරන් ගියා. මේ ළමයා අහස් යාත්‍රාවට නංවා ගන්න කලින් නවත්වා ගන්න පුළුවන් දැයි බලන්න මම උත්සාහයක් ගත්තා. නමුත් ඒක කර ගන්ට මට බැරි වුණා. මට ආරංචිය ලැබුණේ සෑහෙන කාලයක් ගත වුණාට පසුයි. පරිවාස හා ළමා රක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරි මහත්වරුන් මේ සම්බන්ධයෙන් සෑහෙන උත්සාහයක් ගත්ත. නමුත් අපට ඒක සාර්ථක කර ගන්ට බැරි වුණා.

අද මේ ව්‍යාපාරය කොයිතරම් ලාභ ලබන ව්‍යාපාරයක් බවට පත්ව තිබෙනවාද කියනවා නම්, ලංකාවේ 'ඇඩොප්ෂන් සෙන්ටර්' එකක් ඇති කරන්ට ඔස්ට්‍රේලියාවෙන් මහත්වරු දෙන්නෙක් දැන් මේ රටට ඇවිත් සිටිනා බව කියන්ට ඕනෑ. අපේ ළමයින් අර ගන්න 'ඇඩොප්ෂන් සෙන්ටර්' එකක් ඇති කරන්න ඒ ඕස්ට්‍රේලියන් මහත්වරු දෙදෙනාට තියෙන කැක්කුම මොකක්ද කියා අපි කල්පනා කර බලන්න ඕනෑ. ඕස්ට්‍රේලියාවට ළමයින් ගෙන යනවා. එසේ ගෙන යන සමහරුන් ඒ ළමයින් ගැන හොඳට බලනවාය කියා අපට හිතන්න පුළුවනි. පිළිගන්න තරම් සාක්ෂි තිබෙනවා. නමුත් ස්කැන්ඩිනේවියානු රටවලට ගෙන යන ළමයින් ගැන අපේ නියෝජ්‍ය කෘෂිකර්ම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජේ. එල්. ඕරිසේන මහතා]
ඇමතිතුමා කොයි තරම් දුරට කරුණු හොයලා තිබෙනවාදැයි මම දන්නෙ නැහැ. නමුත් අපට ඒ ගැන කිසි සේත් සතුටු වෙන්න බැහැ. ස්කැන්ඩිනේවියානු රට වල විවාහය, පවුල යනා යනා මේවාට තත්ත්වයක් නැහැ. ඒ රටේ විශ්ව විද්‍යාලවල තරුණ කාන්තාවන්, තරුණ ළමයින් පිරිමි ළමයින් සමග අඹු—සැමියන් වශයෙන් ජීවත් වෙනවා, 'කොම්පැටබිලිටි' බලන්න. අපි, නමුත් නාන්සේලා ප්‍රාග දෙනෙක් මේ කරුණු මැගසින්වල කියවා තිබෙනවා. 'කොම්පැටිබල්' නැත්නම් තවත් කෙනෙක් එක්ක ජීවත් වෙනවා. අපගේ වැනි සංස්කෘතියක්, අපගේ වැනි ශිෂ්ටාචාරයක් තිබෙන රටක ළමයින් ස්කැන්ඩිනේවියානු රටවලට දීම යුක්ති සහගතදැයි මම අහනවා.

ළමයින් හදාගැනීමට පිටරටවලට දීම ගැන ගරු ඇමතිතුමා විරුද්ධයි. ඒ නිසායි, එතුමා සන්දේශයක් ඉදිරිපත් කර තිබෙන්නේ. ගරු ඇමතිතුමාට ස්වීඩනයට ගොස් දවස් දෙක තුනක් නැවතී සිටියදී එතුමා දුටු කරුණු අනුව වාර්තාවක් ඉදිරිපත් කරන්න එතුමාට පුළුවනි. නමුත් ගෙන යන ළමයින් ප්‍රමාණය එතුමාට දවස් දෙක තුනකින් බලා ගන්න පුළුවන්ද යන කාරණය අපි කල්පනා කරන්න ඕනෑ.

මේ අවුරුද්දේ නොවැම්බර් මාසයේ 30 වැනිදා දක්වා ගත වූ මාස 11 තුළ ළමයින් කොපමණ ගෙන ගොස් තිබෙනවාද කියා අපි බලමු. ස්වීඩනයට 244 යි; නෙදර්ලන්තයට 73 යි; ස්විට්සර්ලන්තයට 98 යි; ඩෙන්මාර්කයට 64 යි; ඔස්ට්‍රේලියාවට 51 යි; බටහිර ජර්මනියට 73 යි; ඉතාලියට 14 යි; නෝර්වේට 13 යි; එක්සත් ජනපදයට 2 යි; එක්සත් රාජධානියට 1 යි; බෙල්ජියමට 1 යි; කැනඩාවට 1 යි; ප්‍රංශයට 5 යි; ඔස්ට්‍රියාවට 1 යි; ස්කොට්ලන්තයට 1 යි; මුළු ගණන 642 යි.

ඊළඟට, පෞද්ගලික නිවාස අනුව බැලුවොත් ඒ පෞද්ගලික නිවාස ඒවායින් ළමයින් 720 ක් යවා තිබෙන බව පෙනෙනවා. සිහිනිමැදුර 110 යි; වෙල්කම් හෝම් 56 යි; නායකන්ද 46 යි; සාන්ත බර්නාඩ් 36 යි; සාන්ත ලෙනාඩ් 13 යි. දෙපාර්තමේන්තුවෙන් 9 යි. විදේශිකයන් ගෙන ගිය ළමයින් 642 ගෙන් දෙපාර්තමේන්තුව යවා තිබෙන්නේ 9 දෙනෙයි. අපි කවුරුත් මේ කාරණය ගැන හොඳට කල්පනා කරන්න ඕනෑ.

කැබිනට් මණ්ඩලයේ ඉන්නේ ශූන වන්න ඇමතිවරු. දෙන්නෙකුට හැර, අනෙක් හැම දෙනාටම වාගේ ළමයි ඉන්නවා. ඒ නිසා, අද තිබෙන තත්ත්වය උඩ අපි තවදුරටත් මේ ළමයින් යැවීමට ඉඩ හැකිය යුතුද කියන කාරණය අපේ ළමයින් වෙනුවෙන් අපි කල්පනා කරන්න ඕනෑ.

ස්ත්‍රී—පුරුෂ භාවය අනුව සැලකුවොත් ගැහැණු ළමයින් 429 දෙනකුත් පිරිමි 213 දෙනකුත් ගෙන ගොස් තිබෙන බව පෙනෙනවා. මේ ළමයින් 642 න් 241 ක්ම ගෙන ගොස් තිබෙන්නේ ස්වීඩනයට. අපි මේ හැම ළමයෙක් වෙනුවෙන්ම 'හෝම් ස්ටඩි රිපෝට්' එකක් උසාවියට ඉදිරිපත් කරන්න ඕනෑ. මේවා ඉදිරිපත් කරන්න අපි දෙපාර්තමේන්තුවෙන් මුදල් වියදම් කරනවා. නිලධාරීන් යොදවනවා. ඒ අයට මුැවලිං, බටා ආදිය ගෙවනවා. දෙපාර්තමේන්තුවෙන් ඒ අය නඩත්තු කරනවා. නමුත් දෙපාර්තමේන්තුවෙන් ළමයින් 9 ක් යන විට ළමයි 633 ක් පෞද්ගලික ආයතන තුළින් ගෙන ගොස් තිබෙනවා.

පෞද්ගලික ආයතන මේ ළමයින් දෙන්නේ නිකම්ද? මේ ළමයින් විකුණන බවට ඊයේ පෙරෙයිදා නොයෙක් ආරංචි ලැබී තිබෙනවා. මේ විධියට ළමයින් විකිණීමට අප රටේ තව දුරටත් ඉඩ දෙනවා නම් එය බලවත් කනගාටුවට හේතුවක්. මේ අවුරුද්දේ නොවැම්බර් මාසයේ 20 වැනි දා 'ඒෂියා වීක්' සඟරාවේ 27 වැනි පිටුවේ, ළමයින්ගේ පින්තූරත් එක්ක එක්තරා විස්තරයක් පළ වී තිබෙනවා. රටවල් ගණනාවක් මේ භාවයුක්ත කරන බව ඒහි සඳහන් වෙනවා. මම එයින් කොටසක් කියවන්නම්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

I will read out portion from "Asia Week" dated 20th November, 1981. The heading is: "Babies for Sale: The Illegal Adoption Racket".

"The Booming Trade in Babies

Sumanawathie is looking scared. The young Sri Lankan woman is in hospital for her first baby, and she is unsure how she will cope as an unwed mother. Then a hospital orderly approaches and whispers something in her ear. A deal is made. Money changes hands and a few days later Sumanawathie leaves the hospital minus her child but Rs. 1,000 (US $ 50) richer. The orderly's contact man quickly arranges for papers and the infant is whisked away to foster parents in a distant foreign city."

**එන්. එච්. ඒ. එම්. කරුණාරත්න මහතා**
(திரு. என். எச். ஏ. எம். கருணாரத்ன)
(Mr. N. H. A. M. Karunaratne)

She goes back as a virgin!

**ජේ. එල්. සිරිසේන මහතා**
(திரு. ஜே. எல். சிறிசேன)
(Mr. J. L. Sirisena)

Maybe. There are a number of other cases lik that. I will read out another paragraph:

"Margarita is a prostitute in Angeles, the Philippines' notorious red-light town adjoining the U. S. Clark Air Force base. Discovering that she is pregnant, she approaches an underworld connection. She agrees to hand over the baby immediately after birth in exchange for payment of her hospital bills and a small fee. The infant will eventually end up with an illegal adoption syndicate, which will sell it abroad for US $ 6,000—$ 12,000."

තව රටවල් කීපයක් ගැන තිබෙනවා. අපේ රට තමයි මේකෙන් ප්‍රමුඛත්වය ලබා තිබෙන්නෙ. මේ ව්‍යාපාරය දැන් තරඟ ව්‍යාපාරයක් වී තිබෙනවා. අර මම කිව්ව ඕස්ට්‍රේලියානු මහත්වරුන් දෙන්නාට සහාය වෙන්න ලංකාවේ කාන්තාවක් ඉන්නවා. ඒ අය තමයි, ඇඩොප්ෂන් සෙන්ටර් එක ආරම්භ කරන්න ක්‍රියා කර ගෙන යන්නෙ. ඒ විධියට ළමයින් පිටරට වලට විකිණීම මේ රටේ ශිෂ්ටාචාරයට, මේ රටේ ගෞරවයට, මේ රටේ නම්බුවට ලොකු කැළලක්.

ස්වීඩන් දෙස්තර මහත්මයෙක් 'කිරි දරුවන් රට පැටවීම' යන ශීර්ෂ පාඨය යටතේ 1980 අප්‍රේල් 13 වෙනි දින 'සිළුමිණ' පත්‍රයට ලිපියක් ලියා තිබෙනවා. ස්වීඩන් රටේ ළමයින්ට යන තත්ත්වය මොකක්ද කියා මේ ලිපියේ සඳහන් වෙනවා. කාලවේලා නැති නිසා ඒක මම කියවන්න යන්නෙ නැහැ. ළමයින් විකිණීම පිළිබඳව මෙතන ලියුම් 20 ක්, 30 ක් තිබෙනවා. නමුත් මේ ලියමන පමණක් ඉදිරිපත් කරනවා. හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීමට * මොකද? ස්වීඩන්වල සිටින දෙස්තර මහත්මයෙක් කියා තිබෙන කරුණු නිසා.

මට ලැබුණු කාලයත් අවසන් නිසා, ඒ ගැන වැඩි විස්තරයක් මම කරන්න යන්නෙ නැහැ. කෙසේ වෙතත් මගේ කථාව අවසන් කරන්ට කලින් නැවතත් ඇයාචනයක් කරනවා, ගරු ඇමතිතුමාට මේ ගැන අවධානය යොමු කරන්නය කියා. අපේ නිලධාරීන් මේ ගැන බොහෝම උත්සාහ කරනවා. නමුත් තවත් නිලධාරි මහත්වරු ඉන්නවා බොහෝම සූක්ෂම විධියට මේ දරුවන් විකිණීමට උදව් දෙන අය. ඒ ගැන මගේ බලවත් කනගාටුව ප්‍රකාශ කරන අතර මම ඒ ගොල්ලන්ට කියන්න කැමතියි, මේ රටේ දරුවන් විකුණා තම අඹු දරුවන්ට කන්න දෙනවාට වඩා මහ මග හිඟා කන එක හොඳයි කියා තමන්ට ජීවත් වෙන්න විධියක් නැත්නම් ආදායම් මදිනම්.

ඒ නිසා මේ වැඩේ නැවැත්වීමට ඇමතිමණ්ඩලයේ අවධානය යොමු කර, ලබන අවුරුද්දේ සිට විදේශයට දරුවන් විකිණීමේ ව්‍යාපාරය සම්පූර්ණයෙන්ම නවත්වන්න මේ රජය අවශ්‍ය පියවර ගන්නවා ඇතැයි බලාපොරොත්තු වෙමින් මගේ කථාව අවසන් කරනවා.

* කථාව අවසානයේ නැවත පළ කර ඇත.
* உரையினிறுதியில் திரும்பத் தரப்பட்டுள்ளது.
* Reproduced at and of speech.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජේ. එල්. සිරිසේන මහතා]

**සභා මේසය මත තබන ලද ලිපිය :**

*சபாபீடத்து வைக்கப்பட்ட கடிதம் :*

**Letter tabled :**

**කිරි දරුවන් රට පැටවීම**

අපේ ගෙවල බල්ලන් බලලුන් විනෝදයට ඇති කරන්නාක් මෙන් මෑ ඇතැම් විදේශිකයෝද පිට රටින් දරුවෙකු දෙන්නෙකු ගෙන්වා ගෙදර ඇති කිරීමට ආශා කරති. ඒ අතර ඇතැම් අය ඇත්ත වශයෙන් මෑ දරුවන් නොමැති නිසා කෙසේ මහෝ දරුවෙකු ලබාගෙනෑ ඇති දැඩි කිරීමට උත්සාහ ගනිති, ඉදිරියේ වහල්කමට ගැනීමේ කූඨ අද හසින් දරුවන් ගෙන යන අයද නැත්තේ නොවේ. තවත් අය අඩු මිලට මෙහෙන් දරුවන් ලබා ගෙනෑ ගොස් පිටරට වැඩි මිලට දරුවන් විකිණීමේ යෙදී සිටිති.

මෙරට කූට ජාවාරම් කාරයින් කිහිප දෙනෙකු සමග එකතු වී, පිටරට කූට වෙළෙන්දෝ දරුවන් තොග ගණනින් ගෙන ගොස්, මලාකු මුදල් ඉපයීම අද බොහෝ දෙනා දන්නා කරුණකි. බොහෝ විට මෙරට වෙළෙන්දා දරුවාගේ දෙමව්පියන් සමග මිත්‍රවී, දරුවා ලබාගෙන, පිටරටියන්ට විකුණා ලබන මුදල පිටරට බැංකුවල තැන්පත් කරති.

මීට තුන් වසරකට පමණ පෙරු, දරුවන් නැති කම නිසා, දරුවෙකු හදා වඩා ගැනීමේ ආශාවෙන් මෙරටට පැමිණි ස්වීඩන් ජාතික යුවළකට මෙරට නීතිඥයෙක් ඩොලර් 2,000 කට ළමයකු විකුණා තිබේ. ඊට හය මසකට පසුව තවත් ඩොලර් 2,000 ක් අවශ්‍ය බව නීතිඥවරයා මේ යුවළට දන්වා තිබේ, මේ මුදල නොලැබුනොත් දරුවා නැවත ගෙන්වා ගැනීමට පිළිවන්කම තිබේයැයි තර්ජනය කර තිබේ. බියට පත්වූ ස්වීඩන් ජාතික යුවළ ලංකා තානාපති කාර්යාලයෙන් මේ ගැන උපදෙස් ඉල්ලා තිබේ. දරුවෙකු ලබා ගත්තාට පසු නැවත ආපසු දීමට අවශ්‍යතාවයක් නොමැති බව එහිදී පෙන්වා දී තිබේ. කූට අන්දමින් මුදල් ගැනීමේ යෙදී සිටින දරු ජාවාරම්කාරයෝ සත්‍ය ලෙස හදා ගැනීමට දරුවන් ගෙන යන මව් පියන්ට තර්ජනයකි.

ස්කැන්ඩිනේවියාවේ එක්තරා නිවසකට ගිය අවස්ථාවකදී, හදා ගැනීමට ලංකාවෙන් ගෙනෑ ගිය දරුවෙකු දකින්නට මට ලැබිනි. ආසියාතික දරුවෙකු නිසා ඇයව හඳුනා ගැනීමට පිළිවන් වුවද මේ දරුවා කාගේ දැයි මම ඔවුන්ගෙන් නොඇසුවෙමි. ගෙහිමියා, මට එම දරුවා පෙන්වා, මේ ළමයා අප ඩොලර් කිහිපයකට ලංකා වේදී මිළදී ගත බව එක්වරම කීය. මෙය ඒ දැරියට තේරුණු බව මට වැටහිණි. දැරිය ලැජ්ජාවෙන් මුහුණ වසා ගත්තාය. මේ අන්දමට අමුත්තන්ට මේ දරුවා පෙන්වීමෙන්, ඒ දරුවාගේ ගරුත්වයට පහරකි. මේ අන්දමට වසර කිහිපයක් කල් ගොත්, එයින් මනසට ඇති විය හැකි හානිය කිව නොහැකි තරම්ය. ඉදිරියේදී මානසික අතින් නොයෙකුත් දුබලතාවයන්ට මුහුණ දීමට සිදුවනු නියතය.

බොහෝ විටෑ මෙහි 'දරු ජාවාරම්' කාරයෝ මෙරට දුගී දෙමව්පියන් රවටා පසු කාලයකදී දරුවා ආපසු දීමට හෝ දරුවා සෑම වසරකදීම දැක ගැනීමට සැලැස්වීමට හෝ පොරොන්දු දී දරුවන් ආපසු ගැනීම කරති. මේ දරුවා කොතැටද ගෙන යන්නේ, කව්ද ලබා ගන්නේ, ආගමනය කුමක්ද යනාදිය ගැන කිසිවක් ඇතැම් දෙමව්පියන්ට නොදන්වා සුළු මුදලක් දී දරුවන් ලබා ගන්නා අයද බොහෝය.

හොඳ කරුණාවන්ත පිටරට දෙමව්පියන් ලබා ගැනීමට හැකිවීම ලොකු වාසනාවකි. මේ වාසනාව ඇත්තේ සුළු ප්‍රමාණයකට පමණයි කිව හොත් නොවැරදිය. පෞද්ගලික ආයතන මගින් පිටරට දෙමව්පියන් ගැන කිසිවක් නොදැන නොසොයා දරුවන් විකුණා මුදල් ගරා ගැනීමේ පරමාර්ථයෙන් මෑ කරගෙන එන මේ වෙළඳාම ගැන රජය සොයා බැලීමට ඉදිරිපත් වීම කාලෝචිතය.

පෞද්ගලික ජාවාරම්කාරයින්ට දරු වෙළඳාම කිරීමේ පහසුකම් සම්පූර්ණයෙන් මෑ නවත්වා සමාජ සේවා දෙපාර්තමේන්තුව මගින් දරුවන් හදා ගැනීමට සුදුසු දෙමව්පියන් තෝරා ගැනීමේ කටයුත්තේ නිරත වීම සුදුසුය.

දරුවන් ලබා ගැනීමට ඉදිරිපත් වන දෙමාපියන්ගේ, මානසික තත්වය, සමාජ තත්වය, රැකියාව, මුදල් තත්වය ජීවත්වීමට හරියාකාර නිවාසයක් ඇත්ද, අධික ලෙස මත් පැන් හෝ බෙහෙත් වර්ග පාවිච්චි කරන්නේද? යනාදිය පිළිබඳ වාර්තාවක්, එරට රජයේ බලයලත් වෛද්‍ය වරයකුගෙන් ලබා ගත යුතුය යන්න දැන්වීම සුදුසුය. ඇතැම් විට මනස විකල් වූ දෙමව්පියන් අත පත් වුව හොත් කිරි දරුවන්ට පීඩා විඳින්නට පමණක් නොව මරු මුවට පත්වන්නටද ඉඩ තිබේ.

මනස විකල් වූ ඇතැම් අය දරුවන්ට පීඩා දීමෙන් තෘප්තියට පැමිණෙති. 'සැඩිස්ට්' නමින් හඳුන්වන මනස විකල් වූ අයද ළදරුවන් ලබා ගැනීමට ඉදිරිපත් විය හැක. මෙය සොයා මානසික තත්ත්වය පිළිබඳවෑ මෙය සොයා ගැනීමට පරීක්ෂණයක් පැවැත්වීමෙන් පහසුය.

පෝෂ්‍යදායක ආහාර පානාදිය ලබාදීම මෙන් ම ජීවත්වීමට සුදුසු තැනක් නැතිනම් සීතල රටවලට ගෙන යනු ලබන කිරි දරුවන් පහසු වෙන් රෝගී විය හැක.

අධික ලෙස මත්පැන් හා බෙහෙත් වර්ග පාවිච්චි කරන දෙමව්පියන් අතින්, දරුවන්ට පීඩා ලැබිය හැක. ඒ අතරම, අවශ්‍ය සැලකිලි, නොලැබිය හැක. ඉදිරියේදී දරුවන් ද එම දෙමව්පියන්ගේ වැරදි අඩි පාරේ ගමන් කරන්නටද පෙළැඹෙනු ඇත.

පිටරටකට ගෙනෑ යන මේ දරුවාගේ කැමැත්ත හෝ අකමැත්ත විමසීමට අපට හැකියාවක් නොමැත. ඇතැම් විට මේ දරුවා පිටරටක ජීවත් වීමට අකමැති විය හැක. කරුණු තේරුම් ගැනීමට පිළිවන් වයසට පැමිණි විට නැවත තමන්ගේ මව් රටට ඒමට කැමති දරුවන්ට, එසේ කිරීමට බලය ලැබෙන ලෙස නීතියේ වගන්තියක් එකතු කිරීමද සුදුසුයි.

දරුවා ඇතුල්වන සමාජය අනුව දරුවාගේ අනාගතය වෙනස් විය හැක. උගත් සමාජයකට ඇතුල් වීමේ පහසු කම අලුත් දෙමව්පියන් අත රැඳී තිබේ.

'අරන් හදාගත් දරුවා' යන නාම ජීවිතාන්තය දක්වා පවතී. එයද දරුවාගේ මානසික තත්ත්වයට බලපාන බලවත් පහරක් විය හැක. ඇතැම් විට අනුවණ දෙමව්පියන් මේ දරුවා ඩොලර් මෙතරම් ගණනකට අපි මිළදී ගත්තෙමු යයි කියනු ඇසෙන විට හැඬෙන දරුවාගේ සිතට හා මනසට ඇති විය හැකි පහර බලවත් විය හැක. එයින්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මනස විකල් වූ කෙනෙකු බවට පත්වීමටද නො හැක්කේ නොවේ. සමාජයේ අන් අයගේ හා පාසැලේදී අසන්නට ලැබෙන නොයෙකුත් සිත් පීඩවන දේ නිසා දරුවා ගේ අනාගතය මෙන්ම සෞඛ්‍ය තත්ත්වයද අඳුරු විය හැකිය.

පූ. භා. 11.30

**එන්. ඒ. එම්. කරුණාරත්න මහතා (සමාජ සේවා ඇමතිතුමා)**

*(திரு. என். எச். ஏ. எம். கருணாரத்ன— சமூக சேவைகள் அமைச்சர்)*

(Mr. N. H. A. M. Karunaratne)
—Minister of Social Services)

දීර්ඝ වශයෙන් කථා කිරීමට මම බලා පොරොත්තු වන්නෙ නැහැ. පොදු වශ යෙන් පැන නැගුණ ප්‍රශ්න කීපයක් ගැන කරුණු සඳහන් කරන්න කැමතියි. කයිට්ස් ගරු මන්ත්‍රීතුමා (කෝ. පී. ඉරත්තිනම් මහතා) මතු කළ කාරණා ගැන පළමුවෙන් උත්තර දෙන්න කැමතියි.

The hon. Member for Kayts referred to a Gazette notification, which has been misinterpreted. I wish to tell him that it had not been intentionally done and that there has been no disparity whatsoever. I will look into that matter and see that such a thing does not occur in future.

In regard to charitable allowances, the money given is insufficient and what we have is given on a pro rata basis. Now, as we have got some money—I got Rs. 50 million—I will consider all that the hon. Member for Kayts has said, and from next year I hope to increase in every respect either by giving money or grants to social service organizations or to individuals who deserve an allowance. I have an intention of increasing the amount and it will be done.

The hon. Member for Trincomalee raised certain matters. I wish to tell him that at the moment there are no Tamil speaking assistant directors in our department. If we had any, we could have sent one. But this situation will disappear as there will be vacancies occurring very soon and the department will be calling for applications for posts of Tamil-speaking assistant directors as well.

ඊළඟට මතුවුණු තවත් ප්‍රශ්නයක්, ගංවතුරවලින් ආපදා සිද්ධ වුණ අයට ඉඩම් දීම ගැන. එය සමාජ සේවා අමාත්‍යාංශයට අයිති වැඩක් නොවෙයි; ගම් පුළුල් කිරීම යටතේ කෙරෙන වැඩක්. එය අපට අයිති නැහැ.

ඊළඟට, ළමයින්ගෙන් වැඩ ගැනීම සම්බන්ධයෙන් කියන්න යෙදුණා. එයත් අපේ අමාත්‍යාංශයට අයිති වැඩක් නො වෙයි. එය කම්කරු අමාත්‍යාංශයෙන් කළ යුතු දෙයක්. තවත් පොදු වශයෙන් පැන නැගුන ප්‍රශ්නයක් තමයි, ළමයින් හිඟමනේ යැවීම නැත්නම් වෙනත් යම් යම් කරුණුවලට යෙදවීම. අපි ඒ ගැන කටයුතු කරල තිබෙනවා. කොග්ගල, ළමයින් සිය ගණනක් නවත්වාගෙන සිටිනවා. ඒ ළමයින්ට අධ්‍යාපනයක් ලබා දී, යම් කර්මාන්තයක් කරන්නටත් උගන්වා, ඒ ළමයින් ලොකු වුණාට පසුව පිටත් කර යවනවා. මේ ළඟදී සිට එය ක්‍රියාත්මක කිරීම ටිකක් අඩු වුණා. මොකද? මුදල් අඩුපාඩුකම නිසයි. අපි එය නැවතත් ක්‍රියාත්මක කරනවා. ඒ වගේම රක්ෂාවල් නැතිව හිඟමනේ යන අයත් අපි පුනරුත්ථාපනය කරනවා.

අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මහතා) සීදුව සම්බන්ධයෙන් කියන්නට යෙදුණා. එතුමාට මම කියන්නට කැමතියි, සීදූවේ අන්ධ අය, නැත්නම් අංගවිකල අය—ආබාධිත පුද්ගලයන්—අපි පුනරුත්ථාපනය කරනවා. අපි ඒ අයට යම්කිසි වැඩක් කරන්න උගන්වනවා. කුඩා වියන්න, රෙදි වියන්න වගේ දේවල් උගන්වනවා. ඒ සමගම රු. 750 ක පමණ මුදලකුත් අපි ඒ අයට ලබාදෙනවා. ඒ වගේම, අවශ්‍ය නූල් දෙන්නටත් කටයුතු කරනවා. ඒ විධියට ඒ අයව පුනරුත්ථාපනය කරනවා. ඒ අය නිපදවන බඩු සියල්ලක්ම අපි ගන්නවා. ඒවා අරගෙන විකුණන්න ක්‍රමයකුත් අපි ඇති කරල තිබෙනවා. ගරු අගමැතිතුමා අපට සාප්පු වගයක් දී තිබෙනවා, ඒ බඩු විකුණන්න.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කලවාන ගරු මන්ත්‍රීතුමා (සරත් මුත්තෙට්ටුවෙගම මහතා) ප්‍රශ්නයක් ඇනුවා, වැඩ වර්ජනයට සහභාගි වුණු අය සම්බන්ධව. ඒ අය ගැන කටයුතු කරන්නේ කෙසේද කියන එක ගැන කැබිනට් මණ්ඩලයට කරුණු ඉදිරිපත් කර තිබෙනවා. ඒ පිළිතුරු ලැබුණු විට ඒ ගැන කටයුතු කරන්නට අපි ලැස්තියි.

The hon. Member for Chavakachcheri (Mr. V. N. Navaratnam) pointed out that a certain Principal of a school refused to allow his school to be used to house those who were subject to calamities like floods and so on. I would undertake to see that there are no such occurrences in the future.

With regard to casual employees in the Kaithady Home, when there are vacancies they will be accommodated ant the vacancies filled.

I wish to refer to the comments made by the Hon. Deputy Minister with regard to the adoption of children. As he mentioned, I personally examined this matter and I was fully satisfied that the children are being well looked after, and I made a report. This matter was taken up even at Cabinet level. I personally feel that if the adoption of children is not bannen altogether, this is something which it is impossible to implement. Some are of the view that Sri Lanka being a democratic country one must have the freedom to give his or her children for adoption. The money transaction is something that occurs below the counter. There is no law regadring the adoption of children: anyone can adopt a child. If I want to give a child of mine for adoption, I have the freedom to do so in a democratic country. That is the present position. Unless you completely ban the adoption of children, I do not think we have any provision to stop this meance. As you know, in most of these Eastern countries there are so many children born into poor families for whom nobody is responsible and who have come out very saucily into the world. Perhaps from the Kandyan areas or from other places, from a poor place, a girl may come as a servant. She may be misled by someone and she may go astray. Her intention would be when she has the child to hand over the child to someone and go back to the village with all honour as a virgin and, therefore, she would do anything to dispose of the child. Perhaps, she may go to the extent of even killing the child to save her honour. Such things happen. I do not think this has to be taken up at a higher level unless we completely abolish the adoption of children by foreigners. I do not think we have any provision in any law to prevent it because we have the freedom to give any child to anyone unless an order is made by a court of Law, unless that procedure is adopted, I do not think we can prevent it. I do not agree, as my Hon. Deputy Minister said, with the principle of giving children to foreigners. But, after all, it is a very small number, and at the same time, with the increasing population, a girl in a desperate position would like to dispose of her child. That is the position with regard to child adoption.

මන්ත්‍රීවරයෙක්
(அங்கத்தவர் ஒருவர்)
(A Member)

What about local adoption ?

එන්. එච්. ඒ. එම්. කරුණාරත්න මහතා
(திரு. என். எச். ஏ. எம். கருணாரத்ன)
(Mr. N. H. A. M. Karunaratne)

Of course, we have local adoption.

We are putting up some forty odd houses in the villages and there will be ten children in each and all these orphans will be acommodated. There will be a mother looking after those children. We have taken such steps. Although some hon. Members point out that our Ministry is doing the same monotonous thing and everything is a repetition of what had been done in the past, it is not so. There is a great improvement. We are contemplating many other aspects of promotting the welfare of the ordinary man. I would mention that we hope to increase the charitable allowance

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

that we are giving. I also would request every hon. Member in this House to send me a list of all the physically handicapped people who need tricycles. With the money that is available at the moment, I am sure I would be in a position to help them.

I do not think any other comments are necessary. I wish to thank all hon. Members. There was hardly anything said against my Ministry. In fact they commended the work. Of course there are certain drawbacks and shortcomings, and I wish to rectify them and I hope that my Ministry will do very much better in the future than it has done so far.

"159 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 9,07,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

159 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 159, நிகழ்ச்சித்திட்டம் 1, மீண்டுவரும் செலவுக்கான ரூபா 9,07,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 159, நிகழ்ச்சித்திட்டம் 1, மீண்டுவரும் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 907,000, for Head 159, Programme 1, Recurrent Expenditure, be inserted in the Schedule", put and agreed to.

Head 159, Programme 1, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

1 වන වැඩ සටහන—සාමාන්‍ය පරිපාලනය හා කාර්ය මණ්ඩල සේවා—මූලධන වියදම, රු. 1,13,000

நிகழ்ச்சித்திட்டம் 1.—பொது நிருவாகமும் பதவியினர் சேவைகளும்—ஆக்கப்பொருட் செலவு, ரூபா 1,13,000

Programme 1.—General Administration and Staff Services—Capital Expenditure Rs. 113,000

"159 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, මූලධන වියදම් සඳහා රු. 1,13,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

159 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 159, நிகழ்ச்சித்திட்டம் 1, ஆக்கப்பொருட் செலவுக்கான ரூபா 1,13,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 159, நிகழ்ச்சித்திட்டம் 1, ஆக்கப்பொருட் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது,

Question, "That the sum of Rs. 113,000, for Head 159, Programme 1, Capital Expenditure be inserted in the Schedule", put and agreed to.

Head 159, Programme 1, Capital Expenditure, ordered to stand part of the Schedule.

2 වන වැඩ සටහන—ශ්‍රී ලංකා සමාජ සේවා විද්‍යාලය—පුනරාවර්තන වියදම, රු. 22,20,000

நிகழ்ச்சித்திட்டம் 2.—இலங்கை சமூகசேவை வேலைப் பாடசாலை நிர்வாகம்—மீண்டுவரும் செலவு, ரூபா 22,20,000.

Programme 2.—Sri Lanka School of Social Work—Recurrena Expenditure, Rs. 2,220,000

"159 වන ශීර්ෂයෙහි 2 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 22,20,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

159 වන ශීර්ෂයෙහි 2 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 159, நிகழ்ச்சித்திட்டம் 2, மீண்டுவரும் செலவுக்கான ரூபா 22,20,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 159, நிகழ்ச்சித்திட்டம் 2, மீண்டுவரும் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 2,220,000, for Head 159, Programme 2, Recurrent Expenditure, be inserted in the Schedule", put and agreed to.

Head 159, Programme 2, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**2 වන වැඩ සටහන—ශ්‍රී ලංකා සමාජ සේවා විද්‍යාලය—මූලධන වියදම, රු. 1,22,000**

*நிகழ்ச்சித்திட்டம் 2.—இலங்கை சமூகசேவை வேலைப் பாடசாலை திருவாகம் — ஆக்கப் பொருட் செலவு, ரூபா 1,22,000*

Programme 2.—Sri Lanka School of Social Work—Capital Expenditure Rs. 122,000

**"159 වන ශීර්ෂයෙහි 2 වන වැඩ සටහන, මූලධන වියදම සඳහා රු. 1,22,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.**

**159 වන ශීර්ෂයෙහි 2 වන වැඩ සටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

*"தலைப்பு 159, நிகழ்ச்சித்திட்டம் 2, ஆக்கப் பொருட் செலவுக்கான ரூபா 1,22,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*தலைப்பு 159, நிகழ்ச்சித்திட்டம் 2, ஆக்கப் பொருட் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.*

Question, "That the sum of Rs. 122,000, for Head 159, Programme 1, Capital Expenditure be inserted in the Schedule", put and agreed to.

Head 159, Programme 1, Capital Expenditure, ordered to stand part of the Schedule.

**160 වන ශීර්ෂය—සමාජ සේවා දෙපාර්තමේන්තුව**

**1 වන වැඩ සටහන—සාමාන්‍ය පරිපාලනය හා කාර්ය මණ්ඩල සේවා—පුනරාවර්තන වියදම, රු. 16,82,000**

*தலைப்பு 160—சமூக சேவைகள் திணைக்களம்*

*நிகழ்ச்சித்திட்டம் 1.—பொது நிருவாகமும் பதவியினர் சேவைகளும் — மீண்டுவரும் செலவு, ரூபா 16,82,000*

HEAD 160.—DEPARTMENT OF SOCIAL SERVICES

Programme 1.—General Administration and Staff Services—Recurrent Expenditure, Rs. 1,682,000

**"160 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 16,82,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.**

**160 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

*"தலைப்பு 160, நிகழ்ச்சித்திட்டம் 1, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 16,82,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*தலைப்பு 160, நிகழ்ச்சித் திட்டம் 1, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.*

Question, "That the sum of Rs. 1,682,000, for Head 160, Programme 1, Recurrent Expenditure, be inserted in the Schedule", put and agreed to.

Head 160, Programme 1, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

**2 වන වැඩ සටහන—මූදල් ආධාර හා සමාජ සේවා වන් සැපයීම—පුනරාවර්තන වියදම, රු. 7,15,09,000**

*நிகழ்ச்சித்திட்டம் 2.—சமூகசேவைகள், நிதி உதவி ஏற்பாடு — மீண்டுவருஞ் செலவு, ரூபா 7,15,09,000*

Programme 2.—Provision of Financial Assistance and Social Services—Recurent Expenditure, Rs. 71,509,000

**මතු පළවන යෝජනාව සභා සම්මත විය:**

*தீர்மானிக்கப்பட்டது :*

*Resolved :*

"That the Programme be increased by Rs. 50,000,000 in respect of Project 1, Object Code 07 "Grants Contributions and subsidies". (Mr. N. H. A. M. Karunaratne).

**"160 වන ශීර්ෂයෙහි 2 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 12,15,09,000 ක වැඩි කරන ලද මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.**

**160 වන ශීර්ෂයෙහි 2 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

*தலைப்பு 160, நிகழ்ச்சித்திட்டம் 2, மீண்டுவருஞ் செலவுக்கான அதிகரிக்கப்பட்ட ரூபா 12,15,09,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*தலைப்பு 160, நிகழ்ச்சித்திட்டம் 2, மீண்டுவருஞ் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Question, "That the sum of Rs. 121,509,000, for Head 160, Programme 2, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 160, Programme 2, Recurrent Expenditure, as amended ordered to stand part of the Schedule.

**2 වන වැඩ සටහන—මූදල් ආධාර හා සමාජ සේවා වන් සැපයීම—මූලධන වියදම, රු. 3,75,15,000**

*நிகழ்ச்சித்திட்டம் 2.—சமூக சேவைகள் நிதி உதவி ஏற்பாடு — ஆக்கப்பொருட் செலவு, ரூபா 3,75,15,000*

Programme 2.—Provision of Financial Assistance and Social Services—Capital Expenditure Rs. 37,515,000

"160 වන ශීර්ෂයෙහි 2 වන වැඩ සටහන, මූලධන වියදම සඳහා රු. 3,75,15,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

160 වන ශීර්ෂයෙහි 2 වන වැඩ සටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

*"தலைப்பு 160, நிகழ்ச்சித்திட்டம் 2, ஆக்கப் பொருட் செலவுக்கான ரூபா 3,75,15,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக் கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*தலைப்பு 160, நிகழ்ச்சித்திட்டம் 2, ஆக்கப் பொருட் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.*

Question, "That the sum of Rs. 37,515,000, for Head 160, Programme 2, Capital Expenditure be inserted in the Schedule", put and agreed to.

Head 160, Programme 2, Capital Expenditure, ordered to stand part of the Schedule.

**161 වන ශීර්ෂය—පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව**

**1 වන වැඩ සටහන—සාමාන්‍ය පරිපාලනය හා කාර්ය මණ්ඩල සේවා—පුනරාවර්තන වියදම, රු. 16,98,000**

*தலைப்பு 161.—நன்னடத்தைப் பாதுகாவல், சிறுவர் கவனிப்புச் சேவைகள் திணைக்களம்*

*நிகழ்ச்சித்திட்டம் 1—பொது நிருவாகமும் பதவியினர் சேவைகளும்—மீண்டுவருஞ் செலவு, 16,98,000*

HEAD 161.—DEPARTMENT OF PROBATION AND CHILD CARE SERVICES

Programme 1.—General Administration and Staff Services—Recurrent Expenditure, Rs. 1,698,000

"161 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 16,98,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

161 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

*"தலைப்பு 161, நிகழ்ச்சித் திட்டம் 1, மீண்டு வருஞ் செலவுக்கான ரூபா 16,98,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப் பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*தலைப்பு 161, நிகழ்ச்சித் திட்டம் 1, மீண்டு வருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.*

Question, "That the sum of Rs. 1,698,000, for Head 161, Programme 1, Recurrent Expenditure, be inserted in the Schedule", put and agreed to.

Head 161, Programme 1, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

**1 වන වැඩ සටහන—සාමාන්‍ය පරිපාලනය හා කාර්ය මණ්ඩල සේවා—මූලධන වියදම, රු. 46,000**

*நிகழ்ச்சித் திட்டம் 1.—பொது நிருவாகமும் பதவியினர் சேவைகளும்—ஆக்கப்பொருட் செலவு, ரூபா 46,000*

Programme 1.—General Administration and Staff Services—Capital Expenditure, Rs. 46,000

"161 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, මූලධන වියදම සඳහා රු. 46,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

161 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

*"தலைப்பு 161, நிகழ்ச்சித் திட்டம் 1, ஆக்கப் பொருட் செலவுக்கான ரூபா 46,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*தலைப்பு 161, நிகழ்ச்சித் திட்டம் 1, ஆக்கப் பொருட் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.*

Question, "That the sum of Rs. 46,000, for Head 161, Programme 1, Capital Expenditure, be inserted in the Schedule", put and agreed to.

Head 161, Programme 1, Capital Expenditure, ordered to stand part of the Schedule.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

2 වන වැඩ සටහන—හැඩගැස්වීමේ සහ පුනරුත්ථාපන සේවා—පුනරාවර්තන වියදම, රු. 74,87,000

*நிகழ்ச்சித் திட்டம் 2.—சீர்திருத்த முறையும் மறுசீரமைப்புச் சேவைகளும்—மீண்டுவருஞ் செலவு, ரூபா 74,87,000*

Programme 2.—Correctional and Rehabilitation Services—Recurrent Expenditure, Rs. 7,487,000

"161 වන ශීර්ෂයෙහි 2 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 74,87,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

161 වන ශීර්ෂයෙහි 2 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන් ලදී.

*"தலைப்பு 161, நிகழ்ச்சித் திட்டம் 2, மீண்டுவருஞ் செலவுக்கான ரூபா, 74,87,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*தலைப்பு 161, நிகழ்ச்சித் திட்டம் 2, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.*

Question, "That the sum of Rs. 7,487,000 for Head 161, Programme 2, Recurrent Expenditure, be inserted in the Schedule", put and agreed to.

Head 161, Programme 2, Recurrent, Expenditure, ordered to stand part of the Schedule.

2 වන වැඩ සටහන—හැඩගැස්වීමේ සහ පුනරුත්ථාපන සේවා—මූලධන වියදම, රු. 45,000

*நிகழ்ச்சித் திட்டம் 2—சீர்திருத்த முறையும் மறுசீரமைப்புச் சேவைகளும்—ஆக்கப்பொருட் செலவு, ரூபா 45,000*

Programme 2.—Correctional and Rehabilitation Services—Capital Expenditure, Rs. 45,000

"161 වන ශීර්ෂයෙහි 2 වන වැඩ සටහන, මූලධන වියදම සඳහා රු. 45,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

161 වන ශීර්ෂයෙහි 2 වන වැඩ සටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

*"தலைப்பு 161, நிகழ்ச்சித் திட்டம் 2, ஆக்கப்பொருட் செலவுக்கான ரூபா 45,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*தலைப்பு 161, நிகழ்ச்சித் திட்டம் 2, ஆக்கப்பொருட் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.*

Question, "That the sum of Rs. 45,000, for Head 161, Programme 2, Capital Expenditure, be inserted in the Schedule", put and agreed to.

Head 161, Programme 2, Capital Expenditure, ordered to stand part of the Schedule.

3 වන වැඩ සටහන—ළමාරක්ෂක සේවා—පුනරාවර්තන වියදම, රු. 61,05,000

*நிகழ்ச்சித் திட்டம் 3—சிறுவர் கவனிப்புச் சேவைகள்—மீண்டுவருஞ் செலவு, ரூபா 61,05,000*

Programme 3.—Child Care Services—Recurrent Expenditure, Rs. 6,105,000

"161 වන ශීර්ෂයෙහි 3 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 61,05,000 ක මුදල ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

161 වන ශීර්ෂයෙහි 3 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

*"தலைப்பு 161, நிகழ்ச்சித் திட்டம் 3, மீண்டுவருஞ் செலவுக்கான ரூபா, 61,05,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*தலைப்பு 161, நிகழ்ச்சித் திட்டம் 3, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.*

Question, "That the sum of Rs. 6,105,000, for Head 161, Programme 3, Recurrent Expenditure, be inserted in the Schedule", put and agreed to.

Head 161, Programme 3, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

3 වන වැඩ සටහන—ළමාරක්ෂක සේවා—මූලධන වියදම, රු. 67,000

*நிகழ்ச்சித் திட்டம் 3—சிறுவர் கவனிப்புச் சேவைகள்—ஆக்கப்பொருட் செலவு, ரூபா 67,000*

Programme 3.—Child Care Services—Capital Expenditure, Rs. 67,000

"161 වන ශීර්ෂයෙහි 3 වන වැඩ සටහන, මූලධන වියදම සඳහා රු. 67,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

161 වන ශීර්ෂයෙහි 3 වන වැඩ සටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 161, நிகழ்ச்சித் திட்டம் 3, ஆக்கப் பொருட் செலவுக்கான ரூபா 67,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 161, நிகழ்ச்சித் திட்டம் 3, ஆக்கப் பொருட் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 67,000, for Head 161, Programme 3, Capital Expenditure, be inserted in the Schedule", put and agreed to.

Head 161, Programme 3, Capital Expenditure, ordered to stand part of the Schedule.

★ ★ ★

[ඉතිරි වැඩ කටයුතු සඳහා 1981 දෙසැම්බර් 21 වන සඳුදා නිල වාර්තාව බලන්න.]

[நிகழ்ச்சித் தொடரை, 1981 டிசெம்பர் 21, திங்கட்கிழமைய அதிகார அறிக்கையிற் சார்க்க.]

[*For continuation of Proceedings see* OFFICIAL REPORT *for Monday 21st December, 1981*]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org